224 වන කාණ්ඩය - 13 වන කලාපය
தொகுதி 224 - இல. 13
**Volume 224 - No. 13**

**2014 අප්‍රේල් 25 වන සිකුරාදා**
2014 ஏப்பிரல் 25, வெள்ளிக்கிழமை
**Friday, 25th April, 2014**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය
"ඒ" ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන්

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
රථ වාහන අනතුරු ඉහළ යෑම

**වරප්‍රසාද:**
හම්බන්තොට නිරීක්ෂණ චාරිකාවේදී සිදුවූ අවහිරය සහ පහර දීමේ තැත

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
ශ්‍රී ලංකා ෆාතිහ් ආයතනය (සංස්ථාගත කිරීමේ) – [ගරු එම්.එස්. තව්ෆික් මහතා]
පළමු වන වර කියවන ලදී

**ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත:**
නියමය

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
சபாநாயகரது சான்றுரை
நிலைக்குழு 'ஏ' : மேலதிக உறுப்பினர்கள்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல்மூல வினா:**
வாகன விபத்துக்கள் அதிகரிப்பு

**சிறப்புரிமை :**
அம்பாந்தோட்டைக்கான பரிசீலனை விஜயத்தின்போது இடையூறும் தாக்குதல் முயற்சியும்

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
இலங்கை பாதிஹ் நிறுவனம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு எம்.எஸ். தௌபீக்] – முதன்முறை மதிப்பிடப்பட்டது

**செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் சட்டம் :**
கட்டளை

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS :
Speaker's Certificate
Standing Committee "A": Additional Members

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Increase in Traffic Accidents

PRIVILEGE:
Obstruction and attempted Attack during Inspection Tour of Hambantota

PRIVATE MEMBERS' BILLS:
Fathih Institute of Sri Lanka (Incorporation) - [The Hon. M.S. Thowfeek] - Read the First time.

STRATEGIC DEVELOPMENT PROJECTS ACT:
Order

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

*2014 අප්‍රේල් 25 වන සිකුරාදා*
*2014 ஏப்பிரல் 25, வெள்ளிக்கிழமை*
*Friday, 25th April, 2014*

**අ. භා.1.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப. 1.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.30 p.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### I

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව, 2014 අප්‍රේල් මස 24 වන දින මවිසින් පහත සඳහන් පනත් කෙටුම්පත් හි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

එකතු කළ අගය මත බදු (සංශෝධන)
දේශීය ආදායම් (සංශෝධන)
ආර්ථික සේවා ගාස්තු (සංශෝධන)
ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)
විදුලි සංදේශ බදු (සංශෝධන)
විශේෂ වෙළඳ භාණ්ඩ බදු (සංශෝධන)
සමාගම් (සංශෝධන)
ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන)
මුදල් නීති (සංශෝධන)
සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ)
බෞද්ධ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කිරීමේ පදනම (සංස්ථාගත කිරීමේ)

### II

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

"පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)" පනත් කෙටුම්පත, "මොහාන් ලාල් ග්‍රේරු පදනම (සංස්ථාගත කිරීමේ)" පනත් කෙටුම්පත, "නිදහස් අධ්‍යාපන අයිතිවාසිකම්" පනත් කෙටුම්පත,"ර/කුරුවිට මධ්‍ය මහා විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ)" පනත් කෙටුම්පත යන පනත් කෙටුම්පත් සලකා බැලීම පිණිස 139 වැනි ස්ථාවර නියෝගය යටතේ "ඒ" ස්ථාවර කාරක සභාවේ සභාපති වශයෙන් නියෝජ්‍ය කථානායක සහ කාරක සභාපති ගරු චන්දිම වීරක්කොඩි මහතා මවිසින් පත් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

තව ද, එම පනත් කෙටුම්පත් සලකා බැලීම පිණිස "ඒ" ස්ථාවර කාරක සභාවට අතිරේක සාමාජිකයන් වශයෙන් මවිසින් නම් කරන ලද ගරු මන්ත්‍රීවරුන්ගේ නම් සියල්ලම ඇතුළත් "බී" සිට "ඊ" දක්වා නිවේදන හතරක් වෙන් වෙන් වශයෙන් සභාගත කරන බවත් මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

***සභාමේසය මත තබන ලද නාම ලේඛනය:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல் :*
** List of names tabled:*

### "ඒ" ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන්
### நிலைக்குழு 'ஏ' : மேலதிக உறுப்பினர்கள்
### STANDING COMMITTEE "A": ADDITIONAL MEMBERS

#### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත
#### உள்ளூர் அதிகாரசபைகள் தேர்தல்கள் (திருத்தம்) சட்டமூலம்
#### LOCAL AUTHORITIES ELECTIONS (AMENDMENT) BILL

ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා
ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා
ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු ඩබ්ලිව්. බී. ඒකනායක මහතා
ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු පොන්. සෙල්වරාසා මහතා
ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා

மாண்புமிகு முருகேசு சந்திரகுமார்
மாண்புமிகு தினேஷ் குணவர்தன
மாண்புமிகு ஏ.டீ. சுசில் பிரேமஜயந்த
மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா
மாண்புமிகு ஜனக பண்டார தென்னகோன்
மாண்புமிகு றிஸாட் பதியுதீன்
மாண்புமிகு டபிள்யூ. பி. ஏக்கநாயக்க
மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா
மாண்புமிகு விஜித ஹேரத்
மாண்புமிகு ஆர். எம். ரன்ஜித் மத்துமபண்டார
மாண்புமிகு பொன். செல்வராசா
மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டாரஜயசிங்க
மாண்புமிகு அகில விராஜ் காரியவசம்
மாண்புமிகு விதுற விக்கிரமநாயக்க
மாண்புமிகு சி. சிறீதரன்

Hon. Murugesu Chandrakumar
Hon. Dinesh Gunawardena
Hon. A.D. Susil Premajayantha
Hon. A.L.M. Athaullah
Hon. Janaka Bandara Tennakoon
Hon. Risad Badhiutheen
Hon. W.B. Ekanayake
Hon. M. Joseph Michael Perera
Hon.Vijitha Herath
Hon. R.M. Ranjith Madduma Bandara
Hon. Pon. Selvarasa
Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe
Hon. Akila Viraj Kariyawasam
Hon. Vidura Wickramanayaka
Hon. S. Shritharan

**මොහාන් ලාල් ග්‍රේරු පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**

மொஹான் லால் கிரேரு மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

MOHAN LAL GRERO FOUNDATION (INCORPORATION) BILL

ගරු පී. දයාරත්න මහතා
ගරු ගුණරත්න වීරකෝන් මහතා
ගරු නවින් දිසානායක මහතා
ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
ගරු තලතා අතුකෝරල මහත්මිය
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
ගරු අජිත් කුමාර මහතා
ගරු දුනේෂ් ගන්කන්ද මහතා
ගරු පී. අරියනේත්‍රන් මහතා
ගරු වසන්ත අලුවිහාරේ මහතා
ගරු මනූෂ නානායක්කාර මහතා
ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
ගරු තිලංග සුමතිපාල මහතා
ගරු එච්.එම්.එම්. හරීස් මහතා

மாண்புமிகு பீ. தயாரத்ன
மாண்புமிகு குணரத்ன வீரகோன்
மாண்புமிகு நவின் திசாநாயக்க
மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன
மாண்புமிகு மொஹான் லால் கிரேரு
மாண்புமிகு (திருமதி) தலதா அதுகோரல
மாண்புமிகு அகில விராஜ் காரியவசம்
மாண்புமிகு அஜித் குமார
மாண்புமிகு துனேஷ் கங்கந்த
மாண்புமிகு பா. அரியநேத்திரன்
மாண்புமிகு வசந்த அலுவிஹாரே
மாண்புமிகு மனுஷ நாணாயக்கார
மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்
மாண்புமிகு திலங்க சுமதிபால
மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்

Hon.  P. Dayaratna
Hon. Gunaratne Weerakoon
Hon. Navin Dissanayake
Hon. Gitanjana Gunawardena
Hon. Mohan Lal Grero
Hon. (Mrs.)Thalatha Atukorale
Hon. Akila Viraj Kariyawasam
Hon. Ajith Kumara
Hon. Dunesh Gankanda
Hon. P. Ariyanethran
Hon. Wasantha Aluwihare
Hon. Manusha Nanayakkara
Hon. Seeniththamby Yoheswaran
Hon. Thilanga Sumathipala
Hon. H.M.M. Harees

**නිදහස් අධ්‍යාපන අයිතිවාසිකම් පනත් කෙටුම්පත**

இலவசக் கல்விக்கான உரிமை சட்டமூலம்

RIGHT TO FREE EDUCATION BILL

ගරු දුමින්ද දිසානායක මහතා
ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
ගරු මුත්තු සිවලිංගම් මහතා
ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු පොන්. සෙල්වරාසා මහතා
ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය
ගරු දුනේෂ් ගන්කන්ද මහතා
ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා
ගරු රෝසි සේනානායක මහත්මිය
ගරු හුනෛයිස් ෆාරුක් මහතා

மாண்புமிகு துமிந்த திசாநாயக்க
மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா
மாண்புமிகு முத்து சிவலிங்கம்
மாண்புமிகு மொஹான் லால் கிரேரு
மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா
மாண்புமிகு விஜித ஹேரத்
மாண்புமிகு பொன். செல்வராசா
மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டாரஜயசிங்க
மாண்புமிகு துனேஷ் கங்கந்த
மாண்புமிகு மொஹான் பிரியதர்ஷன தசில்வா
மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே
மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன
மாண்புமிகு சி. சிறீதரன்
மாண்புமிகு (திருமதி) ரோஸிசேனாநாயக்க
மாண்புமிகு ஹுனைஸ் பாறூக்

Hon. Duminda Dissanayake
Hon. Gamini Wijith Wijayamuni De Zoysa
Hon. Muthu Sivalingam
Hon. Mohan Lal Grero
Hon. M. Joseph Michael Perera
Hon. Vijitha Herath
Hon. Pon. Selvarasa
Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe
Hon. Dunesh Gankanda
Hon. Mohan Priyadarshana De Silva
Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle
Hon. Eric Prasanna Weerawardhana
Hon. S. Shritharan
Hon. (Mrs.) Rosy Senanayake
Hon. Hunais Farook

**ර/කුරුවිට මධ්‍ය මහා විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**

இர/ குருவிட்ட மத்திய மகா வித்தியாலய பழைய மாணவர் கழகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

R/KURUWITA CENTRAL COLLEGE PAST PUPILS ASSOCIATION (INCORPORATION) BILL

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා
ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා
ගරු එච්.එල්. ප්‍රේමලාල් ජයසේකර මහතා
ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය
ගරු අජිත් කුමාර මහතා
ගරු දුනේෂ් ගන්කන්ද මහතා
ගරු පී. අරියනේත්‍රන් මහතා
ගරු වසන්ත අලුවිහාරේ මහතා
ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා
ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
ගරු රන්ජන් රාමනායක මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

மாண்புமிகு ரெஜினோல்ட் குரே
மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க
மாண்புமிகு எச்.எல்.பிரேமலால் ஜயசேக்கர
மாண்புமிகு இந்திக்க பண்டாரநாயக்க
மாண்புமிகு (திருமதி) தலதா அதுகோரல
மாண்புமிகு அஜித் குமார
மாண்புமிகு துனேஷ் கங்கந்த
மாண்புமிகு பா. அரியநேத்திரன்
மாண்புமிகு வசந்த அலுவிஹாரே
மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா
மாண்புமிகு (வைத்திய கலாநிதி) ரோஹன புஷ்பகுமார
மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்
மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க
மாண்புமிகு ஜானக வக்கும்புர
மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம

Hon. Reginold Cooray
Hon. Nandimithra Ekanayake
Hon. H.L. Premalal Jayasekara
Hon. Indika Bandaranayake
Hon. (Mrs.) Thalatha Atukorale
Hon. Ajith Kumara
Hon. Dunesh Gankanda
Hon. P. Ariyanethran
Hon. Wasantha Aluwihare
Hon. T. Ranjith De Zoysa
Hon. (Dr.) Rohana Pushpa Kumara
Hon. Seeniththamby Yoheswaran
Hon. Ranjan Ramanayake
Hon. Janaka Wakkumbura
Hon. (Mrs.) Sriyani Wijewickrama

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

ගරු කථානායකතුමනි, 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, 2011/2012 වර්ෂය සඳහා නෝත්සී සමාගමේ වාර්ෂික ගිණුම් සහ විගණන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2013 මුදල් වර්ෂය සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ කාර්ය සාධන වාර්තාව.- [ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, 2012 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, 2011 වර්ෂය සඳහා ටවර් හෝල් රඟහල පදනමේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දුමින්ද දිසානායක මහතා (අධ්‍යාපන සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க - கல்விச் சேவைகள் அமைச்சர்)
(The Hon. Duminda Dissanayake - Minister of Education Services)

ගරු කථානායකතුමනි, 2010 වර්ෂය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපන සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ගුණරත්න වීරකෝන් මහතා (නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා)**
(மாண்புமிகு குணரத்ன வீரக்கோன் - மீள்குடியேற்ற அமைச்சர்)
(The Hon. Gunaratne Weerakoon - Minister of Resettlement)

ගරු කථානායකතුමනි, ගෝනාපීනුවල, කුරුසගොඩ යන ලිපිනයෙහි පදිංචි විජයපාල මානවඩු මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා (උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க - உயர் கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Nandimithra Ekanayake - Deputy Minister of Higher Education)

ගරු කථානායකතුමනි, මාතලේ, අළුවිහාරේ, සමන්දාව පාර, නිකකොටුව වත්ත, අංක 116/1 දරන ස්ථානයෙහි පදිංචි එස්.එච්.එම්. විජේසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! I wish to announce that this House cordially welcomes the Parliamentary Delegation from Balochistan led by the Hon. Mir Jan Muhammad Khan Jamali, Speaker of Provincial Assembly of Balochistan, now present in the Speaker's Gallery.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### විදුලිය නොමැති නැඟෙනහිර පළාතේ ගම්මාන : විස්තර
### மின்சார வசதியற்ற கிழக்கு மாகாண கிராமங்கள் : விபரம்
### VILLAGES WITHOUT ELECTRICITY IN EASTERN PROVINCE : DETAILS

2584/'12

1. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) නැඟෙනහිර පළාතේ විදුලිය නොමැති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

යන්න දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් විදුලිය නොමැති ගම්මානවලට කවර කාල සීමාවක් තුළ දී විදුලිය ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) 2012 වර්ෂය තුළදී නැඟෙනහිර පළාතේ විදුලිය නොමැති සියලුම ගම්මානවලට විදුලිය ලබා දීමේ හැකියාවක් තිබුණේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வலு, சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிழக்கு மாகாணத்தில் மின்சார வசதியற்ற கிராமங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி கிராமங்களின் பெயர்கள் யாவையென்பதையும்

மாவட்ட மட்டத்தில் வெவ்வேறாக அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேலே குறிப்பிடப்பட்ட மின்சார வசதியற்ற கிராமங்களுக்கு எக்காலப்பகுதியில் மின்சார வசதியை வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்படுமென்பதையும்;

(ii) 2012ஆம் ஆண்டில் கிழக்கு மாகாணத்தில் மின்சார வசதியற்ற அனைத்துக் கிராமங்களுக்கும் மின்சார வசதியினைப் பெற்றுக்கொடுப்பதற்கான இயலுமை இருந்ததா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will she state separately, on district basis -

(i) the number of villages without electricity in the Eastern Province; and

(ii) the names of those villages?

(b) Will she inform this House -

(i) the period of time within which action will be taken to provide electricity to the aforesaid villages without electricity; and

(ii) whether there was a possibility to provide electricity to all the villages without electricity in the Eastern Province, within the year 2012?

(c) If not, why?

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - வலு, சக்தி அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Power and Energy)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැගෙනහිර පළාතේ විදුලිය නොමැති ගම්මාන සංඛ්‍යාව 92කි. එය පහත සඳහන් වේ.

- අම්පාර දිස්ත්‍රික්කය - 36
- මඩකලපුව දිස්ත්‍රික්කය - 47
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය - 09

(ii) දිස්ත්‍රික්ක වශයෙන් විදුලිය සම්පූර්ණයෙන්ම නොමැති ගම්මානවල නම් ඇමුණුමෙහි සඳහන් වේ. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) (i) ඇමුණුමෙහි සඳහන් විදුලිය නොමැති සියලුම ගම්මානවලට 2014 වසර අවසාන වන විට විදුලිය ලබා දිය හැක.

(ii) 2012 වසර තුළදී නැගෙනහිර පළාතේ එකී සියලුම ගම්මානවලට විදුලිය ලබා දීමට සැලසුම් කර තිබුණු නමුත් ඉරාන රජයේ ණය මුදල් යටතේ ලැබිය යුතුව තිබූ උපකරණ රාශියක් දැනට ඉරානයට පවතින ආර්ථික සම්බාධක නිසා කලට වේලාවට නොලැබීමේ හේතුවෙන් නැගෙනහිර පළාතේ සෑම ගම්මානයකටම 2012 වර්ෂය තුළදී විදුලිය ලබා දීමේ ඉලක්කය සම්පූර්ණ කළ නොහැකි විය.

මෙම ඉලක්කය 2014 වර්ෂය තුළ සම්පූර්ණ කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය ක්‍රියා කරනු ඇත.

(ඇ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

Ampara District

| No. | Name of the Scheme |
|---|---|
| 1 | Wewsama Himiduruwa |
| 2 | Sarana Gama,Inginiyagala |
| 3 | Ambagaswatte |
| 4 | Hagamwela,Kumburuwela |
| 5 | Waragapitiya |
| 6 | Ruppebedda |
| 7 | Hilarunagar |
| 8 | Sagama |
| 9 | Vilathalawa |
| 10 | Kalupenibedda |
| 11 | Karambagodayaya |
| 12 | Thapassiriyaya |
| 13 | Kehelulla Kadupahara |
| 14 | Thangavelayuda Puram |
| 15 | Kanchikudiaru |
| 16 | Mohinipuram |
| 17 | Madeena Puram |
| 18 | Kongaspitiya |
| 19 | Buddhama |
| 20 | Galwalayaya |
| 21 | Thalagangoda |
| 22 | Ruhunu danauwa(20th Mile Post) |
| 23 | Wahawa |
| 24 | Helakomana |
| 25 | Mewlagala Aranaya Senasanaya & Walabedda |
| 26 | Sammanthurai |
| 27 | Paniyarruppu Nagar |
| 28 | Kudasigiriya |
| 29 | Himidurawa 12 ela |
| 30 | Shanthipuram |
| 31 | Kokumawara |
| 32 | Aalim Kaadu |
| 33 | Meenachchi Amman Kovil,Oluvil |
| 34 | Wan Ela |
| 35 | Kudumbigala Aranya |
| 36 | Sinnawaththa M.C.01 |

**Batticaloa District**

| No. | Name of the Scheme |
|---|---|
| 1 | Irruttusoolaimadu |
| 2 | Sippimadu Karaveddi |
| 3 | 10.5th Mile Post |
| 4 | Mullamunai |
| 5 | Palamkudiruppu |
| 6 | Puliyadimadu |
| 7 | Palakadu,Karadipooval |
| 8 | Katputhanai |
| 9 | Kulavinnamadu |
| 10 | Kalapottamadu |
| 11 | Katchchakodi |
| 12 | Panchchenai |
| 13 | Kalapottamadu-Uppukulam |
| 14 | Thevilamunai |
| 15 | 200 Well Village |
| 16 | Kannaki Kiramam,Eravur |

[ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය ]

| | |
|---|---|
| 17 | Kurunthaiyadi Munmari & Iyarkulam |
| 18 | Periyapullumalay |
| 19 | Eralakulam |
| 20 | Kommathurai,Theevu village |
| 21 | Velikakandy kopavelly |
| 22 | 1st colony velikakandy |
| 23 | Mayilawattawan |
| 24 | Kaddumurivu, Vaharai |
| 25 | Omadiyamadu |
| 26 | Thonithndamadu |
| 27 | Uthuchchenai |
| 28 | Mullivaddavan |
| 29 | Pirampadithivu & Murukanthivu |
| 30 | Koravelly |
| 31 | Vadamunai |
| 32 | Kudumpimalay |
| 33 | Thikiliiveddai |
| 34 | Vathiyar Kal |
| 35 | Periyawattawan |
| 36 | Majma Nagar |
| 37 | Atputha Pillayar vilage |
| 38 | Malayarkaddu |
| 39 | Pilalyvempu |
| 40 | Navagiri Nagar |
| 41 | 7th Ward |
| 42 | 6th Ward |
| 43 | Pulayaveli |
| 44 | Veduwar Kudiyiruppu Thalankudah |
| 45 | karaikadu Veppewattawan |
| 46 | Thunadithalawai |
| 47 | Punnakudah |

## Trincomalee District

| No. | Name of the Scheme |
|---|---|
| 1 | Paddagama |
| 2 | Theththavadi village |
| 3 | Jinnapuram fisheries village |
| 4 | Andiyagala village |
| 5 | D1 village |
| 6 | Rajamahavihara |
| 7 | 96th mile post |
| 8 | Thaib Nagar |
| 9 | Sooriyapura |

Summary

| District | No of villages to be electrified |
|---|---|
| Ampara | 36 |
| Batticaloa | 47 |
| Trincomalee | 09 |
| Total | 92 |

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමියනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

නැඟෙනහිර පළාත ගත්තාම එහි කාන්තා ගෘහ මූලික පවුල් ඒකක රැසක් තිබෙනවා. සංඛ්‍යා ලේඛන අනුව වැන්දඹු කාන්තා ගෘහ මූලික පවුල් ඒකක 30,000ක් 40,000ක් පමණ එහි තිබෙනවා. ඒ කාන්තා මූලික ගෘහ ඒකකවලට විදුලිය ලබා ගැනීමේදී සහන ක්‍රමයක් යටතේ ලබා ගැනීමට ඔබතුමියන්ලා ක්‍රියාත්මක කරන වැඩසටහනක් තිබෙනවා ද?

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු මන්ත්‍රීතුමා, ඒ කියන්නේ නිවසට සම්බන්ධතාව - connection - ලබා ගැනීමට ද, නැත්නම් නිවස ඉදිරි පිට විදුලි කණුව සිටවීමට ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නිවෙස්වලට සම්බන්ධතාව ලබා ගැනීමට.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
දැනට සමෘද්ධි ව්‍යාපාරය හරහා වසර පහකදී -වාරික 60කදී- සම්බන්ධතා ගාස්තුව බිලෙන්ම කැපෙන ක්‍රමයක් ලංකාව පුරාම ක්‍රියාත්මක වනවා. ඔබතුමා වඩාත් උනන්දුවක් දක්වන නිසා මමත් පෞද්ගලිකව මැදිහත් වෙලා බලන්නම් නැඟෙනහිර පළාතේ සම්බන්ධතා ඉල්ලන හැමෝටම සමෘද්ධි ව්‍යාපාරය යටතේ පහසුවෙන් සහ ඊටත් වඩා කෙටි ක්‍රමයකින් එය කර ගන්න පුළුවන්ද කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එම පළාතේ කාන්තා ගෘහ මූලික පවුල් ඒකක 40,000ක් පමණ තිබෙනවා කියලා වාර්තා වනවා. මම ඔබතුමියගෙන් ඉල්ලීමක් කරනවා, විශේෂ ණය වැඩසටහනක් යටතේ ඒ නිවෙස්වලට සම්බන්ධතා ඇති කර ගන්නට ඉක්මන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. මම අහනවා, ඔබතුමිය ඒක ඉෂ්ට කරනවා ද කියලා.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
මට මතක විධියට දැන් ආසියානු සංවර්ධන බැංකුව යටතේ ණයක් ලැබිලා තිබෙනවා. සම්බන්ධතා ගාස්තුව සමෘද්ධියේ ණයක් හරහා දෙනවාට වඩා විදුලිබල මණ්ඩලයේ බිලෙන් කැපිලා ඒ මුදල විදුලිබල මණ්ඩලයට ලැබෙන්නට ආසියානු සංවර්ධන බැංකුවෙන් මුදලක් ලබා දීලා තිබෙනවා. ඒ සඳහා අම්පාර දිස්ත්‍රික්කය ඇතුළත් කරලා තිබෙන බවයි මට මතක. මම ඒ සම්බන්ධයෙනුත් ක්‍රියාත්මක වෙන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මාගේ තුන්වෙනි සහ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමියනි, දැන් දින හතරකට පෙර එක පුද්ගලයෙකු සිය දිවි නසාගෙන තිබෙනවා, විදුලි බිල ගෙවා ගන්නට බැරිව.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔය අතුරු ප්‍රශ්නය පිළිතුරට සම්බන්ධයක් නැහැ; මැරෙන ඒවා, දිවි නසා ගැනීම්.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු කථානායකතුමනි, ඒ වාර්තාව සම්බන්ධව අපි සොයා බලමින් සිටිනවා. ඒ වාර්තාව සත්‍ය දැයි අපි සොයා බලමින් සිටිනවා. පත්තරවල කළු පාට අච්චු අකුරින් මුද්‍රණය වූ පමණින් එය සත්‍ය යැයි කියන්නට බැහැ. ඔහොම තමයි, කරච්චි කාලාත්- [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අමාත්‍යවරුන් ප්‍රශ්න අහන පැයේදීවත් සභාවේ රැඳී සිටියා නම් හොඳයි.

ප්‍රශ්න අංක 2, ගරු රවි කරුණානායක මහතා; මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දෙවෙනි ප්‍රශ්නය අහන්නට කලින් මම ගරු කථානායකතුමාගෙන් අහන්නට කැමැතියි, මෙන්න මෙය. පාර්ලිමේන්තුවේ රැස්වීම් සජීවී විකාශනය සම්බන්ධ ඔබතුමාගේ ප්‍රයත්නය මේ මොහොතේ වුණත් ක්‍රියාත්මක වන්නේ නැහැ. ඔබතුමා දරන මේ ප්‍රයත්නය නවත්වන්නේ කවුද? කවුරු හෝ හෙනහුරෙක් ඉන්නවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කවුරුවත් නවත්වන්නේ නැහැ. ලබන සතියේ ඉඳන් පළමුවෙනි පැය සජීවී ලෙස විකාශනය කිරීමට සලස්වනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා සිටින තැන බොත්තම තිබෙනවා නේ, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒකත් තිබෙනවා. නමුත්, කථා පාලනය තමයි කරන්න අවශ්‍ය. ස්ථාවර නියෝග අකුරටම ක්‍රියාත්මක කරනවා. එතකොට ඔක්කොම හරියට කෙරෙනවා.

ප්‍රශ්න අංක 2-3148/'12 - (3), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ගොවිජන විනිශ්චය සභාව : පිහිටුවීම
கமநல நியாய சபை : தாபித்தல்
AGRARIAN TRIBUNAL: ESTABLISHMENT

3217/'12

3. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුඹුරු ඉඩම් හිමියන් හා අඳ ගොවීන් අතර ඇතිවන ආරාවුල් විසඳනු ලබන්නේ ගොවිජන විනිශ්චය සභාවෙන් බවත්;

(ii) වර්ෂ 12 ක පමණ කාලයක සිට එම ආයතනය පිහිටුවා නොමැති බවත්;

(iii) එම නිසා මෙම ක්ෂේත්‍රයේ ඇති වන ගැටලු දිස්ත්‍රික් කාර්යාලවල ගොඩ ගැසී ඇති බවත්;

(iv) එම තත්ත්වය යටතේ කුඹුරු ඉඩම් හිමියන් සහ අඳ ගොවීන් ගැටලු රැසකට මුහුණපා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කඩිනමින් ගොවිජන විනිශ්චය සභාව පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i ) வயற்காணி உரிமையாளர்களுக்கும் வாரக்குடி விவசாயிகளுக்கும் இடையில் ஏற்படுகின்ற பிரச்சினைகள் கமநல நியாயசபையினாலேயே தீர்க்கப்படுகின்றது என்பதையும்;

(ii) சுமார் 12 வருட காலமாக மேற்படி நிறுவனம் தாபிக்கப்படவில்லை என்பதையும்;

(iii) ஆதலால், மேற்படி துறையில் ஏற்படுகின்ற பிரச்சினைகள் மாவட்ட அலுவலகங்களில் குவிந்துள்ளன என்பதையும்;

(iv) மேற்படி நிலைமையின்கீழ் வயற்காணி உரிமையாளர்களும் வாரக்குடி விவசாயிகளும் பலவித சிக்கல்களை எதிர்நோக்கியுள் ளனரென்பதையும்

அவர் அறிவாரா?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ஆ) (i) துரிதமாக கமநல நியாயசபையை தாபிப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அத்திகதி யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Is he aware that-

(i) the disputes between paddy field owners and tenant farmers are resolved by the Agrarian Tribunal;

(ii) this Institution has not been set up for nearly 12 years;

(iii) this has resulted in disputes in this field being piled up in district offices; and

(iv) paddy field owners and tenant farmers are faced with numerous problems owing to this situation?

(b) Will he inform this House-

(i) whether action will be taken to set up the Agrarian Tribunal expeditiously; and

(ii) if so, the date on which such Tribunal will be set up?

(c) If not, why?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (විශේෂ ව්‍යාපෘති අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - விசேட கருத்திட்டங்கள் அமைச்சரும் பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சரும்)
(The Hon. S.M. Chandrasena - Minister of Special Projects and Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ ගොවිජන විනිශ්චය සභා පිහිටුවීම සඳහා සාමාජිකයින් පත් කිරීමට බලය ලත් පුද්ගලයෙකු සඳහන් කර නොමැති වීම ගැටලුවක් විය. 2011 අංක 46 දරන පනත සංශෝධනය කිරීම මඟින් එම ගැටලුව නිරාකරණය කර ගන්නා ලදී.

ඒ අනුව සංශෝධිත පනතේ විධිවිධාන යටතේ ගොවිජන විනිශ්චය සභා පිහිටුවීමට සුදුස්සන්ගෙන් අයදුම් පත් කැඳවීම සඳහා 2013.08.02 දින ගැසට් නිවේදනයක් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ සඳහා ලැබුණු අයදුම් පත් ප්‍රමාණවත් නොවූ බැවින් 2013.12.27 දින නැවත අයදුම් පත් කැඳවීමට ගැසට් නිවේදනයක් පළ කරන ලදී. පසුව එම අවස්ථා දෙකේදීම ලද අයදුම් පත් අතුරින් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට මේ වන විට කටයුතු සිදු කරමින් පවතින අතර එසේ සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගනු ලබන සාමාජිකයින් දිස්ත්‍රික් මට්ටමින් ගොවිජන විනිශ්චය සභාව සඳහා පත් කිරීමට නියමිතය.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ආ) (i) අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මෙය ඔබතුමාත් බොහොම ලැදි ක්ෂේත්‍රයක්. ගරු ඇමතිතුමා කියපු ආකාරයට මීට අවුරුදු 14කට කලින් 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සම්මත කළා. 2014 වනකොටත් අයදුම් පත්‍ර කැඳවා මේ කටයුත්ත සිදු වෙමිනුයි තිබෙන්නේ. ගරු අමාත්‍යතුමනි, දිස්ත්‍රික්ක මට්ටමින් ඉඩම් හිමියන් සහ අඳ ගොවීන් අතර අර්බුද විසඳන්න පුළුවන් විධියේ ගොවිජන විනිශ්චය සභා නියමාකාරයෙන් ස්ථාපනය වන දවස මේ ගරු සභාවට අද කියන්න පුළුවන්ද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගොවිජන විනිශ්චය සභා පිහිටුවන්න විශ්‍රාම ලත් විනිශ්චයකාරවරුන්ගෙන් අයදුම් පත් කැඳවා තිබුණා. මුල් වටයේ අයදුම් පත් ලැබුණේ නැහැ. අප දෙවන වටයේ දැන්වීම් පළ කළාට පස්සේ මේ වන විට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා අයදුම් පත් ලැබිලා තිබෙනවා. දිස්ත්‍රික්ක 25ට ගොවිජන විනිශ්චය සභා 25ක් පත් කරන්න ඕනෑ. ඒ අවශ්‍ය ප්‍රමාණය ඉන්නවා. ඉතාම කෙටි කාලයකින් -තවත් මාසයක් හමාරක් යන කොට- ඒ සියලු විනිශ්චය සභා පිහිටුවනවා. දැනට ගොඩ ගැහිලා තිබෙනවා පැමිණිලි විශාල ප්‍රමාණයක්. විශේෂයෙන් අපේ ගරු කථානායකතුමාගේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තමයි පැමිණිලි වැඩියෙන්ම තිබෙන්නේ. අප ඒ සියල්ල හැකි ඉක්මනින් දිස්ත්‍රික්ක මට්ටමින් විසඳන්න කටයුතු කරනවා කියන එක මා ප්‍රකාශ කරන්න කැමැතියි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි. ගරු ඇමතිතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නයට දුන් පිළිතුරේදී කිව්වා, මාස එකහමාරක් දෙකක් ඇතුළත ගොවිජන විනිශ්චය සභා ස්ථාපනය කරනවා; වැඩි වශයෙන් ප්‍රශ්න තිබෙන දිස්ත්‍රික්කයක් විධියට හම්බන්තොට දිස්ත්‍රික්කය හඳුනා ගෙන තිබෙනවා; එහි විශාල ප්‍රශ්න ප්‍රමාණයක් තිබෙනවා කියලා. මේ මොහොතේ ඇති වන ප්‍රශ්නවලට විසඳුම් සොයන ගමන් කළ යුතු තවත් දෙයක් තිබෙනවා. පරණ ප්‍රශ්න විශාල ප්‍රමාණයකුත් තිබෙනවා, යම් යම් තීන්දු අරගෙන අවසන් කරන්න. සංඛ්‍යාත්මකව බැලුවොත්, මේ දැවැන්ත ප්‍රශ්න ප්‍රමාණය විසඳන්න මුලින් බඳවා ගන්නා ප්‍රමාණයම ද පාවිච්චි කරන්නේ? එහෙම නැත්නම් යම් වැඩි පිරිසක් අරගෙන අන්තර්කාලීන වැඩ පිළිවෙළකට යන්න බලාපොරොත්තු වෙනවාද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

අපි මේ සඳහා ජංගම සේවයක් පවත්වන්න බලාපොරොත්තු වෙනවා. අපේ නිලධාරිවරුන් විධියට ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්වරයා ඉන්නවා; දිස්ත්‍රික්කවල ඉන්නවා නියෝජ්‍ය කොමසාරිස්වරු වාගේම ගොවිජන සංවර්ධන

නිලධාරිවරු. විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කර මේ කටයුත්ත අවසන් කරන්න තමයි අපි ලැහැස්ති කරලා තිබෙන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය විධියට මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි දැනට ගොඩ ගැසී ඇති කුඹුරු ඉඩම් හිමියන් සහ අද ගොවීන් අතර වූ ආරවුල් අවසන් කිරීම පිළිබඳ අමාත්‍යාංශය නිශ්චිත කාලරාමුවක් දැනටමත් සකස් කරගෙන තිබෙනවාද කියා. අපි උදාහරණයක් විධියට කියමු, 2014 දෙසැම්බර් 31 කියලා. ඒ ආදී වශයෙන් යම් කිසි නිශ්චිත කාලරාමුවක් තිබෙනවාද? මොකක්ද කාලරාමුව?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

2014 අවුරුද්ද තුළ මේ සියල්ලම අවසන් කරන්න අපි සැලසුම් කරලා තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

හම්බන්තොට එහෙම වෙයි ද කියලා බලමු.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හම්බන්තොටත් තිබෙනවා, 35,000ක් විතර. මම දන්නේ නැහැ, කවදා ඉවර කරයිද කියලා. හොඳයි, බලමු.

ප්‍රශ්න අංක 4-3369/'12-(1), පී. හැරිසන් මහතා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පාසල් නිල ඇඳුම් රෙදි ආනයනය : විස්තර
## பாடசாலைச் சீருடைத் துணிகள் இறக்குமதி : விபரம்
## IMPORT OF SCHOOL UNIFORM MATERIAL: DETAILS

4153/’13

5. **ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2012 වර්ෂයේ දී පාසල් නිල ඇඳුම් සඳහා චීනයෙන් ආනයනය කරනු ලැබූ රෙදි ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම රෙදි ආනයනය කරනු ලැබූ සමාගම කවරේද;

(iv) එම සමාගම හරහා ඉහත නිල ඇඳුම් රෙදි ආනයනය කිරීමේ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂය සඳහා නිල ඇඳුම් සැපයීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද සමාගම් හා මිල ගණන් කවරේද;

(ii) ඉහත සමාගම් අතරින් තෝරා ගනු ලැබුවේ අඩුම ලංසුව ඉදිරිපත් කරන ලද සමාගමද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iv) අඩුම ලංසුව ඉදිරිපත් කළ සමාගම විසින් ඉදිරිපත් කළ රෙදිවල තිබූ අඩු පාඩු කවරේද;

(v) තෝරා ගත් සමාගම ඉදිරිපත් කළ නිල ඇඳුම් රෙදිවලද ඉහත අඩු පාඩු මෙන්ම තවත් අඩු පාඩුද තිබූ බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்விச் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2012ஆம் ஆண்டில் பாடசாலை சீருடைகளுக் காகச் சீனாவிலிருந்து இறக்குமதி செய்யப்பட்ட துணிகளின் அளவு எவ்வளவு;

(ii) அதற்காகச் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு;

(iii) அத்துணிகளை இறக்குமதி செய்த கம்பனி யாது;

(iv) அக்கம்பனியின் ஊடாக மேற்படி சீருடைத் துணிகள் எந்த அடிப்படையில் இறக்குமதி செய்யப்பட்டன

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2012ஆம் ஆண்டுக்கு சீருடை வழங்குவதற்காக கேள்விப் பத்திரங்களைச் சமர்ப்பித்த கம்பனிகள் மற்றும் விலைகள் யாவை;

(ii) மேற்படி கம்பனிகளில் குறைந்த விலைக் கேள்வியைச் சமர்ப்பித்த கம்பனியா தெரிவுசெய்யப்பட்டது;

(iii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை;

(iv) குறைந்த விலைக் கேள்வியைச் சமர்ப்பித்த கம்பனியினால் சமர்ப்பிக்கப்பட்ட துணிகளில் காணப்பட்ட குறைபாடுகள் யாவை;

(v) தெரிவுசெய்யப்பட்ட கம்பனி சமர்ப்பித்த சீருடைத் துணிகளிலும் மேற்கூறிய குறைபாடுகளைப் போன்றே மேலும் பல குறைபாடுகளும் இருந்தன என்பதை ஏற்றுக்கொள்வாரா

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු අනුර දිසානායක මහතා]

asked the Minister of Education Services:

(a) Will he state -

(i) the amount of school uniform material that was imported to Sri Lanka from China in the year 2012;

(ii) the amount of money that was spent on the aforesaid purpose;

(iii) the name of the company by which the aforesaid uniform material was imported; and

(iv) the basis on which the aforesaid uniform material was imported through that company?

(b) Will he inform this House -

(i) the names of the companies which had submitted tenders for the supply of the uniform material for the year 2012 and the bids they had submitted;

(ii) whether the company that was selected, was the one that had submitted the lowest bid;

(iii) if not, of the reasons for that;

(iv) the defects contained in the material that had been submitted by the company which had submitted the lowest bid; and

(v) whether he admits that the material submitted by the selected company contained more defects than those mentioned above?

(c) If not, why?

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2013 වර්ෂයේදී පාසල් නිල ඇඳුම් සඳහා 2012 වර්ෂයේදී මීටර් 5,605,000ක් (මීටර් පනස්හය ලක්ෂ පන්දහසක්) ආනයනය කර ඇත.

(ii) රු. 812,807,784.75කි. (රුපියල් අටසිය දොළොස් මිලියන අටසිය හත්දහස් හත්සිය අසූහතරයි ශත හැත්තෑ පහකි.) - (රෙදිපිළි සඳහා වියදම, බැංකු ගාස්තු, නාවික ප්‍රවාහන ගාස්තු, වරාය ගාස්තු, රේගු ගාස්තු හා සේවා ගාස්තු ඇතුළත්ය)

(iii) සීමාසහිත ෂැයක්ෂින් සියැන්ගි රෙදිපිළි හා පැෂන් සමාගම (Shaoxing Xiangyue Textile and Fashion Company Limited)

(iv) ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීමේ පදනම මත අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටු තීරණය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

(ආ) (i) 2011 වර්ෂයේදී 2012 වර්ෂය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද සමාගම් හා මිල ගණන්

| සමාගම (ඉහත සඳහන් පරිදි) | කමිස හා ගවුම් රෙදි (සුදු) මීටරයක මිල ඇ.ඩො. | කලිසම් රෙදි (සුදු) මීටරයක මිල ඇ.ඩො. | කලිසම් රෙදි (නිල්) මීටරයක මිල ඇ.ඩො. |
|---|---|---|---|
| 1. සීමාසහිත හේබෙයි හැන්ෆැන් ප්‍රින්ටින් හා ඩයින් සමාගම | 0.95 | | |
| 2. පී.ටී. ශේකර් බෙගාවාන් | 1.07 | 1.74 | 1.87 |
| 3. ට්‍රිනිටි ඉන්ටර්නැෂනල් | 0.80 | 1.80 | 1.90 |
| 4. සීමාසහිත ෂැයක්ෂින් සියැන්ගි රෙදිපිළි හා පැෂන් සමාගම | 1.05 | 1.52 | 1.62 |
| 5. සීමාසහිත ෂැයක්ෂින් සියැන්ගිජියා රෙදිපිළි සමාගම | 0.92 | 1.55 | 1.65 |
| 6. සීමාසහිත ෂියැමන් පොයින්ටර් රෙදිපිළි සමාගම | 0.98 | 1.40 | 1.60 |
| 7. සීමාසහිත බිස්මිලා රෙදිපිළි සමාගම | 1.39 | 1.85 | 2.31 |

(ii) නැත.

(iii) සාරානුකූල ප්‍රතිචාර දැක්වූ ලංසුකරුවන් අතරින් ඇගයීමෙන් අවම මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරු තෝරා ගෙන ඇත. (Lowest evaluated substantial responsive bidder)

(iv) අඩුම ලංසු ඉදිරිපත් කළ සමාගම නියමිත පිරිවිතරවලට අනුකූල නොවන බවත්, පහත අඩුපාඩු පැවති බවත් තාක්ෂණික කමිටුව විසින් දක්වා ඇත.

<u>කමිස රෙදි/ ගවුම් රෙදි (සුදු)</u>

ඉතා තීරණාත්මක පරාමිතියක් වන කෙඳි සංයුතිය පිරිවිතරවල දක්වා ඇති සංයුතියට වඩා විශාල ප්‍රමාණයකින් වෙනස් වන නිසා මේ පිළිබඳව සෑහීමකට පත් විය නොහැකි බැවින් අඩුම ලංසුව ඉදිරිපත් කළ ට්‍රිනිටි ඉන්ටර්නැෂනල් සමාගම (ඇමෙරිකානු ඩොලර් 0.80) ප්‍රතික්ෂේප කර ඇත.

<u>කලිසම් රෙදි (සුදු)</u>

පිරිමැදීම නිසා ඇති වන පුළුන් පිපීමට දක්වන ප්‍රතිරෝධිතාව ඉතා අඩු වීම. අඟලක ඇති හරස් නූල් ප්‍රමාණය අඩු වීම සහ අව්වට ඔරොත්තු දීමේ හැකියාව මත සෑහීමකට පත් විය නොහැකි නිසා අවම මිල ඉදිරිපත් කළ සීමාසහිත ෂියැමන් පොයින්ටර් රෙදිපිළි සමාගම (ඇමෙරිකානු ඩොලර් 1.40) ප්‍රතික්ෂේප කර ඇත.

<u>කලිසම් රෙදි (නිල්)</u>

ඉතා තීරණාත්මක පරාමිතියක් වන කෙඳි සංයුතිය පිරිවිතරවල දක්වා ඇති සංයුතියට වඩා විශාල ප්‍රමාණයකින් වෙනස් වන නිසා සහ වර්ග මීටරයකට ග්‍රෑම් ප්‍රමාණය පිරිවිතර අගයට වඩා අඩු නිසා මේ පිළිබඳව සෑහීමකට පත් විය නොහැකි බැවින් අවම මිල ඉදිරිපත් කළ ෂියැමන් පොයින්ටර් රෙදිපිළි සමාගම (ඇමෙරිකානු ඩොලර් 1.60) ප්‍රතික්ෂේප කර ඇත.

<u>සිවුරු රෙදි</u>

ඉතා තීරණාත්මක පරාමිතියක් වන කෙඳි සංයුතිය පිරිවිතරවල දක්වා ඇති සංයුතියට වඩා විශාල ප්‍රමාණයකින් වෙනස් වන නිසා මේ පිළිබඳව සෑහීමකට පත් විය නොහැකි බැවින් අවම මිල ඉදිරිපත් කළ සීමාසහිත ෂැයක්ෂින් සියැන්ග්ජියා රෙදිපිළි සමාගම (ඇමෙරිකානු ඩොලර් 1.28) ප්‍රතික්ෂේප කර ඇත.

(v) නැත.

(ඇ) අදාළ නොවේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා මේකට කිසි සේත්ම සම්බන්ධ නැහැ. මේ රෙදි පිළි ගන්න කොට එතුමා අමාත්‍යවරයාත් නොවෙයි. එතුමා පැහැදිලි පිළිතුරක් ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. අමාත්‍යාංශ මාරු කළත් හොඳට උත්තර හම්බ වෙනවා වාගෙයි.

කොහොම වුණත් මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මා අහන්නම්. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා අඩු මිල ටෙන්ඩර් ඉදිරිපත් කළ අය ඉවත් කරලා වැඩි මිල ටෙන්ඩර් ඉදිරිපත් කළ අය තෝරා ගත්තා. හැබැයි, දැන් සිදු වී තිබෙන දෙය තමයි ඒ වැඩි මිල ටෙන්ඩර් හරහා ගෙන්වන ලද රෙදිපිළිත් අර නියමිත ප්‍රමිතීන්වලට නොතිබීම. ඒ නිසා තමන් විසින් තෝරා ගන්නා ලද සමාගමට මෙම රෙදි පිළි ඇණවුම් ලබා දීම සඳහා කරන ලද ප්‍රයෝගයක් නේද මේ තුළ තිබුණේ?

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට එවැනි චෝදනාවක් ඉදිරිපත් කරන්න පුළුවන්කම තිබෙනවා. නමුත් මේක කණ්ඩායමක් විසින් එකතු වෙලා තෝරා ගෙන කළ වැඩක්. තනිව ගත් තීරණයක් නොවෙයි. ඔබතුමාට ඉතාමත් සාර්ථක පිළිතුරක් ලැබුණා. ඔවැනි කාරණා ඉතින් ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒක හොඳයි. සිදු වී තිබෙන දේවල් ඉදිරිපත් කරන්නත් එපා යැ.

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මම අහනවා. මට මතකයි මීට පෙර අපේ බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මේ ගරු සභාවට එම රෙදි කැබැල්ලක් ගෙනැල්ලා පෙන්නුවා. එම රෙදි කැබැලි නිකම් මදුරු දැල් වාගෙයි. අන්තිමට ගරු කථානායකතුමනි, එම රෙදි කැබැල්ල ගෙන ආවේ කොහොමද කියලා අහලා පොලීසියට දඬුවම් කර තිබුණා. ඒක වෙනම කථාවක්.

ගරු කථානායකතුමනි, ඉතාමත් පැහැදිලි ලෙස එම රෙදි දුවා දරුවන්ට පාසල් ඇඳ ගෙන යාමට යෝග්‍ය රෙදි නොවෙයි. ඒවා ලිහිල් රෙදි; මදුරු දැල් වාගෙයි. Nighties මහන්න හොඳයි. ඒවා පාසල් අඳින්න හොඳ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියනවා අඩු ලන්සුව ඉවත් කරලා වැඩි ලන්සුව තෝරා ගත්තේ හොඳ රෙදි දෙන්නය කියලා. හැබැයි, හොඳ රෙදි ලබා දීලා නැහැ නේ. ඒ නිසා මෙතැන අයථාවක් සිදු වී තිබෙන බව පැහැදිලියි. ඔබතුමා ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන්න සූදානම් ද?

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)

ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන්න මගේ අමාත්‍යාංශයට පුළුවන්කමක් නැහැ. මොකද, මේක දැන් වෙනම අමාත්‍යාංශයක්. නමුත් පසු ගිය වර්ෂයේ පාසල් දූ දරුවන්ගේ නිල ඇඳුම් සඳහා ලබා දුන් රෙදි සම්බන්ධයෙන් ඔබතුමන්ලාට යම් කිසි ගැටලුවක් තිබෙනවා නම්, ඒ සඳහා වග කියන්නත්, පරීක්ෂණය කරන්නත් පුළුවන්කම තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, පැහැදිලියි. 2013 වර්ෂයේ දී ඇණවුම් කොට, 2014 වර්ෂයේ පාසල් දරුවන්ගේ නිල ඇඳුම් සඳහා රෙදි ලබා දුන්නා. ඒ සඳහා ඔබතුමාගේ මැදිහත් වීමක් සිදු වන්නට ඇති කියලා මා හිතනවා. මා මේ නිශ්චිත ප්‍රශ්නය නඟන්නේ 2012 වර්ෂයේ දී ඇණවුම් කොට 2013 වසර සඳහා ලබා දුන් පාසල් නිල ඇඳුම් රෙදි පිළිබඳවයි. ඔබතුමාත් දන්නා පරිදි ප්‍රශ්නයක් ඇති වුණේ ඒ රෙදි සම්බන්ධවයි. එම ඇණවුම අනුව ගෙන්වන ලද රෙදි තමයි මේ පාසල් දරුවන්ට බෙදුවේ. ඒ සඳහා මුදල් දැරුවේ අපේ භාණ්ඩාගාරයයි; ජනතාවගෙන් එකතු කරන බදු මුදල්වලින්. අමාත්‍යාංශය මාරු වුවත්, ඒ මුදල් අයථා ලෙස පරිහරණය වීමක් සිදු වී තිබෙනවා නම් අමාත්‍යවරයා හැටියට ලිපි ලේඛනවලින්, ටෙන්ඩර් කැඳවීම් තුළින් - ඔබතුමා වාර්තාව ඉදිරිපත් කර තිබෙන ආකාරයටම - ඔබතුමාට මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න පුළුවන්. ඔබතුමා ඒ පිළිබඳව අවධානය යොමු කරනවාද කියන එක මා නැවතත් දැනගන්න කැමැතියි.

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)

එවැනි ප්‍රමිතියෙන් තොර රෙදි ලැබී තිබෙන්නේ මොන මොන තැන්වලටද, මොන මොන ප්‍රදේශවලටද කියන එක ගැන ඔබතුමා අපව නිසි පරිදි දැනුවත් කිරීමක් කරනවා නම් අපි ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඇමතිතුමනි, සාම්පල් ඉදිරිපත් කරලා ඇති නේ. එම සාම්පල් එකයි, දැන් තිබෙන රෙදි කැබැල්ලයි බලලා පරීක්ෂණයක් පවත්වන්න හැකි නේ.

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)

ගරු කථානායකතුමනි, මෙහි සාම්පල් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් සමහර තැන්වලට බෙදා හැරිය ඒවා ගැන තමයි මෙතුමන්ලා කියන්නේ. ඒ නිසා එම ප්‍රදේශ මොනවාද කියලා අපට කිව්වොත් අප ඒ පිළිබඳව බලන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි.

## දැයට කිරුළ 2014 සංවර්ධන වැඩසටහන : කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය වෙත ලබාදුන් පහසුකම්

## 2014 `தேசத்துக்கு மகுடம்' அபிவிருத்தி நிகழ்ச்சித்திட்டம்: குளியாப்பிட்டி மத்திய மகா வித்தியாலயத்திற்கான வசதிகள்

## DEYATA KIRULA DEVELOPMENT PROGRAMME 2014: FACILITIES PROVIDED TO KULIYAPITIYA CENTRAL COLLEGE

4440/'13

8. **ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දැයට කිරුළ 2014 සංවර්ධන වැඩසටහන යටතේ කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය වෙත ලබාදුන් පහසුකම් කවරේද;

(ii) එකී පහසුකම් ලබාදීම වෙනුවෙන් වැය කරන ලද ප්‍රතිපාදනවල වටිනාකම කොපමණද;

(iii) එම ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද නවීකරණ කටයුතු සහ පහසුකම් ලබාදීමේ කටයුතු 2014 දැයට කිරුළ ප්‍රදර්ශනය ආරම්භ කිරීමට පෙර අවසන් කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

தொலைத்தொடர்புகள், தகவல் தொழில்நுட்பவியல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) `தேசத்துக்கு மகுடம்' 2014 அபிவிருத்தி நிகழ்ச்சித்திட்டத்தின்கீழ் குளியாப்பிட்டி மத்திய மகா வித்தியாலயத்திற்கு பெற்றுக்கொடுக்கப் பட்ட வசதிகள் யாவை என்பதையும்;

(ii) மேற்படி வசதிகளைப் பெற்றுக் கொடுப்பதற்காக செலவிடப்பட்ட நிதி ஏற்பாடுகளின் பெறுமதி எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி நிதி ஏற்பாடுகளின்கீழ் மேற்கொள் ளப்பட்ட நவீனமயமாக்கல் பணிகள் மற்றும் வசதிகளைப் பெற்றுக்கொடுக்கும் நடவடிக் கைகள் 2014 `தேசத்துக்கு மகுடம்' கண்காட்சி ஆரம்பிக்கப்பட முன்னர் பூர்த்தி செய்யப்பட்டதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Telecommunication and Information Technology:

(a) Will he inform this House -

(i) of the facilities provided to Kuliyapitiya Central College under Deyata Kirula Development Programme for 2014;

(ii) the value of the provisions made for providing those facilities;

(iii) whether modernization and provision of facilities under the said provisions were completed prior to the commencement of the Deyata Kirula Exhibition of 2014?

(d) If not, why?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாபிட்டிய - தொலைத் தொடர்புகள், தகவல் தொழில்நுட்பவியல் அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of Telecommunication and Information Technology)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)
* ආසන දහසක් සහිත ශ්‍රවණාගාරය
* අංග සම්පූර්ණ දෙමහල් පුස්තකාලය
* විද්‍යාලයීය මාර්ග පද්ධතිය සම්පූර්ණයෙන් අලුත්වැඩියාව
* සියලු ගොඩනැඟිලි හා විද්‍යාලයීය කානු පද්ධතිය අලුත්වැඩියාව

(ii)
* ආසන දහසක් සහිත ශ්‍රවණාගාරය - රු.මි. 141 - වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව.
* පුස්තකාලය - රු.මි. 16 - වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව
* විද්‍යාලයීය මාර්ග පද්ධතිය සම්පූර්ණයෙන් අලුත්වැඩියාව - රු.මි. 95 - මාර්ග සංවර්ධන අධිකාරිය
* සියලු ගොඩනැඟිලි හා විද්‍යාලයීය කානු පද්ධතිය අලුත්වැඩියාව - රු.මි. 18.36 (අලුත්වැඩියාවට අවශ්‍ය අමුද්‍රව්‍ය සඳහා) - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.

(iii) ශ්‍රවණාගාරයේ ආසන හැර අනික් සියල්ල නිම කළා. එම ආසන මැයි මාසය තුළ ලබා දීමට ඉදිකිරීම්කරුවන් එකඟ වී ඇත.

ප්‍රදර්ශනය අවසානයේ දැයට කිරුළ ප්‍රදර්ශන කමිටුව විසින් ප්‍රගති සමාලෝචනයක් 2014.03.10 දින කුලියාපිටිය වයඹ විශ්වවිද්‍යාලයේදී සිදු කළ අතර නැවත ප්‍රගති සමාලෝචනයක් මැයි මස 09 දින සිදු කිරීමට නියමිතය. එදිනට අදාළ ආයතන මේ ඉදිකිරීම් භාරදීම අවසාන කිරීමට බලාපොරොත්තු වනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු රංජිත් සියඹලාපිටිය ඇමතිතුමාට මම බොහොම ගරු කරනවා. හැබැයි, එතුමා අසත්‍ය ප්‍රකාශ කළා. ගරු ඇමතිතුමනි මේ බලන්න, ඒ ගොඩනැඟිල්ලේ ඡායාරූප මා ළඟ තිබෙනවා. තවම සිවිලිම ගහලා නැහැ. ඔබතුමා පුටු නැහැ කියපු කථාව ඇත්ත. පුටු 1,000ක් තිබිය යුතු ශ්‍රවණාගාරයේ පුටු නැහැ කියපු එක ඇත්ත. ඒ වාගේම මේ ගොඩනැඟිල්ලේ බිත්තිවලට තාවකාලිකව plywood sheets ගහලා paint කරලා තමයි ඒ වෙලාවේ විවෘත කළේ කියලා ඔබතුමා පිළිගන්නවාද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
කිසි සේත්ම නැහැ, ගරු කථානායකතුමනි. මම ප්‍රගති සමාලෝචනයක් කර තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඔබතුමා එනවා නම් මට එය ඔප්පු කර පෙන්වන්න පුළුවන්.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මම ඔබතුමාට ආරාධනා කරනවා මේ නවවැනි දා සවස තුනට,

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ආරාධනා කරන්න දෙයක් නැහැ, ගරු ඇමතිතුමනි. ඒ, මායි, අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමායි ඉගෙන ගත්ත පාසල.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, මා කලින් කිව්ව ආකාරයට මේ ශ්‍රවණාගාරයේ ආසන පමණයි සවි කරන්න බැරි වුණේ. එයට හේතුව වුණේ ඒ ආසන ඇණවුම් කරලා ගෙන්වා ගන්න කාලයක් නොතිබීම. මේ ඉදි කිරීම් සියල්ල කළේ රාජ්‍ය ආයතන සහ නාවික හමුදාව. ඒකත් වග කීමෙන් කියන්න අවශ්‍යයි. ඒ නිසා,- [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, පිළිතුරක් දෙන විට අහගෙන ඉන්න. ඉන් පසුව ඒ පිළිතුර අනුව ඔබතුමා අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
දැනට කරන්න තිබෙන්නේ ඒ ආසන සවි කිරීම පමණයි. ඒවා මැයි මාසය තුළ සවි කිරීමට ඉදි කිරීම්කරුවන් හා ඒ රාජ්‍ය ආයතන එකඟ වෙලා තිබෙනවා. මම ඒ ලිපියත් රැගෙන ඇවිත් තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ඇමතිතුමනි, මේ ගොඩනැඟිල්ලේ සිවිලිම ගහන්නේ නැද්ද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඒ ගොඩනැඟිල්ලේ ප්‍රමිතියට සහ සැලසුමට අදාළ සියල්ල කර තිබෙනවා. ඉතිරි වෙලා තිබෙන්නේ මේ ආසන සවි කිරීම පමණයි. ඒක මැයි මාසය තුළ කෙරෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
සිවිලිම ගහන්නේ නැද්ද? මේකේ අඩු පාඩු ගොඩක් තිබෙනවා. මෙතුමා අසත්‍ය කියන්නේ, ගරු කථානායකතුමනි. ගරු ඇමතිතුමනි, අපි දෙන්නා අද හවස යමු මේ ගොඩනැඟිල්ල බලන්න.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, ඒ ගොඩනැඟිල්ලේ සැලසුමට සහ පිරිවිතරයට අදාළ සියල්ල ඉටු කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාට ඒවා එකින් එක අවශ්‍ය නම් මට කියන්න පුළුවන්.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
නැහැ, නැහැ. ඔබතුමා මේ ගරු සභාව නොමඟ යවනවා. මේ, මා ළඟ ඒ ඡායාරූප තිබෙනවා. ඔබතුමා බලන්න. මම එම ඡායාරූප **සභාගත*** කරනවා. මේ බිත්තිවල තිබෙන්නේ plywood sheets. Plywood sheets දමලා paint කරලා තමයි ගරු ඇමතිතුමනි මේ ගොඩනැඟිල්ල විවෘත කළේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එම කාරණය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කළා නේ.

ප්‍රශ්න අංක 9, ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
AC කරලා නැහැ, දොරවල් නැහැ,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්න අහන විධියක් තිබෙනවා නේ. ඔබතුමා දැන් අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවරයි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
නැහැ, නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ කියන්නේ කොහොමද මම නේ ගණන් කරන්නේ. එහෙම නම් අන්තිම ප්‍රශ්නය අහන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මම අන්තිම අතුරු ප්‍රශ්නය අහනවා. පාසලේ අනෙක් ගොඩනැඟිලිවල නොයෙක් ප්‍රදර්ශන කුටි ඉදි

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

කළා. එක එක අමාත්‍යාංශවලින් ප්‍රදර්ශන කුටි හදලා, ඇණ ගහලා බිත්ති පලුදු කරලා නොයෙක් අලාභහානි කරලා තිබුණා. හැබැයි, ඒවා මේ දක්වා පිළිසකර කරලා නැහැ. මේවා කවදාද කරන්නේ?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඒ සඳහා තමයි අපි විදුලිපතිතුමා සහ අදාළ අංශ සමඟ කමිටුවක් හැටියට ප්‍රගති සමාලෝචනයක් කරන්නේ. අපි වෙන් කළ මුදලින් කොටසක් දිසාපතිතුමා ළඟ රඳවා තිබෙනවා, එවැනි හානියක් තිබෙනවා නම් ඒ මුදලින් යථාපූරණය කරන්න. ඒකත් කරලා දෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අදාළ මන්ත්‍රීතුමන්ලා සමඟ ගිහින් ඒවා බැලුවා නම් හුඟක් හොඳයි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු මන්ත්‍රීතුමාට කරුණාවෙන් ආරාධනා කරනවා, 9වන දා හවස තුනට කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාල භූමියට එන්න කියලා. මේවාට අවංකව මැදිහත් වෙන්න.

## කොළඹ ජාතික රෝහල: නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර
கொழும்பு தேசிய வைத்தியசாலை : பிரதிப் பணிப்பாளர் பதவி
COLOMBO NATIONAL HOSPITAL : POST OF DEPUTY DIRECTOR

4555/'13

9. **ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ධුරයට සුදුස්සකු පත් නොකර වර්ෂ 2ක පමණ කාලයක් එම පුරප්පාඩුව තබාගෙන සිටීමට හේතුව කවරේද;

(ii) එම තනතුරේ වැඩ බැලීම සඳහා මේ වන විට පත් කර සිටින නිලධාරියා පරිපාලන ශ්‍රේණියේ අයෙකුද;

(iii) මේ වන විට ඔහු නියමිත පටිපාටියට අනුව බඳවා ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு தேசிய வைத்தியசாலையின் பிரதிப் பணிப்பாளர் பதவிக்கு தகுதிவாய்ந்த ஒருவரை நியமிக்காது இரண்டு வருடங்களாக மேற்படி பதவிக்கான வெற்றிடத்தை வைத்திருப்பதற்கான காரணம் யாதென்பதையும்;

(ii) மேற்படி பதவியில் பதிற்கடமையாற்றுவதற்காக தற்போது நியமிக்கப்பட்டுள்ள உத்தியோகத்தர் நிருவாக தரத்தைச் சேர்ந்த ஒருவரா என்பதையும்;

(iii) அவர் உரிய நடைமுறைக்கு இணங்க ஆட்சேர்க்கப்பட்டுள்ளாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state -

(i) the reason for keeping vacant the post of Deputy Director of the Colombo National Hospital for about 2 years without appointing an qualified person for the post;

(ii) whether the officer who has been appointed to act in this post is from an administrative grade; and

(iii) whether he has been recruited according to the specified procedure?

(b) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර දැරූ වෛද්‍ය එස්. සේනාරත්න මහත්මිය සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) තනතුරට පත්වීම නිසාත්, වෛද්‍ය යූ.පී. ආරියවංශ මහතා විශ්‍රාම යාම නිසාත්, නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු විය. එම තනතුර ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියට අයත් තනතුරක් නිසා TCS/C/11/2012 සහ 2012.10.12 දිනැතිව අංක 02-150/2012 දරන පොදු චක්‍රලේඛයෙන් ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා නිලධාරියෙකු පත් කිරීමට අයදුම්පත් කැඳවීමට නිවේදනය කෙරිණි. එම තනතුරට නිලධාරීන් දෙදෙනෙකු ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් යොමු කර තිබූ අතර, එම නිලධාරීන් දෙදෙනාම නැවත අයදුම්පත් ඉල්ලා අස් කරගෙන ඇත. අනතුරුව 2013 සහ 2014 වසරේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී ද මෙම තනතුරු සඳහා මාරු ලේඛනයේ පුරප්පාඩු තනතුරු ලෙස අමාත්‍යාංශය මඟින් ප්‍රසිද්ධ කර ඇති නමුත් එම තනතුරු සඳහා නිලධාරීන් ඉල්ලීම් කර නොමැත.

(ii) නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරුවල රාජකාරි ආවරණය සඳහා තාවකාලික පදනම මත වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකු පත් කර ඇති අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ (හදිසි අනතුරු ඒකකය) සඳහා නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ නිලධාරියෙකුත්, අනෙක් නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා වෛද්‍ය පරිපාලනය පිළිබඳ විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකුත් පත් කර ඇත.

(iii) යථා කාලයේදී ජ්‍යෝෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය සඳහා නව නිලධාරින් බඳවා ගැනීමට නියමිත අතර, මෙම තනතුරු සඳහා ද ස්ථිර ලෙස නිලධාරින් පත් කිරීමට නියමිතය.

(ආ) පැන නොනඟී.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, අවුරුදු දෙකක් තිස්සේ මේ තනතුරුවලට පත් කරලා නැහැ. අවුරුදු දෙකක් යනතුරු පත් නොකළේ ඇයි?

ඒ වාගේම, senior administrative posts හතළිහකට වැඩි සංඛ්‍යාවක් පුරප්පාඩු වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ තනතුරුවලට පත් කරන්නේත් නැහැ. පළමු අතුරු ප්‍රශ්නය හැටියට මා අහනවා, මේ පත් කිරීම් කරන්නේ නැත්තේ ඇයි කියලා. අවුරුදු දෙකක් යනතුරු ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට කෙනකු පත් කළේත් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සම්බන්ධයෙන් අසා තිබෙන ප්‍රශ්නයට උත්තරය දීලා තිබෙනවා. ඒ සඳහා ගැසට් කළත් අයදුම්පත් ඉදිරිපත් කර නැහැ. ඒ නිසා දැන් නැවත ගැසට් කර තිබෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මා දෙවන අතුරු ප්‍රශ්නය අහනවා.

නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ අවුරුදු තුනක් සම්පූර්ණ කරන ලද ජ්‍යෝෂ්ඨ වෛද්‍ය පරිපාලන සේවයේ සුදුසුකම් තිබෙන වෛද්‍යවරු 60කට වැඩි සංඛ්‍යාවක් ඒ තනතුරුවලට එන්න බලාගෙන ඉන්නවා. සුදුසුකම් තිබෙන ඒ නිලධාරින් පත් කරන්නේ නැත්තේ ඇයි?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ප්‍රශ්නයට අදාළ නොවේ ගරු කථානායකතුමනි. ගරු මන්ත්‍රීතුමා කලින් කිව්වා නම් මට ඒ සඳහා ලෑස්ති වෙලා එන්න තිබුණා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. පසු ගිය අවුරුදු 10කට වැඩි කාලයක් මා සෞඛ්‍ය ඇමතිතුමාගෙන් මේ සම්බන්ධ ප්‍රශ්න 5කට වැඩි ප්‍රමාණයක් අහලා තිබෙනවා. මේ රටේ ජනතාවට සංවේදී ප්‍රශ්නයක් වාගේම සෞඛ්‍ය ක්ෂේත්‍රයට බලපාන ප්‍රශ්නයක්. පසු ගිය කාලය පුරාම ඔබතුමා දිගින් දිගටම කිව්වා, අඩු පාඩුකම් සම්පූර්ණ කරලා, heart surgeries කරන්න අවශ්‍ය පියවර ගන්නවා, ගන්නවා, ගන්නවා කියලා. ගරු කථානායකතුමාගේ අවධානයට පවා ඒ කරුණ යොමු කළා. ඇත්ත වශයෙන්ම මා කොළඹ මහ රෝහලට කථා කරලා මේ සම්බන්ධයෙන් ගෙන තිබෙන ක්‍රියා මාර්ගය ගැන ඇහුවා. කොටින්ම කිසිම ක්‍රියා මාර්ගයක් ගෙන නැහැ. ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා අහන්නේ ප්‍රශ්නයක් නොවෙයි නේ. ඔය කථාවක් නේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය දිගින්-දිගටම අහලා පාර්ලිමේන්තුව හෑල්ලුවට ලක් වෙනවා. මොකද, දිගටම මේ ප්‍රශ්න අහලා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න ඇසීමේ වේලාවේ මෙහෙම කථා කරන්න ගියාමත් හෑල්ලුවට ලක් වෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මට කෙටියෙන් උත්තරය දෙන්න කියන්න, ගරු කථානායකතුමනි. කොළඹ මහ රෝහලේ දැන් ICU beds හතරයි තිබෙන්නේ. පසු ගිය කාලය පුරාම ඒවා වැඩි කරලා නැහැ. වෛද්‍යවරු කියනවා, අඩුම ගණනේ ICU beds ටිකක්වත් වැඩි කරනවා නම් වැඩිපුර heart surgeries කරන්න පුළුවන්ය කියලා. මා internet එකේ බැලුවා, ICU bed එකක මිල සාමාන්‍යයෙන් ඩොලර් 300ත් - ඩොලර් 1,500ත් අතර වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අවධානයට යොමු කළා. එය ප්‍රශ්නයක් නොවෙයි නේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
එතුමන්ලාගෙන් දිගින්-දිගටම අහන ප්‍රශ්නවලට මේ ගරු සභාවේ නිකම් මොකක් හෝ උත්තරයක් දීලා යනවා. ඊට පස්සේ ඒ ගැන සැලකිලිමත් වන්නේ නැහැ. ඒ ඇයි?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මහ රෝහලේ අධ්‍යක්ෂතුමා පසු ගිය සතියේත් නිවේදනය කළා. අවුරුද්දක කාල සීමාව දැන් මාස 10 දක්වා අඩු කරලා තිබෙනවා. විශේෂඥ වෛද්‍යවරුන්ගේ ප්‍රමාණය අනුව දැනට පෝලිම, එහෙම නැත්නම් කාලය අඩු කරන්න කටයුතු කරලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
උපදේශක කාරක සභාවේ දී ඉදිරිපත් කළ යුතු ප්‍රශ්න, පාර්ලිමේන්තු ප්‍රශ්න වෙලාවට ඉදිරිපත් කරන්න එපා.

ප්‍රශ්න අංක 10 -2585/'12- (2), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## චීනයෙන් ලැබී ඇති ආධාර : පොලී පිරිවැය
## சீனாவிடமிருந்து பெற்ற நிதிகள்: வட்டிச் செலவினம்
## FUNDS RECEIVED FROM CHINA : INTEREST COST

3150/'12

11. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) 2010 ජනවාරි 1 වැනි දින සිට අද දක්වා ශ්‍රී ලංකාවට චීනයෙන් ලැබී ඇති ආධාර, සහනදායී ණය හා ප්‍රදාන ප්‍රමාණයන් වාර්ෂික පදනමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එකී අරමුදල් ලබා දුන්, සියල්ල ඇතුළත් වැඩිම සහ අඩුම පොලී පිරිවැය වසරක් සඳහා කොපමණද;

(iii) එක් එක් අරමුදල් සැපයුමේ ආපසු ගෙවීමේ කාල සීමාව කවරේද;

(iv) අරමුදල් යොදා ගත් එක් එක් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ආදායම් කවරේද;

(v) ණය ලබා දුන් දිනයේ සිට වර්ෂ 5ක් සඳහා එක් එක් ණයෙහි මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டு ஜனவரி 1ஆம் திகதி முதல் இற்றைவரை உதவிகள், சலுகைக் கடன்கள் மற்றும் மானியங்கள் போன்ற மேற்படி நிதியிடல் வகைகள் மூலமாக அரசாங்கம் சீனாவிடமிருந்து பெற்றுள்ள தொகைகளை வருட வாரியாக வெவ்வெறாகவும்;

(ii) வழங்கப்பட்டுள்ள நிதிகளுக்கான அனைத்தையும் உள்ளடக்கிய ஆகக் கூடிய மற்றும் ஆகக் குறைந்த வட்டிச் செலவினத்தை வருடவாரியாகவும்;

(iii) ஒவ்வொரு நிதியிடலுக்குமான மீளச் செலுத்தல் கால அளவினையும்;

(iv) நிதியிடல் பயன்படுத்தப்பட்டுள்ள ஒவ்வொரு கருத்திட்டத்தினதும் எதிர்பார்க்கப்பட்ட வருமானங்களையும்;

(v) கடன் வழங்கப்பட்டுள்ள திகதியிலிருந்து 5 வருடங்களுக்கான ஒவ்வொரு கடனினதும் காசுப் பாய்ச்சல் கூற்றினையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he inform this House of-

(i) the amounts of aid, concessionary loans and grants received by Sri Lanka from China since 1st January 2010 to date separately, on per year basis, under the aforesaid funding types;

(ii) the all inclusive highest and lowest interest cost per year that funding have been given;

(iii) the payback period of each funding;

(iv) the expected earnings of each project for which funding was utilised; and

(v) the cash flow statement of each loan for 5 years from the date on which the loan was given?

(b) If not, why ?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2010, 2011, 2012 සහ 2013 සැප්තැම්බර් දක්වා චීනයෙන් ලැබී ඇති ආධාර, සහනදායී ණය හා ප්‍රදාන ප්‍රමාණයන් වගුවෙහි දැක්වේ.

| වර්ෂය | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|
| ණය (එ.ජ.ඩොලර් මිලියන) | 863.5 | 424.5 | 830.6 | 746.7 |
| සහනදායී ණය (එ.ජ.ඩොලර් මිලියන) | 79.9 | 91.4 | 84.8 | 66.1 |
| ප්‍රදාන (එ.ජ.ඩොලර් මිලියන) | 16.1 | 25.0 | 16.6 | 50 |

මෙම ප්‍රදානයන් ශ්‍රී ලංකා රජය වෙත ලබා දීමට එකඟ වූ ප්‍රදාන වේ.

(ii) වර්ෂයක් සඳහා අවම පොලිය 1.53%කි. මෙම පොලී අනුපාතය යටතේ ඉහත කාල සීමාව තුළ ලැබූ මුළු ණය ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන 150.4කි.

වර්ෂයක් සඳහා උපරිම පොලිය 6.50%කි. මෙම පොලී අනුපාතය යටතේ ඉහත කාල සීමාව තුළ ලැබූ මුළු ණය ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන 58.6කි.

(iii) මෙම අරමුදල් සඳහා අවම ආපසු ගෙවීමේ කාල සීමාව වසර 14ක් වන අතර, උපරිම ආපසු ගෙවීමේ කාල සීමාව වසර 20කි.

2010 සිට 2013 සැප්තැම්බර් දක්වා එක් එක් අරමුදල් සැපයුමේ ආපසු ගෙවීමේ කාල සීමාවන් ඇමුණුම 01හි දක්වා ඇත.

ඇමුණුම 01 **සභාගත*** කරමි.

(iv) අරමුදල් යොදා ගත් එක් එක් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ආදායම් ඇමුණුම 02 හි දක්වා ඇත. ඇමුණුම 02 **සභාගත*** කරමි.

(v) එක් එක් ණයෙහි මුදල් ප්‍රවාහ (2007-2017) ඇමුණුම 03 හි දක්වා ඇත. ඇමුණුම 03 **සභාගත*** කරමි.

(ආ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

ඇමුණුම 01

| සංවර්ධන පාර්ශ්වකරු/ ණය දෙන ආයතනය | සංවර්ධන ක්ෂෙත්‍රය | ව්‍යාපෘතිය | අත්සන් කළ දිනය | ආපසු ගෙවීම් කාලය (වර්ෂ) |
|---|---|---|---|---|
| චීන සංවර්ධන බැංකුව | මහා මාර්ග | ප්‍රමුඛ මාර්ග ප්‍රතිසංස්කරණ හා සංවර්ධන ව්‍යාපෘතිය | 16-12-2010 | 15 |
| | | ප්‍රමුඛ මාර්ග ප්‍රතිසංස්කරණ හා සංවර්ධන ව්‍යාපෘතිය | 31-03-2011 | 15 |
| | වාරිමාර්ග | මොරගහකන්ද වාරි සංවර්ධන ව්‍යාපෘතිය | 28-06-2012 | 16 |
| චීන ආනයන අපනයන බැංකුව | වරාය | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 30-10-2007 | 16 |
| | | හම්බන්තොට වරායේ බංකර හා තටාකාංග ව්‍යාපෘතිය | 31-01-2007 | 17 |
| | | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ 2 අදියර | 17-09-2012 | 20 |
| | | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ 2 අදියර | 17-09-2012 | 20 |
| | | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ 2 අදියර | 17-09-2012 | 20 |
| | | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ උපබද්ධ කාර්යයන් හා උපකරණ සම්පාදන ව්‍යාපෘතිය | 24-04-2013 | 20 |
| | අධිවේගී මාර්ග | කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ඒ1 කොටස | 06-08-2009 | 16 |
| | | කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ඒ2 කොටස | 06-08-2009 | 16 |
| | | කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ඒ3 කොටස | 06-08-2009 | 16 |
| | | කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ඒ4 කොටස | 06-08-2009 | 16 |
| | උතුරු මාර්ග | උතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය (ගල්කුලම සිට කි.මී. 230 කණුව දක්වා) | 09-09-2010 | 15 |
| | | උතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - 11බී | 09-09-2010 | 15 |
| | | උතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - (මුලතිව් - කෝකිලායි) 11ඒ | 09-09-2010 | 15 |
| | | උතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය (ඒබී020) (ඒබී032) (ඒබී016) (ඒබී018) | 09-09-2010 | 15 |
| | | උතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය (කි.මී. 230 කණුව සිට යාපනය දක්වා) | 09-09-2010 | 15 |
| | | නාවට්කුලි - කරයිතිවු - මන්නාරම (ඒ032) මාර්ගය ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම | 29-04-2011 | 15 |
| | | පුත්තලම - මරිච්චිකඩේ - මන්නාරම මාර්ගයේ කි.මී. 113 ක් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම | 29-04-2011 | 16 |
| | අධිවේගී මාර්ග | දකුණු අධිවේගී මාර්ගයේ පින්නදූව සිට කොඩගොඩ දක්වා කොටස ඉදිකිරීම ) | 17-02-2011 | 15 |
| | | දකුණු අධිවේගී මාර්ගයේ කොඩගොඩ සිට ගොඩගම දක්වා කොටස ඉදිකිරීම | 17-02-2011 | 15 |
| | ගුවන් | මත්තල හම්බන්තොට අන්තර්ජාතික ගුවන්තොටුපොළ ව්‍යාපෘතිය | 5-03-2010 | 20 |
| | | ගුවන්යානා ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර 60 සැපයීම | 9-09-2010 | 14 |
| | දුම්රිය | මාතර - කතරගම දුම්රිය මාර්ගය මාතර - බෙලිඅත්ත අදියර | 19-02-2013 | 20 |
| | | මාතර - කතරගම දුම්රිය මාර්ගය මාතර - බෙලිඅත්ත අදියර | 28-05-2013 | 20 |
| | | දුම්රිය බලවේග කට්ටල 13ක් සැපයීමේ ව්‍යාපෘතිය | 5-03-2010 | 14 |
| | බලශක්ති | උතුරු පළාතේ විදුලිබල සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ද්‍රව්‍ය ප්‍රසම්පාදනය | 09-09-2010 | 15 |
| | | ඌව පළාතේ විදුලි ආලෝකකරණය (ඌව උදානය) | 19-07-2011 | 12 |
| | | නැගෙනහිර පළාතේ විදුලි ආලෝකකරණය (නැගෙනහිර උදානය) | 16-01-2012 | 15 |
| | වාරිමාර්ග | විසල් කුරුණෑගල ජල සැපයුම් ව්‍යාපෘතිය | 18-09-2013 | 20 |
| | බලශක්ති | පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය - 2 සහ 3 අදියර | 25-12-2009 | 20 |
| චීන රජය | බලශක්ති | පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය - 1 අදියර | 08-09-2006 | 18 |

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

**ඇමුණුම 02**

| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ව්‍යාපෘතිය | අපේක්ෂිත ආදායම | | | |
|---|---|---|---|---|---|
| | | 2013 | 2014 | 2015 | 2016 |
| චීන සංවර්ධන බැංකුව | ප්‍රමුඛ මාර්ග ප්‍රතිසංස්කරණ හා සංවර්ධන ව්‍යාපෘතිය | මෙම ව්‍යාපෘතියේ සෘජු හා වක්‍ර සමාජ ආර්ථික ප්‍රතිලාභ විශාල ප්‍රමාණයක් ඇත. එහෙත් එහි මූල්‍යමය වටිනාකම නිවැරදිව ගණනය කිරීම දුෂ්කරය. | | | |
| | මොරගහකන්ද වාරි සංවර්ධන ව්‍යාපෘතිය | කෘෂිකර්මාන්තය: මූල්‍ය අගයක් ලෙස ශුද්ධ වාර්ෂික ආදායම එ.ජ. ඩොලර් මිලියන 30.1<br>බල ශක්ති උත්පාදනය: :වාර්ෂික ඉන්ධන පිරිමැසුම එ.ජ. ඩොලර් මිලියන 2.49(ජල විදුලි උත්පාදනය නිසා)<br>මිරිදිය මත්ස්‍ය කර්මාන්තය: ටොන් 4700 ක මත්ස්‍ය අස්වැන්න සඳහා ශුද්ධ වාර්ෂික ආදායම එ.ජ. ඩොලර් මිලියන 1.67<br>රැකියා උත්පාදනය : ඉදිකිරීම් උදෙසා මිනිස් දින මිලියන 2 සඳහා එ.ජ. ඩොලර් මිලියන 5.7 | | | |
| චීන ආනයන අපනයන බැංකුව | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය | එ.ජ. ඩොලර් මිලියන 57.9 | එ.ජ. ඩොලර් මිලියන 58.3 | එ.ජ. ඩොලර් මිලියන 58.2 | එ.ජ. ඩොලර් මිලියන 59.2 |
| | හම්බන්තොට වරායේ බංකර හා තටාකාංග ව්‍යාපෘතිය | එ.ජ. ඩොලර් මිලියන 14.2 | එ.ජ. ඩොලර් මිලියන 17.7 | එ.ජ. ඩොලර් මිලියන 22.1 | එ.ජ. ඩොලර් මිලියන 27.4 |
| | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ 2 අදියර | මෙමගින් හම්බන්තොට වරාය ව්‍යාපෘතිය 1 අදියර අදියරෙහි ප්‍රතිලාභ තවදුරටත් වර්ධනය කර ගැනීමට බලාපොරොත්තු වේ. | | | |
| | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ උපබද්ධ කාර්යයන් හා උපකරණ සම්පාදන ව්‍යාපෘතිය | මෙය හම්බන්තොට වරාය ව්‍යාපෘතිය හා සම්බන්ධ ව්‍යාපෘතියකි.මෙහි ආදායම මුළු වරාය ව්‍යාපෘතියෙන් බැහැර කොට ගණනය කිරීම දුෂ්කරය. | | | |
| | කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය කොටස | රුපියල් මිලියන 19.4 | රුපියල් මිලියන 38.1 | රුපියල් මිලියන 48.7 | රුපියල් මිලියන 53.8 |
| | මත්තල හම්බන්තොට අන්තර්ජාතික ගුවන්තොටුපොළ ව්‍යාපෘතිය | රුපියල් මිලියන 75 | රුපියල් මිලියන 509 | රුපියල් මිලියන 730 | රුපියල් මිලියන 973 |
| | ගුවන්යානා ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර 60 සැපයීම | අපේක්ෂිත ආදායම තක්සේරු කිරීම දුෂ්කරය. | | | |
| | මාතර - කතරගම දුම්රිය මාර්ගයේ මාතර - බෙලිඅත්ත අදියර | - | | | රුපියල් මිලියන582.3 |
| | දුම්රිය බලවේග කට්ටල 13ක් සැපයීමේ ව්‍යාපෘතිය | දුම්රිය බලවේග කට්ටල යොදවන මාර්ග හා යොදවන කාල සටහන් අනුව ඉන් උපයන ආදායම වෙනස් වේ. | | | |
| | උතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති | 30 වසරක් පුරා පැවති යුද්ධය අවසන් කිරීමෙන් පසුව උතුරු පළාතේ සීඝ්‍ර සංවර්ධනයක් සඳහා විධිමත් මාර්ග පද්ධතියක් අත්‍යාවශ්‍ය වේ.මෙමගින් සමාජ සහ ආර්ථික ප්‍රතිලාභ විශාල වශයෙන් අපේක්ෂා කෙරෙන අතර එහි වටිනාකම සංඛ්‍යාත්මකව ගණනය කිරීම දුෂ්කරය.<br>මෙම ව්‍යාපෘති මගින් පහත සඳහන් මාර්ග කොටස් ප්‍රතිසංස්කරණය හා උත්ශ්‍රේණිගත කෙරේ.<br>1) ගල්කුලම සිට කි.මී. 230 කණුව දක්වා<br>2) 11බී<br>3) මුලතිව් - කෝකිලායි (11ඒ),<br>4) (ඒබී020), (ඒබී032), (ඒබී016), (ඒබී018) මාර්ග<br>5) ඒ 9 මාර්ගයේ කි.මී. 230 කණුව සිට යාපනය දක්වා<br>6) නවත්කුලි - කරයිතිවු - මන්නාරම (ඒ032) මාර්ගය<br>7) පුත්තලම - මර්ච්චිකඩේ - මන්නාරම මාර්ගය (කි.මී. 113 ක්) | | | |
| | දකුණු අධිවේගී මාර්ගය ව්‍යාපෘතිය (පින්නදූව සිට ගොඩගම) | පින්නදූව සිට කොඩගොඩ දක්වා කොටස ඉදිකිරීම, කොඩගොඩ සිට ගොඩගම දක්වා කොටස ඉදිකිරීම යන ව්‍යාපෘතිය මගින් තවදුරටත් මාර්ග පද්ධතිය සවිමත් කිරීම තුල ආර්ථික වර්ධනයක් ආපෙක්ෂා කෙරේ. | | | |
| | | – | රුපියල් මිලියන 158 | රුපියල් මිලියන 200 | – |
| | උතුරු පළාතේ විදුලිබල සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ද්‍රව්‍ය ප්‍රසම්පාදනය | සියළු ධාරිතාවයන් පද්ධතියට එක් වූ පසුව<br>වර්ෂයක් සඳහා : රුපියල් මිලියන 3,186.2 | | | |
| | | ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘති යටතේ ආදායම් උත්පාදනය දිර්ඝකාලීනව සිදුකරයි.මෙම ව්‍යාපෘති තුළින් යටිතල පහසුකම් ඉහළ නැංවීම තුළින් පුද්ගල ජීවන තත්වය නැංවීම බලාපොරොත්තු වේ. එම ආදායම කොටස් 3කට වර්ග කෙරේ. | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| චීන ආනයන අපනයන බැංකුව | ඌව පළාතේ විදුලි ආලෝකකරණය (ඌව උදානය) | ව්‍යාපෘතිය මගින් නව විදුලි සම්බන්ධතා 80000 ලබා දීමට ඉලක්ක කොට ඇත. | | | |
| | | | කොටස 1 | කොටස 2 | කොටස 3 |
| | | පාරිභෝගිකයන් සඳහා සාමාන්‍යය මාසික බිල(රුපියල්) | 500 | 1,000 | 2,000 |
| | | අපේක්ෂිත මාසික ආදායම(රුපියල් මිලියන) | 40 | 80 | 160 |
| | | අපේක්ෂිත වාර්ෂික ආදායම (රුපියල් මිලියන) | 480 | 960 | 1,920 |
| | නැගෙනහිර පළාතේ විදුලි ආලෝකකරණය (නැගෙනහිර උදානය) | ව්‍යාපෘතිය මගින් නව විදුලි සම්බන්ධතා 20500 ලබා දීමට ඉලක්ක කොට ඇත. | | | |
| | | | කොටස 1 | කොටස 2 | කොටස 3 |
| | | පාරිභෝගිකයන් සඳහා සාමාන්‍යය මාසික බිල | 500 | 1,000 | 2,000 |
| | | අපේක්ෂිත වාර්ෂික ආදායම (රුපියල් මිලියන) | 123 | 246 | 492 |
| | විසල් කුරුණෑගල ජල සැපයුම් ව්‍යාපෘතිය | - | රුපියල් මිලියන 44.5 | රුපියල් මිලියන 44.5 | රුපියල් මිලියන 70.6 |
| | පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය 2 සහ 3 අදියර | – | රුපියල් මිලියන 41,929 | රුපියල් මිලියන 54,690 | රුපියල් මිලියන 54,690 |
| චීන රජය | පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය - 1 අදියර | රුපියල් මිලියන26,787 | රුපියල් මිලියන 27,345 | රුපියල් මිලියන 27,345 | රුපියල් මිලියන 27,345 |

**ඇමුණුම 03**

| සංවර්ධන පාර්ශ්වක රු/ ණය දෙන ආයතනය | ව්‍යාපෘතිය | සක්‍රීය කළ දිනය | මුදල් ප්‍රවාහ ( එ.ජ. ඩොලර් මිලියන ) | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
| චීන සංවර්ධන බැංකුව | ප්‍රමුඛ මාර්ග ප්‍රතිසංස්කරණ හා සංවර්ධන ව්‍යාපෘතිය | 16-12-2010 | – | – | – | - | 12.2 | 47.3 | 29.7 | 25.7 | 14.9 | – | – |
| | ප්‍රමුඛ මාර්ග ප්‍රතිසංස්කරණ හා සංවර්ධන ව්‍යාපෘතිය | 31-03-2011 | – | – | – | – | 31.5 | 157.53 | 133.7 | 245.2 | 15.6 | – | – |
| | මොරගහකන්ද වාරි සංවර්ධන ව්‍යාපෘතිය | 28-06-2012 | – | – | – | – | – | 66.1 | 171.1 | 5.9 | 7.1 | 7.1 | – |
| චීන ආනයන අපනයන බැංකුව | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 30-10-2007 | 0.9 | – | 172.5 | 21.1 | 19.6 | 50.2 | 325.9 | – | – | – | – |
| | හම්බන්තොට වරායේ බංකර හා ටැංකාංග ව්‍යාපෘතිය | 31-01-2007 | – | – | 4.1 | 27.1 | 30.9 | 6.9 | 3.9 | – | – | – | – |
| | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ 2 අදියර | 17-09-2012 | – | – | – | - | – | – | – | 8.0 | 16.0 | 16.6 | 9.5 |
| | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ 2 අදියර | 17-09-2012 | – | – | – | – | – | – | 240.9 | 75.6 | 77.6 | 78.6 | 12.1 |
| | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ 2 අදියර | 17-09-2012 | 2013 සැප්තැම්බර් දක්වා උපයොජනයන් සිදු වී නැත. | | | | | | | | | | |
| | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ උපබද්ධ කාර්යයන් හා උපකරණ සම්පාදන ව්‍යාපෘතිය | 24-04-2013 | – | – | – | – | – | 79.0 | 60.6 | 46.9 | 46.9 | 3.2 | – |
| | කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ඒ1 කොටස | 06-08-2009 | – | – | 4.0 | 17.6 | 14.6 | 14.4 | 21.9 | – | – | – | – |
| | කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ඒ2 කොටස | 06-08-2009 | – | – | 4.4 | 19.3 | 15.9 | 16.7 | 24.5 | – | – | – | – |
| | කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ඒ3 කොටස | 06-08-2009 | – | – | 3.0 | 13.2 | 11.0 | 11.7 | 16.3 | – | – | – | – |
| | කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ඒ4 කොටස | 06-08-2009 | – | – | 4.2 | 18.5 | 1703.6 | 16996. 6 | 3043.9 | – | – | – | – |

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | උතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය (ගල්කුලම සිට කි.මී. 230 කණුව දක්වා) | | – | – | – | 4.6 | 81.1 | 16.8 | 22.4 | 2.6 | – | – | – |
| | උතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - 11බී | 09-09-2010 | – | – | – | 2.8 | 7.2 | 17.9 | 12.8 | 3.9 | – | – | – |
| | උතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - (මුලතිව් - කෝකිලායි) 11ඒ | 09-09-2010 | – | – | – | 2.8 | 13.1 | 7.7 | 19.9 | 2.8 | – | – | – |
| | උතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය (ඒබී020) (ඒබී032) (ඒබී016) (ඒබී018) | 09-09-2010 | – | – | – | 4.9 | 17.5 | 23.1 | 18.9 | 11.0 | – | – | – |
| | උතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය (කි.මී. 230 කණුව සිට යාපනය දක්වා) | 09-09-2010 | – | – | – | – | 22.2 | 33.1 | 1880.4 | 2.2 | 2.1 | – | – |
| | නාවට්කුලි - කරයිතිවු - මන්නාරම (ඒ032) මාර්ගය ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම | 29-04-2011 | – | – | – | – | 4.1 | 14.1 | 16.6 | 19.6 | 1.3 | – | – |
| | පුත්තලම - මර්ච්චිකඩේ - මන්නාරම මාර්ගයේ කි.මී. 113 ක් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම | 29-04-2011 | – | – | – | – | 4.7 | 3.3 | 28.4 | 42.8 | 2.0 | – | – |
| | දකුණු අධිවේගී මාර්ගයේ පින්නදූව සිට කොඩගොඩ දක්වා කොටස ඉදිකිරීම ) | 17-02-2011 | – | – | – | – | 9.3 | 9.6 | 29.3 | 43.7 | 2.1 | – | – |
| චීන ආනයන අපනයන බැංකුව | දකුණු අධිවේගී මාර්ගයේ කොඩගොඩ සිට ගොඩගම දක්වා කොටස ඉදිකිරීම | 17-02-2011 | – | – | – | – | 7.9 | 17.1 | 18.4 | 26.7 | 1.7 | – | – |
| | මත්තල හම්බන්තොට අන්තර්ජාතික ගුවන්තොටුපොළ ව්‍යාපෘතිය | 5-03-2010 | – | – | – | 5607.4 | 6097.5 | 7470.6 | 212.1 | 114.8 | – | – | - |
| | ගුවන්යානා ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර 60 සැපයීම | 9-09-2010 | – | – | – | 1.4 | 265.8 | 5.2 | 9.3 | 13.4 | – | – | – |
| | මාතර - කතරගම දුම්රිය මාර්ගය මාතර - බෙලිඅත්ත අදියර | 19-02-2013 | – | – | – | – | – | – | 84.7 | 31.5 | 31.9 | 32.3 | 32.8 |
| | මාතර - කතරගම දුම්රිය මාර්ගය මාතර - බෙලිඅත්ත අදියර | 28-05-2013 | 2013 සැප්තැම්බර් දක්වා උපයොජනයන් සිදු වී නැත. | | | | | | | | | | |
| | දුම්රිය බලවේග කට්ටල 13ක් සැපයීමේ ව්‍යාපෘතිය | 5-03-2010 | | – | – | 206.51 | 5.2 | 180.5 | 281.5 | 35.7 | – | – | – |
| | උතුරු පළාතේ විදුලිබල සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ද්‍රව්‍ය ප්‍රසම්පාදනය | 09-09-2010 | – | – | – | – | 0.08 | 2.2 | 16.3 | 3.4 | 0.8 | – | – |
| | ඌව පළාතේ විදුලි ආලෝකකරණය (ඌව උද්‍යානය) | 19-07-2011 | – | – | – | – | – | 3.87 | 12.1 | 6.87 | 6.9 | 7.1 | – |
| | නැගෙනහිර පළාතේ විදුලි ආලෝකකරණය (නැගෙනහිර උද්‍යානය) | 16-01-2012 | – | – | – | 0.2 | 2.9 | 13.3 | 9.2 | 7.4 | – | – | – |
| | විසල් කුරුණෑගල ජල සැපයුම් ව්‍යාපෘතිය | 18-09-2013 | 2013 සැප්තැම්බර් දක්වා උපයොජනයන් සිදු වී නැත. | | | | | | | | | | |
| | පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය - 2 සහ 3 අදියර | 25-12-2009 | – | – | – | 52463.0 | 8504.7 | 18261.9 | 16028.3 | 134.2 | – | – | – |
| චීන රජය | පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය - 1 අදියර | 08-09-2006 | 9.8 | – | – | 104.3 | 17.9 | 16.7 | 16.4 | 2.1 | – | – | – |

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුරට අනුව පොලිය සියයට 1.5 යටතේ ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 150යි. පොලිය සියයට 6.5 යටතේ ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 58යි. එතකොට එතැන එ.ජ. ඩොලර් මිලියන 208යි. ඉතිරි ණය ප්‍රමාණය අරගෙන තිබෙන්නේ මොන පදනම යටතේද? ඔබතුමා කිව්වා, වර්ෂයක් සඳහා අවම පොලිය යටතේ ඩොලර් මිලියන 150ක් හා උපරිම පොලිය යටතේ ඩොලර් මිලියන 58ක් ණය අරගෙන තිබෙනවා කියලා. එතකොට එ.ජ.ඩොලර් මිලියන 208යි වෙන්නේ. නමුත් මේ ණය සියල්ලම ඇමෙරිකන් ඩොලර්ස් 427කට වැඩිය තිබෙනවා. එතකොට ඉතුරු ණය ප්‍රමාණය කොයි විධියටද ලබා ගෙන තිබෙන්නේ?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමා, ඉතුරු ණය ප්‍රමාණය අපි වාණිජ ණය හැටියට තමයි අරගෙන තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

වාණිජ ණයවල පොලී ප්‍රමාණය මේ පොලී ප්‍රමාණයන් දෙක අතර පොලී ප්‍රමාණයක්ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒ එකින් එක ණය ප්‍රමාණවල පොලිය මම දාලා තිබෙනවා. ව්‍යාපෘතිය ඇහුවොත් මට කියන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මෙහි උපරිම පොලී ප්‍රමාණය සියයට 6.5යි. නමුත් අපි දැකලා තිබෙනවා, චීනයෙන් ණය ගන්න කොට ඒ ගොල්ලන්ගේ annual fee එකක් තිබෙනවා කියලා. ඊට පස්සේ operational fee එකක් තිබෙනවා. ඒවා ඔක්කෝම බැලුවාම තව සියයට 3.2ක් එනවා. මේ ණයවලටත් එවැනි තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවාද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, නැහැ. සෑම ණයක් ගන්න කොටම යම් යම් fee එකක් ගෙවන්න වෙනවා. ඒ කියන්නේ බොහෝ දුරට insurance fee එකක් ගෙවන්න ඕනෑ. ඒ වාගේ ancillary ගෙවීම් කරනවා. ඒ හැම එකකටම ඔච්චර විශාල ප්‍රමාණයක් යන්නේ නැහැ. ඒ ancillary fee එක මොකක්ද කියලා ඔබතුමා එකින් එක ඇහුවොත් මට කියන්න පුළුවන්. ඔක්කොටම සියයට 3ක් අපි ගෙවන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

චීනයෙන් අරගෙන තිබෙන අනෙක් ණයවලට යන්නේ සියයට 2.8ක පමණ ප්‍රමාණයක්. මට දළ වශයෙන් කියන්න පුළුවන්ද, ඒ සඳහා කොතරම් ප්‍රමාණයක් යනවාද කියලා. මොකද, මෙවැනි ප්‍රශ්නයක් තිබෙන්නේ චීනයෙන් ගන්නා ණයවලට. ඉන්දියාවෙන් ගන්නා ණයවලට මෙවැනි ප්‍රශ්නයක් නැහැ. ලෝක බැංකුවෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගන්නා ණයවලට මෙවැනි ප්‍රශ්නයක් නැහැ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

හැම ද්විපාර්ශ්වික ණයකම ඒ වාගේ ancillary fees තිබෙනවා. සමහර වෙලාවට කියනවා, අපට ඒවා මුලින් ගෙවන්න කියලා. සමහර වෙලාවට ඒ අය ගෙවනවා. ඒ නිසා ඒවා එකින් එක අරගෙන බලන්න ඕනෑ, ගරු කථානායකතුමනි. ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් අහන්න, අහවල් ව්‍යාපෘතිය කියලා. අපි ඒ කරුණු දෙන්නම්. කරුණාකර දැනට අපි සභාගත කළ ඒවා බලා, තව අතුරු ප්‍රශ්න තිබෙනවා නම් අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

සභාගත කරලා තිබෙන නිසා මට cash flow එකෙන් හොයා ගන්න පුළුවන්.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහන්නම්. 2014 වර්ෂයට අපේක්ෂිතභාවයක් තිබෙන අය වැය ප්‍රකාශය තුළින් අපේ ආදායම බිලියන 1,553යි. නමුත් මේ සම්බන්ධයෙන් පොලී සහ ප්‍රාග්ධන වියදම බිලියන 1,853යි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, මෙතුමා ඇහුවා, චීන ණය පිළිබඳව. ඒකට මම උත්තර දුන්නා. පොදු ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ. ඒකට වෙනම ප්‍රශ්නයක් අහන්න. මම ඒ ගැන සොයා බලා උත්තර දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමන්ලාගේ සම්පූර්ණ දළ ණය ප්‍රමාණයෙන් සියයට 28ක් එක රටකට අයත් වනවා. මේක ඔබතුමන්ලාට දරා ගන්න පුළුවන් මට්ටමක්ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට ඉඩ දෙනවා නම්, මම තත්ත්වය පැහැදිලි කරන්නම්. ලොකු වැරැද්දක් කරපු විධියට තමයි ඔබතුමා හැම දාම මේ ප්‍රශ්න මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ. නමුත්, ඇත්ත තත්ත්වය මෙන්න මේකයි. ඉස්සර -තමුන්නාන්සේලාගේ කාලයේත්, අපේ කාලයේත්- ඉතාම සීමිත ණය ප්‍රමාණයක් තමයි අපට ලැබුණේ. විශේෂයෙන්ම ලෝක බැංකුවෙන් සහ ද්විපාර්ශ්විකව බටහිර රටවලින්. නැත්නම් ඇමෙරිකාවෙන්, නැත්නම් ජපානයෙන්. නමුත්, අපේ කාල පරිච්ඡේදය තුළ චීනයෙන් ලබා ගත් ණය විශේෂ සංසිද්ධියක් - phenomenon එකක්- කියලා අපට කියන්න පුළුවන්. ඒ කියන්නේ චීන ණය නිසා සාමාන්‍ය ණය රටාවට අමතරව අපට ණය සම්බන්ධව අලුත් දොරක් ඇරුණා. මේක අපට විතරක් නොවෙයි, සංවර්ධනය වන රටවලට හදිසියේ ලැබුණු opportunity එකක්. ඒක වරදක් නොවෙයි. ඉස්සර මේ වාගේ ඉතාම සුළු ණය ලබා ගත් රටවලට, නොයෙක් කොන්දේසි දාලා යටත් වුණු රටවලට මේ කාල පාරිච්ඡේදය තුළ, මේ වර්ෂ කිහිපය තුළ විශේෂ opportunity එකක් ලැබුණා. තමුන්නාන්සේ අපට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. අපි ඒකෙන් අවස්ථාව අරගෙන ක්‍රියා කළා. පරණ විධියට කටයුතු කළා නම් කවදාවත් මෙච්චර මුදලක් ගන්න ලැබෙන්නේ නැහැ. අවුරුදු 10, 15 යනවා මේ වගේ යටිතල පහසුකම් ලබා දෙන්න. අපි ඒක කර ගෙන තිබෙනවා. Hon. Speaker, we have grasped the opportunity. That is all I can say.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

You are basically saying that you all are having some capital investments put in. But, that does not get the desired revenue. ඒ නිසා තමයි දැන් "ශ්‍රී ලංකා" කියලා කියන්නේ නැතිව "චී ලංකා" කියලා කියන්නේ. මොකද, Chinaවලින් කොච්චර ආධාර දෙනවා ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Those are cheap shots.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි, දැන් ප්‍රශ්න අංක 12, ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

දැන් ඉතාම වග කීමෙන් මම පිළිතුරක් දුන්නා. නිකම් තුට්ටු දෙකේ කථාවලට අපට සහභාගි වෙන්න බැහැ. "චීන ණය" ද, "චීප ණය" ද කියන එක අපට වැඩක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 12 -3418/'13- (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 13 -3429/'13- (1), ගරු පී. හැරිසන් මහතා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඖෂධ වර්ග ගෙන්වීම : ටෙන්ඩර්කරුවන් තෝරා ගැනීම
## மருந்து வகைகள் இறக்குமதி : கேள்விப்பத்திரதாரர் தெரிவு
## IMPORT OF MEDICINAL DRUGS: SELECTION OF TENDERERS

4556/'13

14. **ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2014 වර්ෂය සඳහා අවශ්‍ය ඇතැම් ඖෂධ වර්ග ගෙන්වීම සඳහා මේ වන විට ටෙන්ඩර්කරුවන් තෝරා ගෙන තිබේද;

(ii) එම එක් ඖෂධයක් ගෙන්වීම සඳහා ටෙන්ඩර්කරුවන් කීප දෙනෙක් ඉදිරිපත් වූ අවස්ථාවකදී සුදුසු ටෙන්ඩර්කරු තෝරා ගැනීමට ගත වන කාල සීමාව කවරේද;

(iii) එම හේතුව නිසා 2014 වර්ෂයේදී රෝහල්වල ඖෂධ හිඟයක් ඇතිවීමේ අවදානමක් පවතින්නේද;

(iv) 2013 වර්ෂය සඳහා ඇණවුම් කළ ඖෂධවලින් ලැබී ඇති ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2014ஆம் ஆண்டுக்காகத் தேவைப்படுகின்ற ஒருசில மருந்து வகைகளைப் பெறுவதற்காக ஏற்கெனவே கேள்விப்பத்திரதாரர்கள் தெரிவு செய்யப்பட்டுள்ளனரா என்பதையும்;

(ii) மேற்படி ஒரு மருந்து வகையைப் பெற்றுத்தருவதற்கு பல கேள்விப்பத்திரதாரர்கள் முன்வந்துள்ளபோது தகுதிவாய்ந்த கேள்விப்பத்திரதாரரைத் தெரிவு செய்வதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

(iii) இதன் காரணமாக 2014ஆம் ஆண்டில் ஆஸ்பத்திரிகளில் மருந்துப் பற்றாக்குறை உருவாகின்ற ஆபத்து நிலவுகின்றதா என்பதையும்;

(iv) 2013ஆம் ஆண்டுக்காக கொள்வனவுக் கட்டளை அனுப்பப்பட்ட மருந்துகளில் கிடைத்துள்ள அளவு எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state-

(i) whether tenderers have been selected for importing certain medicinal drugs necessary for the year 2014;

(ii) the duration taken for selecting the most eligible bidder when several bidders have applied for importing each drug;

(iii) whether for this reason, there exists a risk of a shortage of drugs occurring in the year 2014; and

(iv) the amount of drugs that have been received out of that ordered for the year 2013;

(b) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) සාමාන්‍ය පරිපාටිය යටතේ ටෙන්ඩර් කැඳවීමේ සිට ඖෂධයක් ගෙන්වා ගැනීම සඳහා ගතවන කාලය සති 38කි.

(iii) 2014 වර්ෂයේ ලැබිය යුතුව ඇති ඇණවුම් සම්බන්ධයෙන් එම ඇණවුම්වලට අදාළව වර්ෂයේ මුල් භාගයේදී ලැබිය යුතු තොග බොහොමයක් මේ වන විට ලැබී ඇත. වසරේ අග භාගයේදී ලැබිය යුතු තොග සඳහාද ඇණවුම් නිකුත් කර ඇති බැවින් රෝහල්වල ඖෂධ හිඟයක් ඇති වීමේ අවදානමක් නොපවතී.

(iv) ඇමුණුම බලන්න. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

| ORDER YEAR | SRNO | ITEM | UNIT | Quantity Available | Sufficient Period (in mths.) | ORDER_Number | ORDER_QTY | Quantity reveived | % Received |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2013 | 070607 | Metformin Tablet 500mg | Tab | - | 0 | MSD/P/038/13 | 430,000,000 | 99,141,000 | 23% |
| 2013 | 032015 | Paracetamol Tablet 500mg | Tab | 35,300,000 | 1.1 | MSD/P/031/13 | 280,000,000 | 245,025,000 | 88% |
| 2013 | 040026 | Ferrous sulphate Tablet 200mg | Tab | - | 0 | MSD/P/004/13 | 170,000,000 | 60,000,000 | 35% |
| 2013 | 021527 | Losartan Potassium tablet 50mg | Tab | 22,253,000 | 1.7 | MSD/P/027/13 | 125,000,000 | 124,788,000 | 100% |
| 2013 | 080759 | Omeprasole Capsule 20mg | Cap | - | 0 | MSD/P/023/13 | 125,000,000 | 85,000,000 | 68% |
| 2013 | 110033 | Paraffin,yellow soft | g | 8,850,000 | 0.7 | MSD/P/005/13 | 120,000,000 | 120,000,000 | 100% |
| 2013 | 182307 | X'Ray Fixer for Automatic Processing set | ml | 37,540,000 | 3.2 | MSD/XR/041/13 | 110,000,000 | 60,320,000 | 55% |
| 2013 | 070429 | Tolbutamide Tablet 500mg | Tab | 2,984,000 | 0.3 | MSD/P/039/13 | 105,000,000 | 100,027,000 | 95% |
| 2013 | 182519 | X'Ray Developer Automatic Processing set | ml | 33,240,000 | 2.7 | MSD/XR/041/13 | 90,000,000 | 50,600,000 | 56% |
| 2013 | 070411 | Glibenclamide Tablet 5mg | Tab | - | 0 | MSD/P/007/13 | 80,000,000 | 64,994,000 | 81% |
| 2013 | 022963 | Clopidogrel tablet 75mg | Tab | 5,791,500 | 0.7 | MSD/P/027/13 | 65,000,000 | 64,574,500 | 99% |
| 2013 | 050160 | Beclomethazone dipropionate dry powder Capsule fo | Cap | 1,097,300 | 0.2 | MSD/P/023/13 | 65,000,000 | 54,326,700 | 84% |
| 2013 | 080733 | Famotidine Tablet 20mg | Tab | - | 0 | MSD/P/067/13/SPMC | 65,000,000 | 56,504,000 | 87% |
| 2013 | 020806 | Atenolol Tablet 50 mg | Tab | 1,899,000 | 0.5 | MSD/P/052/13 | 60,000,000 | 29,511,000 | 49% |
| 2013 | 080018 | Aluminium hydroxide Tablet 500mg | Tab | - | 0 | MSD/P/023/13 | 60,000,000 | | 0% |
| 2013 | 032007 | Aspirin Tablet 300mg | Tab | 19,070,000 | 6.2 | MSD/P/003/13 | 57,000,000 | 48,500,000 | 85% |
| 2013 | 041200 | Calcium lactate Tablet 300mg | Tab | 40,227,000 | 1.1 | MSD/P/004/13 | 50,000,000 | 50,000,000 | 100% |
| 2013 | 115465 | Ortho-Phthaladehyde 0.55%w/v disinfectant solution | ml | - | 0 | MSD/P/045/13/S | 50,000,000 | | 0% |
| 2013 | 021501 | Captopril Tablet 25mg | Tab | - | 0 | MSD/P/002/13 | 45,000,000 | | 0% |
| 2013 | 140088 | Diclofenac Sodium tablet 50mg | Tab | 1,916,000 | 0.2 | MSD/P/109/13 | 40,000,000 | | 0% |
| 2013 | 140012 | Diclofenac Sodium Tablet 25 mg | Tab | - | 0 | MSD/P/008/13 | 37,000,000 | 18,500,000 | 50% |
| 2013 | 030631 | Prochlorperazine Tablet 5mg | Tab | 9,928,000 | 4 | MSD/P/003/13 | 35,000,000 | 25,000,000 | 71% |
| 2013 | 010128 | Phenoxymethyl penicillin Tablet 250 mg | Tab | 7,753,000 | 5.9 | MSD/P/067/13/SPMC | 34,000,000 | 22,289,000 | 66% |
| 2013 | 140038 | Ibuprofen Tablet 200mg | Tab | 5,249,000 | 1 | MSD/P/118/13 | 30,000,000 | | 0% |
| 2013 | 050217 | Salbutamol dry powder capsules for breath induced d | Cap | 1,953,700 | 0.6 | MSD/P/023/13 | 29,000,000 | 26,184,300 | 90% |
| 2013 | 030550 | Haloperidol Tablet 1.5mg | Tab | 16,671,000 | 7 | MSD/P/003/13 | 25,000,000 | 25,000,000 | 100% |
| 2013 | 050152 | Beclomethazone dipropionate dry powder Capsule fo | Cap | - | 0 | MSD/P/023/13 | 23,000,000 | 22,677,100 | 99% |
| 2013 | 021527 | Losartan Potassium tablet 50mg | Tab | 22,253,000 | 1.7 | MSD/P/EP/05/135/13 | 20,300,000 | 10,000,000 | 49% |
| 2013 | 031289 | Imipramine Tablet 25 mg | Tab | 5,460,000 | 4.8 | MSD/P/003/13 | 19,000,000 | 11,000,000 | 58% |
| 2013 | 040539 | Water for Injection 10ml Ampoule | Amp | 1,369,600 | 1 | MSD/P/004/13 | 16,500,000 | 12,500,000 | 76% |
| 2013 | 022256 | Diltiazem tablet 30mg | Tab | 1,152,000 | 0.8 | MSD/P/002/13 | 16,000,000 | 8,000,000 | 50% |
| 2013 | 030770 | Risperidone tablet 2mg | Tab | 2,475,000 | 1.7 | MSD/P/003/13 | 16,000,000 | 11,000,000 | 69% |
| 2013 | 050178 | Salbutamol dry powder Capsule for Breath induced de | Cap | - | 0 | MSD/P/008/13 | 16,000,000 | 14,398,300 | 90% |
| 2013 | 110025 | Paraffin liquid | ml | 5,700,000 | 4 | MSD/P/005/13 | 13,000,000 | 12,925,000 | 99% |
| 2013 | 140038 | Ibuprofen Tablet 200mg | Tab | 5,249,000 | 1 | MSD/P/EP/05/135/13 | 12,770,000 | 12,770,000 | 100% |
| 2013 | 080806 | Sulphasalazine Tablet 500mg | Tab | 2,602,000 | 1.9 | MSD/P/023/13 | 12,500,000 | 6,250,000 | 50% |
| 2013 | 075306 | Metformin sustain release tablet 850mg | Tab | - | 0 | MSD/P/039/13 | 11,000,000 | | 0% |
| 2013 | 010908 | Erythromycin Tablet 250mg | Tab | 3,767,000 | 2.4 | MSD/P/067/13/SPMC | 9,000,000 | 6,852,000 | 76% |

[ගරු ලලිත් දිසානායක මහතා]

| ORDER YEAR | SRNO | ITEM | UNIT | Quantity Available | Sufficient Period (in mths.) | ORDER_Number | ORDER_QTY | Quantity reveived | % Received |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2013 | 014017 | Mebendazole Tablet 100mg | Tab | 13,776,000 | 3.5 | MSD/P/085/13 | 8,000,000 | 7,307,000 | 91% |
| 2013 | 055275 | Cetrizine hydrochloride Tablet 10mg | Tab | - | 0 | MSD/P/008/13 | 7,500,000 | | 0% |
| 2013 | 032528 | Clonazepam Tablet 2mg | Tab | 39,000 | 0.1 | MSD/P/003/13 | 6,800,000 | 3,800,000 | 56% |
| 2013 | 080822 | Sulphasalazine Delayed release Tablets 500mg | Tab | - | 0 | MSD/P/023/13 | 6,250,000 | 3,250,000 | 52% |
| 2013 | 040513 | Sodium chloride Injection 0.9% in 500ml Bottle | Bot | 4,150 | 0 | MSD/P/036/13 | 6,000,000 | 4,656,950 | 78% |
| 2013 | 071108 | Carbimazole Tablet 5mg | Tab | 5,360,000 | 4.6 | MSD/P/007/13 | 6,000,000 | 3,000,000 | 50% |
| 2013 | 010241 | Cloxacillin capsules 500mg | Cap | 1,430,000 | 3.1 | MSD/P/103/13 | 5,000,000 | 2,000,000 | 40% |
| 2013 | 075021 | Gliclazide Tablet 80mg | Tab | 1,138,500 | 2.1 | MSD/P/039/13 | 4,700,000 | | 0% |
| 2013 | 051077 | Promethazine hydrochloride Tablet 10mg | Tab | 630,000 | 1.7 | MSD/P/008/13 | 4,600,000 | | 0% |
| 2013 | 032641 | Sodium valproate Tablet 200mg | Tab | 1,071,050 | 0.2 | MSD/P/EP/03/115/13 | 4,500,000 | 4,500,000 | 100% |
| 2013 | 190300 | Bandage W.O.W. 6.25 cm x 4.5m Roll | Roll | 767,000 | 1.9 | MSD/DR/009/13 | 4,500,000 | 4,500,000 | 100% |
| 2013 | 015275 | Doxycycline hydrochloride Capsule 100mg | Cap | 879,000 | 2.9 | MSD/P/022/13 | 4,000,000 | | 0% |
| 2013 | 041658 | Calcitriol Capsule 250ng | Cap | 275,700 | 1.3 | MSD/P/002/13 | 4,000,000 | 3,000,000 | 75% |
| 2013 | 191102 | Sanitary pads | Pad | - | 0 | MSD/DR/009/13 | 4,000,000 | 2,408,000 | 60% |
| 2013 | 030275 | Clobazam tablet 10mg | Tab | 611,900 | 1.8 | MSD/P/003/13 | 3,500,000 | 3,000,000 | 86% |
| 2013 | 081006 | Bisacodyl Tablet 5mg | Tab | 1,536,000 | 4 | MSD/P/008/13 | 3,500,000 | 3,497,000 | 100% |
| 2013 | 023600 | Dipyridamole Tablet 100mg | Tab | 577,600 | 0.8 | MSD/P/002/13 | 3,250,000 | 812,500 | 25% |
| 2013 | 013621 | Metronidazole Tablet 400 mg | Tab | 88,000 | 0.3 | MSD/P/022/13 | 3,000,000 | | 0% |
| 2013 | 013639 | Metronidazole Injection 500mg in 100ml Bottle | Bot | 170,420 | 0.6 | MSD/P/022/13 | 3,000,000 | 1,500,000 | 50% |
| 2013 | 015194 | Cefuroxime Tablet 500mg | Tab | 900,200 | 6.1 | MSD/P/012/13 | 3,000,000 | 2,966,350 | 99% |
| 2013 | 015681 | Clarithromycin Tablet 250mg | Tab | 143,200 | 0.4 | MSD/P/022/13 | 3,000,000 | 2,210,800 | 74% |
| 2013 | 110067 | Coconut oil | ml | 387,500 | 1.1 | MSD/P/086/13 | 3,000,000 | 500,000 | 17% |
| 2013 | 014009 | Diethyl carbamazine citrate Tablet 50mg | Tab | 850,000 | 6.2 | MSD/P/022/13 | 2,500,000 | 1,250,000 | 50% |
| 2013 | 023600 | Dipyridamole Tablet 100mg | Tab | 577,600 | 0.8 | MSD/P/069/13/AD | 2,500,000 | | 0% |
| 2013 | 075542 | Levonorgestrel 0.15mg + Ethinyloestradiol 0.03mg tab | Tab | - | 0 | MSD/P/FHB/075/14/S | 2,500,000 | | 0% |
| 2013 | 080806 | Sulphasalazine Tablet 500mg | Tab | 2,602,000 | 1.9 | MSD/P/EP/05/135/13 | 2,400,000 | | 0% |
| 2013 | 010063 | Benzyl penicillin Injection 1 million unit Vial | Vial | 170,500 | 1.1 | MSD/P/014/13 | 2,000,000 | 1,000,000 | 50% |
| 2013 | 011603 | Nalidixic acid Tablet 500mg | Tab | 787,000 | 7 | MSD/P/022/13 | 2,000,000 | | 0% |
| 2013 | 016239 | Cloxacillin Injection 500mg Vial | Vial | 335,600 | 3.8 | MSD/P/014/13 | 2,000,000 | 500,000 | 25% |
| 2013 | 035500 | Cap Flunarizine 5mg | Cap | - | 0 | MSD/P/095/13/AD | 2,000,000 | | 0% |
| 2013 | 035592 | Flinarizine tablets 5mg | Tab | 547,800 | 0 | MSD/P/095/13/AD | 2,000,000 | 1,000,000 | 50% |
| 2013 | 075542 | Levonorgestrel 0.15mg + Ethinyloestradiol 0.03mg tab | Tab | - | 0 | MSD/P/FHB/081/13/S | 2,000,000 | | 0% |
| 2013 | 180240 | X'Ray Film, Blue base for Automatic Processing size 24 | Film | - | 0 | MSD/XR/041/13 | 2,000,000 | 200,000 | 10% |
| 2013 | 045181 | Calcium carbonate Tablet 1.25g | Tab | 5,340,000 | 5 | MSD/P/EP/05/135/13 | 1,900,000 | | 0% |
| 2013 | 131005 | Citric acid crystals | g | 1,314,000 | 15.7 | MSD/P/007/13 | 1,900,000 | 1,200,000 | 63% |
| 2013 | 180208 | X'Ray Film, Blue base for Automatic Processing size 30 | Film | - | 0 | MSD/XR/041/13 | 1,900,000 | 190,000 | 10% |
| 2013 | 081519 | Metoclopramide Injection 10mg in 2ml Ampoule | Amp | 650,700 | 4.1 | MSD/P/008/13 | 1,800,000 | 1,800,000 | 100% |
| 2013 | 015063 | Co-amoxyclav Injection 1000/200mg Vial | Vial | - | 0 | MSD/P/012/13 | 1,700,000 | 576,924 | 34% |

| ORDER YEAR | SRNO | ITEM | UNIT | Quantity Available | Sufficient Period (in mths.) | ORDER_Number | ORDER_QTY | Quantity reveived | % Received |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2013 | 040432 | Dextrose 5% 500ml Bottle | Bot | 99,240 | 1.3 | MSD/P/004/13 | 1,600,000 | 800,000 | 50% |
| 2013 | 050500 | Salmeterol Xinafoate 50mcg + Fluticasone Propionate | Cap | 178,400 | 0.7 | MSD/P/008/13 | 1,500,000 | | 0% |
| 2013 | 125274 | Cyclosporin Capsule 50mg | Cap | 549,620 | 17.2 | MSD/P/037/13/S | 1,500,000 | 300,000 | 20% |
| 2013 | 140931 | Neostigmine Tablet 15mg | Tab | 128,000 | 1.1 | MSD/P/008/13 | 1,500,000 | 1,500,000 | 100% |
| 2013 | 180232 | X'Ray Film, Blue base for Automatic Processing size 35 | Film | - | 0 | MSD/XR/041/13 | 1,500,000 | 150,000 | 10% |
| 2013 | 041577 | Pyridoxine hydrochloride Tablet 25mg | Tab | - | 0 | MSD/P/002/13 | 1,400,000 | | 0% |
| 2013 | 051190 | Chlorpheniramine maleate syrup 2mg in 5ml , 60ml bo | Bot | - | 0 | MSD/P/008/13 | 1,400,000 | 960,000 | 69% |
| 2013 | 032023 | Paracetamol syrup 120mg in 5ml,100ml bottle | Bot | - | 0 | MSD/P/003/13 | 1,300,000 | 299,997 | 23% |
| 2013 | 060076 | Tetanus toxoide Vaccine 0.5ml Ampoule ( single dose | Amp | 156,840 | 1.6 | MSD/P/006/13 | 1,300,000 | 700,000 | 54% |
| 2013 | 180216 | X'Ray Film, Blue base for Automatic Processing size 35 | Film | - | 0 | MSD/XR/041/13 | 1,300,000 | 130,000 | 10% |
| 2013 | 020513 | Atropine Sulphate Injection 600mcg in 1ml Ampoule | Amp | 69,810 | 0.8 | MSD/P/002/13 | 1,100,000 | 750,000 | 68% |
| 2013 | 011734 | Cefotaxime Injection 1g Vial | Vial | 22,400 | 0.2 | MSD/P/001/13 | 1,000,000 | 200,000 | 20% |
මෙම තැති ගන්වන සුළු ප්‍රවණතාව නවතාලනු පිණිස කෙටි කාලීනව මෙන්ම දිගු කාලීනව ද රජය විසින් කවර පියවරයන් ගන්නේද යන්න විමසා සිටීමට මම කැමැත්තෙමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ පිළිබඳව පිළිතුරක් දෙනවාද?

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)
ගරු කථානායකතුමනි, 2013 වර්ෂයේ හා 2014 වර්ෂයේ සිදු වූ රිය අනතුරු සංසන්දනය කිරීමේදී මෙම වර්ෂයේ සිංහල අලුත් අවුරුදු කාල සීමාව තුළ රිය අනතුරු 467කින් අඩු වී ඇත. කෙසේ වුවද මිය ගිය සංඛ්‍යාව 11කින් ඉහළ ගොස් ඇති බව පොලිස්පති විසින් මා වෙත වාර්තා කර ඇති බව කාරුණිකව දන්වමි.

ඒ අනුව රිය අනතුරු සංඛ්‍යාව අවම කිරීම සඳහා පහත සඳහන් කෙටි කාලීන හා දිගු කාලීන ක්‍රියා මාර්ග ගනු ලැබේ. මෙම වර්ෂයේ රිය අනතුරු අවම කර ගැනීම සඳහා ගන්නා ලද කෙටි කාලීන ක්‍රියා මාර්ග වන්නේ, පැය 24 පුරා පොලිස් නිලධාරින් මාර්ගයේ යොදවා රිය පාලනය කිරීම, බීමත් රියැදුරන් අත් අඩංගුවට ගැනීම, අනතුරුදායක ලෙස රිය ධාවනය සම්බන්ධව නඩු පැවරීම, මාර්ග නීති උල්ලංඝනය කිරීම සම්බන්ධව නඩු පැවරීම, පදිකයන් දැනුවත් කිරීම, සියලුම පොලිස් ස්ථානවල අවුරුදු සමය තුළ රථ වාහන මෙහෙයවීමට උපදෙස් ලබා දීම, ත්‍රිරෝද රථවලින් වන අනතුරු අවම කර ගැනීම සඳහා දකුණු පැති දොර සවි කිරීමට අවශ්‍ය කටයුතු කිරීම, මීට අමතරව මෙම අඩු පාඩු සහිත ත්‍රිරෝද රථ රියැදුරන් රථ වාහන පොලිස් මූලස්ථානයට සහ අනෙකුත් පොලිස් ස්ථානවලට ගෙන්වා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මඟී ප්‍රවාහන බස් රථ සහ යතුරුපැදිකරුවන් සඳහා විශේෂ අවධානය යොමු කිරීම ආදියයි.

දිගු කාලීන ක්‍රියා මාර්ග වන්නේ, රිය අනතුරු බහුලව සිදු වන ස්ථාන හඳුනාගෙන ඒ සඳහා විකල්ප ක්‍රියා මාර්ග ඇති කිරීම, බීමත් රියැදුරන් සම්බන්ධව සම්මන්ත්‍රණ පැවැත්වීම හා නඩු ලබා ගැනීම, බහුලව රිය අනතුරු සිදු වන කොට්ඨාස හඳුනාගෙන විශේෂ වැඩ මුළු නොකඩවා පවත්වාගෙන යෑම, නවීන තාක්ෂණය උපයෝගී කරගෙන රථ වාහන නීතිය ක්‍රියාත්මක කිරීම, පොලිස් ස්ථාන මට්ටමින් මාර්ග භාවිත කරන්නන් දැනුවත් කිරීමේ වැඩ මුළු නොකඩවා පවත්වාගෙන යෑම ආදියයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, රියැදුරු බලපත්‍ර නිකුත් කිරීමේදී සමහර විට- [බාධා කිරීමක්] I want a clarification. ඒ පිළිබඳව මොකක්ද කරන්නේ? අද මුදලටත් ඒවා නිකුත් වෙනවා, කිසිම වග විභාගයක් නැතිව.

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)
ගරු කථානායකතුමනි, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහපු ප්‍රශ්නයට අදාළ විෂයය භාර ඇමතිතුමා මොකක්ද කියන්න හදනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු මන්ත්‍රීතුමා, රියැදුරු බලපත්‍ර නිකුත් කිරීමේදී කවදාවත් ඔබතුමා කියන විධියට වැරැදි සිද්ධ වන්නේ නැහැ. ඒක අමූලික අසත්‍යයක්. එහෙම එකක් තිබෙනවා නම් පෙන්නුම් කරන්න මේ වාගේ අසත්‍ය ප්‍රකාශ මේ ගරු සභාවේ කරන්නේ නැතිව. ඔබතුමාට පෙන්නන්න පුළුවන් නේ මොකක් හෝ එක කාරණයක්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මා ගරු ඇමතිතුමාට ගෞරවයෙන් කාරණයක් කියනවා. රියැදුරු පුහුණුව වෙනුවෙන් කියලා අපි විමධ්‍යගත මුදල් වෙන් කරනවා වයඹ බස් සමාගමට. ඔබතුමා හොයලා බලන්න, මම මීට ඉස්සෙල්ලාත් පාර්ලිමේන්තුවේ මේ ප්‍රශ්නය මතු කරලා තිබෙනවා. ඒ වයඹ බස් සමාගම අපි යවන තරුණයන්ගෙනුත් සල්ලි ගන්නවා. ඒ සභාපතිවරයා මට කියනවා, කාලයක් තිස්සේ ඒක වෙනවා කියලා. නැත්නම් ඒ ගොල්ලන් ඒක කරන්නේ නැහැ ලු.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඒ පිළිබඳව පසුව කථා කර ගන්න.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒ රියදුරු බලපත්‍රය නොවෙයි, රියදුරු පුහුණුව. ඒක පුහුණුව. පුහුණුව කියන්නේ එකක්. බලපත්‍රය කියන්නේ තව එකක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. පුහුණු කරන ආයතනවල ප්‍රමිතිය ගැන විටින් විට බලන්න. එතකොට හරි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ආයතන පිළිබඳව මම බලන්නම්. එහෙම එකක් තිබෙනවා නම් මම බලන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න. ගරු අජිත් මාන්නප්පෙරුම මහතා.

## වරප්‍රසාද: හම්බන්තොට නිරීක්ෂණ චාරිකාවේදී සිදු වූ අවහිරය හා පහර දීමේ තැත
## சிறப்புரிமை : அம்பாந்தோட்டைக்கான பரிசீலனை விஜயத்தின்போது இடையூறும் தாக்குதல் முயற்சியும்
## PRIVILEGE : OBSTRUCTION AND ATTEMPTED ATTACK DURING INSPECTION TOUR OF HAMBANTOTA

### I

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, හම්බන්තොට ඔබතුමාගේ බල ප්‍රදේශය තුළ දී මා ඇතුළු මන්ත්‍රීවරුන් පස් දෙනාට සිදු වුණු අකරතැබ්බය පිළිබඳව ඉහළ අය නිහඬව හිටියදී වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, 2014 අප්‍රේල් 17වන දින අජිත් පී. පෙරේරා, ආර්. යෝගරාජන්, ඉරාන් වික්‍රමරත්න, නලින් බණ්ඩාර යන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ මම හම්බන්තොට වරායත්, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළත් නිරීක්ෂණය කිරීමේ චාරිකාවක යෙදුනෙමි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස ඒ සඳහා අපට ඇති අයිතිය තහවුරු කරමින් රජයේ අවසරයත්, එම ආයතනවල අවසරයත් අප වෙත ලබා දී තිබුණි. මේ නිසා මෙම ආයතන නිරීක්ෂණය කිරීම සඳහා ඉහත දිනයේදී පැමිණෙන බවට අප විසින් පූර්ව දැනුම් දීමක් ද එම ආයතන වෙත දැනුම් දී තිබුණි.

ජාතික මෙහෙවරක් සඳහා අප එහි ගියද එහිදී අපට මුහුණ දීමට සිදු වූ තර්ජන, අඩන්තේට්ටම්, බියගැන්වීම්, පහරදීම් ඇතුළු සාපරාධී ක්‍රියාවන් රැසක් නිසා අප අරමුණු කර ගත් කාර්යයන් ඉටු කර ගැනීමට නොහැකි විය. සංවිධානාත්මක අවි ගත් පිරිසක් විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අප හට පහර දීමට තැත් කර, බියවද්දා, අමානුෂික ලෙස සැලකීම නිසා අපගේ මානව හිමිකම් හා වරප්‍රසාද බරපතළ ලෙස උල්ලංඝනය වී තිබේ.

එම බරපතළ ක්‍රියාවන් වෙන් වෙන් වශයෙන් සඳහන් කරමි.

1. රජය සතු ආයතනයකට නිදහසේ ඇතුළු වීමටත්, නිදහසේ පිටව යාමටත් ඇති අයිතිය උදුරා ගැනීම.
2. මෙම නිරීක්ෂණ චාරිකාව සඳහා අප සමඟ ගිය ආරක්ෂක නිලධාරීන් කිහිප දෙනාටත්, මාධ්‍යවේදීන්ටත් ගුවන් තොටුපොළට ඇතුළු වීමට අවසර නොදී ඒ තුළ අප අනාරක්ෂිත තත්ත්වයට පත් කිරීම.
3. එම ආයතන හරියාකාරව නිරීක්ෂණය කිරීමට නොහැකි වන සේ සංවිධානාත්මකව අප හට තර්ජනය කිරීම, බැන වැදීම, පහර දීමට තැත් කිරීම හා විවිධ අඩන්තේට්ටම් කිරීම.
4. රජයේ අධිආරක්ෂිත කලාපයක් ලෙස ස්ථාපිත කර ඇති වරාය හා ගුවන් තොටුපොළ වැනි පරිශ්‍රයන් තුළ අප අනාරක්ෂිත තත්ත්වයට පත් කිරීම හා තර්ජනය කිරීමෙන් මරණ බිය ඇති කිරීම.
5. හම්බන්තොට වරාය නිරීක්ෂණය කිරීම සම්පූර්ණ ලෙස වළක්වාලීමට පසු බිම සකස් කිරීම හා නිරීක්ෂණය සඳහා තිබිය යුතු යහපත් මානසිකත්වය බිඳ හෙළීමට කටයුතු කිරීම.
6. අපගේ ඉල්ලීම පරිදි අපගේ ආරක්ෂාව සඳහා පැමිණ සිටි සහකාර පොලිස් අධිකාරිවරයා, මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා ඇතුළු පොලිස් නිලධාරිහු තම වගකීම් පැහැර හරිමින් කටයුතු කිරීම සහ මැර කණ්ඩායම්වල තර්ජනයෙන් හා ඔවුන්ගේ අඩන්තේට්ටම්වලින් අප ලක් වන අපහසුතාවන් පිළිබඳව කිසියම් වින්දනයක් ලැබීම.
7. පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් ලෙස අපගේ ආරක්ෂාව සලසනු වෙනුවට එම පොලිස් නිලධාරිහු හම්බන්තොට නගරාධිපති එරාජ් නමැත්තාගේ සේවකයින් බවට පත්වීම හා ඔහුගේ වුවමනා එපාකම් සඳහා සෘජුවම පෙනී සිටීම.
8. අප හට මැර පිරිස් විසින් එල්ල කරන ලද තක්කාලි හා බිත්තර ප්‍රහාරයන් වැළැක්වීම පොලීසියට පහසුවෙන් කළ හැකි වුවද, ඒවා නරඹමින් මුනිවත රැකීම හා ඔවුන්ගේ වින්දනය සඳහා ජංගම දුරකථනවලින් ඒවා වීඩියෝගත කිරීම.
9. වරාය භූමියේ පිටත් වන දොරටුව අසලදී ගල් මුල්වලින් පහර දී ප්‍රසිද්ධියේ ගිනි අවි භාවිත කිරීම හොඳින් නිරීක්ෂණය කළ ද, පොලිසිය ඒ පිළිබඳව ද නිහඬව බලා සිටීම හා ඔවුන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග නොගැනීම.
10. අඛණ්ඩව පැය ගණනාවක් මැර කණ්ඩායම්වල තර්ජන ගර්ජනවලට ලක් වී එම ස්ථානයෙන් පිටත්ව එන විට ද අප පොලිස් ආරක්ෂාව ඉල්ලා සිටිය ද, පොලීසිය එම ඉල්ලීම නොසලකා මඟහැර යාම.

එසේ හෙයින් ඉහත කරුණු පිළිබඳව සොයා බලා මාගේ පාර්ලිමේන්තු වරප්‍රසාද ආරක්ෂා කිරීම මෙන්ම රටේ සාමාන්‍ය ජනතාව භුක්ති විඳිය යුතු වරප්‍රසාද මට අහිමි කළ තැනැත්තන්ට එරෙහිව පියවර ගන්නා ලෙස ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

## II

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, හම්බන්තොටදී අපේ මන්ත්‍රීවරුන් පස් දෙනෙකුට මුහුණ දීමට සිදු වූ සිද්ධිය සම්බන්ධයෙන් කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තෙන්ම, මේක පෞද්ගලිකව මන්ත්‍රීවරුන් පස් දෙනෙකුට වූ සිදුවීමක් පමණක් නොව මන්ත්‍රීවරයෙක්ය කියන ඒ තනතුරට ලැබෙන පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ වීමක් හැටියටයි අප දකින්නේ. සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මේ සම්බන්ධයෙන් පෞද්ගලිකව කනගාටුව පළ කරාවිය කියා මා හිතනවා.

ගරු කථානායකතුමනි, වර්ෂ 2014ක් වූ අප්‍රේල් මස 17 වන දින මෙම පාර්ලිමේන්තුවේ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලා වන ගරු ආර්. යෝගරාජන්, ගරු ඉරාන් වික්‍රමරත්න, ගරු අජිත් මාන්නප්පෙරුම සහ ගරු අජිත් පී. පෙරේරා යන මන්ත්‍රීවරු සමඟ මම මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපොළ සහ හම්බන්තොට, මාගම්පුර වරාය නිරීක්ෂණය කිරීම සඳහා පිටත්ව ගියෙමු. එකී ආයතන රජයට අයත් දේපොළ වන අතර, එකී ආයතනවලට ඇතුළු වී එකී ආයතන නිරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්හට නීතිමය අයිතියක් ඇති අතර, එකී අයිතිය වරප්‍රසාදයක් ලෙස වැඩිදුරටත් භාවිතය තුළින් තහවුරු වී ඇත.

එකී ආයතන නිරීක්ෂණය කිරීම සඳහා අදාළ දිනයේ පැමිණෙන බව අදාළ බලධාරීන්ට කල් තියා දැනුම් දීමට කටයුතු කරන ලදී.

එසේ තිබියදී, 2014.04.17වන දින ප.ව. 1.00ට පමණ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පරිශ්‍රය තුළදී අපගේ නිරීක්ෂණයන් සිදු කරන අතරේ, සියයක පමණ පිරිසක් පැමිණ බාධා කරමින්, තල්ලු කරමින් අපගේ ඇඳුම් හා අත්වලින් අදිමින් අපව මිනී මරුවන් ලෙස හඳුන්වා ඉතා පහත් වචනවලින් අපහට බැණ වැදී අප පැමිණි කටයුත්ත නතර කිරීමට කටයුතු කරන ලදී. මෙය ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් වුවත්, මෙම සිදු වීම වන අවස්ථාවේ කිසිදු පොලිස් නිලධාරියකු හෝ ගුවන් තොටුපොළ ආරක්ෂක නිලධාරියකු එහි නොවිය. එය අපගේ විමතියට ලක් වන කරුණක් විය.

පසුව එදිනම පස් වරු 3.00ට පමණ හම්බන්තොට මාගම්පුර වරාය පරිශ්‍රයේ පරිපාලන ගොඩනැඟිල්ලේ බිම් මහල තුළට ද එවැනිම පිරිසක් පැමිණ සිටි අතර, ඔවුන් අතර මත්තල ගුවන් තොටුපොළ පරිශ්‍රයේදී අප හට බාධා කළ පුද්ගලයින් ද දක්නට ලැබුණි. ගරු කථානායකතුමනි, මා කලින් සඳහන් කළ ස්ථානයේ සිටි පිරිසත් මෙම ස්ථානයට පැමිණ සිටියා. ඒකයි තිබෙන වැදගත් කාරණය.

එහිදී අප කළ පෙර දැනුම් දීම පරිදි පැමිණි සහකාර පොලිස් අධිකාරිවරයකු සහ මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයකු ඇතුළු පහළොස් දෙනකුගෙන් පමණ සැදුම්ලත් පොලිස් කණ්ඩායමක් බලා සිටියදී, අපට බිත්තරවලින්, තක්කාලිවලින් සහ ගල්වලින් පහර දෙන ලදී. තවද, ආයුධ සන්නද්ධ පුද්ගලයින් මෙහි සිටි අතර, අපි බස් රථයෙන් පිටත් වන විට ඔවුන් අප පසුපස හඹා විත් අපගේ ජීවිතවලට හානියක් කිරීමට උත්සාහ ගත් බව පැහැදිලිව දක්නට ලැබුණි. ජාත්‍යන්තර වරායක් යැයි කියා ගන්නා ස්ථානයක එහි පරිපාලන ගොඩනැඟිල්ලේ බිම් මහලට ආයුධ සන්නද්ධ මැර කණ්ඩායමකට ඇතුළු වීමට හැකි වූයේ මෙය පිටුපස රජයේ ප්‍රබල හස්තයක් ඇති නිසා බව ඉතා පැහැදිලිය. මෙයින් පිළිබිඹු වන්නේ අප ගිය අරමුණ වැළැක්වීමට රජයට අවශ්‍යතාවක් තිබූ බවය.

තවද, අප ගමන් ගත් බස් රථය පසුපස පැමිණි පොලිස් ජීප් රථයට නතර කරන ලෙස අප සංඥා කළත්, ඔවුන් නතර නොකිරීමෙන් පෙනී යන්නේ පොලීසියට අපව ආරක්ෂා කිරීමේ අරමුණක් නොතිබූ බවත්, ඔවුන්ට නීතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍යතාවක් නොතිබූ බවත්ය කියන එක මා ඉතාම පැහැදිලිව මතක් කරන්න ඕනෑ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පරිපාලනය පාර්ලිමේන්තුව සතු වේ. එකී බලය ක්‍රියාත්මක කිරීම උදෙසා රාජ්‍ය දේපොළ තුළට ඇතුළු වී ඒවා පරීක්ෂා කිරීම අත්‍යවශ්‍ය වන අතර, සම්ප්‍රදාය තුළින්ද පිළිගත් එම වරප්‍රසාදය ඉහතකී පරිදි උල්ලංඝනය වී ඇත. ඔබතුමාත් ඊයේ පිළිගත්තා, ඔබතුමන්ලාත් ඒ කාලයේ ඒ විධියට කළා කියලා. ඒ ප්‍රකාශය කිරීම සම්බන්ධව අපි ඔබතුමාට ගරු කරනවා.

තවද, ඉහත විස්තර කරන ලද මැර කණ්ඩායමේ ක්‍රියා කලාපය හේතුවෙන් පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනයේ "අ" කොටසේ අංක 01 අයිතමයේ විස්තරකොට ඇති ආකාරයේ බරපතළ වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් සිදුකොට ඇත.

ගරු කථානායකතුමනි, අද වනතෙක් මේ සැකකරුවන් අත් අඩංගුවට ගෙන නැහැ. ඒකෙන් අපට සැකයක් ඇති වෙනවා. මොකද, මේ පිස්තෝලය සෙල්ලම් පිස්තෝලයක් කියලා කිව්වා. අපට ලොකු සැකයක් ඇති වෙනවා, මේ සැබෑ පිස්තෝලයට සමාන ප්ලාස්ටික් සෙල්ලම් පිස්තෝලයක් ඒ mould එකෙන් හදලා එනකන්ද මේ සැකකරුවන්ව අත් අඩංගුවට ගන්නේ නැත්තේ කියලා. ගරු කථානායකතුමනි, අපට ඒ ගැන ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, දැනට සතියක් විතර ඉක්ම ගිහිල්ලාත් මේ සැබෑ පිස්තෝලය අත් අඩංගුවට ගන්නේ නැත්තේ ඒ හා සමාන සෙල්ලම් පිස්තෝලයක් හදනකන්ද කියන සැකය ඇති වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මන්ත්‍රීතුමා, මට ඉදිරිපත් කර තිබෙන ටික විතරයි මේ අවස්ථාවේ දී කියවන්න පුළුවන්. එහි නැති ඒවා කියවන්න බැහැ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

එසේ හෙයින් ඉහත කී කරුණු පිළිබඳව සොයා බලා මාගේ පාර්ලිමේන්තු වරප්‍රසාද සහ පරිහාර උල්ලංඝනය කිරීමේ වරද සිදු කළ තැනැත්තන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කරන මෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මටත් මොහොතක් දෙන්න. අපේ ගරු මන්ත්‍රීවරුන් පස් දෙනාම ඔබතුමාගේ අනුග්‍රහය ඇතිව වරප්‍රසාද ප්‍රශ්න ඉදිරිපත් කළා. මේ ප්‍රශ්නය විභාග කිරීම සඳහා වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට හැකි ඉක්මනින්ම යොමු කළ යුතුයි. එහෙම නැතිව මෙය කල්ගත වුණොත් මේ වරප්‍රසාද ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ කිසිම ඵල ප්‍රයෝජනයක් නැති වනවා. මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. අපි හැකි ඉක්මනින්ම එය වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කරනවා. මොකද, මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්නයක් නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එපමණක් නොවෙයි, ඒ සඳහා පොලිස්පතිතුමාටත්, ඒ වාගේම පොලිසියේ ප්‍රධානීන්ටත්, නගරාධිපතිතුමාටත් සිතාසි කරලා පාර්ලිමේන්තුවට ගෙන්වලා මේ පිළිබඳව ඔවුන්ගෙන් කරුණු විමසන්නට ඕනෑය කියා විපක්ෂය වෙනුවෙන් මා ඉල්ලීමක් කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ සම්බන්ධයෙන් වරප්‍රසාද පිළිබඳ කමිටුව තීරණයක් ගෙන අපට දැනුම් දෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේත් විපක්ෂ නායකතුමා වෙනුවෙන් වැඩ බලනවාද කියලා මම දන්නේ නැහැ. නැහැ නේද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කිසිම වුවමනාවක් නැහැ. මටත් පොඩි ප්‍රශ්නයක් අහන්න ඔබතුමා අවසර දෙනවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, නැහැ, වෙලාව ගත වෙලා තිබෙනවා. ඊයේත් කථා කරන මන්ත්‍රීවරුන්ගෙන් මිනිත්තු පහ ගණනේ අඩු වුණා.

ප්‍රධාන කටයුතු ආරම්භයේ දී යෝජනා, ගරු සභානායකතුමා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2011.04.07 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.30 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතුය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### ශ්‍රී ලංකා ෆාතිහ් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### இலங்கை பாதிஹ் நிறுவனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### FATHIH INSTITUTE OF SRI LANKA (INCORPORATION) BILL

**ගරු එම්.එස්. තව්ෆික් මහතා**
(மாண்புமிகு எம்.எஸ். தௌபீக்)
(The Hon. M.S. Thowfeek)
Sir, I move,

"That leave be granted to introduce the Fathih Institute of Sri Lanka".

**ගරු ජානක බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஜானக பண்டார)
(The Hon. Janaka Bandara)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත ගරු බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and Religious Affairs for report.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා මොකක්ද කියන්නේ? වරප්‍රසාද ප්‍රශ්නයක්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදයක් පිළිබඳව තමයි මම අහන්නේ. ඊයේ ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති පක්ෂ නායක රැස්වීමේදී විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් අපි කථා කළා.

අපේ සම්ප්‍රදාය වන්නේ ඒක භාර දුන්න විගසම විවාද කිරීමයි. නමුත් ගරු කථානායකතුමනි, මේ විවාදය කල් ගිහිල්ලායි තිබෙන්නේ. අපි ඒ ගැන ඇහුවාම අප්‍රේල් මාසයේ කියනවා, මැයි මාසයේ කියනවා. තවමත් දිනයක් දීලා නැහැ. මේ තුළින් අපව දැනුවත් කරලා තිබෙනවා, පාර්ලිමේන්තුව prorogue කරන්න; කල් දමන්න හදනවා කියලා. ඔබතුමාගේ ආසනයට ගිහින් හිරිහැරයට ලක් වුණු අපේ අහිංසක මන්ත්‍රීවරු පස් දෙනා වෙනුවෙන් අපි Select Committee එකක් ඉල්ලා තිබෙනවා. ඔබතුමා ඒ සම්බන්ධයෙන් ඊයේ කළ ප්‍රකාශය අපි අගය කරනවා. මේවා ඔක්කොම යටපත් කරන්නද මේවා කරන්නේ කියන ප්‍රශ්නය අපට මතු වෙලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේවා කල් යන්නේත් දෙපක්ෂයම එකට එකතු වෙලා එකඟතාවෙන්. මගේ ඉස්සරහම නේ, වෙන්නේ. එක එක්කෙනාගේ වුවමනාවට කල් තබා ගන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි මම මේ අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේවා ඉක්මන් කළොත් තමයි හොඳ කියලායි මම කාට කාටත් කියන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ සඳහා දවස් දෙකක් ඉල්ලුවාම ජූනි මාසයට කල් දමනවා. මැයි මාසයේ ආණ්ඩුවේ වැඩත් නැහැයි කියලා අපට ඕනෑ තරම් පෙනෙනවා. ලබන බ්‍රහස්පතින්දා, සිකුරාදා කිසි වැඩක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, ඊයේ තීරණය කළා -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ ගැන ඊයේ කථා කළ ස්වරූපයෙන් මේක කල් දමන්න උත්සාහ කරනවා කියලා අපට පෙනෙනවා. එහෙම නම් අපි නැවත ගේනවා. එකක් නොවෙයි, දෙකක් නොවෙයි, තුනක් ගේනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
දහයක් ගේන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ වාගේ උපක්‍රම පාවිච්චි කරන්න අවශ්‍ය නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ඒ ගැන පක්ෂ නායකවරුන්ගේ රැස්වීමේදී -

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමේදී අපි මේ ගැන සාකච්ඡා කළා. පක්ෂ නායක රැස්වීමේදී කළ සාකච්ඡා මේ ගරු සභාවට ඇවිල්ලා කථා කරනවා. මේවා මාධ්‍යයට දෙන්න ඕනෑ නම් වෙනත් විධියකට කරන්න. එහෙම නැතිව මෙතුමා කරන ක්‍රියාවලිය ක්‍රමවත් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි කරන්න ගියාට හිතන දේ නොවෙයි, වෙන්නේ. මේ කරන්නේ මන්ත්‍රීවරුන් අභිබවා යාමක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙතැන තමන්ගේ අවශ්‍යතාවන් කථා කරන්න බැහැ. මේවා කරන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ නිසා කරුණාකර විපක්ෂ නායකතුමා හෝ විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හරහා මේවා ඉදිරිපත් කරන්න. එතකොට කරන්න පුළුවන්.

ප්‍රධාන කටයුතු - අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් ඉදිරිපත් කිරීමට.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ඒ නියමයන් සම්බන්ධයෙන් ඡන්දය විමසන්න බලාපොරොත්තු වෙන්නේ කීයටද කියා දැන ගන්න කැමතියි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
පස්වරු 6.00ට.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අප එයට විරුද්ධව ඡන්දය පාවිච්චි කරනවා. ඒ වාගේම නමින් ඒ ඡන්දය ගන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
හොඳයි. ඔබතුමා නමින් ඡන්දය ගන්න කියලා ඉල්ලන්න. ප්‍රශ්නයක් නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒ වාගේම අප එයට සංශෝධනයක් ඉදිරිපත් කරනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
සංශෝධන භාර ගන්න බැහැ කියලා ඊයේ ගරු කථානායකතුමා කිව්වා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම ඊයේ ඒ පිළිබඳව පැහැදිලිව ප්‍රකාශ කළා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එතුමා ඊයේ තීන්දුවක් දුන්නා. ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමනි, ඔබතුමා නිකම් කාලය නාස්ති කරන්න එපා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒක වෙනම ගැසට් නිවේදනයක්. අද ඉදිරිපත් කරන්නේ වෙන ගැසට් නිවේදන දෙකක්. මේ දෙක වෙන වෙනම යන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නියමයන් පිළිබඳව සංශෝධන දිය නොහැකියි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම ඒ සංශෝධනය කියවන්නම්, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එයට ඉඩ දෙන්නත් බැහැ. [බාධා කිරීමක්] ඉඩ දිය නොහැක.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා දැන් එම නියමයන් ඉදිරිපත් කරනු ලබනවා. ඇමතිතුමාට විනාඩි 25ක් තිබෙනවා.

## ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත : නියමය
## செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் சட்டம் : கட்டளை
## STRATEGIC DEVELOPMENT PROJECTS ACT : ORDER

### I

[අ.භා. 2.42]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - முதலீட்டு ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Minister of Investment Promotion)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජනවාරි 30 දිනැති අංක 1847/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.02.18 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, අද දින මෙම ගරු සභාවට ඉදිරිපත් කරන ලද ගැසට් පත්‍රය මීට කලින් මේ ගරු සභාවට ඉදිරිපත් කරලා සංශෝධිත ගැසට් පත්‍රයක් හැටියට නියමානුකූලව මහ ජනතාවට දැනුම් දීලා, මහ ජනතාවගේ අදහස් විමසීම සඳහා දින 43ක කාලයක් ලබා දුන්නා. ඒ අනුව ඒ පිළිබඳව කිසිම විරෝධතාවක් හෝ මතයක් ප්‍රකාශ නොවුණු නිසා මහ ජනතාව පිළිගත් ක්‍රමවේදවලට අනුකූලව මෙම ගැසට් පත්‍රය අප නැවත නිකුත් කරලා එම නියමයන් පිළිබඳව අද අප මෙම ගරු සභාවේ සාකච්ඡා කරනවා.

ගරු කථානායකතුමනි, මා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අද ඉදිරිපත් කරන පළමුවෙනි ව්‍යාපෘතිය මේ රටේ ඉතාම සුප්‍රසිද්ධ ව්‍යාපාරයක් වන ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයේ ආයෝජනයක් බව. දේශීය ව්‍යාපාරිකයකු වන ජෝන් කීල්ස් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම වෝටර්ෆ්‍රන්ට් ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් ව්‍යාපෘතියක් ආරම්භ කරන්න තීන්දු කර තිබෙනවා. 1870 දසකයේ මුල් අවධියේ නිෂ්පාදන හා විනිමය තැරැව්කරුවකු ලෙස ඇරඹි ජෝන් කීල්ස් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම ආර්ථික වර්ධන අංශය ලුහුබැඳ යමින්, අඛණ්ඩව ප්‍රතිෂ්ඨාපනය වෙමින් සහ නව සොයා ගැනීම් කරමින් පවත්වාගෙන යන ආයතනයක් ලෙස ප්‍රසිද්ධියට පත්ව තිබෙනවා. වර්තමාන කොළඹ කොටස් වෙළෙඳ පොළෙහි විශාලතම සමාගම් ලැයිස්තුව තුළ ජෝන් කීල්ස් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම ලැයිස්තුගත වෙලා තිබෙනවා. වර්තමානයේ මෙම සමාගම බහුවිධ ව්‍යාපාර කටයුතුවල තම ආයෝජන සිදු කර තිබෙනවා. හෝටල් අංශය, පෞද්ගලික අංශයේ හිමිකාරත්වය යටතේ ඇති ප්‍රවාහන ව්‍යාපාරය, තේ වෙළෙඳාම, කොටස් වෙළෙඳාම, බැංකු, දේපොළ වෙළෙඳාම, ප්‍රවර්ධන කටයුතු, ආහාරපාන නිෂ්පාදනය, සුපිරි වෙළෙඳ සැල්, වරාය හා නාවික ඉන්ධන සේවා සැපයීම, තොරතුරු තාක්ෂණ විසඳුම් ඒ අතර වෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ලෝකයේ පවතින පහත සඳහන් ව්‍යාපාර සමඟ සහයෝගිතාව පවත්වාගෙන යනවා. ඩීඑච්එල්, ඇමෙරිකන් එයාර් ලයින්ස්, ටොෂිබා, තෝමස් කුචෝනි යන ව්‍යාපාර ඒ අතර වෙනවා. වෙළෙඳ පොළ ප්‍රාග්ධනීකරණය දෙස බැලීමේදී කොළඹ කොටස් වෙළෙඳ පොළේ සමාගම් ලැයිස්තුවෙහි ඇති විශාලතම සමාගම්වලින් එකක් වෙනවා. ඒ වාගේම කේන්ද්‍රීය කර්මාන්ත කටයුතුවල නියැලී සිටිනවා. පාරිභෝගික ආහාර සහ සිල්ලර වෙළෙඳාම යටතේ, පාන වර්ග, ශීත කරන ලද ආහාර සහ "අලියා" කාබනීකෘත මෘදු පාන, එලිෆන්ට් හවුස් අයිස්ක්‍රීම්, කීල්ස් සහ ක්‍රෙස්ට් පරාසයේ සැකසූ මස් සහ වෙනත් දේවල් තිබෙනවා.

Ceylon Cold Stores, Keells Food Products PLC ඇතුළු සමාගම් සතු ප්‍රමුඛ පෙළේ වෙළෙඳ සන්නාම නාම යටතේ විවිධාකාර ව්‍යාපාර ඔවුන් මේ රටේ පවත්වාගෙන යනවා.

විශේෂයෙන්ම මේ සමාගම ඉදිරිපත් කළ ආයෝජනය හා ඒ ආයෝජනයේ තිබෙන වැදගත්කම සලකා බලා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ඔවුන්ට අවශ්‍ය පහසුකම් සලසා දීමට කටයුතු කරනවා. මේ ව්‍යාපෘතිය තුළින් එක පැත්තකින් මේ රටේ ජනතාවගේ රැකියා ප්‍රශ්නයත් විසඳෙනවා. මේ රට ඉතා ඉහළ මට්ටමේ සංචාරක මධ්‍යස්ථානයක් බවට පත් කර ගැනීම සඳහා වූ මූලික අඩිතාලම දැමීම සඳහා මෙවැනි හෝටල් සංකීර්ණ කොළඹ නගරය තුළ විශේෂයෙන් ඉදි විය යුතු යැයි අප කල්පනා කරනවා. එහෙම කල්පනා කරලා තමයි ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ඇති පහසුකම් ඒවාට ලබා දී තිබෙන්නේ. මේ සමාගම උපදේශනය, මෘදුකාංග සේවා සහ කාර්යාලීය ස්වයංකරණය වාගේ නොයෙකුත් අංශවලින් ලෝකයේ විවිධ රටවල් සමඟ බැඳී සිටිනවා. ඒ නිසා ජාත්‍යන්තරය පිළිගත්ත සමාගමක් හැටියට මේ සමාගමේ ආයෝජනය මේ රටට ඉතාම වැදගත් වේවි කියා කල්පනා කරලා, අප මේ ආයෝජනය සඳහා අනුමතියක් ලබා දීලා තිබෙනවා.

විශේෂයෙන් අද ප්‍රධාන වශයෙන්ම ආසියාවේ සංචාරක ව්‍යාපාරය ඉතාම ඉහළ මට්ටමකට පැමිණෙමින් තිබෙනවා. ආසියාවේ ජීවත් වන අය සංචාරය සඳහා යනවා වාගේම, සංචාරක ව්‍යාපාරය සඳහා ඉතා හොඳ තත්ත්වයේ පසු බිමක් සකස් කර ගෙන ලංකාව පළමුවන ස්ථානයේ ඉන්නවා. ඒ නිසා යුද්ධයෙන් පස්සේ ලංකාවේ අපි ඇති කළ සාමකාමී වාතාවරණය තුළ, සාමකාමී රටක් හැටියටත්, ඉතා හොඳ දේශපාලන ස්ථාවරභාවය තිබෙන රටක් හැටියටත්, අනෙකුත් සම්පත් තිබෙන රටක් හැටියටත් සලකා නොයෙක් විධියේ ආයෝජකයන් සහ සංචාරකයන් මේ රටට ගෙන්වා ගැනීමේ ක්‍රමවේදයක් අප සකස් කර ගත යුතු වෙනවා.

අපට ලෝකයේ තනිවෙලා ජීවත් වෙන්න බැහැ. පුද්ගලයන් තුළ විවිධ මත, දේශපාලන මත තිබෙන්න පුළුවන්. නමුත් රටක් වශයෙන් අපි ඉස්සරහට යන්න නම්, ප්‍රධාන වශයෙන් අපේ රටට ආයෝජන අවශ්‍යයි.

ගරු කථානායකතුමනි, චීනයෙන් පිටතට යන සංචාරකයන් ප්‍රමාණය තමයි අද ලෝකයේ විශාලතම සංචාරකයන් ප්‍රමාණය. විශේෂයෙන්ම පසු ගිය අවුරුදු දහය තුළ ඇමෙරිකාව, ජර්මනිය ඇතුළු යුරෝපයේ රටවල අයට වඩා චීනයේ අය රටින් පිට සංචාරයේ යන්න පටන් ගෙන තිබෙනවා. චීනයේ තවම passports නිකුත් කරලා තිබෙන්නේ ඒ ජනතාවගෙන් සියයට 5ක පිරිසකටයි. මේ සියයට පහක ප්‍රමාණයත් අනෙක් රටවල සංචාරකයන්ට වඩා වැඩි ප්‍රමාණයක්. ඒ අනුව, සංචාරය සඳහා චීනයෙන් පිටවන අය අද විශාල ප්‍රමාණයක් බවට පත් වෙලා තිබෙනවා. 2013 අවුරුද්දේ චීන සංචාරකයන් ඇමෙරිකන් ඩොලර් බිලියන 130ක් පිට රටවලට වැය කර තිබෙනවා. මේක තමයි අප කල්පනා කළ ප්‍රධාන කාරණය. තවම සියයට 5කට පමණ පාස්පෝට් තිබෙන චීන ජාතිකයන් ඇමෙරිකන් ඩොලර් බිලියන 130ක් ගිය අවුරුද්දේ විදේශීය රටවලට ගිහින් වියදම් කර තිබෙනවා. අපි මේ වෙළෙඳපොළ ගැන අපට තිබෙන ආසියානු සම්බන්ධතා අනුව කල්පනා කළොත්, මේ වෙළෙඳපොළ ලංකාව වාගේ රටකට ඉතාම වැදගත් වෙනවා.

මා ඒ කරුණු සඳහන් කළේ ලෝක සංචාරක සංවිධානය නිකුත් කළ නිවේදනයකින්. එහි සඳහන් ආකාරයට සංචාරකයකු හැටියට පිට රටකට ගියාම - average එක අනුව- වැඩියෙන්ම වියදම් කරන්නේ චීන ජාතිකයන්. චීන සංචාරකයෙක් සංචාරය කරන කාලය තුළ දළ වශයෙන් US Dollar 1,230ක් වියදම් කරනවා. අද වැඩිම මුදලක් වැය කරන සංචාරකයන් එන්නේ චීනයෙන්. ඊළඟට, රුසියාව වැනි අනික් රටවලුත් තිබෙනවා. මේ සංචාරකයන් සඳහා Integrated Tourism Resort Projects ඇති කරන්න අවශ්‍යමයි. එය ඇති කරන්න නම් සංචාරකයාට අවශ්‍ය පසු බිම සකස් කරන්න ඕනෑ. ඔවුන්ගේ සංචාරක කාල සීමාව නිදහසේ ගත කරන්න, ඔවුන්ට මේ රටේ විවිධ ස්ථාන බලන්න යන්න මේ රටේ පහසුකම් ඇති කරන්න ඕනෑ. ඔවුන් ආකර්ෂණය වන ලෙස මේ රටේ පසු බිම සකස් කරන්න අපි අපේ සංස්කෘතියත්, අපේ අනික් අංශත් පාලනය කර ගෙන, ඒවාට හානි නොවන ආකාරයට ක්‍රියා කරනවා. සිංගප්පූරුවේ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන කොට යම් යම් කාරණා සම්බන්ධයෙන් නොයෙක් චෝදනා ඉදිරිපත් වුණා. නමුත් අද මේ රටේ ඉන්න බහුතරයක් සිංගප්පූරුවට සංචාරය කරලා තිබෙනවා. අද බොහෝ දෙනෙක් සිංගප්පූරුව ගැන විවේචනය කරන්නේ නැහැ. විවේචනය කරන්නේ නැත්තේ, ඒ රටේ නීතිය රැකිලා තිබෙන නිසායි, ඒ වාගේම විනාශයක් වෙලා නැති නිසායි. මේ කාරණා සලකා බැලුවාම පිටින් එන සංචාරකයකු ආකර්ෂණය වන ලෙස අපේ පසු බිම තුළ මේ රටේ පහසුකම් ටික අපි සකස් කළ යුතුයි. ඒක තමයි අපේ පරමාර්ථය වුණේ. ඒ නිසා තමයි මහින්ද රාජපක්ෂ ආණ්ඩුව යටතේ 2010 - 2013 අතර කාලය තුළ ආයෝජනය සියයට 72ක් වැඩි වුණේ. ප්‍රධාන වශයෙන්ම ඒ ආයෝජනය වැඩි වෙන්න හේතු වුණේ, මේ වකවානුව තුළ මේ රට ගැන විශ්වාසනීය පසු බිමක් අපට සකස් කර ගන්න පුළුවන් වීමයි.

අනික් රටවල් එක්ක සසඳා බලන විට විශේෂයෙන්ම චීන ජාතිකයන්ගේ ආදායමත් එක්ක ඔවුන් වියදම් කරන ස්වභාවය පිළිබඳ ලේඛනයක් හැන්සාඩගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, මේ ස්වභාවයට අපි හැඩ ගැසුණේ නැත්නම්, ඉතාම කෙටි කාලයක් තුළ රටට ආදායම් ලබා ගන්න ක්‍රමයක් අපි සකස් කර ගත්තේ නැත්නම් අපට කවදාවත් සියයට 8ක ආර්ථික වර්ධන වේගයකට යන්න බැහැ. අපි සියයට 8ක ආර්ථික වර්ධන වේගයකට යන්න නම්, මොන ආණ්ඩුව යටතේ වුණත් ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක විදේශ ආයෝජනයක් අවුරුද්දකට ගෙනෙන්න ඕනෑ. එහෙම නැත්නම් මේ කියන අනිකුත් කාරණා පිළිබඳව කොපමණ දේවල් කළත් වැඩක් නැහැ. අපි යටිතල පහසුකම් සඳහා අසීමිත මුදලක් වැය කරලා තිබෙනවාද කියලා ඔබතුමන්ලා සියලුදෙනාම දන්නවා. පක්ෂ භේදයෙන් තොරව හැම කෙනාම පිළිගන්නවා, ඉදි කර තිබෙන පාරවල් ප්‍රමාණය කොපමණද කියලා. පැය තුනක් වාගේ කෙටි කාලයක් ඇතුළත ලංකාවේ ඕනෑම තැනකට යන්න පුළුවන් විධියට මාර්ග පද්ධතිය ඉතාම ඉහළ මට්ටමින් සකස් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, වාගේම seaplanes වැනි විවිධ ආකාරයේ පහසුකම් සකස් කරලා තිබෙනවා. අද ප්‍රධාන වශයෙන් ගාල්ල දක්වා අධිවේගී මාර්ගය හා මාතර දක්වා අධිවේගී මාර්ගය ඉදි කර තිබෙනවා. මහනුවර දක්වා අධිවේගී මාර්ගය ඉදි කර ගෙන යනවා. ඒ වාගේම ගම් ඇතුළේ තිබෙන පාරවල් බලන්න. අද මේ කාලය වන කොට මේ ආණ්ඩුව යටතේ මේ සියලු දේවල වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. මේ වර්ධනයත් එක්ක අසීමිත මුදල් ප්‍රමාණයක් අපි යටිතල පහසුකම්වලට වැය කරන කොට ඒවා ආණ්ඩුවට ආදායමක් හැටියට ගන්න අපි කටයුතු කරන්න ඕනෑ. ප්‍රධාන වශයෙන්ම ආකර්ෂණීය තත්ත්වයෙන් අපේ රටේ සම්පත් ප්‍රයෝජනයට ගන්න ඕනෑ, අනෙක් අය ගෙන්වා ගැනීම සඳහා. ඒක තමයි මේ ආණ්ඩුවේ පරමාර්ථය. ඒ සඳහා තමයි අපි පසු ගිය කාල පරිච්ඡේදය තුළදී කටයුතු කරන්න උත්සාහ කළේ. මෙය කිසි දවසක නොතිබුණු දෙයක්. 2008ට කලින් මේ වාගේ ආයෝජනයක් ආවාම ඒ ආයෝජනය මේ පාර්ලිමේන්තුවට කියන්න අවශ්‍යතාවක් තිබුණේ නැහැ. එහෙම පනතක් තිබුණේ නැහැ. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තමයි මේක බෙල්ලට දා ගත්තේ, මේවා කියන කොට මහජන නියෝජිතයන්ගෙන් ඒකට අනුමැතිය ගත යුතුයි කියලා. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය. ඊට කලින් ආයෝජනය මණ්ඩලය තුළ ගිවිසුමක් අත්සන් කළා නම් ඒ ගිවිසුමේ තිබෙන කරුණක් සම්බන්ධයෙන් ඕනෑ නම් පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් අහන්න පුළුවන්. ඊට වැඩිය මොකක්ද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට තිබුණු වරප්‍රසාදය? අද ඔබතුමන්ලාට මේ සියලු දේවල් ගැන මෙතැනට ඇවිත් කථා කරන්න පුළුවන්. සංශෝධන ගෙනෙන්න පුළුවන්. ඔබතුමන්ලාට අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඇයි, එහෙම නම් ඊයේ බැහැ කිව්වේ?

---

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

සංශෝධන ගේන්න පුළුවන් පනත්වලටයි. ගැසට් නිවේදනවලට නොවෙයි. පනත්වලට සංශෝධන ගෙනෙන්න. ඔබතුමන්ලාට ගැසට් නිවේදන සම්බන්ධයෙන් සංශෝධන ගෙනෙන්න අවශ්‍ය නම් ඒ සම්බන්ධයෙන් උසාවියට යන්න පුළුවන්. ගරු කථානායකතුමනි, දවස් 43ක් දුන්නා, උසාවි යන්න. දවස් 43ක්! දවස් 30යි ඕනෑ. දවස් 43ක් දුන්නා, කවුද ගියේ? කවුද, ගිහිල්ලා කථා කළේ? බොරුවට දවස් දෙකක්, මහජන මතයක් ඇති කරන්න 150ක් අරගෙන roundaboutsවල ගිහින් හිටියා. ඊයේත් හිටියා. කෝ, සෙනඟ? කෝ, මේ විපක්ෂයේ සෙනඟ? හිටියාද සෙනඟක්? සෙනඟක් නැහැ. 150යි හිටියේ ගරු කථානායකතුමනි. කෝ, විරෝධතා? මහජනතාවට මේකේ මතයක් නැහැ. මහජනතාව දන්නවා, තමුන්නාන්සේලා මේක අරගෙන විකුණන්න හදන බව. වෙන කිසි දෙයක් නොවෙයි. මේක විකුණාගෙන කන්න හදන්නේ. නමුත් මහජනතාව ඊට වැඩි දෙයක් දන්නවා. ඒ නිසා මොන ආණ්ඩුව ආවත් අපි මේ ආයෝජනය කියන එක කළ යුතුයි ගරු කථානායකතුමනි. ගරු කථානායකතුමනි, ඒ, අපි ඉදිරිපත් කළ පළමුවෙනි කාරණාවයි.

දෙවෙනි යෝජනාව වශයෙන් අපි ඉදිරිපත් කරලා තිබෙනවා, ක්‍රවුන් සමාගම සම්බන්ධයෙන්. ක්‍රවුන් සමාගම විවිධාංගීකරණය වූ බහුවිධ ව්‍යාපාර ලෝකයේ ගෙනියන්නේ. ඒකට එක අර්ථකථනයක් විතරක් දීලා මහජනතාව අතර ලොකු මතයක් ඇති කරන්න හදනවා. මේ කිසිම දෙයක් අපි මහජනතාවට හංගලා කළේ නැහැ. මේ හැම දෙයක්ම තමුන්නාන්සේලා අර්ථකථනය කරන්න හැදුවාට එහෙම දෙයක් මේක ඇතුළේ නැහැ. මේ සමාගම ප්‍රකාශන කරනවා; රූපවාහිනී ප්‍රචාරණ කරනවා; ගුවන්විදුලි ප්‍රචාරණ කරනවා; විනෝදාත්මක කටයුතු කරනවා; චිත්‍රපට කර්මාන්තය කරනවා; විනෝද උද්‍යාන කරනවා; හෝටල් හා විස්තීර්ණ නිකේතන පවත්වා ගෙන යනවා; තොරතුරු තාක්ෂණය පවත්වා ගෙන යනවා.

ක්‍රවුන් කියන්නේ ඕස්ට්‍රේලියාවේ විශාලතම සමාගමයි. ඕස්ට්‍රේලියාවේ තුන්වන සල්ලිකාර ව්‍යාපාරිකයෙක් ලංකාවට ඇවිල්ලා හෝටලයක් පටන් ගන්නවා නම්, ලංකාවේ තිබුණු පොදුරාජ්‍ය මණ්ඩලයීය සමුළුවේදී ඔහු ඇවිල්ලා කියනවා නම්, "ලංකාව දර්ශනීය තැනක්, ලෝකයේ සංචාරකයෝ ආකර්ෂණය කර ගන්න පුළුවන් තැනක්, මෙහි තිබෙන සම්පත් මේ කිට්ටුව ඇති කිසිම රටක නැහැ, මේක ආකර්ෂණීය ස්ථානයක්" කියලා, ලෝකයේ සංචාරක ප්‍රජාවට ලංකාව තුළ සිට කථා කරලා ඔහු එසේ කියනවා නම් මොකක්ද ඒ දෙන පණිවිඩය? මම දන්නවා, මේ සංස්කෘතිමය අයිතීන්, මේ සියලු දේවල් ගැන විපක්ෂය කථා කළ හැටි. ඒ කාලවල ගාලු කොටුව පෞද්ගලික අංශයට දෙන එක ගැන කථා කරන කොට, සීගිරිය laser shows කරලා market කරන්න කථා කරන කොට ඔය කියන සංස්කෘතියක් ගැන කථා කළේ නැහැ. ඔය තරම් රටට ආදරේ විධියට කථා කළේ නැහැ. මම දන්නවා, ඒ සියලු දේවල්. අපට ඒවා අරගෙන කියන්න පුළුවන්. නමුත් මේ ආණ්ඩුව යටතේ පසුගිය වකවානුව ඇතුළත මේ හැම දෙයක්ම පාලනය කර ගෙන කටයුතු කරන්න අපි උත්සාහ කළා. අපි මේ හැම දෙයක්ම විනිවිදව මිනිසුන්ට කිව්වා. අපි මහජන මතයට කන් දුන්නා. මේ පාර්ලිමේන්තුව තුළ මේ හා සම්බන්ධ ගැසට් නිවේදනය ගැන විවිධ මත ඇති කරන කොට අපට ජනාධිපතිතුමා කිව්වා, "නැහැ, කමක් නැහැ, ගැසට් නිවේදනය ඉවත් කර ගන්න. ඉවත් කර ගෙන මාසයක් කල් දෙන්න. එහෙම කියනවා නම්, ඒ කියන ඒවා ඉවත් කර ගන්න. ඉවත් කර ගෙන මිනිසුන්ගේ මතයට ඉඩ දෙන්න." කියලා. දවස් 43ක් ඒ මතයට ඉඩ දීලායි අපි පාර්ලිමේන්තුවට ආවේ. නමුත් අපට ආයෝජන එන එක නවත්වන්න බැහැ. අපි දන්නවා, මේවායේ පිටුපස විවිධ බලවේග තිබෙන බව. මොකද, 2012 වසරට සාපේක්ෂව 2013 වසරේ විදේශීය ආයෝජන ප්‍රමාණයේ සියයට 42ක වැඩි වීමක් වෙලා තිබෙනවා. තව අවුරුදු කීපයක් නිදහසේ මේ විධියට ගියොත් මේ ආණ්ඩුවට තවත් විදේශීය ආයෝජන එනවා. ආණ්ඩුවට බිලියන 3ක්, 4ක් දක්වා විදේශීය ආයෝජන ආවොත්, මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 8 ප්‍රමාණයක පවත්වා ගෙන යන්න අපට පුළුවන්. මේ රටේ ඒක පුද්ගල ආදායම වැඩි වූ හැටි ඔබතුමන්ලා දන්නවා. ඒවා බොරුයි කියලා කියන්න බැහැ. පසු ගිය වකවානුවත් එක්ක සන්සන්දනය කරන කොට මේ වකවානුවේ ඒක පුද්ගල ආදායම ශීඝ්‍ර ලෙස වැඩි වී තිබෙනවා. මම ඊයේ මේ පාර්ලිමේන්තුවේදී ඒක පෙන්වා දුන්නා. පසු ගිය අවුරුදු ගණනත් එක්ක සන්සන්දනය කළාම මේ වන කොට ඒක පුද්ගල ආදායම සියයට 350කින් වැඩි වෙලා තිබෙන ආකාරය මම පෙන්වා දුන්නා.

ගරු කථානායකතුමනි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මේ ගරු සභාවට ඇවිල්ලා එළියට ගියා. නමුත් මට ඉතාමත්ම කනගාටුයි, ඊයේ මේ පාර්ලිමේන්තුවේදී මම කරපු ප්‍රකාශය සම්බන්ධව එතුමා මහ බැංකු වාර්තාවේ සඳහන් එක් පිටුවක ඉහළ කොටස පමණක් කියවීම ගැන. එතුමා ඒ පිටුවේ පහළ කොටස කියෙව්වේ නැහැ. ඉහළ කොටස කියවලා එතුමා කිව්වා, "එහෙම ආදායමක් නැහැ" කියලා. FDI ගැන සඳහන් පහළ කොටස එතුමා කියෙව්වේ නැත්තේ ඇයි? මම ඒ පිටුව හැන්සාඩගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

මම එතුමාට දෙන්න ලිපිගොනුවක් ගෙනාවා. එතුමා හිටියා නම්, මහ බැංකු වාර්තාවේ ඒ පිටුවත් එක්ක මේ ලිපිගොනුව දෙන්න තිබුණා. කරුණාකර මේ කොටස කියවන්න කියලා මා එතුමාට කියනවා. ගරු කථානායකතුමනි, මේ වැදගත් පාර්ලිමේන්තුවේ; මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ එතුමා කියෙව්වේ මේ කොටස පමණයි. ගරු කථානායකතුමනි, මහ බැංකු වාර්තාවේ 145 වෙනි පිටුවේ සඳහන් මෙම කොටස එතුමා කියෙව්වා.

> "Total direct investment during 2013 amounted to US dollars 916 million, compared to US dollars 941 million in 2012"

ඒ කොටස විතරයි එතුමා කියෙව්වේ, ගරු කථානායකතුමනි. ඒ පිටුවේම යටින් මෙසේ කියා තිබෙනවා:

> "...FDI received by BOI companies including loans, from US dollars 1,279 million in 2012 to US dollars 1,391 million in 2013"

ඒ පිටුවේම යටින් මේ කොටස තිබියදී තමයි එතුමා අර ඉහළ කොටස පමණක් කියෙව්වේ. ඒක වැරදියි. අපි නම් මේ පාර්ලිමේන්තුවේ නිවැරදි විධියට ගණන් හිලව් කියනවා. එතුමා කියපු දෙය අද හැන්සාඩ් වාර්තාවෙන් මම නිවැරදි කරනවා. ඒ වාගේම එතුමාට මම ලිපි ගොනුවක් දෙනවා. මේ කරුණු වැරදි නම්, ඕනෑ වෙලාවක මට කියන්න. මම නිවැරැදි තොරතුරු එවන්නම්. මම හිතන හැටියට මේ වෙලාවේ එතුමා මේ ස්ථානයේ නැහැ. එතුමාට මෙම ලිපිගොනුව ගන්න කියන්න.

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. අපට එකතු වෙන්න තිබෙන අනෙකුත් කොටස් ගැන කිව්වේ නැහැ.

> "Foreign Direct Investment (FDI) including loans increased to US dollars 1,391 million during 2013..."

මහ බැංකු වාර්තාවේ මේ ඔක්කෝම තිබෙනවා. ඒ නිසා පසු ගිය වකවානුව හා සසඳා බැලුවාම එනම්, 1978 වර්ෂයේ ඉඳලා 1994 වර්ෂය වෙනකම් මෙරටට පැමිණි විදේශීය ආයෝජන

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ප්‍රමාණයත්, 2006 වර්ෂයේ මුල් කාර්තුවේ ඉඳලා 2013 වර්ෂය වෙනකම් පැමිණි සම්පූර්ණ විදේශීය ආයෝජන ප්‍රමාණයත් අරගෙන බැලුවාම සියයට 72ක වැඩිවීමක් තිබෙනවා. මේක තමයි ඇත්ත තත්ත්වය. එතකොට මේ ආණ්ඩුව යටතේ මෙරටට පැමිණි විදේශීය ආයෝජන ප්‍රමාණය වැඩි වෙලා නැද්ද? විපක්ෂය මොනවා කිව්වත්, ඒ ප්‍රමාණය අසීමිත ලෙස වැඩි වෙලා තිබෙනවා. එසේ වැඩි වෙලා තිබෙන්නේ ඇයි? අපි මේ රටේ සාමය ඇති කළා; මේ රටේ මිනිසුන්ට නිදහස ලබා දුන්නා; මේ රටේ මිනිසුන්ට විදේශිකයන් එක්ක එකතු වෙලා තමන්ගේ ව්‍යාපාර කරන්න මාර්ගයක් ඇති කරලා දුන්නා; යටිතල පහසුකම් දියුණු කළා; අනෙක් පහසුකම් ටිකත් දුන්නා. මේ සියලු දේවල් නිසා තමයි පසු ගිය වකවානුවේ විදේශීය ආයෝජනවල වැඩි වීමක් වෙලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Sir, I rise to a point of Order. ඔබතුමා ඊයේ කිව්වානේ මට file එකක් දෙන්න තිබෙනවා කියලා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඔව්. ඔබතුමා ඊයේ මහ බැංකු වාර්තාවෙන් උපුටාගෙන ප්‍රකාශ කරපු එක,-

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඔව්, මම කැන්ටිමේ ඉඳලා අහගෙන හිටියේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඔබතුමා බලන්න 145. 5.7.1 "Direct Investment" යටතේ තිබෙන ටික කියවා බලන්න. මම පස්සේ මේ වාර්තාව එවන්නම්. දැන් කියවන්න මට වෙලාව මදි. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ඇමතිතුමාගේ කථාව කරගෙන යන්න. ඔබතුමාට තව විනාඩි 4ක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

මට තව විනාඩි 4යි තිබෙන්නේ. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ණය ඇතුළත් නැතුවද කියලා කියන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ණය නැතුව තමයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඊයේ තමුන්නාන්සේගේ කථාව ඉවර වුණා. ගරු ඇමතිතුමා පිළිතුරක් දෙන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මේ පාර්ලිමේන්තුවට අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. මම ඔක්කෝම දේවල් කියන්නම්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ණය ගැන කියන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ණය කියන්නේ විදේශ රටවලින් එන ණය. [බාධා කිරීමක්] එහෙම කොහොමද? ඇයි, ඒ companiesවලට විදේශ රටවලින් ණය ගන්න බැරිද? ඒවා මේ රටට එන්නේ. [බාධා කිරීමක්] නැහැ, අඩු වෙලා නැහැ. තමුන්නාන්සේ බොරු කියන්නේ. තමුන්නාන්සේ එකතු කරන්නේ නැහැ. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ඇමතිතුමා තමන්ගේ කථාව කරගෙන යන්න. ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. ගරු ඇමතිතුමාට තව විනාඩි 2යි තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

මෙහේ ආයෝජනය කරන සමාගම් විදේශ රටවලින් ණය ගන්නවා. ඒ අපේ සල්ලි නෙමෙයි. තමන්ගේ සමාගම පුළුල් කරන්න විදේශ රටකින් ණය ගත්තාම ඒක FDI හැටියට එන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

FDI හැටියට යටතේ එනවා නම් ඒක මේ වාර්තාවේ සඳහන් කරන්න එපා යැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඒවා අඩු කරලා තමුන්නාන්සේ කියන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

File එක එවනවාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

File එක එවනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, අපි විදේශීය සමාගම් එක්ක ගනු දෙනු කරන කොට මේ පාර්ලිමේන්තුවේදී අපට බනිනවා. දේශීය

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

වශයෙන් තිබෙන සමාගම් එක්ක එකතු වෙලා සිනෝ ලංකා සමාගම වගේ එකක් ඇති කරලා Hyatt Regency එකේ management එක ගෙනැල්ලා කරන කොට මේ රටේ සමාගම් අතර විශ්වාසයක් ඇති වෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
සිනෝ ලංකා සමාගමේ directorsලා කවුද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
පුද්ගලයෝ නෙමෙයි. රක්ෂණ සංස්ථාව, ගෑස් සමාගම, ඒවා තමයි. පුද්ගලයෝ නෙමෙයි. තමුන්නාන්සේලා පාර්ලිමේන්තුවේදී කථා කළේ පුද්ගලයින්ගේ නම් කියලානේ. ඒකේ ඉන්න සභාපතිගේ නම කියලා කිව්වේ. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, ඒ වාගේම දැනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 1,721යි. ඒ ගැන ඊයේ මගෙන් ඇහුවා. එයින් සියයට 54ක්ම, එනම් ව්‍යාපෘති 921ක් නිෂ්පාදන ආශ්‍රිත ව්‍යාපෘති. සියයට 43ක්, එනම් ව්‍යාපෘති 744ක් සේවා ආශ්‍රිත ව්‍යාපෘති වන අතර, ඉතිරි සියයට 3 කෘෂි කර්මාන්තය ආශ්‍රිත ව්‍යාපෘති.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමාට තව විනාඩියයි තිබෙන්නේ. කරුණාකර බාධා කරන්න එපා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ පවතින මහා පරිමාණ නිෂ්පාදන කර්මාන්ත අතුරින් ලෝඩ්ස්ටාර්, ප්‍රීමා සිලෝන්, සිලෝන් ස්ටීල් කෝපරේෂන්, බ්‍රැන්ඩික්ස් ඇපරල්, හොල්සිම් ලංකා, MAS ෆැබ්රික්ස්, ඇන්සෙල් ලංකා යන ව්‍යාපෘතීන් ප්‍රමුඛස්ථානයක් ගන්නවා.

ගරු කථානායකතුමනි, සේවා සපයන ව්‍යාපෘතීන් අතුරින් ඩයලොග් ඇක්සියාටා, ශ්‍රී ලංකා ටෙලිකොම්, මොබිටෙල්, භාර්ති එයාර්ටෙල්, වෙස්ට් කෝස්ට් පවර්, ලංකා IOC වාගේ සමාගම් රාශියක් දැනට ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම සියලුම පළාත් නියෝජනය වෙන්නේ මේ ආණ්ඩුව යටතේයි. පසු ගිය කාලයේ අපට එය පුළුල් කරන්න පුළුවන්කම ලැබුණා. අද වෙන කොට මේ ව්‍යාපෘති යටතේ 480,000ක් දෙනා රැකියා කරනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ඉදි වෙමින් පවතින ව්‍යාපෘති රාශියක් තිබෙනවා. මේ වන විට ආයෝජන මණ්ඩලය යටතේ ව්‍යාපෘතීන් 258ක් ඉදි වෙමින් පවතිනවා. ඒ වාගේම වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා සූදානම් වෙනවා. ඒ අතරින් 101ක් සේවා සපයන ව්‍යාපෘතීන් වන අතර, 72ක් යටිතල පහසුකම් ආශ්‍රිත ව්‍යාපෘති වේ. 67ක් නිෂ්පාදන ආශ්‍රිත ව්‍යාපෘති වෙනවා. ඒ වාගේම 18ක් කෘෂි කර්මාන්තය ආශ්‍රිත ව්‍යාපෘති වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට ලබා දී ඇති විනාඩි 25ක කාලය දැන් සම්පූර්ණයි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, සේවා සපයන ව්‍යාපෘති අතරින් 49ක් පමණයි හෝටල් ව්‍යාපෘති තිබෙන්නේ. ඒ වාගේම ලෝකයේ ප්‍රකට ෂැන්ග්‍රි-ලා, සිනෝ ලංකා, වෙල්කොම් රීජන්සි වැනි හෝටල්වල ආයෝජනයන් ලංකාවට ගේන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඉදිරියේදී මෙවැනි විස්තීර්ණ නිකේතන වගේ ආයෝජන මේ රටට අවශ්‍ය නිසා තමයි මෙම ගැසට් පත්‍රයේ සඳහන් සහන ලබා දීලා ඒවා ගෙන්වන්න අපි කටයුතු කරන්නේ. පසු ගිය දිනවල ඇති වුණු බාධාවලින් මෙම කටයුත්ත ප්‍රමාද වූ නිසා පක්ෂ භේදවලින් තොරව මේ වාගේ යෝජනාවලට සහයෝගය ලබා දෙන්න කියා අපි මේ පාර්ලිමේන්තුවෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

***සභාමේසය මත තබන ලද වගුව :**
*** சபாபீடத்தில் வைக்கப்பட்ட திட்ட வரைபடம்:**
**Chart tabled:*




***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ.භා. 3.06]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, දැන් මේ සාකච්ඡාව කරන්නේ නියෝගවල මූලික හරයෙන් පිට පැනලා. මූලික හරය හැටියට එක්සත් ජාතික පක්ෂය ඉදිරිපත් කළේ මෙයයි:

"කවර තත්ත්වයක් යටතේ හෝ කිසිදු අවස්ථාවක "ව්‍යාපෘතිය" හෝ එහි ශාඛා හෝ ආශ්‍රිත ව්‍යාපාර තුළ සෘජුව හෝ වක්‍රව කවර හෝ නාමයකින් හඳුන්වනු ලබන්නා වූ සූදු කෙළිය, ඔට්ටු ඇල්ලීම, 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 5 වන වගන්තිය යටතේ අර්ථ නිරූපනය කර ඇති පරිදි කැසිනෝ ද තුරඟ තරග මත පරදු තැබීම බඳු ස්වභාවයේ කිසිදු කටයුත්තක් හෝ කවර හෝ නාමයකින් හඳුන්වන ලබන්නා වූ ගණිකා වෘත්තිය හෝ ගණිකා මඩම් බඳු ස්වභාවයේ කිසිදු කටයුත්තක් ද පවත්වා ගෙන යාම නොකළ යුතු බවත්"

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! මේ අවස්ථාවේදී නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව* කථානායකතුමා *මූලාසනයෙන් ඉවත් වුයෙන්,* නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] *මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்* [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] *தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් ඉතාම පැහැදිලියි අපි නගන තර්කය. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ හෝටල් ඇති කරනවාට අපි විරුද්ධයි කියලා කොහේවත් කියලා නැහැ. විරුද්ධ නැත්නම් ඇයි ඒ පිළිබඳව තර්ක කරන්නේ? සාකච්ඡා කරන්නේ? අපේ තර්කය තිබෙන්නේ මා ඉහත සඳහන් කළ කාරණය පිළිබඳයි. ඒකට ආණ්ඩුව මොකක්ද කියන්නේ? ඒකට ආණ්ඩුව හැටියට ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා සඳහන් කළා, "අපි බදු අය කිරීමේ ක්‍රමයෙන් කැසිනෝ එක අයින් කළා" කියලා. ඒක බොහොම පැහැදිලිව එතුමා කිව්වා. ඉස්සෙල්ලා ගැසට් එකේ තිබුණා, කැසිනෝවලින් බදු අය කරනවා කියන එක. මේ ගැසට් එකේ ඒක කියලා නැහැ. බදු අය කරන්නේ නැහැ කියන්නේ, කැසිනෝ නැහැ කියන එක නොවෙයි. ගරු ඇමතිතුමනි, බදු අය කරන්නේ නැහැ. ඊයේ ඔබතුමාගේ කථාවේ පැහැදිලි කරලා ඒක කිව්වා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)
මට විනාඩියක් දෙන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
බැහැ. එතකොට මගේ වෙලාව යනවා නේ. ඔබතුමා කථා කරන්න ලෑස්ති වෙලා ඉන්නවා නේ. ඒ අවස්ථාවේදී පැහැදිලි කරලා කියන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please give the mike to the Hon. Basil Rohana Rajapaksa.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ප්‍රථම ගැසට් එක නිකුත් කළේ 2013 සැප්තැම්බර් මාසයේ 23වැනි සඳුදා. ඒකේ මෙසේ සඳහන් කර තිබෙනවා:

"…. සම්මේලන මධ්‍යස්ථානයකින් ද, සූදු සහ ඔට්ටු ඇල්ලීමේ පහසුකම් වලින්ද….."

හරිද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හරි.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
දැන් අලුත් ගැසට් එක බලන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒකේ කියන්නේ, බදු අය කරන්නේ නැහැ කියලා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
අලුත් ගැසට් එකේ ඒක නැහැ. අපි කැසිනෝ දාන්න දෙන්නේ නැහැ. අපි ඒක පැහැදිලිව කියනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒක මේ ගැසට් එකේ නැහැ. [බාධා කිරීම්] ගරු ඇමතිතුමා, කැසිනෝ දාන්න දෙන්නේ නැහැ කියලා මේ ගැසට් එකේ කොහේවත් නැහැ. කැසිනෝ දාන්න පුළුවන්. නමුත් බදු අය කරන්නේ නැහැ. ඒක තේරුම් ගන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
රවි විජේරත්නට licence එක අරගෙන දෙන්න- [බාධා කිරීම්]

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
නැහැ, නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු ඇමතිතුමා, තමුන්නාන්සේ ඇයි මුළු සභාවම, මුළු රටම, සංඝයා වහන්සේලා සහ නායක ස්වාමීන් වහන්සේලාම මඟ හරින්න උත්සාහ කරන්නේ? මොකක්ද මේ කියන්නේ?

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ගරු මන්ත්‍රීතුමා, - [බාධා කිරීම්] මේකේ බැරි ඒවා කියන්නේ නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මා ළඟ ගැසට් එක තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොර කැසිනෝ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Joseph Michael Perera, you carry on with your speech.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේලා දෙන්න කිව්වා. ඒ නිසා දුන්නා. [බාධා කිරීම්] මම මේ කියන්නේ ගැසට් එක.[බාධා කිරීම්]

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඒ කාලයේ ඉල්ලුවා. ඒ වුණාට අපි දුන්නේ නැහැ. අපි දෙන්නෙත් නැහැ. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ධම්මික පෙරේරාගේ හොර කැසිනෝ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ධම්මික පෙරේරාගේ සල්ලි ගත්තේ කවුද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කවුද? [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-[බාධා කිරීම්]

"The Island" online newspaper of 5th December, 2013 states, I quote:

"Agreement signed with BOI to build third integrated resort

*Dhammika Perera to invest US$ 350 mn

*80 percent would be foreign investment

The Board of Investment has recently signed an agreement with Queensbury owned by the local gaming tycoon Dhammika Perera to build the third US$ 350 million integrated resort which possibly would include an in-house casino.

Investment Promotion Minister Lakshman Yapa Abeywardena said the BoI had reached an agreement with Queensbury to develop 2.5 acres at D.R. Wijeywardene Mawatha, Colombo.

So far only the initial documents had been signed by both the BoI and Dhammika Perera..."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බොහොම පැහැදිලියි- [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Azwer and Hon. Anura Dissanayake, please sit down.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
බොහොම පැහැදිලියි. මේක අත්සන් කරලා තිබෙන්නේ ධම්මික පෙරේරා. ධම්මික පෙරේරා කියන්නේ කවුද? [බාධා කිරීම්] ධම්මික පෙරේරා කියන්නේ රජයේ නිලධාරියෙක්. අමාත්‍යාංශයක ලේකම්වරයෙක්. [බාධා කිරීම්] ඇමතිතුමා, එහෙම නම් අපට පැහැදිලිව-[බාධා කිරීම්] ධම්මික පෙරේරා කියන්නේ රජයේ නිලධාරියෙක්.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. A.H.M. Azwer. Hon. Azwer, what is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරුන් වියරු වැටෙනවා දකිනවා. මේ පාර්ලිමේන්තුව හරියට ගෙන යන්න දෙන්නේ නැහැ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා. එතුමාව සභාවෙන් පිට කරන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Azwer, please sit down. ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ධම්මික කියන්නේ රජයේ නිලධාරියෙක්. ඔහු සමඟ තමයි BOI එක මේ ගිවිසුම අත්සන් කළේ. මේක තේරුම් ගන්න. රජයේ ප්‍රධාන නිලධාරියෙක් කොහොමද එහෙම කරන්නේ? ලේකම් කෙනෙක්. [බාධා කිරීම්]

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - முதலீட்டு ஊக்குவிப்பு பிரதி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Deputy Minister of Investment Promotion)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being by the Hon. Faiszer Musthapha.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
What is the point of Order? Tell me whether you have signed an agreement with Dhammika or not. He is the Secretary to a Ministry. මගේ පළමුවෙනි ප්‍රශ්නය ඒකයි. මෙන්න මෙහෙම තමයි තමුන්නාන්සේලා investmentsවලට ලැහැස්ති කර ගත්තේ. Secretary හැටියට මේ තැනැත්තා දමා ගෙන, ඒ හරහා companies හැදුවා. මේක තමයි රජයේ සම්බන්ධතාව. මේක තමයි ඇත්ත. මේක හංගන්න හදන්නේ ඇයි? ධම්මික පෙරේරා කියන්නේ කැසිනෝකාරයෙක් නොවෙයිද? කැසිනෝ අයිතිකාරයෙක්. තමුන්නාන්සේලා Secretary කර ගත්තේ කැසිනෝ අයිතිකාරයෙක්. ඔහුට තමයි මේ ව්‍යාපෘතිය දෙන්නේ. ඒක තේරුම් ගන්න. මේක නැහැ කියන්න බැහැ. ඒක තමයි තමුන්නාන්සේලා මහා සංඝරත්නයෙන් හැංගුවේ. උන් වහන්සේලා මොකක්ද කියන්නේ? මේක තමුන්නාන්සේලා හංගන්න හදන්න එපා. මේක අපේ ප්‍රශ්නයක් නොවෙයි, ඊට වඩා එහා ගිය ප්‍රශ්නයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ යෝජිත ව්‍යාපෘති තුළ සාරධර්ම විරෝධී කටයුතු වලට කිසිසේත් ඉඩ නොතැබිය යුතුයි" යන මාතෘකාව යටතේ ත්‍රෛනිකායික මහා සංඝයා වහන්සේලා මොකක්ද කියන්නේ?

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
දෙන්නේ නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දෙන්නේ නැහැ. හරි, තමුන්නාන්සේලා කියන්නේ දෙන්නේ නැහැ කියලා. උන් වහන්සේලා කියන දේටත් ඇහුම් කන් දෙන්න කෝ, අපට නොවෙයි.

මහ නායක ස්වාමීන් වහන්සේලා අතිගරු ජනාධිපතිතුමා වෙත යවන ලද ලිපියේ මෙසේ සඳහන් වනවා:

"පරාභව සූත්‍රදේශනාවෙහි දැක්වූ පරිද්දෙන්, 'යම් මිනිසෙක් ස්ත්‍රියට, සුරාවට, සූදුවට ලොල් වී ලද දෑ වනසා ගන්නේ ද, එය පුද්ගලයාගේ පිරිහීමේ දොරටුවයි.' පුද්ගලයන්ගේ පිරිහීම යනු සමස්ත ජාතියේ, සංස්කෘතියේ හා රටේ පිරිහීමයි. පෙර ධර්මද්වීපයක්ව පැවති ශ්‍රී ලංකාද්වීපයෙහි වර්තමානයෙහි ඇතිවෙමින් පවත්නා මිනීමැරුම්, මංකොල්ලකෑම්, ස්ත්‍රීදූෂණ ආදී විවිධ දුරාචාරයන් තව තවත් ව්‍යාප්ත වීමට හේතුසාධක විය හැකි පරිදි, රටේ සංවර්ධනයේ නාමයෙන් විදේශ සංචාරක ව්‍යාපාර ඉලක්ක කොට සූදුව, ඔට්ටු ඇල්ලීම වැනි පුද්ගලික දුශ්චරිත සම්බන්ධයෙන් පහසුකම් සැලසීමට, නියමින් හෝ අනියමින් මගපෑදෙන්නේ නම්, එය ජාතික, ආගමික, සංස්කෘතික, සාමාජික පරිහානියට හේතුසාධක වනු නිසැකය.

අතීතයේ පටන් ශාසනික, ජාතික, සංස්කෘතික, සමාජමය යහපැවැත්ම යථාපරිදි සුරක්ෂා කරගැනීම සඳහා රාජ්‍ය පාලකයන් වෙත සුදුසු අනුශාසනා උපදෙස් ලබාදීමට මහාසංඝරත්නය සතුව පවත්නා ඓතිහාසික උරුමය මුල් කොට ගෙන හා විවිධ ජාතික ආගමික සංවිධාන අප වෙත යොමු කරන ලද කරුණු සැලකිල්ලට ගෙන පහත දැක්වෙන කරුණු ඔබතුමාගේ කාරුණික අවධානයට යොමු කිරීමට අදහස් කළෙමු.

වර්ෂ 2008 අංක 14 ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ, 2014 ජනවාරි මස 30 වන දින අංක 1847/35, 1847/36 සහ 1847/37 යන අතිවිශේෂ ගැසට් පත්‍රිකා මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගයන්හි සඳහන් වන විශේෂයෙන් ආනුෂංගික පහසුකම් සැලසීම පිළිබඳව නිශ්චිත අර්ථකථනයක් දක්වා නොමැතිවීම කාගේත් විමතියට හා සැකයට හේතුවී ඇත. ඉහත ගැසට් පත්‍රිකා තුළ මෙම ආනුෂංගික පහසුකම් සැලසීම යන යෙදුම ඇතුළත් කිරීම තුළින් සූදුව, ඔට්ටු ඇල්ලීම, සුරාව, ගණිකා වෘත්තිය වැනි දුරාචාරයන් එම ව්‍යාපෘති තුළ ක්‍රියාත්මක වීමට ඉඩප්‍රස්ථා සැලසෙන බව අපේ හැඟීමය.

පූර්වයෙහි මෙබඳු නීති අණපනත්හි වචනාර්ථවල පැවති දුර්වලතා ප්‍රයෝජනයට ගෙන නීතියෙන් මඟහැරයෑම් කොපමණවත් සිදුවී ඇති බැවින්, මෙම යෝජිත ව්‍යාපෘති තුළින් කවර අවස්ථාවක හෝ ඇති විය හැකි සූදුව, ඔට්ටු ඇල්ලීම, ගණිකා වෘත්තිය වැනි කිසිදු දුරාචාර කටයුත්තක් පවත්වාගෙන යෑම තහනම් කොට බැහැරලීමට හැකි වන සේ මෙම අණපනත් තුළ ඍජු අර්ථකථනයන් පැහැදිලිව දක්වා සංශෝධනය කිරීමට නිසි පියවර ගන්නා ලෙස කරුණාධ්‍යාශයෙන් ඉල්ලා සිටිම්හ. තෙරුවන් සරණයි."

අතිගරු ජනාධිපතිතුමා වෙත යවන ලද මෙම ලිපිය මම **සභාගත*** කරනවා.

ගරු අගමැතිතුමා, තමුන්නාන්සේ මේ ලිපිය බලන්න. අපි මේ කාරණයට ඇහුම් කන් දෙන්නේ නැද්ද? අපි කියන්නේ මේ ව්‍යාපෘති නතර කරන්න කියලා නොවෙයි. කැසිනෝ, ගණිකා වෘත්තිය කියන මේ රට දුරාචාරයට ගෙන යන වැඩ පිළිවෙළ ඇති නොවෙන්න අවශ්‍ය නීතිමය පරිසරය සකස් කරන්න කියලායි අපි කියන්නේ. [බාධා කිරීම්] අපේ යෝජනාව ඒකයි. ගරුතර මහා සංඝ රත්නයේ යෝජනාව ඒකයි. [බාධා කිරීම්] ඇයි කෑ ගහන්නේ? මම මේ කියන්නේ ගරුතර මහා සංඝ රත්නයේ යෝජනාව පිළිබඳවයි.

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
එහෙම එකක් කොහේද තිබෙන්නේ?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
වෙන එකක් නොවෙයි මම කියන්නේ. මේ රටේ මහා සංඝ රත්නය, නායක ස්වාමීන් වහන්සේලා ඉදිරිපත් කරන මේ යෝජනාවට තමුන්නාන්සේලාට ඇහුම් කන් දෙන්න බැරිද? මුළු රටටම ඇහුම් කන් දෙන්න බැරිද? ඒ ලිපියේ copy එකක් මම ළඟ තිබෙන්නේ. කරුණාකර මේ ලිපිය හැන්සාඩ් වාර්තාවට ඇතුළු කරන්න. මේක තමයි ඉතාම වැදගත් දේ. ඒක නිසයි මම කිව්වේ රජයේ නිලධාරියෙකු හැටියට ධම්මිකව ගෙනැල්ලා අද කැසිනෝ ගහන්න කොම්පැනියක් හදලා තිබෙනවාය කියලා. BOI එකත් එක්ක අත්සන් කළේ කවුද? ධම්මික පෙරේරා. මම ළඟ විස්තරය තිබෙනවා. ධම්මික පෙරේරා අත්සන් කළේ. වෙන කවුරුවත් නොවෙයි. මේවා සල්ලි තිබෙන කොම්පැනි නොවෙයි. මේවා සූදු කෙළින කොම්පැනි. ආණ්ඩුවත් එක්ක එක්කහු වෙලා, ආණ්ඩුවේ දේශපාලනඥයිනුත් එක්ක එක්කහු වෙලා, ආණ්ඩුවේ

****  පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

නායකයෝත් එක්ක එක්කහු වෙලා තමයි අද මේ කොම්පැනි හදලා මුළු රටම රවට්ටන්න හදන්නේ. ඒකේ වැඩි කොටස් තිබෙන්නේ කාටද? මේ රටින් පගා ගහලා ඒ මුදල් යොදවලා කොටස් ගත්ත අයට තමයි ඒවායේ අයිතිය තිබෙන්නේ. වෙන කාටවත් නොවෙයි. තමුන්නාන්සේලා මේක හංගන්න හදන්න එපා. මහා සංඝ රත්නයට, නායක ස්වාමීන් වහන්සේලාට මේ කාරණය තේරුණා. ඒකයි උන් වහන්සේලා කිව්වේ මේ රට සංවර්ධනය කළ යුත්තේ සුරාව, සූදුවෙන් නොවෙයි, ගණිකා වෘත්තියෙන් නොවෙයි කියලා. තමුන්නාන්සේලා හදන්නේ අලුත් ආර්ථිකයක් හදන්න. කොහෙන් කොහෙන් හරි ණය අරගෙන ඇවිල්ලා, ලෝකයේ තිබෙන දුරාචාර ඔක්කොම මෙහාට ගෙනැල්ලා, අපිට ආදායමක් හම්බ වුණාය කියලා මේ රටේ ජනතාව රවට්ටන්නයි තමුන්නාන්සේලා හදන්නේ. ඒක පුද්ගල ආදායම වැඩි වුණා කියලා තමුන්නාන්සේලා කියන්න හදන්නේ මේවායින්. ඒක පුද්ගල ආදායම වැඩි වුණා නම් ඒ වාසිය මේ රටේ දුප්පත් ජනතාවට යන්න ඕනෑ. වැඩ කරන ජනතාවට, කම්කරු ජනතාවට ඒ වාසිය යන්න ඕනෑ. ඔවුන්ට ඒ වාසිය ගිහිල්ලා තිබෙනවාද? මම තමුන්නාන්සේලාගෙන් මේ කාරණයත් අහනවා. ගොවියා දායක වෙච්ච ගොවියාගේ විශ්‍රාම වැටුප තමුන්නාන්සේලා ගෙව්වේ නැහැ. ඒක හංගා ගත්තා. ගොවියාගේ විශ්‍රාම වැටුප අපියි නිර්මාණය කළේ. ඒ සල්ලි ටික ගෙව්වේ නැහැ. තමුන්නාන්සේලා දැන් ගෙවන්නේත් නැහැ. ගොවියා දායක වුණා. [බාධා කිරීම්] ඒ තමුන්නාන්සේලා දන්නා විධිය. රටට ගිහිල්ලා කියන්න. ඒ වාගේම ධීවරයාට පොරොන්දු වුණා ඉන්ධන සහනාධාරය දෙනවාය කියලා. ධීවර ඇමතිවරු මෙතැන ඉන්නවා. ඉන්ධන සහනාධාරය දෙනවාය කියලා පොරොන්දු වෙලා ඒකෙන් මහ හැරියා. ඉන්ධන සහනාධාරය දුන්නේ නැහැ. තමුන්නාන්සේලාට මම කියන්නේ මේකයි. මහා ලොකු සම්පතක් ආවා නම්, අපේ ඒක පුද්ගල ආදායම වැඩි වුණා නම් මේ පැත්තට නැඹුරු වන්න බැරි ඇයි? සහන දෙන්න බැරි ඇයි? මම තමුන්නාන්සේලාගෙන් අහන්නේ ඒකයි.

අපි කියන්නේ හෝටල් හදන්න කියලායි. ඒකට අපි විරුද්ධ නැහැ. ඒක ප්‍රශ්නයක් නැහැ. හෝටල් හදන කොට ඒ හෝටල්වලට ලෝකයේ ඉන්න නොයෙක් විදේශිකයෝ එනවා. එන්නේ ගණිකාවෝ බලා ගෙන නොවෙයි. සූදුව බලාගෙන නොවෙයි. මේ රටේ ඊට වඩා සම්පත් තිබෙනවා. ඉතාම වටිනා සාගරයක් -මුහුදක්- අපිට තිබෙනවා. වෙරළක් අපිට තිබෙනවා. ඒක ප්‍රයෝජනයට ගන්න. ඉතාම හොඳ පරිසරයක් අපිට තිබෙනවා. ඓතිහාසික සිද්ධස්ථාන අපිට තිබෙනවා. අපේම කියලා මුළු ලෝකයම පිළිගන්නා වෙදා ක්‍රම තිබෙනවා. සල්ලි හම්බ කරන්න පුළුවන් ක්‍රම ඕනෑ තරම් තිබෙනවා. ඒවා ගත්තේ නැහැ.

මම තවත් කාරණයක් කියන්නම්. තමුන්නාන්සේලා දෙන මේ බදු සහන ලංකාවේ පොඩි හෝ ලොකු හෝ ජනතාවට අවුරුද්දක් දීලා බලන්න, තමුන්නාන්සේලා බලාපොරොත්තු වන ඒ ආදායම මේ රටට එන්නේ නැද්ද කියලා. අපේ ව්‍යාපාර ඔක්කොම කඩාගෙන වැටෙන කොට ඒ අයට සහන දෙන්නේ නැහැ. මේ බදු සහන අපේ ව්‍යාපාරිකයින්ට දෙනවා නම් ඒ ව්‍යාපාරිකයෝ නිෂ්පාදනය කරලා, විදේශවලට ඒ බඩු යවලා අතිවිශාල ආදායමක් ගෙනැල්ලා දෙනවා. මම දන්නවා, ගරු ඇමතිතුමන්ලාට මේක තේරෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලාට මේක තේරෙනවා. අද ඒ නිෂ්පාදනය කරන අය සියලු දෙනා කඩාගෙන වැටිලා. අපේ ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඇමතිතුමනි, තමුන්නාන්සේ සුළු කාලයකින් සීනි කර්මාන්තය දියුණු කරලා පෙන්නුවා. ඒ වාගේ දියුණු කරන්න පුළුවන් ඒවා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඇයි ඒවාට බදු සහන දෙන්නේ නැත්තේ? රාජ්‍ය සංස්ථා එකකටවත් මේ බදු සහන දෙන්නේ නැහැ. [බාධා කිරීමක්] ඇමතිතුමා, තමුන්නාන්සේගේ දක්ෂකම් ගැන කිව්වත් ඒක පිළිගන්නේ නැහැ නේ. ඒක නේ තිබෙන මෝඩකම. ඇයි බදු සහන දෙන්නේ නැත්තේ? කරුණාකර කියන්න. රාජ්‍ය සංස්ථා තිබෙනවා. ඇයි ඒවාට බදු සහන දෙන්නේ නැත්තේ? ඒ සියල්ල බදු ගෙවන්න ඕනෑ. අද පැකර්ටයි, ධම්මිකටයි තමයි බදු සහන දෙන්නේ. ගරු ඇමතිතුමනි, විදුලිබල මණ්ඩලයට බදු සහන දෙනවාද කියා මම තමුන්නාන්සේගෙන් අහනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔක්කෝටම දීලා තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දීලා නැහැ. මම බය නැතිව කියනවා දීලා නැහැ කියලා. බදු සහන තියා ඉන්ධනවත් සහන මිලට දීලා නැහැ. අපේ ඇමතිතුමා කිව්වා විදේශ ආයෝජන සැහෙන ප්‍රමාණයක් ආවා කියලා. ඔව්, අපි දන්නවා. කොහොමද ආවේ? අපට මුල ඉඳලා අගට කියන්න. විදුලිබල මණ්ඩලය වෙනුවෙන් රජය චීනයත් එක්ක ගිවිසුමක් ගහලා හැදූ විදුලි බලාගාරය තවම ක්‍රියාත්මක කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ මොකද? ක්‍රියා කරන්නේ නැති මැෂින් ගෙනැල්ලා. ඒවා ආවේ කොහොමද? ණයත් එක්ක ආවේ මොනවාද? චීනයට ඕනෑ නැති දේවල් තමයි ණයත් එක්ක මෙහේට ආවේ. අද ඒවා වැඩ කරන්නේ නැහැ. කවුද ඒ ණය ගෙවන්නේ? තමුන්නාන්සේලා බදු පනවලා අහිංසක ජනතාවගෙන් ගන්නා සල්ලිවලිනුයි ඒවා ගෙවන්නේ. වෙනත් ඒවායෙන් නොවෙයි ගෙවන්නේ. පිටින් ගන්නා ණයවලින් නොවෙයි ගෙවන්නේ. ඒ කර්මාන්තශාලා එක්ක, ඒ විදුලි බලාගාරය එක්ක ආවේ කවුද? ගරු ඇමතිතුමා, විදුලි බලාගාරය එක්ක ආවේ කවුද? චීනයේ අයයි ආවේ එහි වැඩට. තවම ඉන්නවා ගෙවල් හදාගෙන. ගෑනුත් ඉන්නවා මෙහේ. කවුද ඒ අයට පඩි ගෙවන්නේ? මෙවැනි සංවර්ධනයක් ගැන තමයි තමුන්නාන්සේලා කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා අනෙක් පැත්ත ගැන කථා කරන්නේ නැහැ මට ලැබී තිබෙන කාල වේලාව සීමාසහිත නිසා. මම විශේෂයෙන් මතක් කරනවා මේ රටේ ජනතාව රවටන්න එපා කියලා. මේ රටේ ජනතාව තමුන්නාන්සේලා පිළිගත්තා නම් තමුන්නාන්සේලා දන්නවා ඉදිරි මැතිවරණයක් එන කොට වෙන්නේ මොකක්ද කියලා. ඉදිරි මැතිවරණයක් ගැන කථා කරන විට ඕනෑ නම් ජනාධිපතිවරණයක් දෙන්නම් කියලා ජනාධිපතිතුමා කියලා තිබෙනවා. අපි ඉල්ලනවා. අපි පැහැදිලිව ඉල්ලනවා ජනාධිපතිවරණයක්. දෙන්න; දීලා බලන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
තමුන්නාන්සේලාගේ පැත්තෙන් කවුද තරග කරන්නේ?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒක අපේ වැඩක්. තමුන්නාන්සේලා කවුද දමන්නේ? අපි දමන්නේ දිනන කෙනෙක්. [බාධා කිරීම්] අපි දමන්නේ මහින්ද රාජපක්ෂ පරාද කරන්න පුළුවන් කෙනෙක්. ඒක හොඳට මතක තියා ගන්න. අපි දමන්නේ රාජපක්ෂ පරාද කරන්න පුළුවන් කෙනෙක්.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අපි දමනවා superstar කෙනෙක්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපි දමනවා Superstar කෙනෙක්.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
Sir, I rise to a point of Order. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල නායකයකු හැටියට කියන්න, ඒ මැතිවරණයට ඉදිරිපත් කරන්නේ කවුද කියලා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඒක ඒ වෙලාවට කියන්නම්. [බාධා කිරීම්]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ඇයි බය?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
දැන් කියන්න බැහැ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ඇයි බය?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කිසි බයක් නැහැ. [බාධා කිරීම්] කිසි බයක් නැහැ. [බාධා කිරීම්] අපට ඕනෑ කෙනා වෙලාවට අපි දමන්නම්. මහින්ද රාජපක්ෂ පරාද කරන්න පුළුවන් කෙනෙක් දමන්නම්. එහි කිසි ප්‍රශ්නයක් නැහැ. වෙලාවට අපි ඒක කරන්නම්. තමුන්නාන්සේලාට පෙනුණා නේද මේ නියමයන් ගෙනැල්ලා මේවාට ඡන්දය දෙන කොට ආණ්ඩුවේ කීදෙනෙක්, තමුන්නාන්සේලාගේ සම්බන්ධකම් තිබෙන වෙනත් පක්ෂවල ඇමතිවරුන් කීදෙනෙක් මෙතැනින් නැඟිටලා ගියාද කියලා; කීදෙනෙක් විරුද්ධ වුණාද කියලා. අන්න ඒ වාගේ තමයි ජනාධිපතිවරණයක් ආපු දාටත් සිද්ධ වන්නේ කියන එක තමුන්නාන්සේලා මතක තියා ගන්න. පිරිස තමුන්නාන්සේලාගෙන් ඈත් වෙනවා. අපි ඕනෑ මිනිහා දමන්නම්. දිනන්න පුළුවන් මිනිහෙක් දමන්නම්. මහින්ද රාජපක්ෂ පරාද කරන්න පුළුවන් කෙනෙක් දමන්නම්. ඒක අපේ වැඩක්. ඒක තමුන්නාන්සේලාගේ වැඩක් නොවෙයි. ඒ වගකීම අපි භාරගන්නවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ඇමෙරිකාවෙන් ගෙනැල්ලා දමනවාද? මෙහේ තවම එහෙම කෙනෙක් හදාගන්න බැරි වුණාද? ඒ, සැහවුණු අමුත්තාද? මේ අවුරුදු උත්සව කාලය නේ. තවම බැරිද සැඟවුණු අමුත්තා සොයා ගන්න?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මීට වඩා කථා කරන්නේ නැහැ. ඒ ජනාධිපතිවරණයට අපි ලෑස්තියි කියා කියනවා. සමස්ත ජනතාවගේම අයිතිය උදුරාගෙන කන මේ දූෂිත ආණ්ඩුව අයින් කිරීමේ, දැන් ඉන්න මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඒ තනතුරෙන් ඉවත් කරලා හොඳ කෙනෙක් පත් කිරීමේ, මුළු රටම එකට ගන්න පුළුවන් කෙනෙකු පත් කිරීමේ වගකීම අපි දරනවා කියලා මතක් කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 3.25]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Petroleum Industries)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලොකු වැස්සක් වැහැලා පෑව්වා වාගේ කියලායි මට හිතෙන්නේ. අපි දන්නවා, එක්සත් ජාතික පක්ෂය හැමදාම දවල් හීන දකින බව. දවල් හීන දැකලා දැකලා සාමාන්‍යයෙන් සැහෙන කාලයක් ඒ දිහා බලාගෙන ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, මේක කවදාවත් වැටෙන ගෙඩියක් හෙම නොවෙයි කියලා මම තමුන්නාන්සේට කියනවා. එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික ප්‍රතිපත්තිය විශ්වාස කරන්නත් බැරි තරම් වෙනස් වෙලා. එක්සත් ජාතික පක්ෂය එක්කෝ ජනතා විමුක්ති පෙරමුණේ ආර්ථික න්‍යායට කිට්ටු වෙලා. එහෙම නැත්නම් ආර්ථික විද්‍යාව පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණ දරන මතයටත් වඩා එහා තැනකට ඇවිල්ලා. මොකද එක්සත් ජාතික පක්ෂය මේ රටේ -[බාධා කිරීම්] ඒක අපේ වෙනම තර්කයක් නේ. අපේ ඒ තර්කය හැම දාම තිබෙනවා. ඒක හැම දාම තිබෙන දෙයක්. ඒක ප්‍රශ්නයක් නොවෙයි. මම කථා කරන්නේ, මේ රටේ විවෘත ආර්ථිකය ඉදිරිපත් කරපු, විවෘත ආර්ථික ක්‍රමය ගෙනැල්ලා කැසිනෝත් ලංකාවට හඳුන්වලා දීපු, ජෝසිම්ව ගෙනාපු, ජෝසිම්ගෙන් සල්ලි ගත්තු උදවියම අද මෙයට විරුද්ධව කථා කරන එක ගැනයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අපි ජෝසිම්ව එළෙව්වා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඔබතුමා දන්නේ මොනවාද? ඔබතුමා මොනවාද දන්නේ? [බාධා කිරීමක්] ඔබතුමා එක්සත් ජාතික පක්ෂය ගැන මොනවාද දන්නේ? ඔබතුමා මොනවාවත් දන්නේ නැහැ. ඔබතුමා ඉතිහාසය දන්නේ නැහැ. අද එක්සත් ජාතික පක්ෂය කරන කථාව මොකක්ද කියලා මම අහන්න කැමැතියි. විශේෂයෙන් ලංකාවේ ආයෝජනය පිළිබඳව ඔබතුමන්ලා දරන අදහස මොකක්ද කියලා මම දැන ගන්න කැමැතියි. ලංකාවේ ආයෝජනය සම්බන්ධයෙන් ඔබතුමන්ලා දරන අදහස මොකක්ද කියලා මම දන්නේ නැහැ. මේ රටේ ආයෝජන අවස්ථා නිර්මාණය කිරීම මේ රටේ ආර්ථික ප්‍රගමනයට අත්‍යවශ්‍ය කාරණාවක් බව මතක තියා ගන්න. මේ ආර්ථික ප්‍රගමනයට අවශ්‍ය කාරණාව පිළිබඳව තමුන්නාන්සේලා මොකක්ද අද කියන්නේ? "කැසිනෝ" එකක් ඉස්සරහට දාලා මුළු ව්‍යාපෘතියම සම්පූර්ණයෙන්ම අනෙක් පැත්ත හරවන්නයි හදන්නේ. ආණ්ඩුව ප්‍රකාශයක් කරලා තිබෙන නිසා මම මේ ගැන ඊට වඩා කථා කරන්න යන්නේ නැහැ.

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ කාර්මීකරණය අනෙක් පැත්ත හැරෙව්වේ කවුද කියලා මම ඉස්සෙල්ලාම මතක් කරන්න කැමැතියි. ඒ, 1977 දී බලයට පත් වුණු එක්සත් ජාතික පක්ෂ රජයයි. 1960 ඉඳලා 1977 වෙන කල්ම මේ රටේ ගෙනගිය ආර්ථික ප්‍රතිපත්තියක් තිබුණා. ඩඩ්ලි සේනානායක මැතිතුමාත් ඒ ආර්ථික ප්‍රතිපත්තිය පිළිගත්තා. එය, සංවෘත ආර්ථික ප්‍රතිපත්තියක් සහ රජය සතු සංස්ථා, ව්‍යාපාර දියුණු වෙන ප්‍රතිපත්තියක්. අපේ අය කළ දේවල් කියන්න ඉස්සෙල්ලා දැන් මම ඔබතුමන්ලා කළ දේවලුත් කියන්නම් කෝ. ඒක මගේ යුතුකමක් නේ. තුල්හිරිය වාගේ දැවැන්ත ව්‍යාපෘති එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ ආවා. ටයර් සංස්ථාව වාගේ ලොකු ව්‍යාපෘති අපේ රජය කාලයේ ආවා. තමුන්නාන්සේලාට මතකද 1977 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට එන කොට දකුණු ආසියාවේ පළමුවැනි වාහන එකලස් කිරීමේ කර්මාන්ත ශාලාව තිබුණේ ශ්‍රී ලංකාවේ බව? තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ප්‍රථම ආයෝජන මණ්ඩල සභාපතිවරයා වන උපාලි විජේවර්ධන මහත්මයා තමයි ඒක කෙරුවේ. එහි Upali Fiat car එකත්, Unic radio එකත් හැදුවා කියන එක මට අද වාගේ මතකයි. එක්සත් ජාතික පක්ෂ රජය බලයට ඇවිල්ලා පැය 24ක් ඇතුළත ඒ දේශීය කර්මාන්ත ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම වෙනස් කෙරුවා. එහෙම කරලා ඔබතුමන්ලා එදා උත්සාහ කෙරුවේ ලෝකයේ තිබෙන සියලුම දේවල් ලංකාවට ගේන්න ඉඩ සැලැස්වීමටයි. කිසිම බාධාවකින් තොරව සියලුම දේවල් ලංකාවට ගේන්න ඉඩ දුන්නා.

1977 කාලයේ මම ශිෂ්‍යයෙක්. ඒ කාලයේ මට මතකයි, මැලේසියාවෙන් ගෙනැල්ලා බීර බොන mugs පාරේ විකුණපු ආකාරය. අපේ වීදුරු කර්මාන්තය සම්පූර්ණයෙන්ම වැහිලා ගියා. නාත්තන්ඩියේ -අපේ ගරු මිල්රෝයි ප්‍රනාන්දු ඇමතිතුමාගේ ප්‍රදේශයේ- වැලිවලින් වීදුරු හදන කර්මාන්තශාලා බංකොලොත් වුණා. උපාලි විජේවර්ධනගේ කර්මාන්තශාලාව නැතුව ගියා. ටයර් වාගේ කර්මාන්තශාලා විනාශ කෙරුවා; විකුණුවා. සමහර සංස්ථාවන් නැති කරලා දැම්මා. පේෂ කර්මාන්තය සම්පූර්ණයෙන්ම අවසන් කෙරුවා. එහෙම කරලා කාර්මික ප්‍රතිපත්තිය නැත්තටම නැති කරන කොට ඊට යාබද ඉන්දියාව මොකද කෙරුවේ? ඉන්දියාව ප්‍රතිපත්ති වෙනස් කෙරුවේ හරිම හෙමින්.

1979 දී තමයි රජීව් ගාන්ධි මහත්මයාලා බලයට ඇවිල්ලා ඉන්දියාවට හෙමින් හෙමින් ප්‍රතිපත්ති ඇතුළු කෙරුවේ. ඒ ගොල්ලන් තමුන්නාන්සේලා වාගේ තිබුණු කර්මාන්ත විනාශ කෙරුවේ නැහැ. ඒ ගොල්ලන් කෙරුවේ ඒ කර්මාන්තවලට තවත් විදේශ ආයෝජකයන් සම්බන්ධ කර ගත්තු එකයි. මට අද වාගේ මතකයි, රජීව් ගාන්ධි මැතිතුමාගේ සොහොයුරා මරුටි කාර් එක හදන කොට ඔහුට හිනා වුණු හැටි. නමුත් මරුටි කාර් එක මුළු ආසියාව පුරාම වේගයෙන් අළෙවි වන සාමාන්‍ය ජනතාවගේ කාර් එකක් බවට පත් කෙරුවා. ඉතින් ඉන්දියාව එහෙම ප්‍රතිපත්තියක් ගන්න කොට අද මේ කථා කරන එක්සත් ජාතික පක්ෂයේ මේ ඉන්න නායකයෝ තමයි එදා අපේ මුළු ආර්ථිකය අනෙක් පැත්ත හරවලා කාර්මීකරණය විනාශ කෙරුවේ. එයින් දකුණු ආසියාවේ අපට වඩා පහළින් හිටපු රටවලට ඉහළට එන්න ඉඩ සැලසුණා. ඒ කාර්මික ප්‍රතිපත්තිය අනුගමනය කරපු මැලේසියාව ඉහළට ආවා. අද වියට්නාමය ඉහළට ඇවිල්ලා. බුරුමය ඉහළට එමින් තිබෙනවා. ඒ වාගේම ඉන්දියාව ඉහළට එමින් තිබෙනවා. පාකිස්තානයේ ප්‍රශ්න තිබුණත් සැහෙන කාර්මීකරණයක් ඒ රට ඇතුළේ තියෙනවා. අද චීනය මහා ඉහළින් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. අද ඒවා මොනවත් කථා කරන්නේ නැතිව මේ ආයෝජන ප්‍රතිපත්තියට පහර එල්ල කරන්න "කැසිනෝ" කියන වචනය පාවිච්චි කරනවා. මොකක්ද මේකේ තේරුම? ආණ්ඩුව කියලා තිබෙනවා මේවායේ කැසිනෝ නැහැ කියලා. ඒ වාගේම තිබෙන licences හැරුණු කොට අලුතින් කිසිවක් දෙන්නේ නැහැ කියලා ආණ්ඩුව පැහැදිලිව කියා තිබෙනවා. එහෙම කියද්දීත්, මේ ආයෝජනවල ප්‍රමාණය වැඩි නිසා, මේ ආයෝජනවල ප්‍රමාණය විශාල නිසා, මේකෙන් ආර්ථිකයේ උද්දීපනයක් ඇති වන බව දන්නා නිසා අද විවිධාකාර කථා කියන්න එක්සත් ජාතික පක්ෂය සූදානම් වෙනවා. අපට යම් දෙයක් ගැන තර්කයක් ඉදිරිපත් කරන්න පුළුවන්. මා තර්කයට කැමැතියි. කවුරු හරි කියනවා නම් මෙන්න මේ දේ වැරදියි කියලා, ඒකට තර්කයක් තිබෙනවා. නමුත් තර්කය වෙනුවට ලාබාල කථා කියලා මේ රටේ අනාගත පරම්පරාව උගස් තියන වැඩවලට අපි යන්න නරකයි.

ඒ කාලයේ අපි විපක්ෂයේ ඉන්න කොට කණ්ඩලම හෝටලය හදනවාට විරුද්ධව පෙළ පාළි ගියා මට මතකයි. මාත් ගියා. නමුත් මා පසුව තේරුම් ගත්තා, ආයෝජනවලට විරුද්ධව පෙළ පාළි යන එක වැරදියි කියලා. ආයෝජන කියන්නේ රටක අනාගතය නිර්මාණය කරන දෙයක් කියලා මට තේරුණා. අපි ඒක තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා මා තමුන්නාන්සේලාට කියන්නේ, අපේ රටේ ආයෝජන පිළිබඳ භීතිකාවක් ඇති කරන්න හදන එක කරුණාකර නවත්වන්න ක්‍රියා කරන්න කියලායි. ආණ්ඩුව මොකක් වුණත්, ආණ්ඩුව මොන අවස්ථාවේ හිටියත් තමුන්නාන්සේලා මේ ආයෝජන අවස්ථා පිළිබඳව මීට වඩා වගකීමෙන් ක්‍රියා කරන්න ඕනෑ. අපේ රටේ ආර්ථිකය දියුණු කරන්න නම් අඩුම වශයෙන් අපි සේවා ආර්ථිකය දියුණු කරන්න ඕනෑ. අපි මේ රටේ ඒක පුද්ගල ආදායම වැඩි කර තිබෙනවා නම්, ඒ ඒක පුද්ගල ආදායමේ ප්‍රතිඵල රට ඇතුළේ තිබෙනවා, ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි. තමුන්නාන්සේ දැන ගන්න ඕනෑ, අද වන කොට three-wheelers අටලක්ෂයක් මේ රටේ පාරවල්වල ධාවනය වන බව. Motorcycles මිලියන 2.7ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් තිබෙනවා. ඒ ප්‍රමාණය එන්න එන්න වැඩි වෙනවා. ඒ නිසා රටේ ධනය සාමාන්‍ය ජනයාට බුක්ති විඳින්න පුළුවන් තත්ත්වයට මේ ආණ්ඩුව මේ රට ගෙනැල්ලා තිබෙනවා.

මේ ආණ්ඩුව හැම විටම සාමාන්‍ය ජනයා දිහා බලලා වැඩ කරන, වැඩ කරන පන්තිය දිහා බලලා වැඩ කරන ආණ්ඩුවක්. මේ ආණ්ඩුව මේ රටේ විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. කවුරු හරි කියනවා නම් අපේ රටේ ඒක පුද්ගල ආදායම වැඩි වුණේ නැහැ, ඒ නිසා ජීවන මට්ටම වැඩි වුණේ නැහැ, සියලු දෙනාම දුගියෝ කියලා, ගිහිල්ලා ජනතාවගෙන් අහන්න ඇයි ආණ්ඩුව ඡන්ද දිනන්නේ කියලා. අපට ගම්බද මිනිස්සු මේ තරම් ඡන්දය දෙන්නේ ඇයි?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
දැන් ඒකට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
එහෙම වෙන්නේ නැහැ කවදාවත්. ඒක තමුන්නාන්සේගේ සිහිනයක් විතරයි. ඒ සිහිනය හිතේ තියා ගන්න. ඒකට කමක් නැහැ. නමුත් කවදාවත් ඒක කරන්න බැහැ. අපිත් දැක්කා තමුන්නාන්සේලාගේ හයිය ගම්පහට ගියාම, මැතිවරණයේදී. ගම්පහදී තමුන්නාන්සේලාගේ මුහුණක්වත් දැක්කේ නැහැ. මාත් ගම්පහ ටවුමේමයි හිටියේ. ඒ නිසා ඒ හයිය ගැන කථා කරන්න එපා. තමුන්නාන්සේලා කවුරු එක්ක ආවත් ඒ හයිය හදා ගන්න බැහැ. ඒ නිසා මා කියන්න කැමැතියි, අපේ ජනාධිපතිතුමා එක්ක තරග කරන්න තවමත් කිසිම කෙනකුට පුළුවන්කමක් ඇති වෙලා නැහැ කියන එක. මොකද, එතුමා මේ රටේ ගම්බද, නගරබද සියලු ජනතාවගේ හදවත් තුළ ජීවත් වන කෙනකු නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආයෝජනයේ තිබෙන වැදගත්කම මොකක්ද? මේ රටේ යුද්ධය නැති වුණා විතරයි මේ රටේ ආයෝජන අවස්ථා විශාල වශයෙන් වැඩි වුණා. සාමාන්‍යයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 3000කට වැඩි ආයෝජන ප්‍රමාණයක් අවුරුදු තුනක්, හතරක් ඇතුළත අපට ගෙන එන්න පුළුවන් වුණා. මේ ප්‍රමාණය ඊටත් වඩා වැඩියි. එහෙම නම් එය ආර්ථිකය තුළ විශාල ගැම්මක් ඇති කරනවා. අපේ සංචාරක කර්මාන්තය තුළ අවුරුද්දෙන් අවුරුද්ද විශාල දියුණුවක් තිබෙනවා. සංචාරකයන් ලංකාවට ආවාම ඒ සංචාරකයන්ට ඕනෑ කරන හෝටල් පහසුකම් සලසන්න, කාමර පහසුකම් සලසන්න අපට පුළුවන් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ දියුණුව ඇති කරන්න බැහැ. යුද්ධයෙන් පස්සේ යාපනයේ පවා අද හොඳ හෝටල් නිර්මාණය වෙමින් තිබෙනවා.

රටේ ආර්ථිකය දියුණු වෙන කොට ඒ සඳහා අත්‍යවශ්‍ය අංගයක් තමයි සෘජු විදේශ ආයෝජන කියන්නේ. සෘජු විදේශ ආයෝජන නැතිව කිසිම රටකට ආර්ථිකයේ පිම්මක් පනින්න බැරි වුණා. සිංගප්පූරුව ඒ පිම්ම පැන්නේ සෘජු විදේශ ආයෝජන නිසා. මැලේසියාව ඒ පිම්ම පැන්නේ සෘජු විදේශ ආයෝජන නිසා. වියට්නාමය ඒ වාගේ පිම්මක් පැන්නේ සෘජු විදේශ ආයෝජන නිසා. ඒ රටවල දේශපාලන මතිමතාන්තර මොනවා වුණත් ඒ ගොල්ලන් සෘජු විදේශ ආයෝජන කෙරෙහි ලොකු විශ්වාසයක් තබා තිබෙනවා. චීනය පවා එහෙමයි. චීනය කියන්නේ කොමියුනිස්ට් දහම අදහන ආණ්ඩුවක් තිබෙන රටක්. නමුත් චීනය තුළ සෘජු විදෙස් ආයෝජනවලට තිබෙන ඉල්ලුම ඉතා විශාලයි. ඇමෙරිකාවේ බොයිං සමාගම පවා අද චීනයේ තමයි සමහර කොටස් නිෂ්පාදනය කරන්නේ. ඒ කර්මාන්තශාලාවකුත් මා නරඹන්න ගියා.

අද අපි කථා කරන ඇපල් ෆෝන්, අපි භාවිත කරන ඇපල් කම්පියුටර් ආදී සියල්ලම නිෂ්පාදනය කරන්නේ චීනයේ. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා අපි ඒ තත්ත්වය තේරුම් ගන්න ඕනෑ. එක පැත්තකින් සෘජු ආයෝජන වර්ධනය කරනකොට ඒකත් එක්ක රැකියා වර්ධනය වෙනවා විතරක් නොවෙයි, විවිධාකාර කර්මාන්ත රට තුළට එන්න පටන් ගන්නවා. කර්මාන්ත රටට එනවා නම් අපි ඒවාට අවශ්‍ය කරන වාතාවරණය රට තුළ හදන්න ඕනෑ. මේ විධියට කෑ ගහලා, විවිධාකාර අසත්‍ය ප්‍රකාශ කරලා, ආයෝජකයන් භය කරලා ක්‍රියා කරන්නේ ආණ්ඩුව පෙරළන අදහසින් නම්, ඒක කවදාවත් හැබෑ නොවන සිහිනයක් බව මම තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි.

අපි බලාපොරොත්තු වෙන්නේ එක දෙයයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ තමයි මේ රටේ සංවර්ධනය, මේ රටේ සංවර්ධනය සඳහා සෘජු ආයෝජන අවශ්‍යතාව සහ ඒ මඟින් ඇති කරන රැකියා උත්පාදනය, ඒ රැකියා උත්පාදනය හරහා ඇති කරන ආර්ථිකයේ ප්‍රසාරණයත් එක්ක මේ රටේ සාමාන්‍ය ජනතාවට මුදල් ගලාගෙන එන ක්‍රම වේදයක් නිර්මාණය කරන වැඩ පිළිවෙළක්. ඒ බව අපි මේ සභාවට ඉතා ඕනෑකමින් කියන්න කැමැතියි. ඒ නිසා කවුරු හරි මේ වැඩ පිළිවෙළට අකුල් හෙළන්න කල්පනා කරනවා නම්, මහානායක ස්වාමීන් වහන්සේලා ළඟට ගිහින් අසත්‍ය ප්‍රකාශ කරනවා නම් ඒවා කවදාවත් ඉටු නොවන දේවල් කියලා මා කල්පනා කරනවා. හරියට යකෙක් පෙන්වනවා වාගේ, භූතයෙක් පෙන්වනවා වාගේ විවිධිකාර දේවල් කියලා මේ රටේ සාමාන්‍ය ජනතාවගේ බුද්ධිය අනික් පැත්ත හරවන්න පුළුවන්කමක් නැහැ. අද දේශපාලනයේ තිබෙන දෙයක් තමයි හුඟක් දේවල් ගැන අසත්‍ය කියන එක. බදු ගැන අසත්‍ය කියනවා. ආයෝජන ගැන අසත්‍ය කියනවා. අනාගතය ගැන අසත්‍ය කියනවා. ආර්ථිකය ගැන අසත්‍ය කියනවා. එහෙම කියන්නේ මොකටද? එහෙම කියනනේ ජනතාව රවටා ඡන්දය ලබා ගැනීමේ පව්ටු චේතනාවෙන්. ඒක තේරුමක් ඇති වැඩක් නොවෙයි.

අද අපි ආසියාවේ ලොකු පිම්මක් පනින්න ඕනෑ රටක්. අපි ඒ පිම්ම පනින්න තිබුණේ මීට අවුරුදු ගණනකට කලින්. අපේ රට දකුණු ආසියාවේ ප්‍රධානතම ගුවන් මධ්‍යස්ථානය වෙන්න තිබුණු රටක්; දකුණු ආසියාවේ බැංකුකරණයේ ප්‍රමුඛස්ථානය ගන්න තිබුණු රටක්; දකුණු ආසියාවේ කර්මාන්තකරණයේ ඉහළම තැනකට එන්න තිබුණු රටක්. නමුත් සමහර අමනෝඥ තීන්දු නිසා, අපේ සමහර දේවල් අපට කළමනාකරණය කර ගන්න බැරි වීම නිසා, අපට දිගු කාලීන සිතුම් පැතුම් තිබුණේ නැති නිසා, අපට ආර්ථිකය පිළිබඳ දැක්මක් තිබුණේ නැති නිසා, අපට සෘජුව තීන්දු ගන්න පුළුවන් නායකයෝ හිටියේ නැති නිසා, සෘජු තීන්දු ගන්න අවස්ථාවල මේ පාර්ලිමේන්තුවට උදව් කරලා නැති නිසා අද අපේ රට මේ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

තමුන්නාන්සේලා මතක තියා ගන්න, 'ආසියාන්' සංවිධානය හදනකොට ඩඩ්ලි සේනානායක මැතිතුමාට ආරාධනා කළා, ආසියාන් සංවිධානයේ සාමාජිකත්වය ලබා ගන්න කියලා. මේ පාර්ලිමේන්තුව වෙනුවෙන් එතුමා ඒකට යන්න සූදානම් වුණා. එවකට මැලේසියාවේ අගමැතිවරයා වශයෙන් සිටියේ එතුමා සමඟ එකට අධ්‍යාපනය ලබපු තුන්කු අබ්දුල් රසාක් මැතිතුමායි. නමුත් එදා අපේ පාර්ලිමේන්තුවේ හිටපු අය ඒකට විරුද්ධ වුණා. එසේ විරුද්ධ වීම නිසා අවසන් අවස්ථාවේදී ඩඩ්ලි සේනානායක මැතිතුමා එතුමාගේ තීරණය වෙනස් කළා. අද ආසියාන් සංවිධානය බලගතු ආර්ථිකමය කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙන අවස්ථාවක, එහි සාමාජිකයකු වෙන්න තිබුණු ඉඩ කඩ ඒ වැරදි තීන්දු නිසා අපට අහිමි වෙලා තිබෙනවා. ඉතිහාසයෙන් අපි පාඩම් ඉගෙන ගන්න ඕනෑ. ඒ නිසා මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, මේ දේශපාලන ගමන් මඟෙහි සෘජු තීන්දු ගන්නත්, හරි තීන්දු ගන්නත්, හරි ආයෝජනවලට ඉඩ සලසන්නත් අපි ක්‍රියා කරන්න ඕනෑ බව. අන්න ඒ වෙනස්කම සඳහා එකට එකතු වුණොත් අපට මේ කටයුත්ත කරන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා එක්සත් ජාතික පක්ෂයට මම ආරාධනා කරනවා, අසත්‍ය ප්‍රකාශ කරන්නේ නැතිව මේ ආයෝජනයේ වැදගත්කම තේරුම් ගන්න කියලා. මේක විශාල ආයෝජනයක්. මේ රටේ සංචාරක ක්ෂේත්‍රයට අත්‍යවශ්‍ය ආයෝජනයක්. ඒ ආයෝජනය, මේ රටේ ජනතාවගේ ඒක පුද්ගල ආදායමේත්, අපේ ආර්ථිකයේත් ඉහළ පිම්මක් පනින්න අපට ඉඩ කඩ ඇති කරන අවස්ථාවක් බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[3.40 p.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Hon. Deputy Chairman of Committees, for the opportunity given to participate in this Debate.

Two Orders have been made under the Strategic Development Projects Act by the Hon. Minister of Investment Promotion published in the Gazette Extraordinary No. 1847/36 and No. 1847/37 and have been placed for approval before this Parliament.

The Hon. Minister who preceded me complained bitterly that the ordinary people of this country are being misled by the Opposition. He said that there are no hidden agendas. He emphatically said that there is no gambling enterprise, no casino in these projects but that

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

the Opposition has misled not only the ordinary people but even the Venerable Mahanayaka Theros and induced them to write a letter asking that these Orders be amended. I do not think the Hon. Minister should devalue the intelligence of the Venerable Mahanayake Theros. Several Members in the Government ranks themselves consciously kept away from participating when a Division was called for last evening. One Member of the Government, the Hon. (Ven.) Athuraliye Rathana Thero quite decisively voted against the approval of these two Orders. Is it the Hon. Minister's position that he also has been misled by the Opposition? Why is it? Ask yourself, "why"? Leave aside what the Opposition says; leave aside the people you say have been misled; are you not able to convince even Members in your ranks, Members who support every other effort of the Government? You are unable to convince them that this does not include a gambling enterprise.

Now, this is what the Orders state. I quote:

"The above Strategic Development Project shall be called and known as a 'the Project to establish and operate an Integrated Super Luxury Tourist Resort which consists.... high-end shopping malls, high quality residencies and office spaces/service spaces .... ' ".

What these services are, we do not know.

"...with associated facilities..."

Both Orders have the words, "service spaces with associated facilities".

The Opposition and the Hon. Karu Jayasuriya moved that this be clarified very clearly and be made known to the country. If, as you say, all this anxiety is unfounded, the anxieties of the Venerable Mahanayake Theros are unfounded, the anxieties of your own Government Members are unfounded, why could the Orders specifically not exclude those enterprises, which most intelligent people in this country including several in your ranks know to be "associated facilities", are the services you mentioned that will occupy those service spaces, in these two projects? That is why for the first time perhaps there have been so many abstentions from the Government and even a vote against.

This country has a rich tradition. It is a home of at least four great religions, not just one or two but four great religions of this world. What does Buddhism say about gambling? In the Sutta Pitaka, in the Sigalovada Sutta of Digha Nikaya, Buddha explains. "There are, young householder, these six evil consequences in indulging in gambling: (1) the winner begets hate; (2) the loser grieves for lost wealth; (3) loss of wealth; (4) his word is not relied upon in a court of law; (5) he is despised by his friends and associates; (6) he is not sought after for matrimony, for people would say he is a gambler and is not fit to look after a wife".

"What are the six channels for dissipating wealth which he does not pursue? (a) indulgence in intoxicants which cause infatuation and heedlessness; (b) sauntering in streets at unseemly hours; (c) frequenting theatrical shows; (d) indulgence in gambling which causes heedlessness; (e) association with evil companions; and (f) the habit of idleness".

It is not only Buddhism that has so much to say about gambling, intoxication and debauchery. All of these associated activities may be included in the two Orders that are being debated.

The Rig-Veda from the Hindu scriptures 10:34:13 has this to say: "Play not with dice; no, cultivate thy own land. Enjoy the gain, and deem that wealth sufficient". It says, "Do not play with the dice. You work with your own hands. Earn, that wealth deem it sufficient".

The Bhagavad Gita arose from the epic Mahabharat. That whole epic is founded on how kingdoms were lost as a result of gambling; not only the kingdom but even the wife was pawned and lost and it led to this great war that resulted in brothers killing each other.

Take the other religious scriptures. In the Quran, Chapter 5, Verses 90 and 91, states: "O you who believe, intoxicants, and gambling, and the altars of idols, and the games of chance are abominations of the devil; you shall avoid them, that you may succeed. The devil wants to provoke animosity and hatred among you through intoxicants and gambling, and to distract you from remembering God, and from obscuring the Contact Prayers. Will you then refrain?"

I am glad that at least the Sri Lanka Muslim Congress has desisted from voting for these Orders and stayed away, but they should have had the guts to come into the Chamber and vote against this as did the Hon. (Ven.) Athuraliye Rathana Thero. Bold, he was yesterday, stood by his principles, understood his scriptures, understood the injunctions of his religion and was willing to be counted even as one person in the midst of so many. I am saddened that the Sri Lanka Muslim Congress does not have the spine to stand for what they believe; to stand for their own scripture.

I referred to three religious teachings. I am a Christian. We abhor gambling. We are taught not to participate in games of chance; that we must work with our hands; that we must do an honest job of work and earn a living only out of the sweat of our brow and not to engage in games of chance. It is not only that. Even the irreligious can take this to heart. A recent study done by Professor John Weltle of the University at Buffalo Research Institute on Addictions shows clearly that gambling is the second-most destructive addiction after drug addiction and casino habits is the third biggest reason for family breakdown. We see this all the time;

how families go to ruin when the breadwinner earns a little money and gambles it away. A gambler never wins. It is a myth that through gambling you can win. It entices you; it keeps you and it lures you to spend more; to invest more. It is always the agency that wins; it is the enterprise that wins; it is the owners of the gambling dens who always win. They never make a loss. So, they prey on the weakness of the people. They prey on the avariciousness of people, who think that they can make a quick buck this way and that is a grave sin according to any religious teaching and even thinking areligiously, looking at what these vices do to family life, to people in their own life; and if one is to be responsible, one will keep all of that away.

You cannot say that you are bringing in foreign investment and therefore whatever that investment does, is good. This is just like gambling itself - the lure of money. You think you are gaining but eventually it is this country, it is the people of this country who will lose. Those who come with this investment of US Dollars 300 million are not coming to do charity in this country. They are coming with that money to make more money. These persons have been named. These persons are known. The business that they are involved in at present is well-known to the world. That is why the fears have been raised. That is why there is anxiety that has been expressed in the letter thatthe Hon. Joseph Michael Perera tabled, which has been written by the Venerable Mahanayakes. You do not bring a gambler to invest and then assuade the people, try and explain it to the country and say, “No, there is not going to be any gambling. They are coming to build hotels and rooms, swimming pools and leisure areas and the health of the country will be better because there will be exercise facilities”. No, a gambling enterprise, invests only to run that enterprise. See the kind of people you have attracted; see the kind of people who have offered, whose investment you have already accepted.

So, it is a lure of money. We understand that the Government is cash-strapped. We understand that the economy is doing badly. However much you window-dress the Central Bank Report, in that itself there is enough to show the perilous state the country’s economy is in. Therefore, to keep things afloat, while keeping things afloat, you yourself make some money on the side, line your own pockets, and you are bringing these people in, calling them "investors". They are not investors. They are sharks. They are like the loan sharks. They come with this money only to take away more money from us and this is the danger that has very clearly been realized by all right-thinking people, by the religious sector - all the religions - and by people in your own ranks. Unfortunately, except one, others did not have the backbone to speak against it and vote against it. They were merely hanging around outside in the Lobby. But, that will change. If you see how the voting has been in the last four years on Bills and Orders that have been placed before this House, how at the beginning - take the Eighteenth Amendment for example - everybody voted, not one person could move. At the time of the impeachment of the Chief Justice, there were abstentions from the Government ranks. And, yesterday we saw the most welcome spectacle of more than 60 people abstaining effectively by staying away and one person actually voting against. Therefore, please see the writing on the wall. If you go on in this way, working against the interests of the country; working against the cultural traditions, the religious underpinnings of this country, very soon you will be out of the door.

Thank you very much.

[අ. භා. 4.01]

**ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතියි. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ විශාල හෝටල් තුනක් සහ සාප්පු සංකීර්ණයක් ගොඩ නැඟෙන විශේෂ ගැසට් නිවේදන තුන පිළිබඳ මේ විවාදය සම්පූර්ණයෙන්ම විපක්ෂය පාවිච්චි කළේ කැසිනෝ පනත කියලායි. මේ පිළිබඳව කථා කළ හැම මන්ත්‍රීවරයාම මේක කැසිනෝවලට බද්ධ කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා කිව්වා වාගේම මීට පෙර මේ පිළිබඳව ගැසට් නිවේදනය නිකුත් කළ අවස්ථාවේදී එහි තිබුණ කැසිනෝ බද්ද හා කැසිනෝ කථාව නිසා තමයි මහානායක හාමුදුරුවරු විරෝධය පළ කළේ. මේ රජය ඒ කැසිනෝ බද්ද සම්පූර්ණයෙන් ඉවත් කරලා දමලා; ඒ කථාව ඉවත් කර දමලා අලුතින් ගැසට් නිවේදන තුනක් පළ කළේ අතිගරු මහානායක හාමුරුවරුන්ගේ ඒ ඉල්ලීමට විශේෂ ඇහුම්කන් දීමක් හැටියටයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ සූදුව, කැසිනෝ පටන් ගත්තේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි. 1988 කැසිනෝ පනත ගෙනාවේ එක්සත් ජාතික පක්ෂයයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය කැසිනෝ විතරක් නොවෙයි, ඒ වෙලාවේ ජැක්පොට් ගෙනාවා. ජැක්පොට් ගෙනැල්ලා, පාසල් ඉදිරිපිට, පන්සල් ඉදිරිපිට, පල්ලි ඉදිරිපිට, කෝවිල් ඉදිරිපිට, දහම් පාසල් ඉදිරිපිට ජැක්පොට් ගහන්න ඉඩ දුන්නා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි, එවකට ආසියාවේ හිටපු කැසිනෝ රජා ජෝසිම් ලංකාවට ගෙනාවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ජෝසිම්ට ආරක්ෂාව සැපයුවා. එදා මම විපක්ෂයේ ඉඳ ගෙන රංජන් විජේරත්න රාජ්‍යාරක්ෂක කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගෙන් මේ පිළිබඳව ප්‍රශ්න ඇහුවා. එදා මම පොඩි පොත් පිංචක් ලිව්වා, "ජෝසිම් සහ එජාප නඩය" කියලා. එදා අගමැතිතුමා හැටියට හිටපු විජේතුංග ජනාධිපතිතුමා කැසිනෝ රජා ජෝසිම් එක්ක ඉන්න පොටෝ එකක් තිබුණා. එදා මට එක්සත් ජාතික පක්ෂයෙන්මයි ඒක දුන්නේ. ඒ පොටෝ එක ඒ පොත් පිංචට දැම්මා. එදා හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ මැතිනිය; ප්‍රේමදාස මැතිනිය ජෝසිම් එක්ක ඉන්න පොටෝ එකක් මට එක්සත් ජාතික පක්ෂයෙන් දුන්නා. ඒකත් අපි ඒ පොතට දැම්මා.

[ගරු එස්.බී. දිසානායක මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ජැක්පොට් මහා වසංගතයක් වෙලා බේරා ගන්න බැරි තැන ඒ අය ඒක නැවැත්වුවා. ඒක ඇත්ත. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය මේ පනත යටතේම සූරන ලොතරැයිය ගෙනාවා. ඒ කාලයේ අපේ ටැක්සි රියැදුරෝ ලොතරැයි හූරලා ගෙදර ගියේ හිස් අතින්. පිටකොටුවේ බඩු කර ගහන අහිංසක කම්කරුවෝ අලුතින් ආපු සූරන ලොතරැයි සූරලා ගෙදර ගියේ හිස් අතින්. ඒ කාලයේ pavement එකේ පුංචි වෙළෙන්දෝ ලොතරැයි සූරලා ගෙදර ගියේ හිස් අතින්.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, race-by-race ගෙනාවා. රූපවාහිනියේ රේස් එක දිහා බලලා ඔට්ටු අල්ලන්න ක්‍රම මේ පනත යටතේ හැදුවේ එක්සත් ජාතික පක්ෂයයි. වෙනත් කවුරුවත් නොවෙයි. ඒක කළේ එක්සත් ජාතික පක්ෂයයි. ඒක පටන් ගත්තේ කොහොමද? හැම දාම නගර සභාවල හිටියේ එක්සත් ජාතික පක්ෂයේ අයයි. අදත් ඔය කැසිනෝ ක්ලබ්කාරයෝ ඔක්කොම එක්සත් ජාතික පක්ෂයේ නගර සභාවෙන්, පුංචි විනෝද බද්දක් ගෙවලා පුංචි ලයිසන් එකක් අර ගෙන තමයි ඔය කැසිනෝ කරන්නේ. [බාධා කිරීමක්] ජැක්පොට් ක්‍රීඩාවත් එහෙම තමයි. ඔය කැසිනෝකාරයෝ සියල්ලම පටන් ගත්තේ ජැක්පොට්වලින් තමයි. ජැක්පොට් තමයි කැසිනෝ දක්වා ගියේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂ නගර සභාවට පුංචි විනෝද බද්දක් ගෙවලා පටන් ගන්න ඉඩ දුන්නු කැසිනෝ සූදුමය ව්‍යාපාරය මිලියන 10ක බද්දක් ගෙවලා ඒකට නීත්‍යානුකූල බවක් අරගෙන කොළඹ හැම තැනකම මේක පටන් ගත්තා. කොළඹ හැම හන්දියක් ගානේම පුංචි පුංචි කැසිනෝහල් තිබුණා. පුංචි පුංචි සූදු ක්‍රීඩා තිබුණා. ඒවා විනෝද ක්‍රීඩා කියලා තමයි නගර සභාවෙන් ඒවාට ලයිසන් එක දුන්නේ. ඒක දුන්නේ එක්සත් ජාතික පක්ෂ නගර සභාවෙන්. ඒ සූදු පනත ගෙනාවේ එක්සත් ජාතික පක්ෂය. මේ මිලියන 10ක - ලක්ෂ 100ක - බද්ද ලක්ෂ 1000ක් දක්වා වැඩි කරලා එය සීමා කළේ රාජපක්ෂ යුගයේ රාජපක්ෂ රජයයි. අර පුංචි පුංචි කැසිනෝකාරයන්ට අද ඒක කරගෙන යන්න බැරිව ඒ කැසිනෝහල් වැසී ගිහින් තිබෙනවා. මේ පුංචි පුංචි කැසිනෝකාරයන් ළඟට තමයි අපේ රටේ අහිංසක මිනිසුන් කෑම පැයේදී, සවස වැඩ ඇරිලා යද්දී ගිහින් කැසිනෝ ගහලා හිස් අතින් ගෙදර ගියේ. ඒ නිසා ඉතිහාසයේ මේ සූදු ව්‍යාපාරයේ උරුමකරුවා තමයි දැන් බණ කියන්නේ.

සුමන්තිරන් මන්ත්‍රීතුමා සිඟාලෝවාද සූත්‍රයෙන් කරුණු කිව්වා; ධම්ම පදයෙන් කිව්වා; භගවත් ගීතාවෙන් කිව්වා; ක්‍රිස්තියානි ආගමේ කියමන් අරගෙන කිව්වා. මේ සියල්ල ඇත්ත. ඒ නිසා තමයි අතිගරු ජනාධිපතිතුමා අය වැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේ දී කිව්වේ, අපේ දරුවන්ගෙන්, අපේ රටේ ජනතාවගෙන් මේක වෙන් කරලා, සංචාරකයන්ට පමණක් මෙය සීමා කරන්න මේවා එක තැනකට ගෙනෙන්න ඕනෑ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කැසිනෝ ව්‍යාපාරිකයන් හෙට ඒ තමන්ගේ බලපත්‍රය පාවිච්චි කරලා අලුතෙන් කැසිනෝ ව්‍යාපාරයක් පටන් ගත්තත් ඒ පටන් ගන්නෙත් එක්සත් ජාතික පක්ෂය 1988 වර්ෂයේ දී ගෙනාපු ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත යටතේයි; එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ නගර සභාවෙන් ලබා ගත් විනෝද බදු සහතිකය යටතේයි.

මේ සම්බන්ධයෙන් අපට කිසිම කතන්දරයක් නැහැ. අද මේ රටේ සිදු වන වේගවත් ආර්ථික සංවර්ධනය නිසා විපක්ෂයට විශාල බයක් ඇති වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවර ලෝකයේ වේගයෙන්ම සංවර්ධනය වුණු රට හැටියට චීනය සියයට 8.7ක සංවර්ධන වේගයක් ලබා ගනිද්දී ශ්‍රී ලංකාවේ අපි ලෝකයේ දෙවැනි තැනට පත් වෙමින් සියයට 7.3ක සංවර්ධන වේගයක් ලබා ගෙන තිබෙනවා. විපක්ෂයට මේක දරන්න බැහැ. ඩොලර් 900ට තිබුණු ඒක පුද්ගල ආදායම අද ඩොලර් 3,400ක් දක්වා ඉහළ ගිහින් තිබෙනවා. විරැකියාව සියයට 4.6ක් දක්වා පහළ බැහැලා තිබෙනවා. දුප්පත්කම සියයට 4.8ක් දක්වා පහළ බැහැලා තිබෙනවා. ආයෝජන වැඩි වෙනවා. 2005 වර්ෂයේ දී තිබුණු විදේශ ආයෝජනවල වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 287යි. අද එය ඩොලර් මිලියන 1,391ක් දක්වා ඉහළ නැඟලා තිබෙනවා. මුළු රටම ණය කරලා, මිනිසුන්ගේ ඔළු උඩ ණය කන්දක් පටවලා තිබෙනවා කියලා විපක්ෂය කියනවා. ඒක වැරැදියි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ රනිල් යුගයේ තමයි - ඒ ආණ්ඩුවේ මමත් සිටියා- ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 102ක්, සියයට 104ක්, සියයට 106ක් දක්වා ඉහළ ගියේ. ණය ප්‍රමාණය රටේ ආර්ථිකයට දරන්න පුළුවන්ද, බැරිද කියන ආර්ථික න්‍යාය සඳහා එය රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන්, රටේ වාර්ෂික ආදායමෙන් මොන අනුපාතයක් ගන්නවාද කියන එක බලන්නට ඕනෑ . සියයට 106කට තිබුණු ණය අනුපාතය අතට ගත් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අද එය සියයට 77ක් දක්වා පහළට ගෙනැවිත් තිබෙනවා. ගිනි පොලියට ණය ලබාගෙන නැහැ. ඒකත් වැරැදියි. අදත් අප රටේ සමස්ත ණය අනුපාතය සියයට 2න් පහළ මට්ටමක තියා ගන්න මේ රාජපක්ෂ රජය ශක්තිමත් වෙලා තිබෙනවා. ඒක නිසා තමයි මේ අයට ඉවසන්න බැරි වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ සංචාරක ව්‍යාපාරය පිනුම් ගසාගෙන නැඟිටලා තිබෙනවා. ලක්ෂ 4ක් සංචාරකයෝ නැතිව තිබුණු රටේ සංචාරකයන්ගේ පැමිණීම ලක්ෂ 14ක් දක්වා ඉහළ ගියා. එහෙම වැඩි වුණේ කැසිනෝ නිසා නොවෙයි; කැසිනෝ තිබෙන හෝටල් ඇරලා නොවෙයි; ඒ විෂයය භාර අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉතා නිවැරදි විධියට මේ රටේ සංචාරක ව්‍යාපාරය කළමනාකරණය කරමින්, ප්‍රචාරක කටයුතු කරමින් එය දියුණු කළ නිසායි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මේ තර්ක හරහා මතු කරන සියලුම දේවල්වල චෝදනාව එල්ල වන්නේ එක්සත් ජාතික පක්ෂයටයි. අපට ඕනෑකම තිබෙන්නේ මේ රටේ සේවා ඉහළට නංවලා, රටේ විදේශ ආයෝජන ඉහළට ගෙනැත්, අපේ නිවැරදි කළමනාකරණය හා ප්‍රචාරණය නිසා වැඩි වන සංචාරක ව්‍යාපාරය තවත් දියුණු කරන්නයි.

මේ රටේ තිබුණු තිස් අවුරුදු යුද්ධය අවසන් වෙලා මේ රට සාම කලාපයක් බවට පත් වුණාට පසුව ලෝකයේ ආකර්ෂණය වැඩි වෙමින් මතු වන සංචාරක ව්‍යාපාරයට, ඒ සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න දැවැන්ත හෝටල් සංකීර්ණ අපට අවශ්‍යයි. අපේ රටේ මේ වන විට දැවැන්ත හෝටල් සංකීර්ණ 403ක් ඉදි වෙමින් තිබෙනවා. මේ හෝටල් ආයෝජකයන්ගෙන් සියයට 90ක් දේශීය ව්‍යාපාරිකයන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පටන් ගන්නා වූ දැවැන්ත හෝටල් සංකීර්ණ තුන එක තැනකට ගෙනැත් ඒවා විදේශිකයන්ට, සංචාරකයන්ට වෙන් කරන්න ඕනෑ නිසා තමයි ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ මේ හෝටල් තුනට විශේෂ පහසුකම් සලසලා මේ අයට ලංකාවට එන්න අවසර දීලා තිබෙන්නේ.

චීනය බලවත්, විශාල රටක්; මහා වෙළඳ පොළක්. චීනයට යන ආයෝජකයන් ඒ වාගේ ලංකාවට එන්නේ නැහැ. සිංගප්පූරුවට මාසයකට දසලක්ෂයකට වඩා සංචාරකයන් එනවා. අප සංචාරක ව්‍යාපාරය වේගයෙන් -සියයට 154කින්- වැඩි කර ගත්තාට, තවමත් අපේ වාර්ෂික සංචාරකයන්ගේ පැමිණීම ලක්ෂ 13යි, ලක්ෂ 14යි. ඒ නිසා අප ඔවුන්ට විශේෂ බදු සහන හා වරප්‍රසාද, ඉඩ ප්‍රස්ථා ලබා දුන්නේ නැත්නම් ඒ ආයෝජකයන් ලංකාවට එන්නේ නැහැ. මේ ආයෝජකයන්ගේ ආකර්ෂණය

ලංකාවට ලැබෙමින් තිබෙන එක ඉවසා ගන්න බැරි නිසා තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ දැවැන්ත හෝටල් සංකීර්ණ තුනේ ව්‍යාපෘතියට කැසිනෝ එකක් පටලලා, සූදුවක් පටලලා ඒකට විරුද්ධව විශාල ව්‍යාපාරයක් අරගෙන යන්න උත්සාහ දරන්නේ.

මම කියන්න කැමැතියි, අද ධම්ම පදයේ ගාථාව කියන්න ඕනෑ එක්සත් ජාතික පක්ෂයට බව. භගවත් ගීතාවල තිබෙන සූදු හොඳ නැහැය කියන කතන්දරය කියන්න ඕනෑ එක්සත් ජාතික පක්ෂයටයි. අප නොවෙයි මේවා පටන් ගත්තේ. ජැක්පොට් පටන් ගත්තේ අපිද? [බාධා කිරීමක්] අපිද පටන් ගත්තේ? සූරන ලොතරැයිය පටන් ගත්තේ අපිද? අශ්වයන් දුවන හැටි රූපවාහිනියෙන් බලා ඔට්ටු අල්ලන්න පහසුකම් සැලසුවේ අපිද? අද මේ රටේ තිබෙන කැසිනෝ ව්‍යාපාර කීපයට ලයිසන් දුන්නේ අපිද? නගර සභාවෙන් ගත්ත විනෝද බදු ලයිසන් එකකින් -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ලයිසන් දුන්නේ පස්සේ.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ඒක වෙන කථාවක්. හැබැයි දුන්නේ එක්සත් ජාතික පක්ෂයයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
2010න් පසුව දුන්නේ.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

දුන්නේ එක්සත් ජාතික පක්ෂයයි. මේ එකක්වත් තව වැඩි වෙන්න නොදී අර පුංචි පුංචි අගුපිල්වල තිබුණු කැසිනෝවලින් අහිංසක මිනිසුන් සූරා කාපු එක නවත්වන්න තමයි අප ලක්ෂ සියයේ බද්ද ලක්ෂ දහස දක්වා වැඩි කළේ. මේ නැඟිටින ශ්‍රී ලංකාවේ ආයෝජන ඉහළට යන්න සකස් කරපු මේ විශේෂ ආයෝජන පනත හරහා ලෝකයේ ආයෝජකයන්ට විශේෂ පහසුකම් හා වරප්‍රසාද දෙමින් ඉතාම පුංචි වෙළඳ පොළක් වන ශ්‍රී ලංකාවට මේ අය ආකර්ෂණය කර ගන්න මේ ගන්නා වූ ව්‍යායාමයට ඊර්ෂ්‍යා කරන්න එපා කියලා මම ඔබතුමන්ලාට කියනවා. මේ රට නැඟිටින්න පටන් අරගෙන තිබෙනවා; දියුණු වෙන්න පටන් අරගෙන තිබෙනවා. රට වේගයෙන් මධ්‍යම පන්තියට එන්න පටන් අරගෙන තිබෙනවා. මේ වෙලාවේ මේ උත්සාහ කළේ මහා හෝටල් ව්‍යාපෘති තුනට සූදුව පටලවා, ගණිකා වෘත්තිය පටලවා, මේ රටේ හාමුදුරුවරුන් අවුස්සා, මේ රටේ ආගමික නායකයින් අවුස්සලා, අවුස්සලා මේ රට අවුලකට ගෙන යන්නයි. එහෙම කරන්න එපා. අපේ රටට ආයෝජකයන් අවශ්‍යයි; ඔවුන්ගේ මුදල් අවශ්‍යයි; දැවැන්ත හෝටල් සංකීර්ණ අවශ්‍යයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දිනපතා අපේ ශ්‍රී mලංකාව අසලින් එහා මෙහා යන 400ක් විතර නැව්වලින් නැව් 50ක් 60ක් අපේ වරායන්ට ගෙන්වා ගන්න අප බලාපොරොත්තු වෙනවා. රට වටේ දැවැන්ත වරායන් 6ක් ඉදි වන්නේ ඒ නිසායි. එතකොට මාස තුන හතර මුහුදේ ඉඳලා එන නාවිකයන්ට ඉහළ පහසුකම් තිබෙන හෝටල් අවශ්‍යයි. නැත්නම් ඒ මිනිස්සු අපේ වරායන්වල නැංගුරම් දමන්නේ නැහැ. අපේ දරුවන්ට තව වැඩි වැඩියෙන් රැකියා උපද්දන එක අවශ්‍යයි. අද අපේ දරුවෝ තේ කර්මාන්තයෙන්, රබර් කර්මාන්තයෙන්, කුරුඳු කර්මාන්තයෙන්, පොල් කර්මාන්තය ආශ්‍රිත රැකියාවලින් ඉවත් වෙනවා. දරුවෝ ඒ රක්ෂාවලට යන්නේ නැහැ. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතට අදාළ නියමයන් අනුව මේ දැවැන්ත ව්‍යාපෘති දෙකෙත් එකම අරමුණ වන ලංකාවේ ආයෝජන වැඩි කරමින් ලංකාව අද ලෝකයේ වේගයෙන් සංවර්ධනය වන දෙවන රට හැටියට තවදුරටත් ඉස්සරහට ගෙන යන බව කියමින් මා නිහඬ වෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Anura Dissanayake. Before he starts, will an Hon. Member propose the Hon. Janaka Bandara to take the Chair?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

I propose that the Hon. Janaka Bandara do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair and* THE HON. JANAKA BANDARA *took the Chair.*

[අ.භා. 4.17]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු එස්.බී. දිසානායක අමාත්‍යතුමා මේ නියමයන් දෙකට එකඟ වීම ගැන මා පුදුම වන්නේ නැහැ. මොකද, එතුමා ලාස්වේගාස්වලට ගිය වෙලාවේත් කැසිනෝ ගැහුව ඇමතිතුමායි. ඒ නිසා එතුමා බොහොම කැමැති වෙනවා නේ බොහොම උජාරුවට විජේවර්ධන මාවතේ කැසිනෝ ගහන්න. ඒ නිසා එස්.බී. දිසානායක ඇමතිතුමාගේ විරුද්ධ නොවීම හරි පැහැදිලියි. මට ඒක තේරුම් ගන්න පුළුවන්. ඒකට අප කැමැතියි. මොකද, එතුමා ඒක කෙළින් කියනවා. ඒක එහෙම තිබෙනවාය කියනවා. ඒක හොඳයි. මේ ව්‍යාපෘතිය පිළිබඳව ඉදිරිපත් කළ අංක 1847/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයට ඊයේ ඡන්දය විමසුවා. විශේෂයෙන්ම අපේ හෙළ උරුමය නියෝජනය කරන අතුරලියේ රතන හාමුදුරුවෝ ඒකට විරුද්ධව ඡන්දය පාවිච්චි කළා. අප අතර විවිධ දේශපාලන වෙනස්කම් තිබෙනවා. හැබැයි, අප සියලු දෙනා එක දේශපාලන ප්‍රභවයකින් දේශපාලනය පටන් ගත් අයයි. උන්වහන්සේ තුළ එන හැඟීම්, එම වුවමනාවන් තවදුරටත් ආරක්ෂා කර ගනිමින් මෙම පනතට විරුද්ධව ඡන්දය පාවිච්චි කිරීම පිළිබඳව අප බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම දේශප්‍රේමිත්වය පිළිබඳව හඬ නඟන මහත්වරු ටිකක් මේ ආණ්ඩුවේ සිටිනවා. වචන දහයක් කථා කළොත් දේශප්‍රේමිත්වය ගැන වචන හතරක් පහක් පටලවන, දේශප්‍රේමිත්වය තවරා ගත්, දේශප්‍රේමිත්වය උජාරුවට පාරම්බාන මහත්වරු ටිකක් සිටියා. හැබැයි, ඒ මහත්වරු ඊයේ මේ සභාවට ආවේ නැහැ. නිකම් බෙරිහන් දෙන්නේ නැතුව අඩුම තරමේ ඒ මහත්වරුන්ට ඇවිත් ස්ථාවරය මොකක්ද කියාවත් මේ පාර්ලිමේන්තුවේ කියන්න තිබුණා. අදත් ඒවිද දන්නේ නැහැ, බලාගෙන ඉඳිමු.

[ගරු අනුර දිසානායක මහතා]

දැන් මෙතැන තිබෙන ප්‍රධාන තර්කය තමයි මෙතැන කැසිනෝ තිබෙනවාද නැද්ද කියන එක. ගරු එස්.බී. දිසානායක අමාත්‍යතුමාගේ කථාවෙන් පැහැදිලි වන්නේ සංචාරක ව්‍යාපාරය අපේ රටේ ආර්ථිකයේ ප්‍රධාන උපාය මාර්ගයක් බවට පත් කොටගෙන තිබෙනවා; සංචාරක ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමට නම් මෙවැනි පහසුකම් ඕනෑය කියන එකයි. ඒක විවෘතව කියන්න. ගොඩක් අමාත්‍යවරු පසු ගිය දින කිහිපය තුළත් අදත් බෙරිහන් දෙමින් කෑ ගහන්නේ මේකේ කැසිනෝ නැහැ කියලායි. "නැහැ" නොවෙයි, තිබෙනවා. ඒක කියන්න. එක්සත් ජාතික පක්ෂයේ එක හොඳක් තිබෙනවා. ඒ ගොල්ලෝ ඒක කරනකොට කියලා කරනවා. තමුන්නාන්සේලා කැතයි. කරන වැඩය හංහලා කරනවා. ඒක කියන්න. ඇයි, භය? මේකේ කැසිනෝ නැහැ කියන්නේ කොහොමද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය අවුරුද්දේ ජුනි මාසයේ 11වන දා තමයි ජේම්ස් පැකර් සමඟ ගිවිසුම අත්සන් කළේ. ඒ ගිවිසුම වෙනස් කළාද? කවදාද වෙනස් කළේ? වෙනස් කළා නම් ගිවිසුම ඉදිරිපත් කරන්න. එහෙම වෙනස් කළේ නැහැ. ජේම්ස් පැකර් ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කළා. ජේම්ස් පැකර්ගේ ව්‍යාපෘති වාර්තාව වෙනස් කළාද? ඒකේ ශක්‍යතා අධ්‍යයනය වෙනස් කළාද? දැන් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න, මෙන්න BOI එකේ අවසර ගන්නා විට ජේම්ස් පැකර් ඉදිරිපත් කළ ව්‍යාපෘති වාර්තාව කියා. ඒවා තමුන්නාන්සේලා හංගනවා. ඒ විතරක් නොවෙයි. ජේම්ස් පැකර් ඔහුගේ ව්‍යාපෘතිය පිළිබඳව ඉදිරිපත් කළ වාර්තාවේ මොකක්ද තිබෙන්නේ? මෙන්න, මේ තිබෙන්නේ ජේම්ස් පැකර්ගේ වාර්තාව. මේ අපුරුවට ඉන්නේ ජේම්ස් පැකර්. මේ තිබෙන්නේ ඔහුගේ අත්සන. මේ ඔහුගේ වාර්තාව. ඔහුගේ වාර්තාවෙන් මොකක්ද කියන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහු ඉතාම පැහැදිලිව කියනවා "Sri Lanka should benefit from international gaming" කියා. ඉතින් එතැනටනේ මේ යන්න හදන්නේ. ඔය වෙනුවෙන්නේ මේක ගේන්නේ. මේ තිබෙන්නේ හෝටලේ පඩංගුව. හෝටලය කොහේද තියෙන්නේ, තියෙන සීමා මායිම්, හෝටලයේ පහසුකම්, මේ තියෙන්නේ අපුරුවට සුරූපි ලලනාවක් එක්ක කැසිනෝ මේසය. මා නිවැරදි නොවෙයි නම්, මේක කැසිනෝ මේසයක් නොවෙයි නම් ගරු එස්.බී.දිසානායක ඇමතිතුමාගෙන් දැන ගන්නට පුළුවන්. මේක කැසිනෝ මේසයක් තමයි. එතුමා දන්නවා. මේක ජේම්ස් පැකර්ගේ වාර්තාව නේ. තමුන්නාන්සේලා කියනවා, මේකේ කැසිනෝ නැහැ කියා. මේ ජේම්ස් පැකර්ගේ "Crown Sri Lanka" නමැති වාර්තාව. මේකේ ජේම්ස් පැකර් කියනවා, gaming තිබෙනවා කියා. ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා මෙතැන ඇවිත් කියනවා, "නැහැ" කියා. ඇමතිතුමා දන්නවානේ ඕස්ට්‍රේලියාවේ ජේම්ස් පැකර්ලාත් එක්ක සාකච්ඡා කළ විධිය. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. දෙවන කාරණය. [බාධා කිරීමක්] ඔව්. හෝටලය ගහනකොට ඔබතුමා ඇමති නොවෙයි නේ. ඔබතුමා ඕක දන්නවා නේ. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ගිහිල්ලා බලන්න www.crownsrilanka.com වෙබ් අඩවියට. ඒ වෙබ් අඩවිය මොකක්ද කියන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකේ කියන්නේ "world class gaming facilities" මේ හෝටලයේ තියෙනවා කියන එකයි. [බාධා කිරීමක්] මේක නැහැයි කියන්නේ කොහොමද? [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, මේ www.crownsrilanka.com වෙබ් අඩවියේත් "Crown Sri Lanka" ව්‍යාපෘති වාර්තාවේත් මේ හැම එකකම මේ හෝටලයේ කැසිනෝ තිබෙනවාය කියා කියනවා. මෙතැන බොරුවට කෑ ගහනවා, "කැසිනෝ නැහැ "කියා. කැසිනෝ නැත්නම් ඒ බව ගැසට් එකට දාන්න කෝ. කැසිනෝ, ඔට්ටු ඇල්ලීමේ පහසුකම් නැහැ කියා ගැසට් එකට දාන්නේ නැහැ. ඒවා හංගනවා. ඒවා හංගලා මෙතැන කියනවා, කැසිනෝ නැහැ කියා. මේකේ කැසිනෝ තිබෙනවා. ජේම්ස් පැකර් කැසිනෝ නැතිව ලෝකයේ කොහේවත් හෝටල් දාලා නැහැ. ජේම්ස් පැකර් කොහේද කැසිනෝ නැතිව හෝටල් දාලා තියෙන්නේ? ජේම්ස් පැකර්ගේ ප්‍රධාන ව්‍යාපෘතිය කැසිනෝ. කැසිනෝ සඳහා හෝටල් දානවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැසිනෝ සඳහා හෝටල් දානවා. එතකොට අප ඒකට කියන්නේ කැසිනෝ ව්‍යාපෘතිය කියලා. දැන් මෙතුමන්ලා කියනවා, හෝටලය හදනවා; කැසිනෝ නැහැ කියා. ජේම්ස් පැකර් කොහේවත් කැසිනෝ නැතිව හෝටල් හදන කෙනෙක් නොවෙයි. ඒ නිසා කැසිනෝ තියෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට වැදගත්ම වූ සාධකය මම කියන්නම්. එක පැත්තකින් මේකේ කැසිනෝ තිබෙනවා. අනෙක් පැත්තෙන් මොකක්ද? මේකෙන් මේ ගොල්ලන්ට සියලුම බදු සහන දෙනවා. ඒ බදු සහන මොනවාද? සංස්ථාපිත ආදායම් බදු නිදහස් කරනවා. ලාභාංශ මත බද්දෙන් නිදහස් කරනවා. රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කරනවා. උපයන විට ගෙවීම් බද්දෙන් නිදහස් කරනවා. 2001 අංක 14 දරන එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරනවා. 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපොළ බද්දෙන් නිදහස් කරනවා. 2003 අංක 3 දරන මුදල් පනත බද්දෙන් නිදහස් කරනවා. රේගු ආඥාපනත යටතේ බදු නිදහස් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට බදු නිදහස් කරනවා, මේ ව්‍යාපෘතිය -[බාධා කිරීමක්] මම ඒකට එන්නම්. ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘතියට මම එන්නම්. පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු අමාත්‍යතුමා, ගරු මන්ත්‍රීතුමාට කථාව කර ගෙන යන්න අවස්ථාව දෙන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මේ ව්‍යාපෘතිය පටන් ගන්නේ 2017 දීයි. 2017 සිට අවුරුදු 3කින් පස්සේ තමයි බදු ගැන සිතන්නේ. බදු ගැන සිතන්නේ අවුරුදු 3කින් පස්සේයි. ඊළඟට අවුරුදු 10ක් බදු නිදහස් කරනවා. තව අවුරුදු 15ක් -[බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න දෙන්න. බාධා කරන්න එපා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

2017 දී හෝටලය විවෘත කරනවා. හෝටලය හදන්න සියලු බදු පහසුකම් නිකම් දෙනවා. 2020 අවුරුද්දේ බදු අය කරන්න ගන්න පටන් ගන්නවා. 2020 සිට 2030 දක්වා සියලු බදු නැවත නිදහස් කරනවා. 2030 සිට 2045 දක්වා තව අවුරුදු 15ක් අර්ධ බදු අය කරනවා. මොකක්ද වෙන්නේ මේ? තමුන්නාන්සේට සතයක් බද්ද ගන්න ඔය ඇමතිකමේ ඉතිරි වන්නේත් නැහැ. මතක තබා ගන්න. මහජනයාට බදු පිට බදු පටවන තමුන්නාන්සේලා -සුදුරු ටිකට,කොත්තමල්ලි ටිකට බදු ගහන තමුන්නාන්සේලා - ජේම්ස් පැකර්ලාට බදු සහන දෙනවා. තමුන්නාන්සේලා ගිහිල්ලා ඡන්දයත් ඉල්ලා ගන්න ජේම්ස් පැකර්ලාගෙන්. ඡන්දය ඉල්ලනවා හක්මන ජනතාවගෙන්. ඒ ගොල්ලන්ට සුදුරු, මහදුරු, කොත්තමල්ලිවලට බදු ගහනවා.

ජේම්ස් පැකර්ලාට බදු සහන දෙනවා. තමුන්නාන්සේලා මීට පස්සේ ගිහින් ජේම්ස් පැකර්ලාගෙන්ම ඡන්දයත් ඉල්ලා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක්ද? ඒ විතරක් නොවෙයි. ප්‍රධාන ප්‍රශ්නය, - [බාධා කිරීමක්] ඔව්. ජේම්ස් පැකර්ගේ සල්ලිවලින් හක්මන ඡන්ද කරනවා. ඒකත් ඇත්ත. ඒකත් එකතු කිරීමක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ප්‍රධාන ප්‍රශ්නය මොකක්ද? ආණ්ඩුවේ සංවර්ධන උපාය මාර්ගයක් බවට කැසිනෝත් අරගෙන තිබෙනවා. ඒක නිසා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ දැන් කැසිනෝ එනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මෙතෙක් කාලයක් තැන, තැන කැසිනෝ තිබුණා තමයි. මුදලාලිලා ලයිසන් අරගෙන හෝ නොගෙන හොරෙන් හෝ යහළුවන් නිසා හෝ කැසිනෝ ගැහුවා. හැබැයි ලංකාවේ පළමුවන වතාවට මොකද වෙන්නේ? කැසිනෝ ව්‍යාපෘතියත් ආණ්ඩුවේ ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘතියක් හැටියට නම් කරනවා. ඒකට ආණ්ඩුව මොකක්ද කියන්නේ? තමන්ගේ සංවර්ධන උපාය මාර්ගයේ කොටසක් හැටියට කැසිනෝ ව්‍යාපාරය පත් කරනවා. ඔහොම ආදායම් ගන්න අය ගම්වලත් ඉන්නවා. සාමාන්‍යයෙන් ගම්වල බූරු ගහනවා. බූරු ගහන අයත් ඉන්නවා. බූරු ගස්සවන අයත් ඉන්නවා. බූරු ගස්සවන එක්කෙනාට තෝන් හම්බු වෙනවා.

එතකොට බූරු ගස්සවලා තෝන් ගන්නවා වාගේ තමුන්නාන්සේලා මොකක්ද කරන්න හදන්නේ? කැසිනෝ ගස්සවලා ආදායම් ගන්න හදනවා. තෝන් මුදලාලිලා ටිකක් නේ මේ ආණ්ඩුව. වෙන මොකක්ද? අර ගමේ බූරු පිටියේ තෝන් මුදලාලි වාගේ තෝන් ගන්න තමයි, ඒක ආදායම් මාර්ගය බවට පත් කර ගන්න තමයි දැන් තමුන්නාන්සේලා කැසිනෝ ගෙනෙන්න හදන්නේ.

පළමුවන වතාවට නිකම් කැසිනෝ නොවෙයි, ලංකාවේ ආර්ථික උපාය මාර්ගයක් හැටියට, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක හැටියට කැසිනෝ නම් කරලා තිබෙනවා. ආණ්ඩුවේ ක්‍රමෝපායික සංවර්ධන වැඩ පිළිවෙළක් බවට කැසිනෝ පත් කර ගෙන තිබෙනවා. මේක තමයි වෙනස. ලංකාවේ නිකම් කැසිනෝ තිබුණා, තැනින්-තැන. දැන් ආණ්ඩුව කැසිනෝ තමන්ගේ ව්‍යාපෘතියක් බවට පත් කර ගෙන තිබෙනවා. කැසිනෝවලින් තෝන් අරගෙන ආණ්ඩුවක් කරන, බූරු පිටි මුදලාලිලා බවට මේ පාලකයෝ පත් වෙලා තිබෙනවා. ඒ තැනට රට පත් කරමින් තිබෙනවා. ඒකයි, අද සිද්ධ වෙලා තිබෙන්නේ.

මේවා කරන්නේ කවුද? මේවා කරන්නේ කවුද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? සාටකය පැළඳ ගත්, කුරහන් තලප ගිලින, ගිරුවා පත්තුවේ ඉපදුණු, පපුවට ගහගන්න, දේශ ප්‍රේමීත්වය පිළිබඳ හඬ නඟන, වේදිකාවේ කථා කරන කොට "අපේ හාමුදුරුවනේ" කියලා කියන, අපේ හාමුදුරුවෝ, මහා නායක හාමුදුරුවෝ කියන කිසිවක් ගණන් නොගන්නා මහා දේශ ප්‍රේමී පුත්‍ර රත්නය තමයි මේවා ගෙනෙන්නේ. එක්සත් ජාතික පක්ෂය මේවා ගෙනෙන කොට අපට පිළිගන්න පුළුවන්. ඒ ගොල්ලෝ 1977 ආර්ථිකය ආරම්භ කළේ කොහොමද, ඒ ගොල්ලෝ මොකක්ද කළේ කියන ඒවා අපට පිළිගන්න පුළුවන්. හැබැයි, මේ දේශ ප්‍රේමීත්වය පිළිබඳ කෑ මොර දෙන, දේශ ප්‍රේමීත්වයේ සාටකය පැළඳ ගෙන සිටින, ඒ සාටකයෙන් තමන්ගේ පපුවට තඩි බා ගන්න මහත්වරු තමයි මෙහෙම කරන්න හදන්නේ. මේ මොන දේශ ප්‍රේමීන්ද? මුළු රටම කැසිනෝ සූදු පිටියක් බවට පත් කරලා, ලෝකයේ ඉන්න අංක එකේ කැසිනෝ රජාලා ගෙනැල්ලා, ලෝකයේ ඉන්න අංක එකේ කැසිනෝ ව්‍යාපාරිකයන් ගෙනැල්ලා මොකක්ද මේ රටට කරන්න හදන්නේ? මා දන්නේ නැහැ, ෆයිසර් මුස්තාපා නියෝජ්‍ය ඇමතිතුමා ඊයේ ඒ පනත යටතේ ගෙනාපු නියමයට ඡන්දය දුන්නේ කොහොමද කියලා, නබි නායකතුමාගේ ධර්මය අනුව. මට ඒක තේරෙන්නේ නැහැ. අස්වර් මන්ත්‍රීතුමා නම් කොහොමත් එහෙම නේ. ඒවා වැඩක් නැහැ. එතුමාට ධර්මයක් තිබෙන්න එපා යැ. ඒ නිසා ඒක අදාළ නැහැ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සමා වෙන්න. සමා වෙන්න. මා ඒ කාරණය ඉවත් කර ගන්නම් කෝ. [බාධා කිරීමක්] නැත්නම් ආයෙත් බාධා කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අස්වර් මන්ත්‍රීතුමා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කිසිම ධර්මයක් නැති

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මගේ ඉස්ලාම් ධර්මයට නිගා කරනවා. මම හොඳ මුස්ලිම් -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එය රීති ප්‍රශ්නයක් නොවෙයි. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීමක්] අනේ! ගරු මන්ත්‍රීතුමා සමා වෙලා වාඩි වෙන්න කෝ. වාඩි වෙන්න, වාඩි වෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රියාවලිය මොකක්ද? [බාධා කිරීමක්] දේශ ප්‍රේමීත්වය පිළිබඳ සළුපිළි පටලවා ගෙන, දේශ ප්‍රේමීත්වය පිළිබඳ - [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට බාධා කරන්න එපා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா )
(The Hon. Faiszer Musthapha)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ෆයිසර් මුස්තාපා නියෝජ්‍ය ඇමතිතුමා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. What is your point of Order, Hon. Deputy Minister?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

මා අනුර දිසානායක මන්ත්‍රීතුමාගෙන් අහන්න කැමැතියි, කැසිනෝ ක්‍රීඩාව බුදු දහමට, ක්‍රිස්තියානි දහමට, හින්දු දහමට පටහැනි නැද්ද කියලා. එතුමා ඉස්ලාම් ධර්මය ගැන -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

එය රීති ප්‍රශ්නයක් නොවෙයි. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එතුමාගේ තර්කය තමයි, එම පනත යටතේ වූ නියමය බුදු දහමට පටහැනිව තිබියදීත්, බුදු දහම අදහන ආණ්ඩුවේ අයත් ඒකට ඡන්දය දුන්නාය කියන එක. එතුමන්ලාටයි ඒ කියන්නේ, මට නොවෙයි. බුදු දහම අදහන අයත් ඊයේ ඡන්දය දුන්නා. හින්දු ධර්මය අදහන අයත් ඡන්දය දුන්නා. බලන්න කෝ. එතුමා මට මතක් කරලා දෙනවා, - [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න. මෙය ඔබතුමාගේ කාලයයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ බොහෝ මන්ත්‍රීවරු, ඇමතිවරු ඉතා අහිංසකයි. මේ ව්‍යාපෘතිය කාගේද? ජේම්ස් පැකර් එක්ක හවුල් වෙන එක් කෙනෙක් තමයි රවි විජේරත්න. අපි මේවා හරියට කථා කරමු. ක්වීන්ස්බරි කැසිනෝ එක අයිති ධම්මික පෙරේරාට. අනික් එක් කෙනා තමයි, ජෝන්ස් කීල්ස් මුදලාලි. ඒක කොහේද තිබෙන්නේ? ග්ලේනි වීදියේ, අක්බාර් මාවතේ. මේ මුදලාලිලා ගැවසෙන්නේ කොහේද? මේ අය ගැවසෙන්නේ අරලියගහ මන්දිරයේ. මේ අය අරලියගහ මන්දිරයේ කැරකෙන "deal මුදලාලිලා." රවි විජේරත්නට සල්ලි කොහෙන්ද? රවි විජේරත්න මහත්මයා ජේම්ස් පැකර් එක්ක එකතු වෙනවා, ඒ ගොල්ලන්ගේ ව්‍යාපාරික ගිවිසුම් අනුව. රවි විජේරත්න මහත්මයා තමන්ගේ කොටස් වෙනුවෙන් ජේම්ස් පැකර්ට දෙන්නේ විජේවර්ධන මාවතේ අක්කර හතරේ ඉඩමයි, licence එකයි. ඔහු ඉඩමයි, licence එකයි දෙනවා. රවි විජේරත්න මහත්මයාට මේ ඉඩම හම්බ වුණේ කොහොමද? මේ ඉඩම අයිති නාගරික සංවර්ධන අධිකාරියට. මේ ඉඩම නාගරික සංවර්ධන අධිකාරියෙන් රවි විජේරත්න මහත්මයාට බදු දුන්නා, car park එකක් දමන්න. Car park එකක් දමන්න නාගරික සංවර්ධන අධිකාරියෙන් බදු දීපු ඉඩමේ අද කැසිනෝ දමන්න රවි විජේරත්නට අවසර ලැබෙන්නේ කොහොමද? මට ඒක කියන්න. මේ අක්කර හතරේ ඉඩමට කීයක් ගෙව්වාද? මේ අක්කර හතරට සල්ලි දෙන්නේ නැහැ. ආරම්භයේදී සියයට 10ක් දෙන්න එකඟ වෙනවා. අවුරුදු 20කින් තමයි ඉතුරු කොටස් හම්බ වෙන්නේ. දැන් මේ ඉඩමේ deal එක කාගේද? රවි විජේරත්නට ඉඩම හම්බ වුණේ කොහොමද? මේවා තමුන්නාන්සේලාගේ deal. මේවා නිකම් කැසිනෝ නොවෙයි. මේවා රජ ගෙදර dealවලින් හදන කැසිනෝ. මේවාට පක්ෂව මැදිරිගිරියේ අහිංසක මන්ත්‍රී අත උස්සනවා; ඇඹිලිපිටියේ මන්ත්‍රී අත උස්සනවා; මැදවච්චියේ මන්ත්‍රී අත උස්සනවා. වෙන මොනවා කරන්නද? ඒ පළාත්වල කැසිනෝත් නැහැ, එතුමන්ලාට ඒකෙන් වැඩකුත් නැහැ. රජ ගෙදර ගැවසෙන deal මුදලාලිලාගේ වැඩ මේවා.

ඊට එහා පැත්තේ ඉඩම කාගේද? ක්වීන්ස්බරි හෝටලය හදන්න යන ඉඩම කාගේද? ඒක වරායට අයිති ඉඩමක්. ඒ ඉඩම අයිති වරායට. ඒ ඉඩම කොහොමද ධම්මික පෙරේරාට ගියේ? අපිට කියන්න ඒවා. මොකක්ද මේ වෙලා තිබෙන්නේ, මේ රටේ? කොතැනද ඒ ඉඩම දෙන්න දැන්වීමක් දැම්මේ? කොතැනද ඉඩමක් දෙනවා කියලා කිව්වේ? කවුද ඉල්ලුම් කළේ? කවුරුවත් ඉල්ලුම් කරන්නේ නැතුව රවි විජේරත්නට එකවරම අක්කර හතරක් ලැබෙන්නේ කොහොමද? ධම්මික පෙරේරාට එතැන පර්චස් 500ක් ලැබෙන්නේ කොහොමද? ඒ ගොල්ලන්ගේ පාරම්පරික දේපළද, ඒවා? මේවා මේ රටේ නාගරික සංවර්ධන අධිකාරියටයි, වරාය සංවර්ධන අධිකාරියටයි අයිතිව තිබුණු ඉඩම්. ඒ ඉඩම් කොහොමද "ඩීල්කාරයෝ" අතට යන්නේ? ඒවා තමුන්නාන්සේලාගේ ඉඩම් නොවෙයි. මේ රජගෙදර ඩීල්කාරයෝ. රජගෙදර ඩීල්කාරයෝ තමයි මේ හෝටල්වලට සම්බන්ධ වෙන්නේ. ඒ නිසා තමයි මෙච්චර කෑ මොර ගහන්නේ.

බැසිල් ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ සිටියා නම් හොඳයි. මම එතුමාට කියලා දෙනවා, ඩීල්කාරයන්ගේ තරම. මම ගරු සභාවේ නැති වෙලාවේ එතුමා බොරුවට මෙතැන කෑ ගැහුවා. මම ලැහැස්තියි, එතුමාත් එක්ක මෙතැන කථා කරන්න. මේ ඩීල්කාරයන්ගේ ගේම් මේවා. අහිංසක මන්ත්‍රීවරු නිකම් මේවාට අත උස්සනවා. මේ මන්ත්‍රීවරු මේවාට හවුල් නැහැ; අඩුම තරමින් කැසිනෝ ගහන්නවත් යන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දන්නවා ඔබතුමාත් යන්නේ නැහැ කියලා. හැබැයි ඔබතුමාටත් මේවාට පක්ෂව අත උස්සන්න වෙලා තිබෙනවා. ඇයි ඒ? මේවා බලවත් deal නිසා. මේවා නිකම් deal නොවෙයි. මේවා නිකම් ගනුදෙනු නොවෙයි. මේවා රජගෙදර වටේ කැරකෙන deal මුදලාලිලාගේ ගනුදෙනු.

ජේම්ස් පැකර් ගෙනෙන්න කවුද ගියේ? ඕස්ට්‍රේලියාවට අට පාරකට වඩා ගියේ කවුද? රවි විජේරත්න. එහෙම නොවෙයිද? ඊට පස්සේ ජේම්ස් පැකර් හම්බ වෙන්න ඕස්ට්‍රේලියාවට ගියේ කවුද? මම ඒ ඇමතිගේ නමත් දන්නවා, දරුවාගේ නමත් දන්නවා. ඒක මතක තබා ගන්න. එහෙම හම්බ වෙන්න ගිහිල්ලා වෙලා ඕස්ට්‍රේලියාවේදී deal දැම්මේ නැද්ද, මේ ගනුදෙනුවලට.

"සංචාරක ව්‍යාපාරය, ආර්ථික වර්ධනය, රැකියා, මාර ගමනකට අපි යන්නේ" කියනවා. මේවා බොරු වචන නේ. මේවා ගනුදෙනු; තමුන්නාන්සේලාගේ deal; තමුන්නාන්සේලාගේ කොමිස්. ඒවා හරහා සිදු වෙන ගනුදෙනුවලට තමයි පාර්ලිමේන්තුවේදී අත උස්සලා අනුමැතිය ඉල්ලන්නේ. පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරු මේ ඉදිරි පෙළේ අසුන්වල වාඩි වෙලා ඉන්නවා. ඒ ඇමතිවරුන්ට මේ හොර ඩීල්වලට නැඟිටලා අත උස්සන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ ඇමතිවරුන් නිහඬ කරලා තිබෙනවා. මටත් වඩා හොඳට මේ විස්තර මේ ඇමතිවරු දන්නවා. සමහර දේවල් ඒ ගොල්ලෝ තමයි මට කිව්වේත්. මතක තබා ගන්න. මටත් වඩා හොඳට මේ ගොල්ලෝ දන්නවා. හැබැයි ඒ හැම දෙනාටම මොකක්ද වෙලා තිබෙන්නේ? නැඟිටලා මේවාට පක්ෂව අත උස්සන්න සිද්ධ වෙලා තිබෙනවා.

ලක්ෂ්මන් යාපා ඇමතිතුමනි, ඔබතුමාත් අහිංසකයි. ඔබතුමා ඕස්ට්‍රේලියාවට එක පාරක් ගියා, එච්චරයි. මම ඒක දන්නවා. දන්න නිසා කියන්නේ. ඔබතුමාත් අහිංසකයි. ඒකත් මම කියන්නම්, හරියට. ඔබතුමාට පාලනය කරන්න බැරි බලයක් තිබෙනවා. මේ අය නිකම් ව්‍යාපාරිකයෝ නොවෙයි. එල්ඕඑල්සී එකට නීති හැදුවේ කොහොමද? එල්බී ෆිනෑන්ස් එකට නීතිය හැදුවේ කොහොමද? රජයේ බලපත්‍ර - permits - දුන්නාට පස්සේ permit එක විකුණන්න අවසර ලබා දෙන්න නීතිය හැදුවේ ඇයි? මේවා රජ ගෙදර deal ; ගනුදෙනු. අද මේ රට යටපත් කරලා තිබෙනවා, ගනුදෙනුකාරයෝ ටිකක් විසින්.

මේ රටේ ඇත්ත ව්‍යාපාරිකයෝ සිටියා. මේ රටේ ඇත්ත නිෂ්පාදනයට හවුල් වුණ ව්‍යාපාරිකයෝ සිටියා. මේ රටේ පිරිසිදු ව්‍යාපාරිකයෝ ඉන්නවා. අපි ඒ ව්‍යාපාරිකයෝ රකින්න ඕනෑ; ඒ ව්‍යාපාරිකයන් වෙනුවෙන් පෙනී සිටින්න ඕනෑ. හැබැයි, මේ පාර්ලිමේන්තුව හෝ වෙන කවුරුන් හෝ මේ ඩීල්කාරයන් වෙනුවෙන් පෙනී සිටින්න එපා. තමුන්නාන්සේලා අද මේ ගැසට් හරහා ගෙනෙන්න හදන්නේ මොකක්ද? ඒ deal එක. ඒ ගනුදෙනුව. රජගෙදර ගනුදෙනු මේවා. නැත්නම් වෙන කොහේ ඒවාද? එහෙම නැත්නම් මෙහෙම මේ පාර්ලිමේන්තුවට එනවාද මේවා, මෙච්චර බඳු නිදහසක් දෙන්න?

අපේ මල්වතු නායක හාමුදුරුවෝ නිවේදන නිකුත් කරලා කියද්දී, ගරුතර මහා සංඝ රත්නය මේ පිළිබඳව හඬ නඟද්දී ඇයි මේක අකුළන්නේ නැත්තේ? එහෙම අකුළන්න පුළුවන් ගනුදෙනු නොවෙයි මේවා. තමන්ගේ ඊළඟ මැතිවරණ ව්‍යාපාරවලට, තමන්ගේ දරුවන්ගේ මැතිවරණ ව්‍යාපාරවලට, තමන්ගේ ඉදිරි අනාගතයට එක් රැස් කර ගන්න මහා ධනය මේ. ඒ ධනය වෙනුවෙන් තමයි පාර්ලිමේන්තුව මේ නීති සම්පාදනය කරන්න හදන්නේ. ඒ ධනය වෙනුවෙන් තමයි මේ ගැසට් ඉදිරිපත් කරන්න හදන්නේ. මම තමුන්නාන්සේලාගෙන් අහන්නේ, ඒකට අපි අත උස්සන්න ඕනෑ ද කියලායි. ඒකට අපි අත උස්සන්න ඕනෑද? ඒවා එළිදරවු කරලා මේක පරාජය කරන්න ඕනෑ නැද්ද? හදවතක් තිබෙන හැම මන්ත්‍රීවරයකුගෙන්ම අපි අහන්නේ, "ඇයි තමුන්නාන්සේලා මේ අපරාධයට හවුල් වෙන්නේ?" කියලායි. තමුන්නාන්සේලා දන්නවා, මොකක්ද මේ සිද්ධ වෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැසිනෝ කියන්නේ සූදුවක් විතරක් නොවෙයි. ආණ්ඩුව තමන්ගේ සංවර්ධන උපාය මාර්ගය ලෙස අපේක්ෂා කරන්නේ සංචාරක ව්‍යාපාරය. සංචාරක ව්‍යාපාරය රඳා පවතින්නේ විනෝදාශ්වාදය මත. ලෝකයේ සංචාරකයන් සියයට 82ක් සංචාරය කරන්නේ විනෝදාශ්වාදයට. විනෝදාශ්වාදය රඳා පවතින්නේ සූදුව, ගණිකාව හා මත් ද්‍රව්‍ය මත. ඒකට ඒ තුන ඕනෑ. මේ කැසිනෝ ශාලාව ඒකටයි එන්නේ. ඒකේ සූදුව තිබෙනවා. මත් ද්‍රව්‍ය? මත් ද්‍රව්‍ය ඇමතිවරු ගෙනැත් දෙනවා. ඒක ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. සූදුවත් තමුන්නාන්සේලා ගණනේ. ඒකත් මම පිළිගන්නවා. ඇත ගිරාඳුරුකෝට්ටේ දරුවා සූදු ගහන්න මේවාට එන්නේ නැහැ. ඒක ඇත්ත. ඒ ගොල්ලන්ට සූදු ගහන්න සල්ලිත් නැහැ. සූදුවත් තමුන්නාන්සේලාගේ, මත්ද්‍රව්‍යයත් තමුන්නාන්සේලාගේ. හැබැයි තව රස්සාවක් එතැන හැදෙනවා. ඒ තමයි ගණිකා වෘත්තිය. ඒකට තමුන්නාන්සේලාගේ දරුවෝ දෙන්නේ නැහැ. මතක තබා ගන්න. ඒකට තමුන්නාන්සේලාගේ දරුවෝ එවන්නේ නැහැ. ඕනෑ නම් තමුන්නාන්සේලාගේ දරුවෝ ඒ වැඩේට යයි; එවන්නේ නැහැ. ඇත්ත කථාව ඒකයි. ඒ නිසා අපේ දරුවන්ට ගණිකා වෘත්තිය තෝරා ගන්න රැකියා නිර්මාණය කරන ආයතන තමුන්නාන්සේලා හදනවා. මේ පාර්ලිමේන්තුවේදී අපි ඒකට අත උස්සන්න ඕනෑ ද? මේක අපි විරුද්ධ වන්න ඕනෑ එකක්. [බාධා කිරීමක්] අනේ මහත්තයෝ, ඕනෑ නම් අර තැනකට ගිහිල්ලා එන්න කෝ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ එමින් තිබෙන ව්‍යාපෘතිය එක පැත්තකින් හොර ගනුදෙනු; අනෙක් පැත්තෙන් අපේ රටේ වටිනා ඉඩම් හරහා සිදු වූ ගනුදෙනු; තව පැත්තකින් රජ ගෙදර දේශපාලනය වෙනුවෙන් අනාගත තැන්පතු; තවත් පැත්තකින් අපේ රටේ සංස්කෘතියට ප්‍රබල ප්‍රහාරයක් එල්ල කරන මධ්‍යස්ථාන. ඒ මධ්‍යස්ථාන වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේදී අපි අත උස්සන්න ඕනෑ ද? මොකක්ද මේ කරන්නේ? තමුන්නාන්සේලා දන්නවා, මේ ගනුදෙනුව කාගේද කියලා. මේ පාර්ලිමේන්තු ඇමතිවරුන්ට වඩා; මන්ත්‍රීවරුන්ට වඩා ඒ මුදලාලිලා බලවත්. ඒ මුදලාලිලා තමුන්නාන්සේලාගේ telephone call එකකට උත්තර දෙන්නවත් එන්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
රජ ගෙදර වටේ කැරකෙන deal මුදලාලිලාගේ ගනුදෙනුවක් හැටියට ගෙනෙන මේ පනත් කෙටුම්පත්, මේ සංශෝධන, මේ ගැසට් නිවේදන මේ පාර්ලිමේන්තුවේදී පරාජයට පත් කළ යුතුයි. මේ එක මන්ත්‍රීවරයෙකුවත් deal මුදලාලිලාගේ සල්ලිවලින් පාර්ලිමේන්තුවට පැමිණි අය නොවෙයි. මේකට අනුමැතිය පළ කරන්න පුළුවන් වන්නේ deal මුදලාලිලාට යටත් වුණු අයට පමණයි. ඒ නිසා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අද දින ඉදිරිපත් කර තිබෙන මේ නියමයන් මේ පාර්ලිමේන්තුවේදී පරාජයට පත් කළ යුතුයි කියලා ඉල්ලමින් මම නතර වනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට ගරු රෝහිත අබේගුණවර්ධන අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 28ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.37]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Minister of Highways, Ports and Shipping)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේදී ආයෝජන ප්‍රවර්ධන ඇමතිතුමා විසින් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ පහත සඳහන් විස්තීර්ණ නිකේතන ව්‍යාපෘතීන් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන අවස්ථාවේදී-

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ පොඩි සිදු වීමක් වුණා. අපේ රතන හාමුදුරුවන්ට ඊයේ වෙලාව දුන්නේ නැහැ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අනේ හරිම අනුකම්පාවක් තිබෙන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් රීති ප්‍රශ්නයක් මතු කරන්න එපා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
පටන් ගන්න කොටම පනිනවා නේ දෙවියනේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අද දින මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන නියමයන් පිළිබඳව සාකච්ඡා කරන වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණේ වත්මන් නායකතුමා වන අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න ලැබීම ගැන මා සතුටු වනවා. එතුමාගේ කථාවේ කුරහන් සාටකය ගැන, ඒ වාගේම මේ පනතත් එක්ක සම්බන්ධ වුණු deal වැනි දේවල් ගැන සඳහන් කරන කොට මට තවත් දෙයක් මතක් වුණා. පපුවට ගහ ගෙන, පොළොවට වඳින, "ගෞරවනීය නායක හාමුදුරුවනේ" කියලා කථා කරන නායකයෝ කියලා තමයි එතුමා අද මේ කථාව සභා ගර්භය තුළ කිව්වේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තමන්ගේ පක්ෂය සහ තමන් ඒවාට සම්බන්ධ වෙමින් පන්සිල් පද පහෙන් කීයක් කැඩුවාද, නැද්ද කියන එක මේ රටේ ජනතාව ඉස්සරහට ගිහිල්ලා පපුවට අත තියලා තමන්ගේ හෘදය සාක්ෂියෙන් අහන්න කියලා ජනතා විමුක්ති පෙරමුණේ වත්මන් නායකතුමාට මම කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාණාති පාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි" කියන පළමු වන පන්සිල් පදය ඔවුන් කඩන්න පටන් ගත්තේ කාගෙන්ද? මේ රටේ වීරෝදාර රණ විරුවාගෙන්. මේ රටේ සාමය ආරක්ෂා කරපු පොලිස් නිලධරයාගෙන්. ඒක කොහොමද පටන් ගත්තේ? අද ඔවුන් කථා කරන්නේ හරියට ඊයේ පෙරේදා දිව්‍ය ලෝකයෙන් බැහැලා, කිසිම දෙයක් දන්නේ නැති, රෝස මල් යහනාවක ඉන්න, විල්ලුද පලසක ඉන්න හාදයෝ වාගේයි. ඉතිහාසය ගැන හොයලා බැලුවොත් අපට ඒවා බලා ගන්න පුළුවන්. ඉතිහාසය අවුස්සන්න අපි කැමති නැහැ. හැබැයි, තමන්ගේ හෘදය සාක්ෂියට අවනත වෙමින් කථා කළොත්, යළි තමන්ගේ අතීතය සිහිපත් කළොත්, ඔය කියන කථාව කරන්න පුළුවන්ද කියන එක අපට අහන්න සිද්ධ වනවා. හැබැයි, අපි වග කීමකින් කියනවා, කුරහන් සාටකය දමා ගත් අතිගරු මහින්ද රාජපක්ෂ ජනපතිතුමාගේ අතේ සහ ඒ ආණ්ඩුවේ ලේ තැවරිලා නැහැයි කියලා. ජනතාවට වග කියන ආණ්ඩුවක් විධියටයි අද අපි ජනතාව ඉදිරියට ගිහිල්ලා තිබෙන්නේ කියන එකත් අපි බොහොම වග කීමකින් කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ කථාවට උත්තර දෙන්න ලැහැස්තියි. නමුත් එතුමාගේ කථාවට උත්තර දෙන්න ඉස්සෙල්ලා මා මේ කාරණය මතක් කරන්න ඕනෑ. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ඉදිරිපත් කර තිබෙන මේ නියමයන් ගැන කථා කරන කොට ජනතා විමුක්ති පෙරමුණ සහ එක්සත් ජාතික පක්ෂය මේ නියමයන් ඇතුළේ කැසිනෝ රකුසෙක් මැව්වා. මේ ක්‍රමෝපාප සංවර්ධන ව්‍යාපෘති පනතට; මේ නියමයන් ඇතුළට කැසිනෝ රකුසෙක් මැව්වා. මේ රටේ මහා සංඝරත්නයට, මේ රටේ සිවිල් ජනතාවට මෙම නියමයන් තුළ කැසිනෝ රකුසෙක් මවා පෙන්වපු එක්සත් ජාතික පක්ෂයෙන් සහ ජනතා විමුක්ති පෙරමුණෙන් අපි අහනවා,- [බාධා කිරීමක්] බාධා කරන්න එපා, මන්ත්‍රීතුමා. මම කිසිම කෙනෙකුට බාධා කළේ නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, what is your point of Order?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා කියන ආකාරයට ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමින්වහන්සේ,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ, නැහැ, ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මට අහිමි වන කාලය එක්සත් ජාතික පක්ෂයෙන් අරගෙන දෙන්නය කියලා. අපි එක්සත් ජාතික පක්ෂයෙන් පටන් ගනිමු, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි එතැනින් පටන් ගන්නේ මෙන්න මේ විධියටයි. එක්සත් ජාතික පක්ෂය කියනවා, මේක ඇතුළේ රකුසෙක් ඉන්නවා; මේක ඇතුළේ කැසිනෝ මාෆියාවක් තිබෙනවා කියලා. ඔවුන් සහ ජනතා විමුක්ති පෙරමුණ එහෙම කියලා ඒක මේ රටේ ජනතාව තුළට අරගෙන ගිහිල්ලා මෙය දේශපාලන මාතෘකාවක් කර ගන්න තමයි උත්සාහ කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂයේ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාගෙන්, ඒ වාගේම හිටපු ජනාධිපතිතුමාගේ පුත්‍ර රත්නය වන මේ ගරු සභාවේ ඉන්න සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගෙන් අපි අහනවා මේ රටේ සූදු පිළිබඳව වූ පළමුවැනි පනත, ඒ කියන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ කවුද කියලා. ලංකාවට ප්‍රථම වතාවට සූදුව, ඔට්ටු ඇල්ලීම ගෙනාවේ එක්සත් ජාතික පක්ෂයයි. ඒක එක්සත් ජාතික පක්ෂය ලංකාවේ තියපු වාර්තාවක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අපි ඒවාට බදු ගහනවා, ඔබතුමන්ලා බදු ඉවත් කරනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
අහගෙන ඉන්න කෝ දෙයියෝ. ඔය විධියට පැනලා නේන්නම් එක්සත් ජාතික පක්ෂය ඉල්ලාගෙන කෑවේ. [බාධා කිරීමක්] මේ ගරු සභාවේදී කැසිනෝ ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ කැසිනෝ ගැන කථා කරන එක්සත් ජාතික පක්ෂයෙන් අපි අහනවා, - [බාධා කිරීමක්] අහගන්න ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි. ඔබතුමාට නැකම් කියන ඔබේ පක්ෂය එදා ගෙනාපු පනතේ අවසන් පිටුවේ මෙසේ සඳහන් වනවා:

> " 'සූදු' යන්නෙන් ඔට්ටුවක් සඳහා යම් ක්‍රීඩාවක් කිරීම අදහස් කෙරෙන අතර ...."

සූදු මොනවාද කියලාත් එහි සඳහන් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න ඒ සූදු ටික.

".... බකාරා, පුන්ටෝ බැංකෝ, බිග්සික්ස්, බ්ලැක් ජැක්, බුවලේ, චෙමින්ඩිපර්, චක් අ ලක්, ක්‍රවුන් ඇන්ඩ් ඇන්කර්, පාරෝ, පාරෝ බැන්ක්, හසාඩ්, පෝකර් ඩයිස්, පොන්ටූන්, ඇමෙරිකානු හෝ ප්‍රංශ රූලේ, ට්‍රෙන්ටෙ එට් ක්වොරන්ටේ, විංග් -එට්-උම්, වීල් ඔෆ් ෆෝචූන් යන කවර වූ හෝ ක්‍රීඩාවක්."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1988 ගෙනාපු අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ තිබෙන මේ සූදු සෙල්ලම් ටික අපට කියවා ගන්නත් බැහැ. එතකොට මේ කියන සෙල්ලම් ටික ඔක්කෝම මේ රටට උරුම කළා. ඒවා මේ රටට උරුම කරන කොට හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලා එක්සත් ජාතික පක්ෂයේ නැහැ. එතකොට හිටපු නැති නිසානේ අද මේ විධියට කෑ ගහන්නේ. ඒ නිසා දැන් මුලින්ම කරන්න ඕනෑ මොකක්ද? එක්සත් ජාතික පක්ෂය මුලින්ම කරන්න ඕනෑ මොකක්ද? මේ රටේ මහා සංඝරත්නයෙන් සහ ජනතාවගෙන් සමාව ගන්න ඕනෑ. "අපි තමයි ඔට්ටු අල්ලන්න සූදු ගේන්න මේ රටට පළමුවැනි පනත ඉදිරිපත් කළ පක්ෂය" කියලා ජනතාවගෙන් සහ මහා සංඝ රත්නයෙන් සමාව ඉල්ලන්න ඕනෑ. [බාධා කිරීමක්] ඔහොම ඉන්න දෙයියෝ. මගේ වස්තුවේ වාඩි වෙනවාද? වාඩි වෙනවා නම් පින් සිද්ද වෙනවා. වාඩි වෙන්න දෙයියෝ. වස්තුවේ, මම අනිත් පැත්තෙන් ඇවිල්ලා උම්මා එකක් දෙන්නම් වාඩි වෙන්න. [බාධා කිරීමක්] වාඩි වෙන්නකෝ පැටියෝ. මෙච්චර ආදරෙන් කිව්වත් වාඩි වෙන්නේ නැහැනේ. [බාධා කිරීමක්] පස්සේ කියා දෙන්නම්. අපි එළියේදී හම්බ වෙනවානේ.[බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමා කථා කරන්න. ඔබතුමාගේ වේලාව තිබෙන්නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
හොඳයි. එතුමා තවම ළදරු පාසල් දරුවෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි ඉතිහාසය. එවැනි ඉතිහාසයක් තිබෙද්දී අද මේ ගැසට් පත්‍රය අනුමැතියට ඉදිරිපත් කරන කොට අපේ ලක්ෂ්මන් යාපා ඇමතිතුමාට කියනවා, ඒකට සංශෝධනයක් ඉදිරිපත් කරන්න ඕනෑ කියලා. මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ පාලන කාලයේ නයිනමරික්කාර් කියන ඇමතිවරයා විසින් 1988 ගෙනාපු ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතට නියාමනයක් හැටියට 2010 පනතක් ගෙනාවා. ඒ තමයි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර නියාමනය කිරීමේ පනත. කැසිනෝ නියාමනය කිරීම. එක්සත් ජාතික පක්ෂය ඒ පනත ගෙනැල්ලා අර කියන සූදු සෙල්ලම් ටික මේ රටේ ස්ථාපිත කළා විතරක් නොවෙයි. පාසල ඉදිරි පිට තිබෙන පුංචි කඩ පෙට්ටියට ජැක් පොට් එක ගෙනැල්ලා දැම්මා. රුපියල් දෙකක් දාලා අඹ ගෙඩි ටික එකට එකතු කළාම පාසල් දරුවා පුරුදු වුණා සූදුවට. අද මහ ලොකුවට කථා කරන එක්සත් ජාතික පක්ෂයට අපි කියනවා, එදා තමුන්නාන්සේලා එහෙමයි නොයෙකුත් සූදු ක්‍රීඩා රටට පුරුදු කළේ කියලා. රටේ වැඩිහිටි ජනතාව පමණක් නොවෙයි. පොඩි ළමයා පුරුදු වුණා සූදුවට. හැම පාසලක් ඉදිරි පිටම ජැක් පොට් එක ගෙනැල්ලා දැම්මා. පාසල් දරුවා ගෙදරින් ඉල්ලා ගෙන එන රුපියලේ කාසි පහ අරගෙන ගිහින් අඹ ගෙඩි පහක් එකට සැසඳුවා. අන්නාසි ගෙඩි පහක් එකට සැසඳුවා. නමුත් අද කැසිනෝ ව්‍යාපාර නියාමනය කිරීමට ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් ගෙනාවා. එතකොට අපට කියනවා, ඒකට සංශෝධන ගෙනෙන්න කියලා. තමුන්නාන්සේලා සංශෝධන ගෙනෙන්නට කථා කරන කොට මෙන්න බලන්න ඒකේ තිබෙනවා නියෝග.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ බුද්ධිමත් හා නීතිය ගැන දන්නා මන්ත්‍රීවරයෙක්. කැසිනෝ ව්‍යාපාර නියාමනය කිරීමට අදාළ නියෝග. මේ පනත ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීමේ කාර්ය අමාත්‍යවරයා විසින් නියෝග කර සාදනු ලබන නියෝග පනවන්න තිබෙන්නේ. ඕනෑ ඕනෑ මිනිහෙකුට ඇවිල්ලා කැසිනෝ දමන්න, එක්සත් ජාතික පක්ෂය ඇති කරපු දේවල් ඇති කරන්න නොවෙයි, ඒවා නියාමනය කරමින් රටේ සංස්කෘතියට හා රටේ සභ්‍යත්වයට හානියක් නොවන ලෙස කටයුතු කරන්නයි. රටේ මිනිසුන්ව සූදුවට පුරුදු කරලා, ආර්ථිය ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් අපි ළඟ නැහැ. අපට අවශ්‍ය කරන්නේ රට ශක්තිමත් කරමින් රට ආර්ථික වශයෙන් ගොඩ නඟන වැඩ පිළිවෙළකට යන්න. අන්න ඒක කරන්න යන කොට තමයි අද මේ අවශ්‍ය නැති දේවල් රටට ගෙනි යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ නියමයන් ඉදිරිපත් කළාට පසු මොකක්ද කියන්නේ? මම දැක්කා, ඊයේ ගරු මන්ත්‍රීතුමෙකු කථා කරනවා ජේම්ස් පැකර් ගැන. ඔහුගේ තාත්තා ගැන, සීයා ගැන, ආච්චි ගැන, ඔහුගේ පප්පා පුප්පන් හිටියද, නැද්ද කියන එක ගැන. ඒ පැත්තෙන් ජේම්ස් පැකර්ට ගහනවා. ඒ මිනිහා සූදුද කළේද කියලාවත් තවම දැකලා නැහැ. ඒ වාගේම අපේ රටේ ධම්මික පෙරේරාට ගහනවා. දැන් මෙතැන ඔහුගේ නම කියැවුණා. ධම්මික පෙරේරා කියන්නේ ව්‍යාපාරිකයෙක්. ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයෙක්. මම වග කීමකින් කියනවා කළුතර දිස්ත්‍රික්කයේ, පයාගල ගමේ ඉපදුණු පුංචි තැනකින් නැගිටපු ව්‍යාපාරිකයෙක්. ඒ මිනිසුන් දිහා බලා සතුටු වන්න. ඔහු ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයෙක්. ඔහු ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයෙකු හැටියට අද තමන්ගේ ව්‍යාපාර කටයුතු කර ගෙන යනවා. එතකොට ඒ මිනිසුන්ට ගහනවා; වැටෙන්න ගහනවා. ඒ පැත්තෙන් ජේම්ස් පැකර්ට වැටෙන්න ගහනවා. මේ පැත්තෙන් ධම්මික පෙරේරාට ගහනවා. මේ පැත්තෙන් ජෝන් කීල්ස් සමාගමට ගහනවා. මොකක්ද ඒ තුළ තිබෙන්නේ? ඒ තුළ එක දෙයක් තිබෙනවා. ඒ තමයි ආර්ථිකය කඩන ත්‍රස්තවාදය. අද ආර්ථිකය කඩන ත්‍රස්තවාදයක් රට තුළ - මේ පාර්ලිමේන්තුව ඇතුළත හා පාර්ලිමේන්තුව පිටත- ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

ආර්ථිකය කඩන ත්‍රස්තවාදයක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකක්ද මේ ආර්ථිකය කඩන ත්‍රස්තවාදය? මම කියලා දෙන්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආර්ථිකය කඩපු එක ත්‍රස්තවාදයක් ගැන මම කියලා දෙන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉපදුණු දිස්ත්‍රික්කයේ; තමුන්නාන්සේගේත් මගේත්කළුතර දිස්ත්‍රික්කයේ මේ රටේ රබර් කර්මාන්තය ශක්තිමත් වෙලා තිබුණා. ඉතිහාසයේදී තේ, රබර්, පොල් කියන කර්මාන්ත තුනෙන් අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කර ගත්තා. මේ විධියට ආර්ථිකය ශක්තිමත් කර ගත්ත අපේ රටේ, අද ඔබතුමාව හමු වන විට ඒ පැත්තේ රබර් ගොවියෝ මොනවාද කියන්නේ? "මන්ත්‍රීතුමා, රබර් මිල බැහැලා නේද?" කියලා කියනවා අපට ඇහෙනවා. අපට දෙන්න උත්තර තිබෙනවාද?

පාර්ලිමේන්තුවෙන් එළියේ ආර්ථිකය විනාශ කරන ත්‍රස්තවාදය ක්‍රියාත්මක වෙන්නේ කොහොමද? ක්‍රියාත්මක වෙන ක්‍රමයක් තිබෙනවා. ඒකට සෘජුවම වග කියන්නට ඕනෑ, -මේ සභාවේ නොසිටියත්- ජනතා විමුක්ති පෙරමුණ. සෘජුවම වග කියන්නට ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණ සෘජුවම වග කියන්නට ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සෘජුවම වග කියන්නට ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණ එදාත් රට විනාශ කළා. එදා රට විනාශ කළේ අවි ආයුධ අතට අරගෙන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මිනිසුන්ගේ ජීවිත විනාශ කළා. මේ රටේ දේපොළ විනාශ කළා. මේ රටේ මිනිසුන්ගේ ඉතිහාසය පවා විනාශ කළා. පන්සලක් තිබ්බේ නැහැ. මේ රටේ මිනිසුන්ගෙන් මං කොල්ල කෑවා. මේ රටේ මිනිසුන්ව මැරුවා. මේ රටේ මරපු මිනිහෙකුව දණ්ඩෙසෙන් උඩට උස්සන්න එපා කියලා නියෝග දුන්නා. එල්ටීටීඊ

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

සංවිධානයටත් වඩා දරුණු නියෝග දෙමින් රට විනාශ කළ පක්ෂයක් ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ. අද නිකම් කථා කරන්නේ සුදු රෙද්ද ඇඳගෙන; වඳුරෝ සිල් ගත්තා වාගේ. තමන්ගේ ඉතිහාසය අමතක වෙලා.

රබර් කිරි මිල වට්ටන්නට පටන් ගත්තේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රතුපස්වල සිද්ධිය ගන්න. ඒ ප්‍රදේශයේ මිනිසුන්ට පරිසර හානියක් වෙනවා නම් ඒ ගැන සොයා බලා ඒකට විසඳුමක් දෙනවා වෙනුවට, කර්මාන්තශාලාව වැසිය යුතුයි කියන මානසිකත්වය හදනවා. එහෙම කරලා මිනිසුන් ටික කුලප්පු කරලා, මිනිසුන්ව පාරට දාලා මිනිසුන්ට කියනවා, "නැඟිටපියව්, උඹලා විනාශ වෙනවා" කියලා. එතැනට ගිහින් ඉන්න සමහර මිනිසුන් ඉන්නේ අන්ධ භාවයෙන්. ඇතුළේ ඉන්න මිනිසුන් දන්නේ නැහැ එතැන ජේවීපී එකේ එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා කියලා; ඒ වාගේම, ආර්ථිකය කඩන ත්‍රස්තවාදී මිනිසුන් මේක තුළ ඉන්නවා කියලා. එතැනින් පටන් ගන්නවා ආර්ථිකය කඩන්නට. එහෙම කරලා රතුපස්වල factory එක වැහෙනවා. කොහොමද වැහෙන්නේ? ලංකාවේ නිෂ්පාදනය කරන රබර් කිරිවලින් අත් වැසුම් නිෂ්පාදනය කරලා ලෝකයට ලබා දෙන කර්මාන්තශාලාව, අපේ රටට වැඩියෙන් ආදායම් උපද්දවන කර්මාන්තශාලාව වහනවා. අනෙක් පැත්තෙන් අවිස්සාවේල්ලේ තිබෙන කර්මාන්තශාලාව සොයාගෙන තුන්නානට ගිහින් එතැන මිනිසුන්ටත් උපදෙස් දෙනවා. සාමාන්‍ය මිනිහා එතැනට එකතු වන විට දන්නේ නැහැ ඒක අස්සේ මේක විනාශ කරන ත්‍රස්තවාදියෙක්, මේ රටේ ආර්ථිකය කඩන මිනිහෙක් ඉන්නවා කියලා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ මනුෂ්‍යයාගේ අතේ තමයි රබර් ගස කපන මැෂින් එක තිබෙන්නේ. සාමාන්‍ය මිනිසුන් දහසක් හිටියත් ඔවුන් ළඟ නැහැ, රබර් ගස කපන මැෂින් එක. රබර් ගස කපන මනුෂ්‍යයා එතැන ඉඳගෙන ගහ කපලා දානවා. මේ වාගේ ක්‍රියාවල ප්‍රතිඵලයක් විධියට අද අහිංසක පොලිස් නිලධාරියෙකුගේ බිරිඳට සහ දරුවන්ට ස්වාමි පුරුෂයෙක්; තාත්තා කෙනෙක් නැතිව ගියා. මේ විධියට කටයුතු සිදු වන විට රටේ ආර්ථිකය කැඩීමේ පළමුවෙනි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා. කර්මාන්තශාලාවකට ආයෝජකයෙක් එන්නේ නැහැ.

අද ජනතා විමුක්ති පෙරමුණ website එකක් ගැන කථා කරනවා.

අද මේ පාර්ලිමේන්තුව තුළ කථා කළ සියලු දේ තව ටිකකින් අපේ රටට අකමැති තානාපති කාර්යාල හරහා ලෝකයේ අපි දිහා බලාගෙන ඉන්න ආයෝජකයන් ළඟට යනවා. ඒ තොරතුරු ආයෝජකයෝ ළඟට ගියාම කිසිම සංචාරක ව්‍යාපාරයකට, කර්මාන්තශාලාවකට රුපියලක් දෙන්න මනුෂ්‍යයෙක් එන්න කැමැති වෙන්නේ නැහැ. ඇයි එන්න කැමැති වෙන්නේ නැත්තේ? මේ රටේ ජාතිවාදය අවුස්සනවා; ආගම්වාදය අවුස්සනවා. අද ගරු ෆයිසර් මුස්තාපා නියෝජ්‍ය ඇමතිතුමාව සහ ගරු අස්වර් මන්ත්‍රීතුමාව නම් කරගෙන, -කැසිනෝ කියන වචනයත් නැති මේ වාගේ පනත් කෙටුම්පතක්, මේ වාගේ සංශෝධනයක්, මේ වාගේ ගැසට් පත්‍රයක්, මේ වාගේ නියමයක් එන විට- මුස්ලිම්වරුන්ට අගෞරව වන විධියට එක්සත් ජාතික පක්ෂය ලජ්ජා නැති ආකාරයට හැසිරුණා. ලජ්ජා නැතිව හැසිරෙනවා. මොකටද මේ? තමන්ගේ දේශපාලන හෙළුවැලි භාවය වහ ගන්නට. මේ වාගේ දේවලින් කාටද ගහන්නේ? ගහන්නේ මේ රටේ ආර්ථිකයට. මේ රටේ ආර්ථිකයට ගහන්නේ.

අද පාර්ලිමේන්තු නිලධාරි ගැලරියේ ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයේ නිලධාරින් ඉන්නවා. මේ නිලධාරින්ගෙන් මම අහනවා, ඔබතුමන්ලාගේ පිටේ අලවලා තිබෙනවාද "ශ්‍රී ලංකා නිදහස් පක්ෂය" කියලා. ඔබතුමන්ලාගේ පිටේ අලවලා තිබෙනවාද "එක්සත් ජාතික පක්ෂය" කියලා. ඔබේ පිටේ අලවලා තිබෙනවාද "ජනතා විමුක්ති පෙරමුණ" කියලා. නැහැ, ඔබලා නිලධාරින්. ඔබලා පවතින ඕනෑම රජයකට වග කියන්නට ඕනෑ නිලධාරින්. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ලෝකයට පෙන්වන්න හදනවා මේ ඉඩම් ටික දීලා තිබෙන්නේ හරියට අපේ අම්මාගේ තාත්තාගේ බූදලය දෙන විධියටයි කියලා. දැන් පෙන්නුවේ. එකක් වරාය සතු ඉඩමක්ය කිව්වා. ඒ ඉඩම දුන්නේ මේ විධියටයි කියලා කිව්වා. මේ තිබෙන්නේ ඉඩම් දීපු විධිය. අක්කර 02, රූඩ් 01, පර්චස් 01යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවාට දීපු මුදල් ගණන් එක්කම මේ තොරතුරු මම **සභාගත*** කරනවා.

මම ඒ නිලධාරින්ගෙන් ඇහුවා. ඇයි මේ රටේ රාජ්‍ය නිලධාරියාව අගෞරවයට පත් කරන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මන්ත්‍රීවරයෙක්. මම ඇමතිවරයෙක්. මම කිව්වාය කියලා මට ඕනෑ විධියට මේ රටේ රාජ්‍ය දේපළ අයුතු විධියට පාවිච්චි කරන්න පුළුවන්ද? බැහැ. නීති -රීතිවලට එකඟව එම නිලධාරින් තමන්ගේ වගකීම, යුතුකම ඉටු කරමින් අපේ රටට ආයෝජකයින් ගෙනෙන්නයි උත්සාහ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහරු කියනවා, සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න ඕනෑය කියලා. අනේ! හරි සද්භාවයෙන් කියන්නේ, "සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න, අපි ඒකට කිසිම විරුද්ධත්වයක් නැහැ" කියලා. ඊයේ රෑ වන කොට "ආනුෂංගික" කියන වචනයක් ගැන කථා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ තිබෙනවා, ආනුෂංගික කියලා වචනයක්. ඔය කැල්ලට තමයි ලූ එකතු කරන්න හදන්නේ කැසිනෝ, ගණිකා වෘත්තිය. මේ ගණිකා වෘත්තිය ගැනම කියන්නේ මේක කට්ටියකට ඕනෑ වෙලාද කියලාත් සමහර වෙලාවට මට සැකයක් ඇති වනවා. මේකම කියමින් කෑ ගහනවා. මොකක්ද මේකේ තේරුම? ශ්‍රී ලංකාව තුළ දැනට තිබෙන තරු පහේ හෝටලයක, තරු හතරේ හෝටලයක කොහේවත් තැනක ගණිකා වෘත්තියක් තිබෙනවාද කියලා පෙන්වන්න කියන්න. ඇයි මේ රටට රකුසෙක් බිහි කරන්න හදන්නේ? ඇයි මේ රටට අනවශ්‍ය බියක් ඇති කරන්න හදන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේ අවශ්‍යතාව වෙන මොකක්වත් නොවෙයි. අද එක්සත් ජාතික පක්ෂයේ උදවියගේ සහ ජනතා විමුක්ති පෙරමුණේ උදවියගේ හදවත්වල ගැස්මක් තිබෙනවා. මොකක්ද ඒ හද ගැස්ම? ඒ හද ගැස්ම මේකයි. 2005 නොවැම්බර් මාසයේ 19 වැනිදා ඉඳලා 2014 මේ මොහොත වන තුරු තියන තියන හැම ඡන්දයකදීම මහින්ද රාජපක්ෂ ජනපතිතුමාව ජයග්‍රහණය කරන්න මේ රටේ ජනතාව කැප වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කැප වීම මේ අයට දරා ගෙන ඉන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවුරුදු කීපය තුළ මේ රටේ කැඩුණු පාරවල් ටික හැදුණා. මේ රටේ වරායවල් හැදුණා. මේ රටේ ගුවන් තොටුපොළවල් හැදුණා. මේ රටේ භූමියෙන් තුනෙන් එකක් අපිට තිබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔය එක එක දේවල් ගැන කථා කරන්න අපිට භූමිය තිබුණේ තුනෙන් දෙකයි. තුනෙන් තුනම දැන් අපේ භූමියක් බවට පත් කර දීලා තිබෙනවා. මේ රටේ මහ මුහුදින් තුනෙන් දෙකක් අපිට තිබුණේ නැහැ. ඒ තුනෙන් දෙකත් අද අපිට තිබෙනවා. රට වටේ මුහුදත් අයිති අපිටයි. මුළු රටම අයිතිත් මේ ශ්‍රී ලාංකික ජනතාවටයි. ඒ රට එක් සේසත් කරලා අද සංවර්ධනය කර තිබෙනවා. තව අවුරුදු තුන හතරක් යන කොට රට ආර්ථික වශයෙන් නැඟිටින වැඩ පිළිවෙළේ ප්‍රධාන සන්ධිස්ථානයක් හැටියට තමයි මේ ගරු ඇමතිතුමා ප්‍රධාන ආයෝජකයින් තුන්

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***

** ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*

** Document not tendered.*

දෙනෙකුව ගෙනැල්ලා රට ඉදිරියට ගෙන යන ගමන හදන්න ලෑස්ති කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2013 අවුරුද්දේ අපේ රටට සංචාරකයින්ගේ පැමිණීම මිලියන 1.2යි; ලක්ෂ 12යි. මේ මැයි මාසය වන කොට මිලියන 1.5ක -ලක්ෂ 15ක- ඉලක්කයකට යන්න අපට පුළුවන්කම තිබෙනවා. තව අවුරුදු දෙකක්, දෙක හමාරක් යන කොට ලංකාවට පැමිණෙන සංචාරකයින්ගේ සංඛ්‍යාව මිලියන 2.5යි; ලක්ෂ 25යි. අපේ රටේ ජීවත් වන ජනතාවගෙන් අට දෙනෙකුගෙන් එක් කෙනෙකුට, සංචාරකයෙක් මේ රටට පැමිණෙන්න නම් මේ කියන විධියේ සංචාරක නිවාඩු නිකේතන අවශ්‍යයි. පහසුකම් තිබෙන, ඒ වාගේම ඒ අය කැමැති වන විධියට, සංචාරකයින්ගේ මනසට ගැළපෙන විධියට ගුණාත්මකභාවය තිබෙන, ඒ අවශ්‍යතාවන් එක්ක සරිලන ව්‍යාපාර තමයි අද මේ ගෙනැල්ලා තිබෙන්නේ. ඒ ව්‍යාපාර එන කොට මොකක්ද කරන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? එන ආයෝජකයා බිය වද්දනවා. දැන් ජේම්ස් පැකර් බය වෙලා ඇති. මේ වන කොට එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ ඕස්ට්‍රේලියාවට ගිහිල්ලා ජේම්ස් පැකර්ගේ සීයාගේ, මී මුත්තාගේ උප්පැන්න සහතික හොයනවා ලු. ඒ මිනිහාගේ පැටිකිරිය හොයනවා ලු. මොකටද? මේ බය ඇති කරන්න. මොකක්ද මේ කියන්නේ? නොකියා කියනවා, "එන්න එපා අපේ රටට, අපි ම්ලේච්ඡ ජාතියක් වාගේ ජීවත් වන කට්ටියක්, ඒ නිසා අපේ රටට එන්න එපා, අපේ රටට ආයෝජනය කරන්න එපා. ඒක කරන එක ලේසි නැහැ. අපි උද්ඝෝෂණය කරනවා. අපි මේවාට විරුද්ධ වනවා"ය කියා. ඒ පණිවුඩය තමයි දෙන්නේ.හැබැයි ඕක කියන සමහරුන්ට තවත් යටි අරමුණු තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොනවාද ඒ අරමුණු? මෙතැන මහා ලොකුවට බණිනවා "කැසිනෝකාරයා" කියලා. නම කියලා බණිනවා කැසිනෝකාරයා කියලා. එහෙම බැණලා -

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීති ප්‍රශ්නයක්, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද රීති ප්‍රශ්නය?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා කිව්වා භීෂණයක් මවනවා කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එතැන රීති ප්‍රශ්නයක් නැහැ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
රීති ප්‍රශ්නය මොකක්ද? [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එතැන රීති ප්‍රශ්නයක් නැහැ. ගරු අමාත්‍යතුමා කථා කරන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,- [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, බාධා කරන්න එපා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
අපත් එක්ක කථා කරන්න විශ්වවිද්‍යාලයේ යන කෙනෙකු හෝ A/L කරන කෙනෙකු හෝ යූඑන්පී එකෙන් එවන්න. මේ පොඩි එකෙක් නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
පොඩි නැහැ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
පොඩි නැද්ද? පෙන්නුවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද මෙහි යටි අරමුණ වෙලා තිබෙන්නේ? එක පැත්තකින් කැසිනෝකාරයා කියලා ගහනවා. කැසිනෝකාරයා කියලා ගහලා, ඒ ව්‍යාපාරිකයාට පොඩි තර්ජනයක් කරලා බලනවා ඒ ව්‍යාපාරිකයා අත යට තියාගන්න පුළුවන්ද කියලා. එතකොට තමයි එතුමන්ලාට හොඳ. Deals ගැන කථා කළා. මේගොල්ලෝ දාපු deals අපි දන්නවා. ජනතා විමුක්ති පෙරමුණ ගිහිල්ලා මේ රටේ කැසිනෝ ව්‍යාපාර කරන ව්‍යාපාරිකයන් දෙදෙනාගෙන්ම තමන්ගේ මැතිවරණයට සල්ලි ගෙනාපු බව මම වගකීමකින් කියනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් මේ ගරු සභාවේදී මොනවාද කරන්නේ? මේ ගරු සභාවේදී දමනවා, සද්දේ. ඊට පස්සේ තමයි වැඩ තිබෙන්නේ. මේ ගරු සභාවේ තමයි සද්දය දමන්නේ. සද්දය දාලා බලනවා කොහොමද මේක වෙනස් කරලා මේකෙන් ගන්න පුළුවන් දේවල් ගන්නේ කියලා. හැබැයි කථා කරන්නේ තොත්ත බබ්බු වාගෙයි. අද මේ හැම දෙයක් තුළින්ම උත්සාහ කරන්නේ මේ රටේ ආර්ථිකය විනාශ කරන ත්‍රස්තවාදයක් ක්‍රියාත්මක කිරීමටයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට බොහොම පැහැදිලිව මතක් කරනවා සංචාරක ව්‍යාපාරයත් එක්ක බැඳුණු මේ වැඩ පිළිවෙළ යටතේ ඉදි කරන්න යන මේ ආයතන තුන මඟින් මේ රටේ ආර්ථිකයට ලොකු ශක්තියක් ඇති වන බව. ඒ ශක්තිය ශ්‍රී ලංකාවේ ඉදිරි ගමනට ලොකු පිටුවහලක් වෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක තමයි රටක ඉදිරි ගමන. අපේ ආසියානු කලාපයේ තිබෙන රටවල් එක්ක බලන කොට අපේ රට ගැන අපි

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

අද සතුටු වෙනවා. යුද්ධයක් නැති අපේ රටට ඇවිල්ලා අපේ රට තුළ ව්‍යාපාරයක් කරන්න ආයෝජකයන්ට පුළුවන්කමක් ඇති වෙන කොට ඒක අපේ රටේ ආර්ථිකයට දැඩි ලෙස බලපානවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රැකියා උත්පාදනය වීම, ඒ වටාපිටාවෙන් තවත් ව්‍යාපාරිකයන් බිහි වීම ආදි සියල්ල ඇති කරගන්න පුළුවන් ව්‍යාපෘතියක් තමයි අද ආරම්භ වෙමින් යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය ඊයේ-පෙරේදා කළේ මොකක්ද? පසු ගිය දවස්වල ගිහිල්ලා මහා නායක හාමුදුරුවන් වහන්සේලා බැහැ දැකලා තිබෙනවා. මහා සංඝ රත්නයට, කතෝලික සභාවට, මුස්ලිම් පූජකතුමන්ලාට විවිධ දේ කියලා බැලුවා, අනෙකුත් තැන්වලට ගිහිල්ලා බැලුවා ඒ මඟින් රටේ ආර්ථිකය බිඳ වට්ටන්න පුළුවන් මොකක් හරි එකක එල්ලෙන්න පුළුවන්කමක් තිබෙනවාද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුව ශක්තිමත් ආණ්ඩුවක්. ශක්තිමත් නායකයෙකු ඉන්න ආණ්ඩුවක්. අපට මෙතුමන්ලාට වාගේ නායකයන් තුන්දෙනෙක්, හතරදෙනෙක්, පස්දෙනෙක් නැහැ. අපට එක නායකයායි ඉන්නේ. ඒ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමායි. එතුමා එක්ක ඉන්න පක්ෂයක වග කිවයුතු මන්ත්‍රීවරුන් හැටියටයි අප කථා කරන්නේ. ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමාගේ කථාවේදී විවිධ දේ කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තවත් විනාඩියක් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ වාගේම ආන්දෝලනාත්මක තවත් පනතක් ඉදිරිපත් වුණා. ඒකත් තමුන්නාන්සේ දන්නා කාරණයක්. ඒ පනත තමයි 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම පනත. ඒ පනත් කෙටුම්පත ගෙනාපු වෙලාවේ මේ පාර්ලිමේන්තුව ඇතුළේ මේ වාගේම මහා හඬක් නැඟුවා ඔබතුමාට මතක ඇති. මේ වාගේම ගිහිල්ලා ගෞරවණීය හාමුදුරුවන් වහන්සේලාට කිව්වා, අනේ හාමුදුරුවනේ, අපේ ව්‍යාපාර රජයට ගන්න යනවා, රජයට අරගෙන වෛරයෙන් අප දිහා බලන්න යනවා, වෛරයෙන් බලලා අපේ ව්‍යාපාර විනාශ කරන්න හදනවා කියලා. ව්‍යාපාර 36ක් රාජ්‍ය දේපළ විධියට පවරාගත්තා. ඒවා පාඩු ලබන ආයතන කියලා වසා තිබුණු ඒවායි. සමහරුන් ඒවායෙන් යටි මඩි ගහමින් වෙනත් වැඩ කරමිනුයි සිටියේ. එවැනි ව්‍යාපාර ගණනාවක් තමයි පවරා ගත්තේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ඒ අතරින් ව්‍යාපාර දෙකක, තුනක නම් කියනවා. එකක් තමයි සෙවණගල සීනි කර්මාන්තශාලාව. අනෙක් එක, පැලවත්ත සීනි කර්මාන්තශාලාව. අනෙක් එක, හිල්ටන් එක. ඒ වාගේ ව්‍යාපාර 36ක් පවරා ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප වග කීමෙන් කියනවා, සෙවණගල සහ පැල්වත්ත සීනි කර්මාන්තශාලා අද ලාභ ලබන ආයතන බවට පරිවර්තනය වෙලා තිබෙනවා කියන එක. ඒ ආයතන පවරා ගන්න කොටත් මේ වාගේම රකුසෙක් මවන්නයි හැදුවේ. මේ විධියටම කෑ ගැහුවා. හැබැයි දැන් ජනතාව ඒ ගැන ඇත්ත තත්ත්වය දන්නවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ගරු අමාත්‍යතුමා. කථාව අවසන් කරන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
අවසාන වශයෙන්, ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමාට උත්තර දෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කිව්වා, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ජනාධිපතිවරණයක් දෙන්න යනවා කියලා. ඔව්. අපි වග කීමෙන් කියනවා, කොන්ද කෙළින් තියාගෙන කියනවා, අපි 2015 දී ජනාධිපතිවරණයක් දෙනවා කියලා. ඒකේ ජනාධිපති අපේක්ෂකයා වෙන කවුරුවත් නොවෙයි, අතිගරු මහින්ද රාජපක්ෂ අපේ ජනාධිපතිතුමායි.

හැබැයි තමුන්නාන්සේලාට ජනාධිපති අපේක්ෂකයෙක් නොවෙයි, තමුන්නාන්සේලාගේ පක්ෂයේ නායක අපේක්ෂකයාවත් හොයා ගන්න බැරුවයි ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ තුන්වැනි වතාවටත් ජනාධිපති වෙන්නේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමායි කියන එක මතක් කරමින් මා ඔබෙන් සමුගන්නවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.06]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් ගැන කරුණු එකතු කරන්නට ප්‍රථමයෙන් මා මේ කාරණය මුලසුනට මතක් කරන්න කැමැතියි. පිස්තෝලයක් අරගෙන හම්බන්තොට දී අපට තර්ජනය කළ පුද්ගලයාගෙන්වත්, ඒ වාගේම ඒ අනෙක් කණ්ඩායම්වල සිටි අයගෙන්වත් තවම ප්‍රශ්න කරලාත් නැහැ; කවුරුවත් අත් අඩංගුවට අරගෙනත් නැහැ. ඒ සිද්ධියෙන් පස්සේ අද අටවැනි දවස කියලා ඔබතුමාට මතක් කරලා මේ විවාදයට කරුණු ඉදිරිපත් කරන්න මා කැමැතියි. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට බාධා කරන්න එපා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මට ප්‍රථමයෙන් කථා කළ ඇමතිතුමා එක් එක් කරුණු ගැන කථා කරන කොට සූදුව ගැන සඳහන් කළා. විශේෂයෙන්ම ඉතිහාසයේ එක් එක් පක්ෂවලට එතුමා දෝෂාරෝපණය කළා. මා හිතන හැටියට අද ඇත්තටම ඒ දෝෂාරෝපණයෙන් ජනතාවට කිසිම වැඩක් නැහැ. අද අපි ඉදිරිපිට තිබෙන මේ ගැසට් පත්‍රයේ සඳහන් කරන මේ ගොඩනැඟිලිවලට අනුමැතිය දෙනවාද, නැද්ද කියන එකයි අප දැන ගන්නට ඕනෑ. මේවා හෝටල් ගොඩනැඟිලිද නැත්නම් කැසිනෝ සූදුව කරන ගොඩනැඟිලිද කියන ප්‍රශ්නයයි මෙතැන තිබෙන්නේ.

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ඊයේ තිබුණු නියමයට ඡන්දය ගන්න කොට ආණ්ඩුවේ සමහර ඇමතිවරු ඡන්දය නොදීමෙන් ඒ වාගේම ගරුතර සංඝ රත්නය ඡන්දය නොදීමෙන් සමහර අය තුළ සැකයක් ඇති වෙනවා, මේ ගොඩනැඟිලි ඇත්තටම යොදවා ගන්න යන්නේ මේ සූදුවටයි; කැසිනෝ ගැසීමටයි කියලා. ඒකයි තිබෙන ප්‍රශ්නය. මේක ආණ්ඩුව ඇතුළේම මතු වෙලා තිබෙන සැකයක් කියලා මුලින්ම සඳහන් කරන්නට ඕනෑ. අපේ මහ නායක ස්වාමීන් වහන්සේලා ජනාධිපතිතුමාට ලියපු ලියුමෙන් ඒ ප්‍රශ්නයම මතු කරලා

තිබෙනවා. ඒ ස්වාමීන් වහන්සේලා සඳහන් කරනවා, පැහැදිලිව මේ නියමයන් සංශෝධනය කිරීමට නිසි පියවර ගන්න කියලා. ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමාත්, බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත් අද සභ ඊයේ කරන ලද ප්‍රකාශවලට මා පිළිතුරක් දෙන්නට කැමැතියි. විවාදයක් තුළදී ඒ විවාදයේ ඉදිරිපත් කරන කරුණු, අනෙක් කරුණුවලට සමාන්තර නැත්නම්, ඒ කරුණු අතර ඝට්ටනයක් තිබෙනවා නම් අපට නිගමනය කරන්නට වෙන්නේ එක්කෝ අසත්‍යයක් ප්‍රකාශ කරනවා, නැත්නම් සභාව නොමඟ යවනවා, නැත්නම් ඒ අයට මේ කිසිවක් තේරෙන්නේ නැහැ කියන එකයි. බැසිල් රාජපක්ෂ ඇමතිතුමාටත්, ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමාටත් නොතේරෙනවා කියලා මා නම් හිතන්නේ නැහැ. ඒ අයට බුද්ධිය තිබෙනවාය කියා හිතන්න මා කැමැතියි. එහෙම නම් අපට නිගමනය කරන්න වෙන්නේ එක්කෝ ඒ දෙදෙනා අසත්‍යයක් ප්‍රකාශ කරනවාය; එහෙම නැත්නම් සභාවත්, රටත් නොමඟ යවනවාය කියායි. ඒ අය එක් එක් තර්ක ඉදිරිපත් කළා. නමුත් අනාගතයේදී මේ හෝටල් ගොඩනැඟිලිවල කැසිනෝ සූදුව සිදුවන්නේ නැහැ කියා රටටයි, අපේ මහා නායක ස්වාමීන් වහන්සේලාටයි, අනික් ආගමික පූජකවරුන්ටයි කියන්න ඇමතිතුමාට පුළුවන්ද? එහෙම සඳහන් කරන්න පුළුවන් නම් දැන් සඳහන් කරන්නය කියා මා එතුමාට කියනවා. ඒ සඳහා මගේ වෙලාවෙන් මා එතුමාට අවස්ථාව දෙනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමා, රීති ප්‍රශ්නයක්ද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අනාගතයේදී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් මනඃකල්පිතව හරි ආවොත් ඒක කරනවාද නැද්ද කියා මට මෙතැනදී කියන්න බැහැ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඒ ප්‍රකාශනයට බොහොම ස්තුතියි. ඒක මම අහපු ප්‍රශ්නයට උත්තරයක්ය කියා අපේ රටේ ඉන්න ආගමික නායකයන්, ඒ වාගේම අපේ රටේ ඉන්න බුද්ධිමත් පිරිස පිළිගනීවිය කියා මා හිතන්නේ නැහැ. එතුමා නැවතත් මගේ ප්‍රශ්නය මඟ හැරියා. ඒකට ඍජු පිළිතුරක් දෙන්නට එතුමාට බැරි වුණාය කියන එක මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

විජාතිකයන්ට මේ රටට ඇවිල්ලා, සූදු කෙළින්නට දොර ඇරියේ ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමාය; බැසිල් රාජපක්ෂ ඇමතිතුමාය කියා මේ රටේ ඉතිහාසය ලියැවෙනකොට ලියැවෙන බව මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. ඒ අය තමයි මේ දොර විවෘත කළේ. මොකද, ඒ අය හරි, ඍජු පිළිතුරක් දීලා නැහැ. මේ ගොඩනැඟිලි කැසිනෝ සූදුවට භාවිත කරන්න දෙන්න යනවාද නැද්ද කියන ප්‍රශ්නයට ඒ අය ඍජු පිළිතුරක් දුන්නේ නැහැ කියන එක දැනුත් මා සඳහන් කරන්න ඕනෑ. වටේට, වටේට ගිහින් හරියන්නේ නැහැ.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
මොකක්ද මගේ නම සඳහන් කරලා කිව්වේ?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔබතුමා මගේ තර්කය අහගෙන හිටියේ නැත්නම් දැන්වත් පොඩ්ඩක් අහගෙන ඉඳලා කථා කරන්න. [බාධා කිරීමක්] අවස්ථාව දෙන්නම්. වාඩි වෙලා ඉඳලා පස්සෙදි කථා කරන්න.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
මගේ නම සඳහන් කරලා මොකක්ද කිව්වේ?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඒ විතරක් නොවෙයි මේ ගැසට්වල සඳහන් වෙන විධියට මොනවාද දෙන්නේ? බදු සහන දෙනවා. ගොඩනැඟිලිවලට බදු සහන දෙනවාය කියා කියනවා. ගොඩනැඟිලිවලට බදු සහන දුන්නාම මොනවාද වෙන්නේ? ඒවා හෝටල් ගොඩනැඟිලි වෙන්න පුළුවන්. ව්‍යාපාරික ගොඩනැඟිලි වෙන්න පුළුවන්. මිශ්‍ර ගොඩනැඟිලි වෙන්න පුළුවන්. එතකොට ඒවායේ මිල අඩු වෙනවා. ඒවායේ මිල අඩු වුණාම ඒ ගොඩනැඟිලි පාවිච්චි කරන අයට වක්‍රව ඒ සහන ලැබෙනවාය කියන එක සඳහන් කරන්න ඕනෑ. එහෙම, වක්‍රව ඒ සහන ලැබෙනවාය කියන එක තේරුම් ගන්න පුළුවන් වෙන්න ඕනෑ. හැම සහනයක්ම දෙනවා. අද මේ රටේ බදු ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 11යි. 1948 ඉඳලා අද වෙනකම් බලනකොට 2013 දී තමයි දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට අඩුම ආදායමක් ලැබී තිබෙන්නේ. මොකක්ද එල්ලය? එල්ලය තමයි, දළ දේශීය නිෂ්පාදනයෙන් ලැබෙන ආදායම සියයට 20ක් කරන එක. නමුත් ඒක අඩු වෙමින්, අඩු වෙමින් යනවා. බදු සහන දෙන නිසා තමයි ඒක අඩු වෙන්නේ.

මේ බදු සහන දෙන එකෙන් කාටද ප්‍රයෝජනය ලැබෙන්නේ? මේ බදු සහනවලින් ප්‍රයෝජනය ලැබෙන්නේ ව්‍යාපාරික පාර්ශ්වයටයි. ඒ අයට සම්බන්ධතා තිබෙන දේශපාලන නිලධාරි පන්තියට පමණයි ඒක ලැබෙන්නේ. අද රජයේ ආදායම අඩු වුණාම ඒක අධ්‍යාපනයට වදින පහරක් වෙනවා. අද මේ රටේ ළමයි උසස් පෙළ විභාගය අවසන් කරලා පැසල්වලින් පිට වෙනවා. ඒ අයට කවදාවත් කම්පියුටරයක් පාවිච්චි කරන්නවත්, අන්තර් ජාලය පාවිච්චි කරන්නවත් අවස්ථාවක් ලැබිලා නැහැ. ඒ දරුවන්ට නවීන ලෝකයට, මේ විද්‍යාත්මක ලෝකයට ඇතුළු වෙන්න අවස්ථාවක් නැහැ. ඒ කිසිම දරුවෙකුට ඒ සඳහා අවස්ථාවක් නැහැ. රටේ ආදායම අඩු වෙනවා නම් ඒක රටේ අධ්‍යාපනයටයි, සෞඛ්‍යයටයි බලපානවා. සාමාන්‍ය ජනතාවට බලපානවා. ඉහළ පැළැන්තිවල ඉන්න අයට නම් ඒ අයගේ දරුවන්ට තමන්ගේ පෞද්ගලික ආදායමෙන් ඒවා ලබා දෙන්න පුළුවන්. ඒ අයගේ දරුවන් පිට රට අධ්‍යාපනය සඳහා යවන්න ඒ අයට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ ජනතාව දීර්ඝ කාලයක් ජීවත් වෙන නිසා වැඩිමහල් අය සිටිනවා. ඒ අයට සෞඛ්‍ය පහසුකම් අවශ්‍ය වෙනවා. වැඩිමහල් අයට ජීවත් වෙන්න නිවාස ඕනෑ. නමුත් එවැනි දේවල්වලට වුණත් වෙන් කරන ප්‍රතිශතය වැඩි කරන්නට සමාජ සේවා අංශවලට බැරි වෙලා තිබෙන්නේ මේ රටේ ආදායම පහත වැටීම නිසායි. එහෙම නම්

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

අපි මෙවැනි අයට මේ වාගේ බදු සහන දෙන්නේ මොකටද? සංචාරකයන් වැඩි කර ගන්නට ඕනෑ නම් තවත් ක්‍රම හුඟක් තිබෙනවා. එක එක විධියේ සංචාරකයන් රටවලට එනවා. ක්‍රීඩා සඳහා සංචාරය කරනවා. සංස්කෘතික සහ ඓතිහාසික ස්ථාන නැරඹීම සඳහා රටින් රටට සංචාරකයන් යනවා. ඒ වාගේම සෞඛ්‍ය සේවා ලබා ගන්නට සංචාරකයන් යනවා. මේ වාගේ නානාප්‍රකාර ව්‍යාපාර තිබෙනවා. අපට එයින් එකක්, දෙකක් තෝරා ගන්න පුළුවන් අවස්ථාවක් තිබෙනවා. නමුත් මොනවාද අපි තෝරා ගෙන තිබෙන්නේ? මේ පනත යටතේ මේ නියමය තුළින් අපි තෝරා ගෙන තිබෙන්නේ කැසිනෝ සහ ලිංගික සේවා සපයන සංචාරක ව්‍යාපාරයක් දෙසට යන්නයි.

ආසියාවේ කැසිනෝ අගනුවර මැකාවු දූපතයි. අද මැකාවු දූපත ඇමෙරිකාවේ නෙවාඩා ප්‍රාන්තයට වැඩිය විශාල කැසිනෝ ව්‍යාපාරයක් තිබෙන දූපතක් වෙලා තිබෙනවා. එහි ලක්ෂ හයක් වැඩ කරන ජනතාව ඉන්නවා. එහි වර්ග කිලෝමීටර් 29.9ක ප්‍රමාණයක් තිබෙන්නේ. කුඩා දූපතක්. එහි කැසිනෝ ව්‍යාපාර තිබෙනවා 35ක්; clubs තිබෙනවා 21ක්; ලිංගික සේවා සපයන ව්‍යාපාර පණස් ගණනක් තිබෙනවා. කැසිනෝවලට වැඩිය ඒ සේවා තමයි දිගින් දිගටම වැඩි වෙන්නේ. මොකද, කැසිනෝ සඳහා සංචාරය කරනවා නම් ඒවාට සම්බන්ධ ව්‍යාපාරත් ඉබේටම ඇති වෙනවා. ඒ නිසා තමයි මේ රටේ ආගමික නායකයන් මේ ප්‍රශ්නය පිළිබඳව මේ රටේ ජනාධිපතිතුමා දැනුවත් කරලා තිබෙන්නේ. අපට පුළුවන් දොර විවෘත කරන්න. නමුත් දොර වහන්න ඊට වඩා හුඟක් අමාරුයි. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, මේ ගරු සභාව තුළ හෘදය සාක්ෂිය අනුව ඡන්දය දෙන්න අද අවස්ථාවක් දෙන්න කියලා. තමුන්ගේ පක්ෂ කියන විධියට නොවෙයි තමුන්ගේ හෘදය සාක්ෂිය අනුව ඡන්දය දෙන්න අවස්ථාවක් දෙන්න. මේක අපේ රටේ සංස්කෘතියට බලපාන කරුණක්. එහෙනම් හෘදය සාක්ෂිය අනුව ඡන්දය දෙන්න අවස්ථාවක් දෙන්න කියලා මම ඉල්ලනවා. එතකොට මන්ත්‍රීවරුන් සියලු දෙනාටම එඩිතරව මුහුණ දීලා මෙතැනට ඇවිල්ලා ඒ ගොල්ලන්ගේ ස්ථාවරය ප්‍රකාශ කරන්නට පුළුවන්. නැත්නම් ඒ අවස්ථාව නැහැ. ඒ අය පාර්ලිමේන්තුවටවත් එන්නේ නැහැ, ඒ අවස්ථාව නැති නිසා.

අද ආදායම අඩු වෙන කොට, දුගීභාවය මනින්නේ බත් පිඟානෙන් සහ පොල් සම්බෝලයෙන් නොවෙයි. අද දුගීභාවය මනින්නේ කොම්පියුටරය තිබෙනවාද, අන්තර්ජාල පහසුකම තිබෙනවා ද, ඒක භාවිත කරන්නට පුළුවන් ද, ඒකෙන් ආදායමක් උපයන්න පුළුවන් ද කියන ක්‍රමයටයි. මැකාවු දූපතේ ජනතාව අද දුගීභාවයෙන් ජීවත් වෙනවා. වැඩිමහල් අයට මහලු නිවාසවත් නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහතුන්දහසක් සූදුවට ඇබ්බැහි වෙලා තිබෙනවා, ලක්ෂ හයක් වැඩ කරන කුඩා දූපතක. එතකොට ඔබතුමන්ලාට හිතලා බලන්න පුළුවන්, මිලියන 21ක් ජීවත් වන අප රටේ කී දෙනකු මේකට ඇබ්බැහි වෙන්න යනවා ද කියලා. මේ ප්‍රමාණය සූදු ගැසීමට පමණයි. ඊට අමතරව, අපි දන්නා විධියට දැන් විශාල පිරිසක් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තිබෙනවා. කොහේටද මේ ආර්ථිකයේ දිශානතිය තිබෙන්නේ? මේ ආර්ථිකය කොහේද යන්නේ කියන ප්‍රශ්නය මා අහන්නට කැමැතියි. අපි මේ නියමයට සම්පූර්ණයෙන්ම විරුද්ධයි කියලා ප්‍රකාශ කරන්නට ඕනෑ. නමුත් ආණ්ඩුව හිතනවා නම් මේක කරන්නම ඕනෑ කියලා එහෙනම් මොකටද මේක කොළඹට ගෙනෙන්නේ? මැකාවු දූපතේ මේ වෙනුවෙන් කොටසක් වෙන් කරලායි තිබෙන්නේ. එහෙම වෙන් කරලා එතැනට ගුවන් තොටු පොළක් දාලා තිබෙනවා. දකුණේ ජීවත් වන අපේ ජනතාවගෙන් මම අහන්න කැමැතියි, මේ කැසිනෝ මත්තලට ගෙනාවා නම් ඔබ අනුමත කරනවා ද කියන ප්‍රශ්නය. දකුණේ හම්බන්තොට, මත්තල ජනතාව මේක අනුමත කරනවාද, නැද්ද කියලා අපි දැන ගන්නට කැමැතියි. මේක මේ කොළඹ නගරයට ගෙනැල්ලා කරන්නේ කොළය වහලා ගහන වැඩක් කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට ඕනෑ. ඉතින් ඒ නිසා අපි මේකට සම්පූර්ණයෙන්ම විරුද්ධයි.

ඒ විතරක් නොවෙයි. මේ වාගේ කැසිනෝ ව්‍යාපාර තියෙන කොට සිදු වන්නේ මොකක්ද? මුලදී කියනවා, ලාංකිකයන්ට එතැනට යන්නට බැහැ, එතැනට යන්න පුළුවන් විදේශිකයන්ට විතරයි කියලා. මොකක්ද ඔය තර්කය?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මා අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සුද්දාට තිබුණා hotels, සුද්දාට තිබුණා restaurants. ඒ යුගයට අපි ආයෙත් යන්න ලැස්ති නැහැ. මේක අපේ රට. මේ රටේ මොනවා හරි තිබෙනවා නම්, ඕනෑම තැනකට ගිහිල්ලා ඒ ඕනෑම දෙයකට සහභාගි වන්නට අපේ පුරවැසියාට අයිතිය තිබෙන්නට ඕනෑ. පුරවැසියා ආරක්ෂා කරන්න අවශ්‍ය නම්, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අද දින ඉදිරිපත් කර තිබෙන මේ නියමයන්ට විරුද්ධව ඡන්දය දෙන්නය කියලා ඉල්ලමින් මම නිහඬ වනවා, ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, බොහොම ස්තුතියි.

මීළඟට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.21]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියමයන් සම්බන්ධයෙන් අපි දවස් දෙකක් විවාදයට ලක් කළා. මම හිතන විධියට මේ ප්‍රශ්නයෙන් ගොඩ එන්නට නම් එකම දෙයයි කරන්නට තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එනම් මේ අදාළ ගිවිසුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමයි. අද වනතෙක් මේ අදාළ ගිවිසුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ. පැකර් එක්ක අත්සන් කරපු ගිවිසුම, ඒ වාගේම ඔය කියන අනෙකුත්

ආයෝජකයන් සමඟ අත්සන් කරපු ගිවිසුම් කෝ? ඉතින් මේකෙන්ම පෙනෙනවා, ආණ්ඩුවට හංගන්නට දෙයක් තිබෙන බව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආණ්ඩුව විනිවිද භාවයකින් යුතුව කටයුතු කරනවා නම්, ආණ්ඩුවේ යුතුකම තමයි මේ සැකය දුරු කරන එක.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ෆයිසර් මුස්තාපා නියෝජ්‍ය අමාත්‍යතුමා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙම ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I have only 15 minutes. Please sit down like a gentleman.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා මුදල් පිළිබඳව බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට බව. එතකොට ඔය කියන ජාත්‍යන්තර ආයෝජනකරුවන් සමඟ අපේ රටේ මුදල් ගනුදෙනු ඇති කර ගන්නවා නම් විපක්ෂයේ හොඳ හිත දිනා ගන්න, මහා නාහිමියන්ගේ හොඳ හිත දිනා ගන්න, මේ රටේ සියලු ජනතාවගේ හොඳ හිත දිනා ගන්න මේ ගිවිසුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැත්තේ ඇයි? මට ඒකට උත්තරයක් දෙන්න කෝ. අපේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ගරු සභාවේ සිටිනවා. මම අහන්නේ මේ ගිවිසුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැත්තේ ඇයි? බොහොම සරල දෙයක්. දවස් දෙකක් තිස්සේ මේ ගැන පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන්නට ඕනෑ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ගිවිසුම් ටික පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒ අවශ්‍ය සංශෝධනයන් කළා නම්, දවස් දෙකක් මේ ගැන සාකච්ඡා කරන්නට ඕනෑ නැහැ.

බලන්න, අපේ මහානාහිමිවරුන් ලියුමක් එවලා තිබෙනවා. ඒ කියන්නේ මල්වතු, අස්ගිරි, අමරපුර සහ රාමඤ්ඤ නිකායේ මහානාහිමිවරුන්. ඇත්ත වශයෙන්ම එම මහානායක ස්වාමීන් වහන්සේලා හතර දෙනාටත් මේ ආණ්ඩුව ඉදිරිපත් කරන අර්ථ නිරූපණය ගැන විශ්වාසයක් නැහැ. ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. ආණ්ඩුවේ වගකීම තමයි යම් අවිශ්වාසයක් තිබෙනවා නම් ඒක නැති කරන එක. නමුත් ඒ අවිශ්වාසය නැති කරන්නට ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙනවා. මට වෙලාව මදි නිසා අපේ මහානාහිමියන් එවලා තිබෙන ලියුමේ අවසානය පමණක් මා කියවන්නම්. "මෙම අණ පනත් තුළ ඍජු අර්ථ කථනයක් පැහැදිලිව දක්වා සංශෝධනය කිරීමට නිසි පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමි. තෙරුවන් සරණයි!" කියා එය අවසන් කර තිබෙනවා. ඒ කියන්නේ අපේ මහානායක ස්වාමීන් වහන්සේලාත් පැහැදිලි අර්ථ කථනයක් ඉල්ලනවා. ඒක අපේ පාර්ලිමේන්තුවේ වගකීම. ආණ්ඩු පක්ෂයේ නොවෙයි, විපක්ෂයේ විතරක් නොවෙයි, අප සියලු දෙනාගේම වගකීම තමයි ආගමික නායකයන්ට, මහානායක ස්වාමීන් වහන්සේලාට විතරක් නොවෙයි, ක්‍රිස්තියානි, මුස්ලිම් නායකවරුන් සියලු දෙනාටත් මේ පිළිබඳව පැහැදිලි අර්ථ කථනයක් ලබා දීම. ඉතින් මේ ගිවිසුම ඉදිරිපත් කරන්නේ නැත්තේ ඇයි, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි?

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
පළමු වැනි ගිවිසුමේ ඔය කියන ඔට්ටු ඇල්ලීම සහ සූදු ගැන තිබුණා. ඒක කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළාම අපි එයට විරුද්ධ වුණා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ පළමු වැනි ගිවිසුමේ නේ? මේකෙ නොවෙයි නේ?

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඔව්. ඒ අනුව එම ගිවිසුම අවලංගු වන විධියට තමයි මේ අලුත් ගිවිසුම තිබෙන්නේ. ගරු ඇමතිතුමා ඊයේ පැහැදිලි කළා, මේ ගැසට් නිවේදනය අනුමත වීමෙන් පසුව නව ගිවිසුම අත්සන් කරන බව. රජය වෙනුවෙන් මා කියනවා, ඒක අත්සන් කළ වහාම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තවම ගිවිසුම අත්සන් කරලාත් නැහැ. ඒක තමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකෙන් පෙනෙනවා රජය වගකීමකින් තොරව කටයුතු කර තිබෙන බව. ගිවිසුම අත්සන් කරලා නැත්නම්, බදු සහන නැහැ කියලා ඔබතුමා කියන්නේ කොහොමද? [බාධා කිරීම්] Please do not disturb me.

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
වාඩිවෙන්න, වාඩිවෙන්න. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
You

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

sit down. - [*Interruption.*]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි-

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ෆයිසර් මුස්තාපා නියෝජ්‍ය ඇමතිතුමා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. ඔබතුමා ඉදිරිපත් කරන රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Sir, the Hon. Lakshman Kiriella asked me a question. Can I answer his question?- [*Interruption.*] Sir, I am on a point of Order.- [*Interruption.*]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අහන්නේ ගිවිසුමක් නැත්නම් -[බාධා කිරීමක්]

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Sir, can I answer his question? - [*Interruption.*] Sir, I am on a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ෆයිසර් මුස්තාපා නියෝජ්‍ය අමාත්‍යතුමා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. මොකක්ද රීති ප්‍රශ්නය?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Hon. Member, may I be permitted to answer your question? - [*Interruption.*]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එතුමා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. අවස්ථාව දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
You

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

sit down.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
I am not a

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

you cannot call me like that.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you cannot use those words. ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවට ගැළපෙන වචන භාවිත කරන්න. එම වචනය මා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Sir, with respect, I ask the Hon. Lakshman Kiriella to withdraw that statement. You have no right to call me like that. Sir, I ask him to withdraw that statement first; ask him to withdraw that statement.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I withdraw that.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, එතුමා කැමති නම් විතරයි, එතුමාගේ කාලය අර ගෙන උත්තර දෙන්න පුළුවන්.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Sir, can I answer his question? He asked me a question. Can I answer that?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා නම් අවස්ථාව දෙන්න පුළුවන්. නමුත් රීති ප්‍රශ්නයක් නැහැ. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බැසිල් රාජපක්ෂ මහත්මයාගේ කථාවෙන් හෙළිදරවු වුණා ගිවිසුමක් අත්සන් කරලා නැහැයි කියලා. ගිවිසුමක් අත්සන් කරලා නැත්නම් දවස් දෙකක් තිස්සේ පාර්ලිමේන්තුවට කිව්වේ අසත්‍ය. අමූලික අසත්‍ය. [බාධා කිරීමක්]

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා, රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඔබතුමා ඉල්ලුවා -[බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
මෙතුමා ඉල්ලුවා ගිවිසුම සභාගත කරන්න කියලා. රජය වෙනුවෙන් අපි ඒ වගකීම ගන්නවා. ගිවිසුම සභාගත කරනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අනෙක, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ BOI එක භාරව කටයුතු කරන ලක්ෂ්මන් යාපා ඇමතිතුමා නැහැ. එතුමා කිව්වා ආයෝජන වැඩි වෙලා කියලා. මම ඔබතුමාට ඒ විස්තර ඉදිරිපත් කරනවා. මේක ඔබතුමා කියවන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 සෘජු ආයෝජන ඇමෙරිකන් ඩොලර් මිලියන 877.2යි. මේවා තිබෙන්නේ මහ බැංකු වාර්තාවේ. 2013 සෘජු ආයෝජන ඇමෙරිකන් ඩොලර් මිලියන 850යි. ඇමෙරිකන් ඩොලර් මිලියන 25කින් අඩු වෙලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේක බලන්න. ඔබතුමා මේක කියවන්න. මේ මහ බැංකු වාර්තා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අනුව බලන කොට ඇමෙරිකන් ඩොලර් මිලියන 25ක් අඩු වෙලා. මේක තමයි ඇත්ත. අපේ ලක්ෂ්මන් යාපා ඇමතිතුමා ඊයේ ඉලක්කම් විජ්ජාවක් ඉදිරිපත් කළා. මොනවා කිව්වාද කියලා අපට තේරෙන්නේ නැහැ. නමුත් මේක තමයි ඇත්ත.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
තේරෙන්නේ නැති එක තමයි වෙලා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ආයෝජන අඩු වෙන්නේ ඇයි? අද අපේ රටට එන ආයෝජකයෝ කවුද? අපේ මන්ත්‍රීවරුන්ට [බාධා කිරීමක්] රෝහිත අබේගුණවර්ධන ඇමතිතුමා කිව්වා, රතුපස්වල සිද්ධිය නිසා ආයෝජන අඩු වෙනවා කියලා. ඉතින් අපි ද ඒක කළේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන අමාත්‍යතුමා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. මොකක්ද, රීති ප්‍රශ්නය?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කළේ නිවැරදි ප්‍රකාශයක් බව මා කියා සිටිනවා. ගරු මන්ත්‍රීතුමා කියන දේ සම්පූර්ණයෙන්ම අසත්‍යයි. [බාධා කිරීම්] මම ඒක සභාගත කළා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ කීර්තිනාමය ගැන කථා කරනවා. ආයෝජන එන්න ඕනෑ කියනවා. දැන් අපේ රටට කීර්තිනාමයක් නැහැ. මොකක්ද, තිබෙන කීර්තිනාමය?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අද මන්ත්‍රීවරුන්ට ගහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද "රාවය" පත්‍රයේ ලිපියක් තිබෙනවා. ඔබතුමා ඒක කියවන්න. මම හැම සිකුරාදාම "රාවය" පත්‍රය කියවනවා. අපේ රට ජාත්‍යන්තර වශයෙන් නීච තත්ත්වයට පත් කළේ මේ ආණ්ඩුවයි කියන එක අද "රාවය" පත්‍රය කියනවා. මම බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගෙන් තවත් ප්‍රශ්නයක් අහනවා. ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමනි, ඔබතුමාගෙනුත් මම ප්‍රශ්නයක් අහන්න කැමැතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා කාලය දෙනවාද? ප්‍රශ්නයක් අහනවා නම්, උත්තර දෙන්න අවස්ථාව දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කාලය දෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එහෙම නම් ප්‍රශ්නය අහන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලංකාවේ කැසිනෝ තිබෙනවා. කොළඹ, මහනුවර ප්‍රදේශවල කැසිනෝ තිබෙනවා. ඒවා පවත්වන්නේ යම්කිසි නෛතික පදනමක් මත නේ. ඒක නීති විරෝධියි කියන්න බැහැනේ. නීති විරෝධී නම් වහලා දමන්න ඕනෑ. ඒවා කරන්නේ නෛතික පදනමක් යටතේ. එතකොට මේ ව්‍යාපෘති ආරම්භ කළාට පස්සේ ඒ නෛතික පදනමම පාවිච්චි කරලා මෙම සංකීර්ණයටත් ලයිසන් ඉල්ලුවොත් තමුන්නාන්සේලා දෙනවාද?

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
මොකක්ද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන අමාත්‍යතුමා පිළිතුරු දෙන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
1988 දී එක්සත් ජාතික පක්ෂ රජය ඉදිරිපත් කළ ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත යටතේ අතිවිශාල ප්‍රමාණයක් බදු ගෙවා ගෙන එම ව්‍යාපාර පවත්වා ගෙන ගියා. මේ ආණ්ඩුව තමයි ලක්ෂ දහයේ බද්ද ලක්ෂ 1,000 කළේ. [බාධා කිරීම්] ලක්ෂ 1,000 කළාම සූදු ව්‍යාපාර අඩු වෙලා තිබෙනවා. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන අමාත්‍යතුමනි, ඔබතුමා කියන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මේ රටේ තිබෙන නීතියට අනුව අනාගතයේ යමක් සිද්ධ වෙනවාද කියා මා දන්නේ නැහැ. නමුත් නීතියට පටහැනිව මේ රටේ කිසිම දෙයක් කරන්න බැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මේ ආණ්ඩුව යටතේ කරනවාද කියලායි ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා අහන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
උත්තර දෙන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මේ ආණ්ඩුව යටතේ තිබෙන ඒවා අඩු කළා. මේ තිබෙන නීතියට පටහැනිව මොකුත්ම කෙරෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම අහන්නේ මෙයයි. අද ධම්මික පෙරේරා, රවි විජේරත්නලා වැනි අය යම්කිසි පදනමක් යටතේ කැසිනෝ කරගෙන යනවා. ඒ පදනම පාවිච්චි කරලා මේ සංකීර්ණ ඇතුළේ කැසිනෝ දමන්න ඉල්ලුවොත් තමුන්නාන්සේලා එයට ඉඩ දෙනවාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අප ආයෝජන මණ්ඩලය හරහා මේ කිසිම දෙයකට අනුමැතියක් දෙන්නේ නැහැ. මා ඒ බව ඉතාම පැහැදිලිව කියනවා. මට කියන්න පුළුවන් එච්චරයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා වුණත් මේ ගැසට් නිවේදන කියවලා නැහැ. [බාධා කිරීමක්] එහෙනම් ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙලා මේක අහගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ගැසට් නිවේදනවල මෙන්න මෙහෙම කාරණයක් තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔබතුමා පන්තියක් පවත්වන්න වාගෙයි හදන්නේ. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. කථාවේ අවසාන විනාඩි කීපය මේ යන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ගැසට් නිවේදනවල තිබෙන මෙන්න මේ වගන්තිය ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සියලුම ගරු මැති ඇමතිතුමන්ලාට අමතක වුණා. මේ වගන්තිය යටතේ බලතල තිබෙනවා.

මම එය දැන් කියවන්නම්. මෙම ගැසට් නිවේදනවල මෙන්න මෙහෙම සඳහන් වෙනවා:

"ඉහත කී ව්‍යාපෘති සමාගමේ කාර්යයන්හි විෂය ක්ෂේත්‍රය ඉක්මවා අදාළ ආඥාපනත් වලට.......

"අදාළ ආඥාපනත්වලට" කියන්නේ කලින් සම්මත වුණු අණපනත්වලටයි. ඉහත කී ව්‍යාපෘති සමාගමේ කාර්යයන්හි විෂය ක්ෂේත්‍රය ඉක්මවා අදාළ ආඥාපනත්වලට අනුකූලව විස්තීරණය

කරන්න බලය තිබෙනවා. ඒ කියන්නේ මෙම නියමයන්ගෙන් බලය නැති වුණාට, මෙහි විෂය පථය ඉක්මවා කවුරු හරි කටයුතු කරනවා නම් පාර්ලිමේන්තුවේ සම්මත වුණු පනත් යටතේ ක්‍රියා කරන්න බලය තිබෙනවා කියන එකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියන්න අදහස් කරන්නේ මෙයයි. යම් පිරිසක් දැනට ලංකාවේ කැසිනෝ ව්‍යාපාරය පවත්වා ගෙන යනවා. ඒකට යම්කිසි නෛතික පදනමක් තිබෙනවා. මේ හෝටල් සංකීර්ණ ආරම්භ කළාට පසුව ඒ නෛතික පදනම පාවිච්චි කරලා ඒවායේත් කැසිනෝ ගහන්න ඉල්ලුවොත් ආණ්ඩුව ඒක ලබා දෙන්න මේ වගන්තිය යටතේ පොරොන්දු වෙලා තිබෙනවා. ඒකයි මා කියන්නේ. මේක තමයි වැදගත්ම කාරණය. කලින් සම්මත වුණු පනත්වලට කැසිනෝ ලයිසන් දෙන්න පුළුවන්. ඒ නීතිය පාවිච්චි කරලා මේ හෝටල් සංකීර්ණ තුළත් කැසිනෝ අරින්න පුළුවන් කියන එක මා කියනවා. මේ සඳහා නිශ්චිත අර්ථ නිරූපණයක් ඕනෑය කියලා අපේ අතිපූජ්‍ය මහානායක ස්වාමීන්වහන්සේලා කිව්වේ ඒ නිසායි.

අවසාන වශයෙන්, මම මේ කාරණයත් කිව යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ කීර්ති නාමයට අද මොකද වෙලා තිබෙන්නේ? අපේ රට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේදී අවුරුදු තුනක් පිට පිට පැරදුණා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ රටට අද කීර්ති නාමයක් නැහැ. අපේ රට ගැන අප කනගාටු වෙනවා. ආණ්ඩුව විතරක් නොවෙයි, මේ රටට අපත් ආදරෙයි. මේක අප කාගේත් රටයි. මොකද අප පිට රටකට ගියාම, අප ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේද, යූඑන්පී එකේද කියලා ඒ රටවල් අපෙන් අහන්නේ නැහැ. අප පිට රටකට ගියාම ඒ අය අහන්නේ අප මොන රටේද කියලායි. යූඑන්පී එකේ අය ගියත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය ගියත් පිට රටකට ගියාම අප එකට ඉන්නවා නේ, නේද?

අද අපේ රටට කීර්ති නාමයක් නැහැ. මේ නැති කීර්ති නාමයක් ගැන ඔබතුමන්ලා කථා කරන්න එපා. අපේ ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමා මේ ගරු සභාවේ දැන් සිටිනවා. මම එතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ ඡන්දය තිබුණු දිනයේ ඔබතුමා හිටියේ හම්බන්තොට නේද? එදා ඔබතුමා කොහේද හිටියේ? කියන්න බලන්න. ඔබතුමා හම්බන්තොට නේද හිටියේ. [බාධා කිරීම්] මේ රටට ආදරේ මිනිස්සු, - [බාධා කිරීම්]

**ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)
ගරු මන්ත්‍රීතුමනි, ඡන්දය ගන්න අවස්ථාවේදී කිසිම විදේශ ඇමතිවරයෙක් ඉන්නේ නැහැ. ඊට ඉස්සර වෙලා අපේ පැත්තෙන් අවශ්‍ය කටයුතු ඔක්කොම කෙරිලා තිබුණා. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් කාලයක් තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත් ඒ කාලයේ ජිනීවාවල සිටියා. තානාපති කාර්යාලයේ අය කිව්වා, අපට ලැබෙන්නේ පරාජයක්ද, ඉනිමක පරාජයක්ද කියන එක තමයි අප බලාගෙන ඉන්නේ කියලා.

ලජ්ජයි, ලජ්ජයි! මේ අපේ රට.

26 වැනි දා පොදු රාජ්‍ය මණ්ඩලයේ උත්සවයට සහභාගි වෙන්න කියලා අපේ අතිගරු ජනාධිපතිතුමා අපට ආරාධනා කර තිබෙනවා. පොදු රාජ්‍ය මණ්ඩලයේ සභාපතිවරයා හැටියට අතිගරු ජනාධිපතිතුමා අපේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න බැඳී සිටිනවා. එතුමාට අපේ මන්ත්‍රීවරු ආරක්ෂා කරන්න බැරි නම්, මේ රටේ ජනතාව ආරක්ෂා කරන්න පුළුවන්ද කියන එකත් මම අහනවා. ඔය තර්ක අමතක කරලා රට වෙනුවෙන් ආණ්ඩුවට උදව් කරන්න අපි සූදානම් බව මම හැමදාම කියනවා. ආණ්ඩුව බේරා ගන්න නොවෙයි, රට බේරා ගන්න අප සූදානම්. අද බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ කථාවෙන් ඔප්පු වුණා, ගිවිසුම් අත්සන් කර නැහැ කියා. ගිවිසුම් අත්සන් කර නැත්නම් කොහොමද පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමාගේ රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අපට උදවු කරන්න කැමැති වීම ගැන බොහොම ස්තුතියි. හැබැයි, ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන් කියලා කිව්වේත් ඔබතුමාම තමයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.37]

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප බොහොම කනගාටු වෙනවා, ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන් කියපු ලක්ෂ්මන් කිරිඇල්ල මහත්මයා දැන් කැසිනෝ සම්බන්ධව කථා කිරීම ගැන.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම මේ ගරු සභාවේ භය නැතුව කියනවා, ගොන් විධියට වැඩය කළ නිසා තමයි ජාත්‍යන්තර -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොනවාවත් නැහැ වාගෙයි. යූඑන්පී එක එදා 61,000ක් තරුණයෝ මැරුවා. 61,000ක් තරුණයෝ මැරුව යූඑන්පී එක අද නිදහස ගැන කථා කළාට වැඩක් නැහැ. ගෙදරට ඇවිත් රිචඩ් ද සොයිසා වාගේ මාධ්‍යවේදීන් - [බාධා කිරීමක්] නෝනට ජනවසම වත්ත ලියලා දුන්න මනුෂ්‍යයා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මොන වගන්තිය යටතේද රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ? [බාධා කිරීමක්] කුමන ස්ථාවර නියෝගය යටතේද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මාවනැල්ලේ මුස්ලිම් මිනිස්සු- [බාධා කිරීමක්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
හන්තාන වත්තලු. නෝනට ජනවසම හන්තාන වත්ත ලියලා දුන් මිනිස්සු දැන් මහ ලොකුවට කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දෙදෙනාටම සාධාරණව අවස්ථාව දුන්නා. දැන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කථා කරන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එක්සත් ජාතික පක්ෂය මෙහෙමයි. එදා 60,000ක් විතර තරුණයෝ මරලා ඉවර වෙලා අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. අද මාධ්‍ය නිදහස ගැන කථා කරනවා. ගෙදරට ඇවිත් රිචඩ් ද සොයිසා මහත්මයා වාගේ අය එතුමන්ගේ අම්මා ඉස්සරහා පැහැරගෙන ගිහින් මරලා මුහුදට දාපු එක්සත් ජාතික පක්ෂය මාධ්‍ය නිදහස ගැන කථා කරනවා. ජනතාව මේවා විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසයි අපට ඡන්දය දෙන්නේ. ඒ විතරක් නොවෙයි. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත ගෙනාවා. මේ රටේ කැසිනෝ නොවෙයි, අප තිබෙන සූදුවල නම් දන්නෙත් නැහැ. සූදුවට විරුද්ධව කථා කරන එක්සත් ජාතික පක්ෂය 1988 තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ සූදු ක්‍රීඩා නීතිගත කර තිබෙනවා. ඒ සූදු ක්‍රීඩා මොනවාද?

2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 5 වන වගන්තියේ (ආ) උප වගන්තියේ මෙහෙම සඳහන් වෙනවා:

> "ඔට්ටුවක් සඳහා යම් ක්‍රීඩාවක් කිරීමට පුද්ගලයන්ට ඇතුළුවිය හැකි ස්ථානයක් අදහස් වන අතර ඊට බකාරා, පුන්ටෝ බැංකෝ, බිග්සික්ස්, බ්ලැක් ජැක්, බූවලේ, චෙමින්ඩිෆර්, චක් අ ලක්, ක්‍රවුන් ඇන්ඩ් ඇන්කර්, ෆාරෝ..."

මේවා අපි දන්නේත් නැහැ. තමන් ආණ්ඩු බලයේ සිටින විට සූදු නීතිගත කරලා අද හාමුදුරුවරු හෝ වෙනත් උදවිය ඉස්සරහට දමා picketing කරන්න යනවා. ජනතාව මේවා විශ්වාස කරන්නේ නැහැ. මොකද, මේ ගොල්ලෝ කළ වැඩ දන්නවා. ඒ විතරක් නොවෙයි. යුද්ධය ගැන කථා කරනවා. එදා ප්‍රේමදාස මහත්මයාගේ කාලයේ තමයි ගිහින් චෙක්පත් ලියලා කොටි හමුදාවට ආයුධ දීලා කටයුතු කළේ. ඒ නිසා මේ ගොල්ලෝ යුද්ධය ගැන කථා කළාට ජනතාව විශ්වාස කරන්නේ නැහැ.

Explore Sri Lanka කියා පොතක් තිබෙනවා. මා ඒ පොතේ දෙවන පිටුව පෙරලුවා. එහි තිබුණේ මොකක්ද? මේ කැසිනෝ කොහේද තිබෙන්නේ? Bally's Casino එක තිබෙනවා. ඊළඟට Bellagio Casino එක තිබෙනවා. ඒ වාගේම MGM Casino කැසිනෝ එක තිබෙනවා. මේ කැසිනෝ එක තිබෙන්නේ 772, ගාලු පාර, කොළඹ. මා ගරු ජයසූරිය මහත්මයාට කියනවා, ගිහින් මේවා ඉදිරිපිට picketing කරන්න කියා. මේවා කියන්න. තමුන්නාන්සේලා ගිහිල්ලා මේ කැසිනෝ ගහන තැන් වහන්න. මම තමුන්නාන්සේගෙන් අහනවා, යූඑන්පී ආණ්ඩු කාලයේ මෙහෙම ස්ථානයක් 772, ගාලු පාර, කොළඹ තිබුණේ නැද්ද කියා. එදා තමුන්නාන්සේලා කැසිනෝ ගැන කථා කළා ද? එදා තමුන්නාන්සේලා කැසිනෝ ගැන කථා කළේ නැහැ. මේ පොත සංචාරකයන් වෙනුවෙන් මුද්‍රණය කරන පොත. Casino Marina කොහේද තිබෙන්නේ? ඒක තිබෙන්නේ 30, Marine Drive, Colombo 03, Sri Lanka. මේ සම්බන්ධව තමුන්නාන්සේලා ගිහින් උද්ඝෝෂණය කළා ද? මේවා ඉදිරියට ගිහින් උද්ඝෝෂණය කළා ද? ගිහින් මේවා ඉදිරිපිට උද්ඝෝෂණය කරන්න. බොරුවට මේවායෙන් ඡන්ද වැඩ සඳහා මුදල් අරගෙන දැන් බොරුවට "කැසිනෝ, කැසිනෝ" කියා කෑ ගහලා මිනිසුන් තුළ වැරදි මතයක් ඇති කරන්න හදනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යූඑන්පී එකට මිනිස්සු ඡන්දය දෙන්නේ නැත්තේ ඒකයි. මේ අයට වැඩ පිළිවෙළක් නැහැ. රතුපස්වල සිද්ධිය අල්ලා ගත්තා. ඒ පසු පස ගියා. අන්තිමට මොකද වුණේ? ඒකත් නැහැ. මොනවා හරි දෙයක එල්ලෙන්න යනවා. එහෙම එල්ලිලා තමයි දේශපාලනය කරන්නේ. දේශපාලන වැඩසටහනක් නැහැ. මේ ගොල්ලන් කියනවා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩු කාලයේ නොවෙයි, කැසිනෝ ගෙනාවේ කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 1721යි. මේ ව්‍යාපෘතිවලින් සියයට 54ක් ඒ කියන්නේ ව්‍යාපෘති 921ක්ම නිෂ්පාදන ආශ්‍රිත ව්‍යාපෘති. සියයට 43ක් සේවා ආශ්‍රිත ව්‍යාපෘති. ඉතිරි සියයට 3 කෘෂිකාර්මික ව්‍යාපෘති. Computers කවදාවත් පාවිච්චි නොකළ දරුවන් ඉන්නවා. Computers දෙන්න ඕනෑය කියා ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කිව්වා.

ආයෝජන මණ්ඩලය යටතේ පවතින ප්‍රධාන ව්‍යාපෘති ගනිමු. නිෂ්පාදන කර්මාන්ත ගත්තාම ලෝඩ්ස්ටාර්, ප්‍රිමා සිලෝන්, සිලෝන් ස්ටීල් කෝපරේෂන්, බ්‍රැන්ඩික්ස් ඇපරල්, හොල්සිම් ලංකා, MAS ෆැබ්‍රික්ස්, ඇන්සෙල් ලංකා යන මේ ව්‍යාපෘති ලංකාවේ තිබෙනවා. මේ ගොල්ලෝ කෑ ගැහුවා, මේවා ගෙනාවේ ඒ ගොල්ලන්ය, ඒ නිසා අපේ ආණ්ඩුවක් ආවාම මේ අය ආපසු යනවාය කියා. මේවා දැන් මේ රටේ තිබෙනවා. මේ ආයතන මේ රටේ අද ක්‍රියාත්මක වෙනවා.

ඊළඟට, සේවා සපයන ආයතන ගත්තාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩයලොග් ඇක්සියාටා, ශ්‍රී ලංකා ටෙලිකොම්, මොබිටෙල්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, භාරතී එයාටෙල්, වෙස්ට් කෝස්ට් පවර්, ලංකා IOC යන මේ ආයතන අද මේ රටේ පවතිනවා. කැසිනෝ ගහනවාය කියා ජනතාවට ප්‍රතිරූපයක් මවා පෙන්වන්නට තමුන්නාන්සේලා උත්සාහ කළාට ඒක එහෙම නොවෙයි. අද මේ ආයෝජන මණ්ඩලය යටතේ ඉතා විශාල ව්‍යාපෘති රැසක් ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටේ ඉදි වෙමින් පවතින ව්‍යාපෘති තිබෙනවා. ආයෝජන මණ්ඩලය යටතේ ඉදිරියේ ආරම්භ වන ව්‍යාපෘති 258ක් තිබෙනවා. මෙතුමන්ලා කියන්නේ, ආයෝජකයෝ එන්නේ නැහැ කියා. අපේ ආණ්ඩුවට ආයෝජකයෝ ගෙන්වන්නට බැහැ කියායි කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන ව්‍යාපෘති 258ක් තිබෙනවා. ව්‍යාපෘති 101ක් සේවා සපයන ව්‍යාපෘති. ව්‍යාපෘති 72 ක් යටිතල පහසුකම් ආශ්‍රිත ව්‍යාපෘති. 67ක් නිෂ්පාදන ආශ්‍රිත ව්‍යාපෘති. ව්‍යාපෘති 18ක් කෘෂිකර්මාන්තය ආශ්‍රිත ව්‍යාපෘති. මේ සේවා සපයන ව්‍යාපෘතිවලින් 49ක්ම හෝටල් ව්‍යාපෘති. ෂැන්ග්‍රි-ලා කොම්පැනිය, ඒ වාගේම සිනො ලංකා, වෙල්කොම් රීජන්සි වැනි විශාල හෝටල් ව්‍යාපාර. මේ හෝටල් ව්‍යාපෘති 49න් කාමර 7000කට වැඩි සංඛ්‍යාවක් ඉදි වනවා. ලක්ෂ 12කට වැඩියෙන් සංචාරකයෝ එනවා නම් අප මේ හෝටල් කර්මාන්තය ආරම්භ කරන්නට ඕනෑ.

ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ තමයි, ප්‍රභාකරන් කියන මිනීමරුවා ඝාතනය කරලා, ත්‍රස්තවාදය නැති කරලා, සාමය ගෙනාවේ. ඒ සාමය ගෙනා නායකයා මේ රට කවදාවත් පාවා දෙන්නේ නැහැ. එදා පටන් ගත් ධර්ම දේශනා හැම පෝයකටම අරලියගහ මන්දිරයේ පැවැත්වෙනවා. යූඑන්පී නායකයෝ හිටියා, අරලියගහ මන්දිරයේ හෝ ජනාධිපති මන්දිරයේ එක බණක් කියෙව්වාද? නැහැ. අපේ ජනාධිපතිතුමා එහෙම නොවෙයි, එදා පටන් ඒ ආකාරයෙන්ම ඒ ධර්ම දේශනා පැවැත්වීම කෙරෙනවා. එම නිසා ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ චින්තනයට වැරදි දේවල් ගෙන එන්නට ඒ අය අදහස් කරනවා. නමුත් එහෙම වෙන්නේ නැහැ. අද ජනතාව ඒක දන්නවා. අද ජනතාවාදී නායකයෙක් ඉන්නේ.

මේ අය එදා කිලිනොච්චි යනකොට මැදවච්චි යනවාය කියා සිනහ වෙද්දී, පරණ රජ කාලයේ නිගණ්ඨයෝ කෑ ගැහුවා වාගේ කෑ ගහද්දී අපේ හමුදාව යුද්ධය ජයග්‍රහණය කළා. ඒ වාගේ කීර්තියක් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ ඇති කර තිබෙනවා.

ඉදි කිරීමට නියමිත ව්‍යාපෘති යටතේ අපට රැකියා අවස්ථා 40,500ක් පමණ නිෂ්පාදනය කරන්නට පුළුවන්. ව්‍යාපෘති 1721ක් යටතේ දැනට අප රැකියා අවස්ථා 480,000ක් උත්පාදනය කර තිබෙනවා. ඉදි වෙමින් පවතින ව්‍යාපෘතිවල ව්‍යාප්තිය ගත්තොත්, ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 1721න් 1141ක් ව්‍යාප්ත වෙලා තිබෙන්නේ බස්නාහිර පළාත තුළයි. ඒ වාගේම උතුරු පළාත තුළ ව්‍යාපෘති 146ක්, මධ්‍යම පළාතේ ව්‍යාපෘති 126ක්, දකුණු පළාතේ ව්‍යාපෘති 103ක්, සබරගමුව පළාතේ ව්‍යාපෘති 82ක්, නැගෙනහිර පළාතේ ව්‍යාපෘති 41ක්, ඌව පළාතේ ව්‍යාපෘති 38ක්, වයඹ පළාතේ ව්‍යාපෘති 35ක් යන ආකාරයට ව්‍යාප්ත වෙලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමාට තව විනාඩි දෙකක කාලයකුයි තිබෙන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂය පුළුවන් තරම් උත්සාහ කරනවා මේ පිළිබඳව වැරදි අවබෝධයක් ජනතාවට ලබා දෙන්නට. 2012 දී සෘජු ආයෝජනවලින් ඇමෙරිකන් ඩොලර් මිලියන 941ක් උපයා තිබෙනවා. මේ වන විට ඒක වර්ධනය වෙලා තිබෙනවා. එම නිසා එක්සත් ජාතික පක්ෂය අප ගෙන එන පනත් කෙටුම්පත් තුළින් වැරදි දෙයක් මවා පාන්නට හදනවා. කැසිනෝ ගෙනෙනවාය, ගණිකා වෘත්තිය ගෙනනවාය කියා විවිධ කථා කිව්වාට, එතුමන්ලා හදපු නිදහස් ක්‍රමය තුළ තමයි රුසියාවේ සිට එන කාන්තාවන්ට මෙහෙ ඇවිත් ඕනෑ විධියට කොල්ලුපිටියේ ඉන්න පුළුවන් වෙලා තිබෙන්නේ. කවුද ඒ ඉන්නේ? මේවා යූඇන්පී එකෙන් කරලා අප පිට දාන්න එපා. මේවා තමුන්නාන්සේලා ඇති කරපු නිදහස් ක්‍රමය යටතේ ඇවිත් තිබෙන ඒවා. ඒවා ගැන මොනවාවත් දන්නේ නැහැ වාගේ අද කථා කරනවා.

මේ ආයෝජන ව්‍යාපෘති දෙක කවුද කරන්නේ? එකක් පිටරට ආයෝජකයන් කරනවා. අනෙක ශ්‍රී ලංකාවේ ඉන්න ව්‍යාපාරිකයන් කරන්නේ. ශ්‍රී ලාංකික, සිංහල ව්‍යාපාරිකයෝ. ඒ අය මේ ව්‍යාපාර කරන එක හොඳ නැද්ද? ඒ අයට සහන දෙන එක හොඳ නැද්ද? ඒ අය නැගිටුවන්න ඕනෑ. මේ අය හොඳ ව්‍යාපාරිකයෝ. ඒ අයටත් අප අත දෙන්න ඕනෑ. විදේශීය ආයෝජකයෝ ගෙන්වනවා වාගේම දේශීය ආයෝජකයන්ටත් ශක්තියක් දෙන මේ ව්‍යාපෘති වැරදි විධියට නිර්වචනය කරලා කැසිනෝ ව්‍යාපාරයක් බවට පත් කරන්න හදන එක්සත් ජාතික පක්ෂයට පසු ගිය පළාත් සභා මැතිවරණයේදී දුන් දෙය තමයි ලැබෙන්නේ. පැරදිලාත් මේ ගොල්ලෝ කියන්නේ ප්‍රතිශතය අනුව දිනුම් කියලායි.

Green light පත්තු වෙලා ලු. හැබැයි green light පත්තු වෙලා නම් කඩා ගෙන යන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා. දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
යූඑන්පී ආණ්ඩුවට අපි එක දෙයක් කියනවා. එදා 1993 දකුණු පළාත් සභා මැතිවරණය අපි ජයග්‍රහණය කළාට පස්සේ තමුන්නාන්සේලා පළාත් සභාවේ මුල් පුටුව දෙන්නේ නැති වුණාම මහින්ද රාජපක්ෂ මැතිතුමා ගිහිල්ලා අපේ අමරසිරි දොඩන්ගොඩ හිටපු ඇමතිතුමා ඒ මුල් පුටුවේ වාඩි කරවපු එක තමයි ආණ්ඩුවක් පෙරළන green light එක කියන්නේ. තමුන්නාන්සේලාගේ එහෙම light එකක් අද දකින්නවත් නැහැ. අවුරුදු 50ක් යන කල්වත් එය දකින්න බැහැයි කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. ඊළඟට ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.47]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් සාකච්ඡාවට භාජන කරන මොහොතේ මගේ අදහස් කිහිපයකුත් එකතු කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා. මේ ගරු සභාවේ කියවුණා, විශේෂයෙන්ම අසත්‍ය ප්‍රකාශ කරන්නේ නැතුව, සත්‍ය තොරතුරු, හරවත් තර්ක ඉදිරිපත් කරමින් මෙම විවාදයට සහභාගි වුණොත් හොඳයි කියලා. මමත් උත්සාහ කරනවා, හරවත් අදහස් කිහිපයක් ඉදිරිපත් කරලා ඒවායේ නිගමනයන්, තීන්දු, තීරණ මේ සභාවේ ඔබ සියලුදෙනාටම භාර කරන්න.

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත නිර්මාණය වෙලා තිබෙන්නේ, ක්‍රමය, උපාය මාර්ගය, සංවර්ධනය යන තුනම එකතු කර ගෙන අපේ රට තුළ පංච මහා කේන්ද්‍රීය සංවර්ධන මධ්‍යස්ථාන -නාවුක කේන්ද්‍රස්ථානය, බලශක්ති කේන්ද්‍රස්ථානය, ගුවන් කේන්ද්‍රස්ථානය, වාණිජ කේන්ද්‍රස්ථානය, දැනුමේ කේන්ද්‍රස්ථානය - බිහි කරන්නයි. ඒ කියන්නේ රට ආශ්චර්යයක් කරා ගෙන යන්නයි.

විශේෂයෙන්ම මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ගැන කථා කරන කොට එහි දෙපැත්තක් තිබෙනවා. එක පැත්තකින් විදේශ ආයෝජන අපේ රටට ගෙන්වන්නට සහන ලබා දෙනවා. හැබැයි ඒ සහන ලබා දෙන කොට අපේ රටට, රජයට රාජ්‍ය ආදායම අහිමි වනවා. එතකොට මෙතැන opportunity cost එකක් තිබෙනවා. තරාදියක දමලා, කිරලා, මැනලා රජය තීන්දු කරන්නට ඕනෑ, බදු සහන ලබා දෙන එක වාසියි ද, එහෙම නැත්නම් රාජ්‍ය ආදායම වැඩි කර ගන්න එක වාසියි ද කියලා. එතකොට cost-benefit analysis කරලා, ආවස්ථික පිරිවැය - opportunity cost - ගැන හිතා බලා තමයි රට වෙනුවෙන් වැඩ කරන ආණ්ඩුවක් කටයුතු කළ යුත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා ප්‍රකාශ කළා, ආණ්ඩුවේ ඉලක්කය සියයට අටක ආර්ථික වර්ධන වේගයක් ක්‍රියාත්මක කිරීමයි කියලා. ඒ සඳහා පෞද්ගලික ආයෝජන අවශ්‍යයි, රාජ්‍ය ආයෝජනයන්ට පමණක් මෙය ක්‍රියාත්මක කරන්න බැහැ, එම නිසා විදේශීය ආයෝජනය ප්‍රවර්ධනය කරන්නට කටයුතු කරන්න ඕනෑ, ඒ සඳහා සියයට 35ක ආයෝජන වේගයක් ක්‍රියාත්මක කළ යුතුය කියා එතුමා ප්‍රකාශ කළා. ඒ සඳහා තමයි ඔබතුමන්ලා බදු සහන ලබා දෙන්නේ. හැබැයි ඇමතිතුමනි, රජයේ සංඛ්‍යා ලේඛනවලට අනුව අද හතරදෙනකු සිටින පවුලකට මාසයකට ජීවත් වෙන්න රුපියල් 49,000ක්අවශ්‍ය වනවා. නමුත් මේ රුපියල් 49,000 ආදායම සපුරා ගන්නට බැරි සියයට 73ක් ඉන්නවා, අපේ රටේ ග්‍රාමීය ජනතාව; සියයට 53ක් ඉන්නවා, නාගරික ජනතාව; සියයට 81ක් ඉන්නවා, වතු ජනතාව. එක පැත්තකින් බදු සහන දෙන කොට රජය තීන්දු කරන්නට ඕනෑ, බදු සහන දෙන එකද රටේ ප්‍රමුඛතාව විය යුත්තේ, එහෙම නැත්නම් රාජ්‍ය ආදායම ලබා ගෙන මේ රට තුළ තිබෙන ආර්ථික, සමාජයීය අසමානාත්මතාව, මේ පරතරය, නැති බැරි ඇති හැකි පරතරය සඳහා ප්‍රායෝගික සක්‍රිය විසඳුමක් ලබා දීමද රජයේ න්‍යාය පත්‍රයේ ඉහළින්ම තිබිය යුත්තේ කියන එක ගැන.

ඒ ප්‍රවේශයත් සමඟ අද එක පැත්තකින් බදු සහන ගැන කථා කරනවා. ඊයේ දවසේ එක හෝටල් ව්‍යාපෘතියකට බදු සහන ලබා දීම පිළිබඳව සාකච්ඡාවට භාජන කළා. අද දවසේ හෝටල් ව්‍යාපෘති දෙකකට බදු සහන ලබා දීම පිළිබඳවයි සාකච්ඡාවට භාජන වන්නේ. තමුන්නාන්සේලාගෙන් මා අහන්න කැමැතියි, අපේ රටේ පාසල් යන දූ දරුවන්ගෙන් සියයට 25කට පමණක් දිවා ආහාරය දීලා, සියයට 75කට දිවා ආහාරය කපන කොට රටේ ප්‍රමුඛතාව විය යුත්තේ, හෝටල් දෙකකට බදු සහන ලබා දෙන එක ද, එහෙම නැත්නම් රාජ්‍ය ආදායම ලබා ගෙන සියලුම පාසල් දරුවන්ට දිවා ආහාරය ලබා දෙන එකද කියලා. මේ රටේ පාසල් 500ක් වැසී තිබෙන මොහොතක රජයේ ප්‍රමුඛතාව විය යුත්තේ, හෝටල් දෙක තුනකට බදු සහන ලබා දෙන එකද, එහෙම නැත්නම් රාජ්‍ය ආදායම ලබා ගෙන අර වැසී ගිය පාසල් 500 නැවත විවෘත කිරීමද?

ඊළඟට, සමෘද්ධි ව්‍යාපාරය ගැන බලමු. සියයට 15 සිට සියයට 6 දක්වා දුගී දුප්පත්කම අඩු වෙලා තිබෙනවා කියනවා. හැබැයි, අපේ රටේ 51ලක්ෂයක් වූ පවුල්වලින් ලක්ෂ 16කටම සමෘද්ධි සහනාධාරය දෙනවා. ඇත්තම කථා කරනවා නම්, දුප්පත්කම තුරන් කිරීමේ ව්‍යාපාරයෙන් පවුල් ලක්ෂ 16ක් ආවරණය වෙනවා. ඒ, පවුල් ප්‍රතිශතයෙන් 31ක්. එතකොට අපි තීන්දු කරන්න ඕනෑ, මේ හෝටල් දෙක තුනකට බදු සහන ලබා දෙනවාද, එහෙම නැත්නම් අර ලබා දෙන සොච්චම් අගයක ඇති සමෘද්ධි මුද්දරය වෙනුවට අඩු ගණනේ සමෘද්ධි ලාභීන්ගේ මුද්දරයක වටිනාකම රුපියල් 10,000ක් කරනවාද කියන එක. මේක ප්‍රමුඛතාව පිළිබඳ ප්‍රශ්නයක්. මේක හර බැර පිළිබඳව තිබෙන ප්‍රශ්නයක්. [බාධා කිරීමක්] පොඩ්ඩක් අහගෙන ඉන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ විරැකියාව අඩු වෙලා කියලා හැමෝම පම්පෝරි ගහනවා. නමුත් ඔබතුමන්ලා දැන ගන්නට ඕනෑ, වයස අවුරුදු 15ත්-24ත් අතර අපේ රටේ තිබෙන පිරිමි විරැකියා ප්‍රතිශතය 16යි; කාන්තා විරැකියා ප්‍රතිශතය 24යි කියලා. එතකොට අපි තීන්දු කරන්න ඕනෑ, හෝටල් ව්‍යාපෘති තුනකට බදු සහන ලබා දෙනවාද, එහෙම නැත්නම් ඒ ලබා දෙන සහන අහිමි කරලා රාජ්‍ය ආදායම ලබා ගෙන, ඇඟලුම් කම්හල් 200 වාගේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනවාද කියලා.

අපේ රට තුළ ආයෝජකයන් පන්නා දමන කුමන්ත්‍රණ ක්‍රියාත්මක වෙනවා කියලා අපට අහන්නට ලැබුණා. ඇත්තම කථා කරනවා නම් අපි කුහක දේශපාලනයක් ක්‍රියාත්මක කරන්නේ නැහැ. රටට හොඳ දෙයක් සිද්ධ වෙනවා නම් ඕනෑම අවස්ථාවකදී අපි ලැහැස්තියි, එඩිතරව රාමුවෙන් පිට පැනලා සත්‍ය ප්‍රකාශ කරලා ඕනෑම හොඳ දෙයකට අත උස්සන්න; ඕනෑම හොඳ දෙයකට ශක්තිය ලබා දෙන්න. ඒ නිසා කුහක දේශපාලනයක් අපි අනුගමනය කරන්නේ නැහැ. නමුත් මම මතක් කර දෙන්නට කැමැතියි, ඇඟලුම් කම්හල් 200 වැඩසටහනට බදු සහන දීලා, දෙපැත්ත පත්තු වන විලක්කුවක් රට තුළ ක්‍රියාත්මක වෙන කොට, පිටරට ආයෝජකයන් ලංකාවට එන කොට එදා විපක්ෂය කිව්වේ මොකක්ද කියලා. "ප්‍රේමදාස ගමේ ඉන්න කොල්ලෝ කෙල්ලෝ ලවා සුද්දියන්ට යට ඇඳුම් මස්සවන්නට, ජංගි මහන්නට කටයුතු කරනවා" කියලා කිව්වා. ඒක ආර්ථික කුමන්ත්‍රණයක් නොවෙයිද, ඒක කුහකකම නොවෙයිද, ඒක ඊර්ෂ්‍යාව නොවෙයිද කියලා මම තමුන්නාන්සේලාගෙන් අහන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම මේ අවස්ථාවේ දී කියන්න කැමැතියි, අද උහුලා ගන්න බැරි ජීවන වියදමක් තුළ රටේ ජනතාව මහා පීඩනයකින් අසහනයකින් පෙළෙන බව. අද එන්න එන්නම ජීවන බර වර්ධනය වෙනවා. මහජනතාව අසහනයට පත් වන කොට රටේ ජාතික ප්‍රමුඛතාව හෝටල් ව්‍යාපෘති තුනකට බදු සහන ලබා දෙන එකද, එහෙමත් නැත්නම් ජීවන වියදම් සහනාධාර රටේ ජනතාවට බෙදා හදා දෙන එකද? මොකකටද, ප්‍රමුඛතාව ලබා දිය යුත්තේ?

වසර දෙකහමාරක් ගොවි විශ්‍රාම වැටුප කැපුවා. අදත් ගොවි විශ්‍රාම වැටුප වශයෙන් ලබා දෙන්නේ සොච්චමක්. බොහොම දියාරු සොච්චමක් ලබා දෙන්නේ. අවුරුදු දෙකහමාරක ගොවි විශ්‍රාම වැටුප කප්පාදු කරන්නට හොඳයි. ඒවාට පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරලා මුදල් වෙන් කරන්න බැහැ. හැබැයි, සංචාරක හෝටල් ව්‍යාපෘති තුනකට බදු සහන ලබා දෙන්න පුළුවන්. මොකකටද, රජයේ ප්‍රමුඛතාව? හෝටල් තුනකට බදු සහන ලබා දීමටද, මේ රටේ ගොවියා සුරැකීමටද?

අද වන විට වසර ගණනාවක සිට ධීවර ජනතාවගේ ඉන්ධන සහනාධාරය කපලා තිබෙනවා. ඉන්ධන සහනාධාරය ලබා දෙන්නේ නැහැ. මම අහන්න කැමැතියි, රජයේ ප්‍රමුඛතාව ලබා දිය යුත්තේ, මේ හෝටල් තුනකට සහන ලබා දෙන එකටද, එහෙමත් නැත්නම් ධීවර ජනතාවට ඉන්ධන සහනාධාරය ලබා දෙන එකටද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නියඟයක් ඇති වුණා, ගංවතුරක් ඇති වුණා. මහින්ද අමරවීර ඇමතිතුමාගෙන් අහන්න, ගංවතුරින්, නියඟයෙන් විපතට පත් වුණ ජනතාවට අදටත් අබමල් රේණුවක තරම්න්වත් සහනයක් ලබා දීලා නැහැ නේද කියන එක. රජයේ ප්‍රමුඛතාව හිමි වන්නේ, හෝටල් ව්‍යාපෘති තුනකට කෝටි ප්‍රකෝටි ගණන් බදු සහන, විවිධ සහන, බදු නිවාඩු - tax holidays - ලබා දෙන එකටද, එහෙම නැත්නම් පොදු ජනතාව සුරකින එකටද?

නිවාස නැති පවුල් ලක්ෂ 15ක් අද මේ රටේ ඉන්නවා. හිසට වහලක් නැතුව, අව්වට වේලි වේලි, වැස්සට තෙමී තෙමී ඉන්න මේ ගෙවල් නැති ජනතාවට ගෙවල් පහළොස් ලක්ෂයක් හදලා දෙන එකටද, එහෙම නැත්නම් කඩිමුඩියේ රෙගුලාසි ගෙනැල්ලා පෝසතුන්ට, ධන කුවේරයන්ට බදු සහන ලබා දෙන එකටද, රජයේ ප්‍රමුඛතාව හිමි විය යුත්තේ?

උසස් අධ්‍යාපන ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. මහ පොළ ශිෂ්‍යත්ව මුදල ලෙස තවමත් දෙන්නේ සොච්චමයි. රජයේ ප්‍රමුඛතාව විය යුත්තේ අර හෝටල් ව්‍යාපෘති තුනට ලබා දෙන බදු සහන ලබා නොදී ඒවා රාජ්‍ය ආදායමට එකතු කරලා මහපොළ ශිෂ්‍යත්වලාභීන්ගේ මහපොළ ශිෂ්‍යත්ව මුදල වර්ධනය කරන එක ද, එහෙම නැත්නම් මේ ධන කුවේරයින්ට බදු සහන ලබා දෙන එක ද? [බාධා කිරීම්] පොඩ්ඩක් අහගෙන ඉන්න. මේවා කියන කොට තමුන්නාන්සේලාට රිදෙනවා. නමුත් අහගෙන ඉන්න.

මම පැහැදිලිවම ප්‍රකාශ කරන්න කැමැතියි, අද අපේ රට තුළ ඖෂධ හිඟයක් තිබෙන බව. අද අපේ රටේ විදුලි බලාගාරවල අවශ්‍යතාවක් තිබෙනවා. අද අපේ රටේ ජනතාව බලාපොරොත්තු වනවා, ජනතාවගේ ඇඟට පතට දැනෙන සේවාවක්. [බාධා කිරීම්] ඔබතුමන්ලා රජයේ ප්‍රමුඛතා ටික පටලවා ගෙනයි තිබෙන්නේ. ඔබතුමන්ලාට මේ රටේ සාමාන්‍ය ජනතාවගේ සිතුම් පැතුම් තේරෙන්නේ නැහැ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට බාධා කරන්න එපා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමන්ලාට රාජ්‍ය ප්‍රමුඛතා අවබෝධ කර ගන්න තේරෙන්නේ නැහැ. තමුන්නාන්සේලාට මේවා නොතේරෙනවා ඇති. කෝටි ප්‍රකෝටි ගණනින් ලබා දෙන බදු සහන ටික රාජ්‍ය ආදායමට එකතු කරලා රටේ ජනතාවට දැනෙන සහන ලබා දෙන්න පුළුවන් බවත් ඔබතුමන්ලා මතක තබා ගන්න.

දැන් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතක් ගැන කථා කරනවා; ක්‍රමෝපාය ව්‍යාපෘති ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශ් කියන ප්‍රාන්තයේ අද ක්‍රියාත්මක කරන මහා පරිමාණයේ ව්‍යාපෘති මොනවාද? සුළං බලය මඟින්, හිරු එළිය - solar power - මඟින්, ජලය මඟින් විදුලිය නිපදවීම. ජීව වායුව නිපදවීම තවත් ව්‍යාපෘතියක්.

පිලිපීනයේ මොනවාද ක්‍රියාත්මක වන්නේ? එරටේ දැවැන්ත වශයෙන් BPO ව්‍යාපෘති ක්‍රියාත්මක වනවා. ඉන්දියාවේ ඒ ඒ රටවලට ආවේණික වුණු වෙනමම කර්මාන්තපුර බිහි වනවා. ජපාන ආයෝජකයින්ට වෙනම, ඒ වාගේම චීන ආයෝජකයින්ට වෙනම මේ යනාදී වශයෙන් දැවැන්ත සංවර්ධන වැඩසටහන් ඉන්දියාවේ ක්‍රියාත්මක වනවා. හැබැයි, ඒ හැම වැඩසටහනක්ම ඒ රටවල් ක්‍රියාත්මක කරන්නේ රටේ ජනතාවගේ ශුභ සිද්ධිය දිහා බලා රටේ ජනතාවට සහනයක් හැටියටයි. තමුන්නාන්සේලා මේ වැඩ කටයුතු ටික ක්‍රියාත්මක කරන්නේ; මේ සහන ටික ලබා දෙන්නේ තරාදියක දමා කිරලා, මැනලා ජනතාවගේ පැත්තෙන් හිතා නොවෙයි.

බංග්ලාදේශය ගන්න. බංග්ලාදේශයේ නැව් ඉදි කිරීමේ - shipbuilding - වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. බංග්ලාදේශය shipbuilding ක්‍රියාත්මක කරන කොට අපි කරන්නේ හෝටල් ව්‍යාපෘතිවලට බදු සහන ලබා දෙන එකයි. අපේ රටේ ප්‍රමුඛතාව මේකද කියලා මම අහන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම මේ අවස්ථාවේදී තවත් කාරණයක් ප්‍රකාශ කරන්න කැමැතියි. ගිය වසරේත් මේ රෙගුලාසි ඉදිරිපත් වුණා. කැසිනෝවලට සහන ලබා දීම ඒ රෙගුලාසිවල අඩංගු වෙලා තිබුණා. ඒ තුළින් කැසිනෝ ව්‍යාපෘති සඳහා යම් යම් සහන ලබා දෙනවා කියා තිබුණා. මේ සම්බන්ධයෙන් රට තුළ මහා ආන්දෝලනයක් ඇති වුණා. ඊට එරෙහිව ලොකු බලවේගයක් බිහි වුණා. ගෞරවනීය මහා සංඝ රත්නය ප්‍රමුඛ ආගමික නායකයින්, මුළුමහත් සිවිල් ජන සමාජයම ඒ සඳහා විරුද්ධ වුණා. රජය මොකක්ද කළේ? ඒක හකුළා ගත්තා. ඒක හොඳ දෙයක්. හකුළා ගෙන 2014 වර්ෂයේදී නැවත වරක් මේ රෙගුලාසි ගෙන එමින් රජය කරන්නේ මොකක්ද?

"කැසිනෝ සූදු" කියන වචන වෙනුවට "ආනුෂංගික පහසුකම්" කියන වචන මේ රෙගුලාසියට ඇතුළත් කරනවා. මේ සභා ගර්භය තුළ බැසිල් රාජපක්ෂ ඇමතිවරයා, ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිවරයාත් රජයත් ප්‍රකාශ කරලා තිබෙනවා, "නැහැ, කිසිම දවසක කැසිනෝ ව්‍යාපෘති සඳහා මේ රෙගුලාසි උපයෝගී කර ගන්නේ නැහැ." කියලා. ඒක හොඳ දෙයක්. තමුන්නාන්සේලාගෙන් මම එක දෙයක් අහන්න කැමැතියි. ඔබතුමන්ලාගේ ප්‍රකාශවලට නෛතික බලයක් නොදෙන්නේ ඇයි? සභා ගර්භය තුළට පමණක් සීමා කරන්නේ නැතිව ඔබතුමන්ලාගේ ප්‍රකාශවලට නෛතික බලයක් නොදෙන්නේ ඇයි? එහෙම දුන්නා නම්, මෙවැනි විවාදයක් නැහැ නේ?

විදේශ ආයෝජන අපේ රටට එනවාට අපි වුණත් අත් උස්සනවා; සහයෝගය ලබා දෙනවා. අපි දේශපාලන කුහකයෝ නොවෙයි. අපි දේශපාලන ඊර්ෂ්‍යාකාරයෝ නොවෙයි. අපි රට වෙනුවෙන් ඉන්න පුද්ගලයෝ. මේ රටේ යුද්ධයක් ක්‍රියාත්මක වන කොට මොන වාද භේද තිබුණත්, යුද්ධය වෙනුවෙන් අපට කරන්න පුළුවන් ඉහළම උපකාරය, ඉහළම ශක්තිය කුහකකමකින් තොරව අපේ වීරෝදාර රණ විරුවන්ට අපි ලබා දුන්නා. අපි නිල්පාට, කොළ පාට, රතු පාට බැලුවේ නැහැ. ඒ වාගේම තමයි, විදේශ ආයෝජන ගැන කථා කරන කොට හැමෝම තුළ ලොකු සැකයක් ඇති වනවා, මොනවාද මේ "ආනුෂංගික පහසුකම්" කියලා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මම ඇමතිතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. ඇමතිතුමනි, බලන්න 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත දෙස. ඒ පනතේ විග්‍රහ කරලා තිබෙනවා ක්‍රමෝපය සංවර්ධන ව්‍යාපෘති කියන්නේ මොනවාද කියලා. ඒ ආකාරයට ඔබතුමන්ලාට මේ ආනුෂංගික පහසුකම් ගැනත් විග්‍රහයක් කරන්න බැරි ඇයි? මේ පනත තුළ ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව විග්‍රහයක් කෙරනවා නම් ඇයි ආනුෂංගික පහසුකම් පිළිබඳව,-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු මන්ත්‍රීතුමා, පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාව දෙනවා ද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, වේලාව දෙනවා ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. මගේ වේලාව දෙන්නේ නැහැ.

ඒකේ ආනුෂංගික පහසුකම් පිළිබඳව ඇයි විග්‍රහයක් නැත්තේ? ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ අරමුණුවල ඒ ව්‍යාපෘති පිළිබඳව නිර්වචනයක් තිබෙනවා නම්, ඇයි මේකට නිර්වචනයක් ලබා දෙන්නේ නැත්තේ කියන එක මම අහන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලා මේ සභා ගර්භය තුළදී "කැසිනෝවලට සහන නැහැ, කැසිනෝ ගෙනෙන්නේ නැහැ, කැසිනෝවලට පක්ෂ නැහැ"යි කියලා නිකම් වචන කිව්වාට හරියන්නේ නැහැ. ඔබතුමන්ලාගේ වචනවලට නීතියේ රාමුව තුළ වග කීමක්, බලයක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා. ඒකයි මගේ ඉල්ලීම.

විශේෂයෙන්ම මම මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. දැන් බොහෝ දෙනා විග්‍රහ කරනවා, විරුද්ධ පාර්ශ්වය රටට විරුද්ධ, ආයෝජනවලට විරුද්ධ, සංවර්ධනයට විරුද්ධ පාර්ශ්වයක් හැටියට. කරුණාකර මට කියන්න, මේ රටේ සංචාරක ව්‍යාපාරයේ දැවැන්ත ව්‍යාපෘතියක් වන කණ්ඩලම හෝටලය හදනකොට එතකොට හිටපු විපක්ෂය කොයි විධියටද හැසිරුණේ, මොනවාද කිව්වේ කියලා. කණ්ඩලම හෝටලය හදනකොට කිව්වා, ඒ හෝටලයේ තිබෙන මළ මූත්‍ර ටික කණ්ඩලම වැවට යවලා මුළු වැවම අපවිත්‍ර කරනවා කියලා. ඒක ගොවියාට කරන මහා හානියක් කිව්වා. ඒකට විරුද්ධව පෙළපාළි ගියා, සත්‍යාග්‍රහ කළා, උද්ඝෝෂණ කළා. ඔය ඔක්කෝම කරලා 1994 දී මැතිවරණය ජයග්‍රහණය කළාට පස්සේ තමුන්නාන්සේලා ඔක්කෝම කණ්ඩලම නිවාඩු නිකේතනයට ගියා නිවාඩු ගන්න. පවුල් පිටින් ගියේ. එදා කණ්ඩලම ව්‍යාපෘතිය විවේචනය කරපු විපක්ෂය අද හොඳට මතක තියා ගන්න, ලෝක පාරිසරික සම්මානවලින් අද කණ්ඩලම හෝටලය ශක්තිමත් වෙලා තිබෙනවාය කියලා. ඒකයි සත්‍යය. ඒ නිසා කුහකකම ගැන කථා කරන කොට, ආර්ථික කුමන්ත්‍රණ ගැන කථා කරන කොට ඔබලාගේ නිරුවත ගැනත් හොඳට හොයලා බලන්න, ඔබලා කටයුතු කරපු ආකාරයත් හොඳට හොයලා බලන්න කියලා රජයේ සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම තවත් වැදගත් කාරණාවක් කියන්නට ඕනෑ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සූදු පනතක් ගෙනැවිල්ලා කැසිනෝ ව්‍යාපාරය, ජැක්පොට් ව්‍යාපාරය ව්‍යාප්ත කරන්නට කටයුතු කරපු පාර්ශ්වයක් හැටියට මේ සභා ගර්භය තුළදී සඳහන් කළා. 1991.05.31 වැනි දා අතිවිශේෂ ගැසට් පත්‍රය මම **සභාගත*** කරනවා.

මොකක්ද මේ ගැසට් පත්‍රයෙන් කියන්නේ? එදා "සූදු ක්‍රීඩා කිරීම සඳහා උපකරණ සහ උවාරණ ආනයනය තහනම් කිරීමේ නියෝගය" ක්‍රියාත්මක කළේ වෙන කවුරුවත් නොවෙයි, එක්සත් ජාතික පක්ෂ රජයයි කියන එක මම මේ අවස්ථාවේ මතක් කරනවා. [බාධා කිරීමක්] මම කියන්නම්. ඒවා තහනම් කළාට පස්සේ ජෝසිම්ලා මොකද කළේ? එදා ජෝසිම්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක එකතු වෙලා, රාජාලියා පක්ෂයත් එක්ක එකතු වෙලා දෝෂාභියෝගයක් ගෙනාවා. ජෝසිම් කිරි පෙව්වේ වෙන කාටවත් නොවෙයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටයි, රාජාලියා පක්ෂයටයි. එදා දෝෂාභියෝගයක් ගෙනාවේ ජෝසිම් කියන පුද්ගලයා. ඒ නිසා නිකම් බොරුවට මඩ ගහන්න එපා. නිකම් බොරුවට විවේචනය කරන්න එපා. වැරදි ගැන කථා කළොත් හැම පැත්තකම වැරදි තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේත් වැරදි තිබෙනවා; අපේත් අඩු පාඩුකම් තිබෙනවා. ඔබතුමන්ලාගෙත් වැරදි තිබෙනවා; ඔබතුමන්ලාගෙත් අඩු පාඩුකම් තිබෙනවා. හැබැයි, "ඔවා දෙනු පරහට තමා සම්මතෙහි පිහිටා සිට." අනුන්ට බණ දේශනා කරන්න ඉස්සෙල්ලා තමුන්නාන්සේලා සුදුසු ගුණයෙහි පිහිටා සිටින්න කියලා මම මේ සභාවේදී යෝජනා කරනවා. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථාව අවසන් කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට කථාව අවසන් කිරීමට අවස්ථාව දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම විවාදය තුළ ඒක පුද්ගල ආදායම ගැන කථා කළා; ආර්ථික වර්ධනය ගැන කථා කළා; රටේ ආශ්චර්යය ගැන කථා කළා. නමුත් ඒ කොච්චර කථා කළත් මේ

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

රටේ ජාතික ආදායමෙන් සියයට 53ක් භුක්ති විඳින්නේ පොහොසත්ම සියයට 20යි. දුප්පත්ම සියයට 20 භුක්ති විඳින්නේ ජාතික ආදායමෙන් සියයට 4යි කියන එකත් මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

මම මේ අදහස් උදහස් සියල්ලක්ම බොහොම සද්භාවයෙන් ඉදිරිපත් කළේ. මගේ අදහස්වලට ඇහුම්කන් දීලා ඒ නිවැරදි නිගමන ක්‍රියාත්මක කරන්නට තමුන්නාන්සේලා කටයුතු කරන්න. [බාධා කිරීම්] මම දන්නවා, ඇත්ත කථා කරන කොට රිදෙනවා, ඇත්ත කථා කරන කොට අමාරුයි, ඇත්ත කථා කරන කොට නළියනවා කියලා. නමුත් මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, සත්‍ය කවදා හෝ ජය ගන්නවා කියලා. මේ අවස්ථාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටයි-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි බොහොම ස්තුතියි.

මීළඟට ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.07]

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සජිත් ප්‍රේමදාස මැතිතුමාට පසු මේ විවාදයට එක්කාසු වෙන්න ලැබීම ගැන මා ඉතාම සතුටු වනවා. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ කථාව කරන්න ඉඩ දෙන්න.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ කථාව දෙස අපි හරියට බැලුවොත් පෙනෙන්නේ, සාර්ථක ඕනෑම දෙයකට මුලින් විරුද්ධ වන බවයි. එතුමා කිව්වා, කණ්ඩලම හෝටලය හදන කොට කණ්ඩායමක් විරුද්ධ වුණා, නමුත් දැන් කණ්ඩලම හෝටලය හදපු එක හොඳයි, ඇඟලුම් කර්මාන්තශාලා හදන කොට කණ්ඩායමක් විරුද්ධ වුණා, නමුත් දැන් ඇඟලුම් කර්මාන්තශාලා හදපු එක හොඳයි කියලා. ඉතින්, එතුමාගේ කථාවෙන් තේරෙන්නේ මේ ආයෝජනවලට වුණත් කණ්ඩායමක් විරුද්ධ වනවා, හැබැයි මේකත් හොඳයි කියන එකයි. ඒක තමයි එතුමාගේ කථාවෙන් කිව්වේ. වෙන දෙයක් නොවෙයි. ඒක තමයි එතුමාගේ කථාව.

ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේත් මේ වාගේ ආයෝජනවලට තමුන්නාන්සේලා දිරි දීලා තිබෙනවා. තමුන්නාන්සේලා කැසිනෝ පනත් ගෙනැල්ලා තිබෙනවා. ඒවා නැහැයි කියන්න බැහැ. රටකට ආයෝජකයකු එන්නේ ලාභ උපයන පරමාර්ථයෙන් තමයි. ඕනෑම ආයෝජකයකු එහෙමයි. විදේශ ආයෝජන එනකොට එහෙම තමයි. හැබැයි, අපි බලන්න ඕනෑ, අපේ රටේ තිබෙන දේවල් ආරක්ෂා කර ගන්න. අපේ රටේ සංස්කෘතියක් තිබෙනවා නම්, අපේ රටේ විනයක් තිබෙනවා නම් ඒ දේවල් අපි ආරක්ෂා කර ගන්න ඕනෑ. ඒවා ආරක්ෂා කර ගනිමින් ඒ ආයෝජන ලබා ගැනීම තමයි රජයක වගකීම සහ යුතුකම වන්නේ. මේ රජය සම්පූර්ණයෙන්ම ඒ වගකීම ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ වෙලාවේ කියන්න ඕනෑ මේ රජය දැවැන්ත විධියට ජනතාවට වැඩ කරපු රජයක් බව. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා, සුබසාධනය ගැන කථා කළා. මේ රජය කවදාවත් සුබසාධන කප්පාදු කරපු රජයක් නොවෙයි. තමුන්නාන්සේලා මහ ජනතාවට යම් කිසි සුබසාධනයක් දුන්නා නම් ඒ සුබ සාධනය අපිත් ඉදිරියටම ගෙනිච්චා. තමුන්නාන්සේලා ඉතුරු කරපු ප්‍රශ්න තිබුණා. යුද්ධය තමුන්නාන්සේලා ඉතුරු කරපු ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නයට විසඳුම් දුන්නේ මේ රජයයි. ඒ යුද්ධයේ පාපය තවමත් අපි ගෙවනවා. යුද්ධය නිසා මේ රටට ඇති වුණු අනිසි විපාකවලට රජයක් හැටියට තවමත් අපි වන්දි ගෙවන කාලයක් මේ. ඒ යුද්ධය අවසන් කරපු රජය දැවැන්ත විධියට ජනතාවගේ යටිතල පහසුකම් සංවර්ධනය කරමින්, මහ ජනතාවට සියලුම සහනාධාර දෙමින්, නිදහස් සෞඛ්‍ය, නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් අද පදනමක් ඇතිව රට ඉදිරියට ගෙන යන්නට හදනවා.

රටට ආයෝජන ඕනෑ. විදේශ සෘජු අයෝජන ඕනෑ. ඒ ආයෝජන තුළින් ලබා ගන්නා වූ විදේශ මුදල්, එහෙම නැත්නම් විදේශ විනිමය තුළින් තමයි තමුන්නාන්සේ කියන සහන දිගටම දෙන්න පුළුවන් වන්නේ. සජිත් ප්‍රේමදාස මැතිතුමනි, තමුන්නාන්සේ අහනවා ඒ දෙක අතර තිබෙන සම්බන්ධය මොකක්ද කියලා. අපිට ඒ විධියට විදේශ ප්‍රභවයන්ගෙන් මුදල් එනවා නම් ඒවායෙන් සහන දෙන්න අපට පුළුවන්. ඒක තමයි රජයක් හැටියට අපි බලාපොරොත්තු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දවසේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩායමේ රැස්වීමට ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් ඇවිල්ලා මේ ආයෝජන ගැන සම්පූර්ණයෙන් පැහැදිලි කරද්දී අපට මේ ගැන හොඳ පැහැදිලි වීමක් වුණා. හැබැයි අපි කියනවා, නිලධාරීන්ගේ පැත්තෙනුත් සමහර වෙලාවට අඩු පාඩු තිබෙනවා කියලා. නමුත් අපි සන්තෝෂ වනවා, 2006 සිට මේ දක්වා කාලය තුළ විදේශ ආයෝජනවල වැඩි වීමක් තිබීම ගැන.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள்* [மாண்புமிகு சந்திம வீரக்கொடி] *தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. JANAKA BANDARA *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයෝජන මණ්ඩලයට අපේ ප්‍රණාමය පුද කරනවා. 1978 සිට 2005 දක්වා මේ රටට ආවාට වැඩිය දැවැන්ත ආයෝජනයක් 2006 සිට 2013, 2014 දක්වා කාලයේ යම් යම් ක්ෂේත්‍රවලින් මේ රටට ඇවිල්ලා තිබෙනවා. නමුත් අඩු පාඩුවක් තිබෙනවා. මේ වාගේ නියමයන් ගේන විට ඒවා පිළිබඳව ජනතාව හරියාකාරව දැනුවත් කරන්න ඕනෑ; මේ සභාව හරියාකාරව දැනුවත් කරන්න ඕනෑ. අපේ රටේ මේ පිළිබඳව විමසිලිමත් වන සියලු දෙනා හරියාකාරව දැනුවත් කිරීම කරන්නට ඕනෑ. අද ඇති වෙලා තිබෙන ප්‍රශ්නය ඒකයි. ඇත්තම කියනවා නම් මන්ත්‍රීවරුන් විධියට අපි මේ පිළිබඳව හරියටම දැනුවත් වුණේ ඊයේ-පෙරේදායි.

[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණය කියන්නට ඕනෑ. විපක්ෂය මේකේ ලොකු බිල්ලෙක් මවා පෙන්වනවා. මේකේ ලොකු බිල්ලෙක් මවා පාලා පෙන්වනවා. මෙතැනදී විශේෂයෙන්ම අපි බලන්නට ඕනෑ මේ ව්‍යාපෘති තුළින් අපේ දරුවන්ට යම් කිසි හානියක් වෙනවා ද කියලායි. අපි හිතමු මේ හෝටල් ව්‍යාපෘතිවල කැසිනෝ ඇති වෙනවා කියලා. නමුත් අපට පුළුවන් වන්නට ඕනෑ ඒ කැසිනෝවලට අපේ දරුවන් යන්නේ නැති විධියට, එහෙම නැත්නම් අපේ අය සම්බන්ධ නොවන විධියට අපේ සංස්කෘතිය ආරක්ෂා කර ගන්නට. ඒ පිළිබඳව නීති රීති දාලා ඒවායින් ආරක්ෂා වන්නට අපට පුළුවන් වන්නට ඕනෑ. විපක්ෂය මේ පිළිබඳව බොරු බිල්ලෙක් මවා පානවා. විපක්ෂයට මේ පිළිබඳව පැහැදිලිවම තිබෙන්නේ ඊර්ෂ්‍යාවක්. මේ රට සංවර්ධනය වන විට, මේ රටට ආයෝජකයන් එන විට ඔවුන්ට ඊර්ෂ්‍යායි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉල්ලීමක් කළා විපක්ෂයේ අවසාන කථිකයන් දෙදෙනාට විනාඩි 10 බැගින් කාලය ලබා දෙන්නය කියලා. තව විනාඩි 15ක් පමණ තිබෙනවා නේ. එම නිසා ඒ අවස්ථාව අපට දෙන්න. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමන්ලා කථා කළා නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා, කථා කරන්න.

[අ.භා. 6.13]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මේ අවස්ථාවේදී මේ නියමයන් ගැන විවාදයක් අවශ්‍ය නැහැ, අපි ඉදිරිපත් කරන සංශෝධනය ඉදිරිපත් කරන්නට පුළුවන් නම්. මේ "අනුෂාංගික පහසුකම් ද සහිතව...." කියන කොටස වෙනුවට, ව්‍යාපාර තුළ සෘජුව හෝ වක්‍රව කවර හෝ නාමයකින් හඳුන්වනු ලබන සූදු කෙළිය, ඔට්ටු ඇල්ලීම, එහෙම නැත්නම් කවර නාමයකින් හඳුන්වනු ලබන්නා වූ ගණිකා වෘත්තිය හෝ ගණිකා මඩම් බඳු ව්‍යාපාර මේ තුළ ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියලා කියනවා නම් අපි ඡන්දයක් ඉල්ලන්නේ නැතිව මේ නියමයන් සම්මත කරනවා කියන කාරණය විශේෂයෙන්ම පැහැදිලි කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශීය සංස්කෘතිය, දේශීය උරුමයන් රකිනවා කියූ ආණ්ඩුව, රට තුළ සදාචාරය, යහපත් භාවය ගොඩ නඟනවා කියලා කඳුළු හෙළපු ආණ්ඩුව, බලය ඉල්ලපු ආණ්ඩුව අද ඒ කඳුළු කිඹුල් කඳුළු බවට පරිවර්තනය කරලා තිබෙනවා කියන කාරණය අද ජනතාවට ඒත්තු ගැන්වෙනවා. ජනතාව ඉදිරියේ, මේ දේශය ඉදිරියේ සිංහයෙක් වාගේ හැසිරුණු මේ ආණ්ඩුව, සිංහ හමක් පොරවා ගත්ත කොටලුවෙක් වාගේ කටයුතු කරනවා කියන කාරණයත් අද ජනතාව දකිනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සූදු තිප්පොළවල්, කැසිනෝ ව්‍යාපාර, ගණිකා ව්‍යාපාර, මතට තිත කියූවත් මත්ද්‍රව්‍ය මධ්‍යස්ථාන රට තුළට ඇතුළත් කරලා මේ ධර්මද්වීපය විනාශ කරන්නට හදනවා. ඒ විතරක් නොවෙයි. ඉන්දියන් සාගරයේ මුතු ඇටය කියා හඳුන්වපු මේ රට අද දුරාචාරයේ මුතු ඇටය බවට පත් කරන්නට නීති කෙටුම්පත් ගේනවා කියන කාරණයත් විශේෂයෙන් සඳහන් කරනවා. මේ ගරු සභාව තුළ බෙරිහන් දීපු ආණ්ඩුවේ ඇමතිවරුන්ගෙන් මා අහනවා, තමුන්ගේ පාර්ශ්වයන්ට මේ නියමයන් පිළිබඳව පැහැදිලි කරලා දෙන්න බැරි ඇයි කියා; තමුන් සමඟ හවුල් වෙලා සිටින ජාතික හෙළ උරුමයට මේ නියමයන් ගැන පහදලා දීලා ඒ අයගේ ඡන්දය ගන්න බැරි ඇයි කියා; තමුන් සමඟ හවුල් වෙලා සිටින විමල් වීරවංශ ඇතුළු ඒ පක්ෂයේ අයට මේ නියමයන් ගැන පැහැදිලි කරලා දෙන්න බැරි ඇයි කියා; මුස්ලිම් කොංග්‍රසයට මේ නියමයන් ගැන පැහැදිලි කරලා දෙන්න බැරි ඇයි කියා; අපටම පැහැදිලි කර දෙන්න හදන්නේ ඇයි කියා.

අද අපේ රතන හාමුදුරුවෝ මේ ගරු සභාවේ හිටියා. කොන්ද කෙළින් තියාගෙන උන් වහන්සේ ඊයේ දින සම්මත කළ නියමයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළා. දැන් වන විට උන් වහන්සේටත් මැර තර්ජන එල්ල කරලා මේ සභා ගර්භයෙන් පිට කරලා තිබෙනවාය කියන කාරණය අපට දැන ගන්නට ලැබිලා තිබෙනවා. උන් වහන්සේට මේ ගරු සභාවට එන්න දෙන්නේ නැහැයි කියන කාරණයත් විශේෂයෙන් කියනවා. ත්‍රෛ නිකායික මහා නායක හිමිවරුන්, ආගමික නායකයින්, ආණ්ඩුවේ මැති ඇමතිවරුන් විරුද්ධ වෙද්දී මේ නියමයන් සම්මත කර ගන්නට මෙච්චර දඟලන්නේ ඇයි? විශේෂයෙන්ම අවසාන මොහොතේ අහනවා, මේ රට දියුණු කරන්නට පුළුවන් වන්නේ ලෝකයේ ඉන්න බේබද්දෝ මේ රටට ගෙනැල්ලාද කියා; ලෝකයේ ඉන්න කැසිනෝකාරයෝ මේ රටට ගෙනැල්ලාද කියා; ලෝකයේ ඉන්න කුඩුකාරයෝ, ගණිකාවෝ සොයාගෙන එන අය මේ රටට ගෙනැල්ලාද කියා. ඒ වාගේ අයට මේ රටට එන්න කියලාද මේ රට දියුණු කරන්නට හදන්නේ කියා අසමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 6.16]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමන්ලා කියන විධියට අපට පෙනෙනවා අද මේ ආණ්ඩුව විසින් ජේම්ස් පැකර්ව සෝවාන් කර තිබෙනවා කියලා. මොකද, ජේම්ස් පැකර්ගේ කැසිනෝ ශාලා නැති කිසිම ව්‍යාපාරයක් නැහැ. හැබැයි, මේ ආණ්ඩුවට පුළුවන් වෙලා තිබෙනවා, කැසිනෝ ශාලාවක් නැති හෝටලයක් හදන්න. ඒ කියන්නේ, ජේම්ස් පැකර්ව මේ ආණ්ඩුව සෝවාන් කරලා තිබෙනවා. ඒකයි අපිට කියන්න තිබෙන්නේ. ඊට අමතරව අපිට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. එහෙනම් මේ හෝටල් සංකීර්ණයට ජාතික හෙළ උරුමය විරුද්ධ ඇයි? වීරවංශ ඇමතිතුමන්ලා විරුද්ධ ඇයි? මුස්ලිම් කොංග්‍රසය මේකට විරුද්ධ ඇයි? මේක අපට ප්‍රශ්නයක්. කැසිනෝ ශාලා නැත්නම් මේ මහත්වරු මේකට විරුද්ධ ඇයි? මොකක්ද මේ රජයට විරුද්ධව මේ ඇමතිවරු දක්වන කුමන්ත්‍රණය? පාඨලී චම්පික රණවක ඇමතිතුමා නැහැ. ඊයේ අපේ රතන හාමුදුරුවන්ට කථා කරන්න විනාඩි පහක් ලබා දුන්නේ නැහැ. අපට උන් වහන්සේගේ මතය දැන ගන්න බැරිව ගියා. ඒ නිසා අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

"අනුෂාංගික පහසුකම්" කියන වචනය වෙනුවට කැසිනෝ කියලා දැම්මා නම් කැසිනෝ විතරයි. දැන් ආනුෂාංගික පහසුකම් යටතේ බුරු ගහන්න පුළුවන්; පොර කුකුල්ලු කොටවන්න පුළුවන්; අශ්ව රේස් දමන්න පුළුවන්; ඕමි ගහන්න පුළුවන්; ළමා ගණිකා වෘත්තියේ යෙදෙන්න පුළුවන්; සම ලිංගික වෘත්තියේ යෙදෙන්න පුළුවන්. [බාධා කිරීමක්] ඕනෑ නම් සබන් ගාලා නාන්නත් පුළුවන්. ඕනෑ දෙයක් කරන්න පුළුවන්, මේ අනුෂාංගික පහසුකම් යටතේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
කාලය ඉවරද? තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ සම්බන්ධව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මෙකේ කැසිනෝ නැහැ කියලා කොච්චර කිව්වත් මෙහි කැසිනෝ තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. මී ළඟට ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 6.18]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විනාඩි පහකින් කථාව අවසාන කරන්න සිදු වීම ලොකු අසාධාරණයක්. විනාඩි පහකින් මම හිතන හැටියට වැඩි විස්තරයක් කරන්න දෙයක් නැහැ. විශේෂයෙන් බැසිල් රාජපක්ෂ ඇමතිතුමා වාගේම තවත් ඇමතිතුමන්ලා BOI එක සම්බන්ධයෙන් කථා කළා. ඔවුන් ප්‍රකාශ කළේ මෙය කැසිනෝ ව්‍යාපෘතියට සම්බන්ධ නොවන බවයි.

ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි, අපි අහන්නේ මේකයි. මම හිතන හැටියට ඔබතුමා මේ ආණ්ඩුවේ ඉන්න ඉතා බලවත් පුද්ගලයෙක්. රවුෆ් හකීම් ඇමතිතුමා ඉන්නවා. රිසාඩ් බදියුදීන් ඇමතිතුමා ඉන්නවා. අතාවුල්ලා ඇමතිතුමා ඉන්නවා. හසන් අලි මැතිතුමා ඉන්නවා. හිස්බුල්ලා මැතිතුමා ඉන්නවා. බෂීර් සෙගු ඩාවුඩ් මැතිතුමා ඉන්නවා. මොහමඩ් අස්ලම් මැතිතුමා ඉන්නවා. හරීස් මැතිතුමා ඉන්නවා. තව්ෆික්, ෆයිසාල් කාසීම්, ෆාරුක්, විමල් වීරවංශ මැතිතුමන්ලා ඉන්නවා. [බාධා කිරීම්] නැහැ, අහ ගන්න, අහ ගන්න. ඔබතුමන්ලාගේ යාළුවෝ නේ. ඔබතුමන්ලා අඩු ගණනේ රතන හාමුදුරුවන්ට කථාවක් කරන්න අවස්ථාව ලබා දුන්නේ නැහැ. ඊයේ ඔබතුමන්ලාගේ නියෝගයෙන් උන් වහන්සේගේ කථාව කැපුවා. උන් වහන්සේ රණ්ඩු වුණා. අපි ඒක දැක්කා. ඔබතුමන්ලා අපට මේ කාරණය තේරුම් කර දීලා වැඩක් නැහැ, ඇමතිතුමනි. ඔබතුමා බලවත් ඇමතිවරයෙක්. ඔබතුමා ජනාධිපතිතුමාගේ සහෝදරයා. මේ ආණ්ඩුවේ ඉන්න බලවත්ම පුද්ගලයෙක්. ඔබතුමාට පුළුවන් නම් -

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා "නැහැ" කිව්වාට අපි දන්නවා, ඔබතුමා බලවත් කියලා. මේක කැසිනෝ සම්බන්ධයෙන් ගෙනෙන පනතක් නොවෙයි කියලා මේ ඉන්න ඇමතිවරුන්ට කියලා දෙන්න ඔබතුමාට බැරි ඇයි? මුස්ලිම් භක්තියකයන්, මුස්ලිම් ඇමතිවරු මේකට විරුද්ධ වුණා. ඔවුන් පාර්ලිමේන්තුවට එන්නේ නැහැ. මම දන්නවා, ආණ්ඩුව ඇතුළේ ගොඩක් ප්‍රශ්න තිබෙන බව. ආණ්ඩුවේ ඇමතිවරුත් ඉන්නවා, මේ පනතට විරුද්ධව. වාසුදේව නානායක්කාර ඇමතිතුමා වාගේම අනිකුත් ඇමතිවරු ඒ කාලයේ කොකා කෝලාවලට විරුද්ධ වුණා. අද මම හිතන්නේ එතුමන්ලා මේ සම්බන්ධයෙන් විශාල විරුද්ධත්වයක් ප්‍රකාශ කරනවා. හැබැයි, එතුමන්ලා ආණ්ඩුවේ ඉන්න නිසා යම්කිසි තීන්දුවක් අරගෙන තිබෙනවා, මේක වැරදි වුණත් මේකට යම්කිසි සහයෝගයක් දෙන්න ඕනෑය කියලා. අපි කියන්නේ මෙච්චරයි, ඇමතිතුමනි. ඔබතුමන්ලා විශේෂයෙන්ම BOI එක ගැන කථා කළා. Katana City එක - ඔබතුමන්ලා අත්සන් කළේ මොකක්ද කියලා බලන්න. අක්කර 200ක් මේ රට සංවර්ධනය කරන්නේ කැසිනෝ ඇති කරලා නොවෙයි, ඇමතිතුමනි. මේවා අනුශාංගික කරුණු.

රටක් සංවර්ධනය වන කොට කර්මාන්ත දියුණු වන්න ඕනෑ. දැන් අවුරුදු පහක් ගිහිල්ලා තිබෙනවා. බයිසිකලයක්, මෝටර් සයිකලයක්, පුෂ් බයිසිකලයක්, ත්‍රී වීලර් එකක්, කාර් එකක් මේ රටේ හදන්න ඔබතුමන්ලා පටන් ගන්න. මේවායෙන් වැඩිය පගා ගහන්න බැහැ. ජේම්ස් පැකර්ලා ඔබතුමන්ලාගෙන් සල්ලි අරගෙන ඉවරයි. සල්ලි අරගෙන ඉවර නිසා ඔබතුමන්ලා කොහෙන් හරි ගෙනැල්ලා මේක හංගලා ගහලා, එතුමන්ලාට කැසිනෝ ආරම්භ කරන්න දෙනවා. කැසිනෝ ගැන පස්සේ කථා කරන්න පුළුවන්. මේක කොහේද ආරම්භ කරන්නේ, මේක හම්බන්තොට ආරම්භ කරනවා ද, මේක පොඩි දූපතක ආරම්භ කරනවාද, නැත්නම් රටින් පිට වෙනත් තැනක ආරම්භ කරනවාද, සුද්දන්ට පමණයිද මේක විවෘත කරන්නේ වාගේ දේවල් පිළිබඳව අපිට පසුව කථා කරන්න පුළුවන්. කැසිනෝ සඳහා පනතක් ගෙනාවේ මේ රට තුළ තිබුණු සූදුවෙන් යම්කිසි ආකාරයකින් මුදලක් ලබා ගන්න. එය සහනයක් නොවෙයි. පනතක් ගෙනාවේ මුදලක් ලබා ගන්න. ඔබතුමන්ලාට පුළුවන් නම් මේක නීත්‍යනුකූලගත කරන්න. මේකට ඔබතුමන්ලා licence එකක් ලබා දෙන්න. පනතක් ගෙනෙන්න පුළුවන්. ඔබතුමන්ලාට මේ වාගේම පනතක් ගෙනැල්ලා මේ ආයතනවලට licence එකක් ලබා දෙන්න පුළුවන්. විශාල මුදලක් මේ ආයතනවලින් ගන්න පුළුවන්. වෙන තැනක ඇති කරන්න පුළුවන්. සුද්දන්ට පමණක් මේවාට යන්න ඇති කරන්න පුළුවන්. මේවායින් ආර්ථික ලාභයක් ලබා ගන්න පුළුවන්. හැබැයි, ඇමතිතුමනි, මේක ඔබතුමන්ලාගේ සංවර්ධන ව්‍යාපෘතිය බවට පත් කර ගන්න එපා. මේ රට බෞද්ධ රටක්. ඔබතුමන්ලා මේ රටට පොරොන්දු වුණේ මේක නොවෙයි. ජනාධිපතිතුමා මේ රටට පොරොන්දු වුණේ මේක නොවෙයි. ජනාධිපතිතුමා මොකක්ද කිව්වේ? ජනාධිපතිතුමා මේවාට විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙන බව පසු ගිය හැන්සාඩ් වාර්තාවලින් පෙනෙනවා.

1990 ඔක්තෝබර් 25 වැනි දින හැන්සාඩ් වාර්තාවේ එතුමාගේ කථාවේ මෙසේ සඳහන් කර තිබෙනවා:

> "අතුරුදහන්වීම් ගැන තමුන්නාන්සේලාට කිව්වා. මේ රටට ජෝසිම්ලා - මංකොල්ලකාරයින්- ඇවිල්ලා ආණ්ඩුවේ සංවර්ධනයට ය කියලා කුට්ටි ගණන් සල්ලි දුන්නා ම "අර ගනින් බොලා" කියලා තියෙන හෝටල් ඔක්කොම දෙනවා".

මේක නේ ඔබතුමන්ලා කරන්නේ. ජනාධිපතිතුමා 1991 කිව්ව දේම ඔබතුමා අද සහෝදරයා විධියට කරනවා. එතුමා තවදුරටත් මෙහෙම කියනවා:

> "මොනවා ද ගෙනිච්චේ ? අපි දන්නවා අද මේ ජෝසිම්ලාට දීලා තියෙන තැන. හොර ජාවාරම් කාරයින්ට පහසුකම් ඇති කර තිබෙනවා. තරු පහේ හෝටල්වල කැසිනෝ ගහන්න. ඒක තමයි තමුන්නාන්සේලාගේ ධාර්මිෂ්ටකම. ඒක තමයි හැමදාම උදේට කියන බණ. ඒ තමයි සුචරිත වාදය. මේක අලුත් වාදයක්. සුචරිත යයි කියා උගන්වා තියෙන්නේ, අද කරපන් ජෝසිම් එක්ක සූදුව කියලයි...."

[ගරු සුජීව සේනසිංහ මහතා]

එහෙමයි එතුමා එදා කිව්වේ. අද එතුමාට පාරා වළල්ලක් වෙලා තිබෙනවා එදා එතුමා කියපු වචන ටික. එදා එතුමා විරුද්ධ වූ දේ එතුමාගේ සහෝදරයා වශයෙන් අද ඔබතුමා කරනවා. [බාධා කිරීම්]

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
නැහැ, නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමාට මේක සම්බන්ධයි කියලා අපි දන්නවා. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ- [බාධා කිරීම්] ඔබතුමාගේ vision එක මේක. අප කියන්නේ මේකයි ගරු ඇමතිතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. අවසන් කරන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අප කියන්නේ, පුළුවන් නම් three-wheelers කර්මාන්තයක්, මෝටර් බයිසිකල් කර්මාන්තයක්, මේ රට සංවර්ධනය කරන වෙනත් සංවර්ධන ව්‍යාපෘති ඇති කරන්න කියලායි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Thank you very much. The Hon. Faiszer Musthapha, please.

[අ.භා. 6.22]

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - முதலீட்டு ஊக்குவிப்பு பிரதி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Deputy Minister of Investment Promotion)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාගෙන් පසුව කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අද ගෙනාපු නියමයන්ට අදාළ ගැසට් පත්‍රිකා ගැන කථා කරමින් විපක්ෂය කැසිනෝ සම්බන්ධව ප්‍රකාශයක් කළා. මෙය එක්සත් ජාතික පක්ෂය සහ විපක්ෂයේ අනෙකුත් පක්ෂ චේතනා සම්බන්ධයෙන් නඟන තර්කයක්. හැබැයි අද මේ ගැසට් පත්‍රිකාවේ සිද්ධිමය හා නෛතික වශයෙන් අඩංගු කරුණු වන්නේ මොනවාද? Lake Leisure Project සහ Waterfront Project කියන ව්‍යාපෘති දෙකට ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ යම් යම් පහසුකම් ඉල්ලා තිබෙනවා. එම පහසුකම් සම්බන්ධයෙන් වූ නියමයන් ඇතුළත් ගැසට් නිවේදන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. එම ගැසට් නිවේදනවලට අනුකූලව එම පහසුකම් ලබා දිය යුතුද නැද්ද යන්න සම්බන්ධයෙන් පවත්වන විවාදයක් සහ ඡන්දයක් පමණයි මෙය. ඒ නිසා කිසිසේත් මේ නියමයන් දෙකට කැසිනෝ සම්බන්ධ කළ නොහැකියි. කෙසේ වෙතත් කලින් ඉදිරිපත් කරපු ගැසට් පත්‍ර තුළින් සූදු සහ ඔට්ටු ඇල්ලීම සම්බන්ධයෙන් යම් යම් සහන ඉල්ලා සිටියා. නමුත් ඒ සම්බන්ධයෙන් තිබුණු විරෝධතාව මත එම සහන කොන්දේසි ඉවත් කර තිබෙනවා. අද මෙම ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙන නියමයන්ට ඒවා කිසිසේත් සම්බන්ධවීමක් නැහැ. එක්සත් ජාතික පක්ෂය සහ අනෙකුත් විරුද්ධවාදී පක්ෂ කැසිනෝ සම්බන්ධයෙන් ආගම සහ ධර්මය සම්බන්ධ කරලා දේශනා කරන්න හදන දේ දේශපාලන වේදිකාවට සීමා වූ දෙයක් පමණයි. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ විවාද කළ යුතු දේ විපක්ෂය අද විවාද කරන්නේ නැහැ. ආගමට ධර්මයට අනුකූලව කැසිනෝ නොගෙනා යුතුයි යන තර්කය පමණයි මේ ගරු සභාවට ඉදිරිපත් කළේ. නමුත් නෛතික හා සිද්ධාන්ත තර්කයක් එක්සත් ජාතික පක්ෂය සහ විපක්ෂයේ අනෙකුත් පක්ෂ ඉදිරිපත් නොකිරීම ගැන මම බෙහෙවින් කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද එක්සත් ජාතික පක්ෂය කැසිනෝ ගැන කථා කරනවා. අපි අතීතයට යන්න ඕනෑ. 1988 ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා රුපියල් මිලියනයකට කැසිනෝ ව්‍යාපාරයක් ගෙන යෑමේ අවස්ථාව එක්සත් ජාතික පක්ෂ රජය ලබා දුන්නා. නමුත් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා 2013 පාර්ලිමේන්තුවේ සංශෝධනයක් ගෙන ඒම තුළින් එය රුපියල් මිලියන 100ක් කිරීමෙන් පසු අද කැසිනෝ ව්‍යාපාරය ව්‍යාපාරිකයන් පස්දෙනකුට සීමා වෙලා තිබෙනවා. අද එක්සත් ජාතික පක්ෂය කියනවා, මෙම ව්‍යාපෘතිවල කැසිනෝ ව්‍යාපාරය කරගෙන යන්න බැහැ කියලා සංශෝධනයක් ගෙනෙන්න ඕනෑ කියා. එක්සත් ජාතික පක්ෂ රජය නිසා ලංකාවේ අද කැසිනෝ ව්‍යාපාරය තිබෙනවා. එම ව්‍යාපාරය නීති රාමුවට ඇතුළත් කිරීමට 2010 දී පනතක් මේ පාර්ලිමේන්තුවේදී සම්මත වුණා. එය සම්මත කිරීමෙන් බලාපොරොත්තු වූයේ මොකක්ද? ඊට කලින් 1988 එක්සත් ජාතික පක්ෂ රජය බලාපොරොත්තු වූයේ මොකක්ද? එක අතකින් එය නීති විරෝධී ව්‍යාපාරයක් බව කියලා, අනෙක් අතින් ආණ්ඩුවට බදු ලබා ගැනීමේ ප්‍රයත්නය දැරීමකුයි එම පනත ගෙන ඒමේ අරමුණ වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා Lake Leisure ව්‍යාපාරයේ ඉඩම සම්බන්ධයෙන් මේ සභාවට ප්‍රශ්නයක් මතු කළා.

ඒ පිළිබඳ සත්‍ය තත්ත්වය මේ අවස්ථාවේ මා මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා. එම ඉඩම අක්කර දෙකයි, රූඩ් එකයි, පර්චස් විසිඑකයි. එම ඉඩමේ වටිනාකම රුපියල් මිලියන 1,300යි. පර්චස් එකක් මිලියන 3.41යි. ඒ යටතේ සියයට දහයක මුදලක් 2007 ගෙවා තිබෙනවා. වර්තමාන වටිනාකම රුපියල් මිලියන 2,787යි. පර්චස් එකක් මිලියන 7.3යි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
එම ආයෝජකයා ඒ මිලියන 2,787 ගෙවීමට අවබෝධතා ගිවිසුමකට එකඟ වෙලා තිබෙනවා. ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
න්‍යාය පත්‍රයේ අංක 1, 2 අයිතමයන් සඳහා ඡන්ද විමසීමට කාලය ඉල්ලා සිටිනවා.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අංක 01 යෝජනාවට සභාව එකඟ ද?

***ප්‍රශ්නය විමසන ලදී.***
***කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*வினா விடுக்கப்பட்டது.*
*குரல்களின்படி 'ஆம்' மேலோங்கிற்று என பிரதிச் சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.*

*Question put.*
MR. DEPUTY SPEAKER, *having collected the Voices, declared that the "Ayes" had it.*

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නාමිකව බෙදීමක් අවශ්‍යයි.

***පාර්ලිමේන්තුව මතු පළ වන අන්දමට-පක්ෂව 112; විරුද්ධව 44; නොපැමිණි 67 යනුවෙන් බෙදුණේය.***
*பாராளுமன்றம் பிரிந்தது: சார்பாக. 112; எதிராக 44; வராதோர் 67.*
*The Parliament divided: Ayes 112; Noes 44; absent 67*

***පක්ෂව***
*சார்பாக*
*Ayes*

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

ගරු ජීවන් කුමාරණතුංග මහතා
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க)
(The Hon. Jeewan Kumaranatunga)

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා
(மாண்புமிகு ரெஜினோல்ட் குரே)
(The Hon. Reginold Cooray)

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු පියසේන ගමගේ මහතා
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු ඩීව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ගරු දයාශ්‍රිත තිසේරා මහතා
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன்)
(The Hon. Janaka Bandara Tennakoon)

ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்)
(The Hon. Arumugan Thondaman)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු දුමින්ද දිසානායක මහතා
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු සාලින්ද දිසානායක මහතා
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

**ගරු එස්.බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து)
(The Hon. Milroy Fernando)

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

**ගරු (ආචාර්ය) ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜகத் பாலசூரிய)
(The Hon. (Dr.) Jagath Balasuriya)

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

**ගරු රත්නසිරි වික්‍රමනායක මහතා**
(மாண்புமிகு ரத்னசிறி விக்கிரமநாயக்க)
(The Hon. Ratnasiri Wickramanayaka)

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

**ගරු ගුණරත්න වීරකෝන් මහතා**
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

**ගරු ඒ.එච්-.එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் )
(The Hon. Murugesu Chandrakumar)

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அன்டனி)
(The Hon.Victor Antony)

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)

ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා
(மாண்புமிகு டபிள்யு.பி. ஏக்கநாயக்க)
(The Hon. W.B. Ekanayake)

ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)

ගරු සිරිපාල ගමලත් මහතා
(மாண்புமிகு சிறிபால கமலத்)
(The Hon. Siripala Gamalath)

ගරු සරත් කුමාර ගුණරත්න මහතා
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු සරණ ගුණවර්ධන මහතා
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)

ගරු අර්ල් ගුණසේකර මහතා
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)

ගරු හේමාල් ගුණසේකර මහතා
(மாண்புமிகு ஹேமால் குணசேகர)
(The Hon. Hemal Gunasekera)

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)

ගරු සනත් ජයසූරිය මහතා
(மாண்புமிகு சனத் ஜயசூரிய)
(The Hon. Sanath Jayasuriya)

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

